# 13

## මහින්ද රාජපක්ෂ පාලනය රට උකසට තබා ණය ගෙන

# මහා පරිමාණ ව්‍යාපෘතීන් හරහා සිදු කළ මංකොල්ලය

**කැමැත්තෙන් දුන් ව්‍යාපෘති යෝජනා නොහොත්**

**අන්සොලිසිටඩ් ප්‍රපෝසල්ස් (Unsolicited Proposals).**

ශ්‍රී ලංකා රජයේ මිලදී ගැනීම් සහ ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පැවරීම් ඇතුළු සියලු ප්‍රසම්පාදන කටයුතු මූල්‍ය විනය සහිතව විනිවිද පෙනෙන ආකාරයට සිදු කිරීම සඳහා සකස් කරනු ලැබූ රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියකට දීර්ඝ කාලයක සිට පිළිගත් ක්‍රමවේදය විය. එම ක්‍රියාවලිය වරින්වර වෙනස් වන ආර්ථික සහ සමාජ තත්ත්වයන් අනුව සංවර්ධනය වෙමින් ඉදිරියට පැමිණි ක්‍රියාවලියකි. 1997 රාජ්‍ය ටෙන්ඩර් මාර්ගෝපදේශ සංග්‍රහය මෙහිදී යොදා ගත් මූලික රාමුවයි.

එහෙත් මෙම ක්‍රියාවලිය තුළ පැවති දුර්වලතාවන් ලෙස අකාර්යක්ෂමතාවය, දීර්ඝ කාලයක් ව්‍යාපෘති ප්‍රමාද වීම හා ඇතැම් දූෂණ වලට ඇති ඉඩකඩ පිළිබඳ නිරන්තර විවේචන එල්ල විය. 2004 වසරේදී මෙම දුර්වලතා මඟ හරවා ගැනීමට රජයේ අවධානය යොමු විය. ලෝක බැංකුව ප්‍රධාන කොට ගත් ශ්‍රී ලංකාවට ආධාර ලබා දෙන අනෙකුත් රටවල සහ රාජ්‍ය ආයතන රැසක යෝජනා සැලකිල්ලට ගනිමින් 2004 වසරේ දී ජාතික ප්‍රසම්පාදන ආයතනය (National Procurement Agency) පිහිටුවනු ලබන්නේ මෙම අකාර්යක්ෂමතාවය ඇතුළු අනෙකුත් දුර්වලතා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් ඉවත් කිරීම වෙනුවෙනි.

ඒ අනුව සියලුම රජයේ මිලදී ගැනීම් සහ ව්‍යාපෘති කොන්ත්‍රාත් පිරිනැමීම් විධිමත් පටිපාටියකට අනුව විවෘත ටෙන්ඩර් කැඳවීම් හරහා තරගකාරී මිලගණන් කැඳවීම තුළින් ලබාදීමටත්, ඒ පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම ඇතුළු විධිවිධාන රැසක් යටතේ ජාතික ප්‍රසම්පාදන ආයතනය හරහා සිදු කරනු ලැබී ය. මේ තුළින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය වඩාත් විධිමත් විය.

2005 මහින්ද රාජපක්ෂ පාලනය ඇරඹීමත් සමගම මෙම ප්‍රසම්පාදන ආයතනය හා එහි විධිමත් ක්‍රියා පටිපාටිය තම අභිමතය පරිදි විවිධ ගණුදෙනු සිදු කිරීමට බාධාවක් බව හඳුනාගත් බව පෙනේ. ඒ අනුව 2007 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී රාජපක්ෂ ආණ්ඩුව විසින් මෙම ජාතික ප්‍රසම්පාදන ආයතනය අහෝසි කරනු ලබයි.

ඒ සමගම මහා පරිමාණ වංචා හා දූෂණ සඳහා ඔවුන් මාර්ගය විවෘත කර ගනී. කෙසේ වෙතත් "රජයේ සියලුම මිලදී ගැනීම් සහ ගණුදෙනු විවෘතව තරගකාරී මිලදී ගැනීම් හරහා සිදු විය යුතුය" යන මූලික නිර්දේශය මේ හරහා අහෝසි නොවේ.

එහෙත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශණ තුළ "ඉතා හදිසි" අවශ්‍යතා වලදී කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට එනම් සුනාමි, ගංවතුර වැනි ස්වභාවික විපත් වලදී යොදා ගැනීමට එම මාර්ගොපදේශන තුළින් ලබා දුන් 'කැමැත්තෙන් දුන් යෝජනා හෝ නොකැඳවන ලද

යෝජනා` ලෙස හැඳින්විය හැකි Unsolicited Proposals යන ප්‍රතිපාදනය තුළින් රිංගා යමින් මහා පරිමාණ වංචා සිදු කිරීමට රාජපක්ෂ පාලනය කටයුතු කරන ලදී.

ඒ අනුව හදිසි සහ ප්‍රමුඛ අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා විශේෂ කැබිනට් අනුමැතියක් යටතේ ලංසු කැඳවීමකින් තොරව (තරඟකාරී නොවන ක්‍රමයට) කොන්ත්‍රාත් පිරිනැමීමට කැබිනට් අනුමැතිය ලබා ගනී. ටෙන්ඩර් මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව "කැමැත්තෙන් දෙන යෝජනා" ලබා ගත යුතු වූයේද ප්‍රසිද්ධ දැන්වීම් හරහාය.

ලංකාවේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 1035 ඉක්මවීම නිසා තුන්වන ලෝකයේ රටවලට ලබා දෙන සහනාධාර අත්හිටුවීමත් සමඟ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විදේශ ණය ලබා ගැනීමේ අවශ්‍යතාව වැඩි විය. එහිදී රාජපක්ෂ ආණ්ඩුව සිදු කළේ එම සියලු ව්‍යාපෘති සඳහා කැබිනට් අනුමැතිය පමණක් ලබා ගෙන ඒවා " කැමැත්තෙන් දෙන ව්‍යාපෘති යෝජනා" යටතේ ක්‍රියාවට නැඟීමයි.

Standing Cabinet Appointed Review Committee (SCARC) පිහිටුවීම නොහොත් කැබිනට් අනුමැතිය ලද ස්ථාවර සමාලෝචන කමිටුව පිහිටුවීම ප්‍රසම්පාදන ක්‍රමවේදයේ පවතින ප්‍රමාදයන් අඩු කර ගැනීම සඳහා යැයි පවසමින් "1997 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ II වන කොටස" ට සංශෝධන ගෙන ඒමට 2010/06/23 කැබිනට් තීරණයක් ගන්නා ලදී. එහිදී මෙම " කැමැත්තෙන් දෙන ව්‍යාපෘති යෝජනා" ඇගයීමට ලක් කිරීමට සමාලෝචන කමිටුවක් ස්ථාපිත කරන ලද අතර ඒ සඳහා අමාත්‍යාංශ 07 ක ලේකම්වරු පත් කරන ලදී. එම කැබිනට් තීරණයට අනුව 2011/05/16 දින රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 23 වන අතිරේකය (සංශෝධිත) ප්‍රකාශයට පත් කරන ලදී.

එම සංශෝධනයට අනුව අමාත්‍යාංශ වෙත කැමැත්තෙන් දෙන ව්‍යාපෘති යෝජනා ලබා ගත හැකි වන අතර ඒවා SCARC වෙත ඉදිරිපත් කළ යුතු ය. එවිට SCARC කමිටුව විසින් මෙහි සක්‍යතාව, පාරිසරික ඇගයීම්, මූල්‍යමය පහසුකම් හා එම මුදල් ගෙවන ආකාරය, පොලී අනුපාත, එම ව්‍යාපෘතිය රටට කෙතරම් ප්‍රයෝජනවත් ද ආදී උක්ත සංශෝධනයේ අඩංගු ක්‍රමවේදයට අනුව විශ්ලේෂණයට භාජනය කළ යුතු ය. විශේෂයෙන් ම මෙම යෝජනා සාමාන්‍ය ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරවීමට පිළිගත හැකි හේතු තිබිය යුතු බව උපදෙස් මාලාවේ සඳහන් වේ.

එසේ අධීක්ෂණය කිරීමෙන් පසු ඔවුන්ගේ වාර්තාව අමාත්‍ය මණ්ඩලයට යොමු කරනු ලැබේ. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත පරිදි පරීක්ෂා කොට බලා අනුමත කිරීමෙන් පසු කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කරයි. සත්‍ය වශයෙන් ම ගත් කළ මෙය ජාත්‍යන්තරය පවා පිළිගත් ක්‍රමවේදයකි. බැලූ බැල්මට ඉතා සාධාරණ ක්‍රමවේදයක් වන අතර අවස්ථා කිහිපයකදී රාජ්‍ය මාර්ගෝපදේශකත්වය යටතේ ලබා දී ඇති නිර්ණායක වලට අනුව අධීක්ෂණයට ලක් වේ. නියමිත පරිදි සිදු වේ නම් රටට අහිතකර, රජයට සහ ජනතාවට මූල්‍ය අලාභ සිදු නොවන ඉතා හොඳ ක්‍රමවේදයක් වුවද වංචා කරන කණ්ඩායමකට එය තමන්ට අවශ්‍ය ලෙස හසුරුවා ගැනීමේ ඉඩකඩ පවතියි. මෙය උපයෝගී කර ගනිමින් වංචාවට සහ සොරකමට, නීත්‍යානුකූල බලය ලබා දීමට මහින්ද රාජපක්ෂ රජය කටයුතු කළේය.

මෙය සියුම් ව විශ්ලේෂණය කොට බැලීමේදී රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට ඉතාමත් විනිවිද පෙනෙන උපදේශන හා නිර්ණායක සහිත 23 වන අතිරේකය එක් කළේ මෙයට මුවා වී සොරකම නීතිගත කර ගැනීම සඳහාමද යන්න සැක සහිතය. මෙම සංශෝධනය ගෙන එන්නේ 2011 වර්ෂයේ දී වන අතර සොරාකෑම නිර්ලජ්ජිතව ඇරඹෙන්නේ 2010 වර්ෂයේ මහින්දගේ දෙවන ආගමනයෙන් පසුව ය. ඒ මෙසේ ය.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය නියමිත පරිදි සාධාරණ ලෙස සිදුවීමට නම් පාලකයා, අමාත්‍ය මණ්ඩලය හා SCARC කමිටුව යන ත්‍රිත්වයම අවංකව කටයුතු කළ යුතුය. මෙහිදී පැන නගින ප්‍රධාන ගැටලුව වන්නේ මහින්ද රාජපක්ෂ කිසි විටෙකත් ඇමතිවරයෙකුට හෝ කිසිම කමිටුවකට අවම වශයෙන් අග්‍ර විනිශ්චයකාරවරයාටවත් ස්වාධීනව නීතියට, මාර්ගෝපදේශ සංග්‍රහයන්ට හෝ චක්‍රලේඛයන්ට අනුගතව සිය රාජකාරී කිරීමට ඉඩ නුදුන් තත්ත්වය තුළ මෙම ක්‍රියාවලිය ස්වාධීනව ඉටු කිරීමට ඉඩදුන්නේද යන්නයි. මහින්ද රාජපක්ෂ SCARC කමිටුවට ස්වාධීනව කටයුතු කිරීමට ඉඩ ලබා නොදුන් අතර නීති හා උපදෙස් ටෙන්ඩර් මර්ගෝපදේශ සංග්‍රහයන්ට පමණක් සීමා විය. ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමයක් ලෙස කැමැත්තෙන් දෙන ව්‍යාපෘති යෝජනා සැලකිය හැකි වුවද ලංකාවේදී මෙය මහින්ද රාජපක්ෂ විසින් සිදුකරනු ලැබුවේ රටේ සංවර්ධනය මුවාවෙන් සියලුම සංවර්ධන ව්‍යාපෘති (සමහර ව්‍යාපෘතින් කිසිදු ප්‍රමුඛතාවක් නොමැති ඒවාය) ඒ යටතේ ලබා ගැනීමයි. එයට මහින්දගේ මිතුරු කැල ප්‍රමුඛත්වය ගන්නා ලද අතර, සිදුකිරීමට අවශ්‍ය සංවර්ධන වැඩ සොයා ගෙන ගොස් එයට ව්‍යාපෘති වාර්තා සකසයි. මුදල් ආයෝජකයන් ඉහළ පොලී අනුපාත යටතේ ඔවුන් විසින්ම සොයා ගනු ලබයි. මෙහි දී සත්‍ය වියදමට වඩා තුන් හතර ගුණයක් නොව සමහරවිට විසි තිස් ගුණයක් වුව ද වැඩිපුර ඇස්තමේන්තු කරයි. කැබිනට් අනුමැතිය ලැබීම සමඟ මේවා නීතිගත වේ. ඒ අනුව වැඩිපුර පෙන්වූ මුදල් ගජ මිතුරු කැල අතරේ බෙදාගනී.

මෙම ස්ව කැමැත්තෙන් ලබාදෙන යෝජනා Unsolicited Proposals බොහෝමයක් LUM SUM (මුලු ව්‍යාපාරයටම ගෙවීම් කරන) යෝජනා / ව්‍යාපෘතීන් වේ. එනම් ව්‍යාපෘතියේ අංග වෙන්කොට එක් එක් අයිතමයට තක්සේරු කිරීමෙන්, වැය ලේඛනයෙන් පිළියෙළ නොකරයි. උදාහරණ ලෙස පිටත වටරවුම් පාර (කඩුවෙල - කඩවත කොටස ) ව්‍යාපෘතිය ගත් කල දුර 9km කි. මෙම මාර්ගය ඉදි කිරීම රුපියල් මිලියන 47,000ක මුදලකට ඉටු කර දීමට යෝජනාව ඉදිරිපත් කරයි. නමුත් නියම මූල්‍ය වියදම ලබා ගැනීමට නම් ඉඩම් මැනීම, ඉඩම් අත්පත් කර ගැනීමට ගෙවීම්, එක් එක් පාලම සඳහා වියදම, මෙම පාලම ඉදි කරන ප්‍රමිතිය, යොදන තාර වර්ගය ආදී වශයෙන් වෙන වෙනම ඇගයීමක් සිදු කළ යුතුය. එසේ එක් එක් අයිතම සඳහා වැය විස්තරය, සක්‍යතා ආදී සියල්ල එක්කළ විට සමස්ත වැය ප්‍රමාණය ලබා ගත හැකිය. එය විනිවිද පෙනෙන සේ විගණනය කළ හැකි ක්‍රමයයි. එසේ තක්සේරු කළ විට ලෝකයේ පවතින නිර්ණායක අනුව ඉහළ ප්‍රමිතියෙන් ඉදිකිරීමට වියදම් වන නියම මුදල ලබා ගත හැකි ය.

නමුත් රාජපක්ෂ ආණ්ඩුවේ "ස්ව කැමැත්තෙන් දෙන යෝජනා " වලදී එසේ විනිවිද පෙනෙන වැය විස්තරයක් නොමැත. ව්‍යාපෘතියේ සමස්ථ වියදම යෝජනාකරුගේ අභිමතය පරිදි ඉදිරිපත් කරයි. මෙම මිල යෝජනාකරු හා දූෂිත පාලකයින් හා නිලධාරීන් එක්ව තීරණය කරන වියදම, අවසන් මිල වන්නේය. වංචා හා සොරකම් සිදු කිරීමට

අවශ්‍යම නිසා මෙම ක්‍රමය ස්ව කැමැත්තෙන් කරන බොහෝ යෝජනා වලදී දක්නට ලැබේ.

2011න් පසු ආරම්භ කල ප්‍රධාන ව්‍යාපෘති වලින් 90 % පමණ ක් විදේශීය ණය උපයෝගී කරගනිමින් ආරම්භ කර තිබුණි. මෙහිදි ණය සපයන ආයතන විසින්ම ඉදි කිරීම් කොන්ත්‍රාත්කරුවන් තීරණය කර ඇති බව පැහැදිලි ය. චීන - එක්සිම් බැංකුව විශාල වශයෙන් ලංකාවේ ව්‍යාපෘති සඳහා ඉහළ පොලී අනුපාත යටතේ ණය සපයා ඇති අතර, එම ණය මුදල් යටතේ කරනු ලබන ඉදිකිරීම් චීන ඉදිකිරීම් සමාගම් වලට පැවරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘති සියල්ලේම මිල ගණන්, අභ්‍යන්තර ගණුදෙනු කොමිස් මුදල් තීරණය කරනු ලබන්නේ ණය ලබාදෙන මූල්‍ය ආයතන, කොන්ත්‍රාත්කරු සහ මහින්ද රාජපක්ෂ යන තුන් පාර්ශවය විසිනි.

2011 වසරේ SCARC කමිටුව පිහිටුවීමෙන් පසුව ස්ව කැමැත්තෙන් ලබා දෙන ව්‍යාපෘති යෝජනා 298 ක් අධිකරණයට භාජනය කොට ඉන් 62 ක් මෙම කමිටුව මගින් අනුමත කොට ඇති බව පැවසේ. මෙසේ SCAR ක් මගින් අනුමත නොකොට කෙලින්ම කැබිනට් අනුමැතිය යටතේද තවත් ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කොට ඇත. ඉන් තෝරා ගත් ව්‍යාපෘති කිහිපයක් 01.01 වගුවේ දැක්වේ.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරු / ආයෝජකයා | අරමුදල් ප්‍රභවය | වටිනාකම | ලංකා රුපියල් (මිලියන) | ණය ආපසු ගෙවන කාලය (අවුරුදු) |
|---|---|---|---|---|---|---|
| 1 | මහියංගනය ජල සැපයුම් යෝජනා ක්‍රමය | M/S MUT Gmbh, Austria | Uni Credit Bank of Austria<br>ඔස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව | Euro 10.4 Mn | 1,560 | 12 |
| 2 | ගම්පහ අත්තනගල්ල මිනුවන්ගොඩ ජල සැපයුම් යෝජනා ක්‍රමය | China Machinery Corporation, China | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 229.5 Mn | 29,835 | 20 |
| 3 | කතරගම පූජා භූමියේ යටිතල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය | STRABAG, Austria | Uni Credit Bank of Austria<br>ඔස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව | Euro 10.5 Mn | 1,575 | 15 |
| 4 | අම්පාර දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ජල සැපයුම් යෝජනා | M/S Outokumpu (pvt) Ltd | Australia & New Zealand Investment Bank | US $ 118.5 Mn | 15,400 | 10 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ක්‍රමය | | ඔස්ට්‍රේලියා හා නවසීලන්ත ආයෝජන බැංකුව | | | |
| 5 | රත්නපුර නාගරික ජල සැපයුම් යෝජනා ක්‍රමය | M/S BEFESA AGUA, Spain | Banco Bilbao Vizcaya Argentaria<br>බැංකෝ බිල්බාඕ විසිකායා ආර්ජන්ටේරියා | Euro 25.8Mn | 3,870 | 08 |
| 6 | මොණරාගල හා බදුල්ල ඒකාබද්ද ජල සැපයුම් ව්‍යාපෘතිය | M/S Besix, SA, Belgium | HNB හා KBC බැංකු - බෙල්ජියම | Euro 23.98Mn | 3,830 | |
| 7 | හම්බන්තොට මහනගර සීමාවේ අපජලය අපවහන ව්‍යාපෘතිය | JV of M/S China Textile Industried Corporation<br>Chiana Mechinary TDI International Co.Ltd | චයිනා ඩිවලප්මන්ට් බැන්ක් | US $ 75 Mn | 9,700 | |
| 8 | බදුල්ල හාලිඇල හා ඇල්ල ඒකාබද්ධ ජල සැපයුම් ව්‍යාපෘතිය | M/S Tetra Tech of United States of America | Exim Bank of USA & HNB Bank<br>එක්සිම් බැංකුව ඇමරිකාව හා හැටන් නැෂනල් බැංකුව | US $ 74 Mn | 9,600 | 14 |
| 9 | කුරුණෑගල නාගරික ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | China Machinery Engineering Co. | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 77.3 Mn | 10,000 | 20 |
| 10 | ජාතික රුධිර පාරවිලයන සේවය නගා සිටුවීමේ ව්‍යාපෘතිය | M/S Simed International BV, Netherlands | Rabo Bank<br>රබෝ බැන්ක් | US $ 32.6 Mn | 4,200 | 13 |
| 11 | හම්බන්තොට මහ රෝහල සංවර්ධන ව්‍යාපෘතිය | M/S Enraf – Nonius BV of Nethealand | Rabo Bank<br>රබෝ බැන්ක් | Euor 46.8 Mn | 7,800 | 13 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | නුවරඑළිය දිස්ත්‍රික් රෝහල සංවර්ධන ව්‍යාපෘතිය | M/S Enraf – Nonius BV of Nethealand | Rabo Bank<br>රබෝ බැන්ක් | Euor 39.7 Mn | 6,660 | 13 |
| 13 | ජාතික රුධිර පාරවිලයන සේවාව යටතේ ප්‍රාදේශිය ලේ බැංකු වැඩි දියුණු කිරීම | M/S Simed International BV, Netherlands | Rabo Bank<br>රබෝ බැන්ක් | Euor 21.7 Mn | 3,470 | 13 |
| 14 | ජාතික රෝහල සඳහා Cardiac Catheterization System 02 ක් සැපයීම | M/S Vamed Engineering GmbH & CO KG | Uni Credit Bank of Austria<br>ඔස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව | Euor 2.4 Mn | 400 | 18 |
| 15 | මාතලේ මහනගර ජලසැපයුම් ව්‍යාපෘතිය | OTV-SADA Consortium France | ක්‍රෙඩිට් ඇග්‍රිකොල් ඔෆ් ෆයිනෑන්ස් හා HNB | Euor 156 Mn | 24,960 | |
| 16 | අලුත්ගම මතුගම අගලවත්ත ඒකාබද්ධ ජල සැපුම් යෝජනා තර්ජන් | IRON Exchangs India | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | USD 165 Mn | 1450 | |
| 17 | පාලම් 104 ක් ඉදිකිරීම හා සැපයීම | Mabay Bridges Limited UK | HSBC Bank<br>HSBC බැංකුව | GBP 45 Mn | 9,000 | 14 |
| 18 | මාර්ග 15ක කොටස් සංවර්ධනය කිරීම | CATIC – ENG<br>Hunan Construction Eng - Group Cop Xian DAGAN Machinery Com Ltd. | China Development Bank<br>චීන සංවර්ධන බැංකුව | US $ 347 Mn | 45,000 | 15 |
| 19 | වේයන්ගොඩ ගුවන් පාලම ඉදිකිරීම | CENTUNION, Espafiola de Coordination Tecnica | BBVA Bank Spain<br>ස්පාඤ්ඤයේ BBVA බැංකුව | Euor 11 Mn | 1,650 | 8 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | Financiers SA | | | | |
| 20 | කඩවත - කෙරවලපිටිය පිටත වට රවුම් අධිවේගී මාර්ගය ඉදිකිරීම | Metallorgical Co orparation of China Ltd (MCC) | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 520 Mn | 67,600 | 15 |
| 21 | හම්බන්තොට වරායේ සිට මත්තල ගුවන් තොටුපල දක්වා අධිවේගී මාර්ගය ඉදිකිරීම | China Harbour Engineering Com. Ltd | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 412 Mn | 53,560 | 15 |
| 22 | කිරම කටුවන ඒකාබද්ධ ජල සැපුම් ව්‍යාපෘතිය | UNIA – 4 ustna | Uni Credit Bank of Austria<br>ඔස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව | Euor 10.5 Mn | 1575 | |
| 23 | කොලොන්න බලංගොඩ ජල සැපුම් යෝජනා ක්‍රමය | Tetra Tech of United stale of Amenica | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | USD 74 Mn | 9620 | |
| 24 | දකුණු අධිවේගී මාර්ගය මාතර සිට බෙලිඅත්ත දක්වා කි.මී. 26 කින් දීර්ඝ කිරීම | China Aero Technology Eng Corporation | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 804Mn | 104,520 | 15 |
| 25 | දකුණු අධිවේගී මාර්ගය බෙලිඅත්තේ සිට වැටිය දක්වා ඉදිකිරීම | China Hunan Expressway Project Consottium | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 429.8 Mn | 55,700 | 15 |
| 26 | හම්බන්තනොට වරාය සංවර්ධනය යටතේ තෝරාගත් මහා මාර්ග ඉදිකිරීම | China State Construction Eng Co. Ltd | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 252.5 Mn | 32,825 | 15 |
| 27 | කොළඹ වරායේ ජය බහාලුම් පර්යන්තය සඳහා හදිසි මිලදී ගැනීම | M/S Shanghai Zhenhua Port Machinery Co. Ltd | HSBC Bank<br>HSBC බැංකුව | US $ 35Mn | 4,500 | 6 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 28 | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය අදියර 1 | China Harbour Engineering Com. Ltd | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 360Mn | 46,800 | 15 |
| 29 | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය අදියර 2 | China Harbour Engineering Com. Ltd | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 809.35Mn | 105,200 | 20 |
| 30 | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියර සඳහා අතුරු වැඩ සහ උපකරණ සැපයීම | China Harbour Engineering Com. Ltd | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 147Mn | 19,000 | 20 |
| 31 | නැව් තෙල් සඳහා ටැංකි අංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය | China Huanqiu Contraction & Engineering Corporation | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US 76.58 Mn | 9,900 | 15 |
| 32 | උතුරු මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | China Harbour Engineering Com. Ltd | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | Rs. 57248 Mn | 57,248 | 15 |
| 33 | දකුණු අධිවේගී මාර්ගය<br>පින්නදූව - කෝදාගොඩ සහ කෝදාගොඩ - ගොඩගම දක්වා කොටස සහ ගාලු වරාය පිවිසුම් මාර්ගයේ ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ | China National Technical Import & Export Co operation | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 162.6 Mn | 21,138 | 15 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | කිරීම | | | | | |
| 34 | කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | China Metallurgical Group Co operation | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 292 Mn | 37,960 | 15 |
| 35 | තෝරාගත් මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය අදියර 1 | China National Aero Technology International Eng.corp | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | විදේශ මුදලින් සඳහන් නොවේ | 18,675 | 15 |
| 36 | රට පුරා පිහිටි මාර්ග අතින් තෝරාගත් මාර්ග වැඩිදියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය අදියර 2 | China National Aero Technology International Eng.corp | China Development Bank<br>චීන සංවර්ධන බැංකුව | විදේශ මුදලින් සඳහන් නොවේ | 57,538 | 15 |
| 37 | මොරගහ කන්ද ජලාශය | Syno Hydro Co.Ld | China Development Bank<br>චීන සංවර්ධන බැංකුව සහ Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 214.2 Mn | 31,330 | 15 |
| 38 | මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල | China Harbor Engineering Co.Ltd | China Development Bank<br>චීන සංවර්ධන බැංකුව සහ Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 190 Mn | 24,700 | 20 |
| 39 | MA- 60 මිග් යානා දෙකක් මිලදී ගැනීම | China National Aero Technology Import & Export Co. | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 106 Mn | 13,780 | 20 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 40 | නැගෙනහිර දුම්රිය මාර්ග නැවත ගොඩනැගීම | M/S Voestalpine Schienen GMBH | Uni Credit Bank of Austria<br>ඔස්ට්‍රියාවේ යුනි ක්‍රෙඩිට් බැංකුව | Euro 9.8 Mn. | 1,568 | 8 |
| 41 | දුම්රිය බලවේග කට්ටල 13 ක් මිලදී ගැනීම | China South Locomotive & Rolling Stock Co. | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 102 Mn | 13,260 | 20 |
| 42 | මාතර කතරගම දුම්රිය මාර්ගයේ මාතර - බෙලිඅත්ත කොටස ඉදිකිරීම | China National machinery Import & Export Co. | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 278 Mn | 36,140 | 20 |
| 43 | මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ පීඨය හෝමාගම දියගම ස්ථාපිත කොට දියුණු කිරීම | China National Technology International Engineering Co. | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 76 Mn | 9,880 | 15 |
| 44 | ආපදා කළමනාකරණ හා හදිසි ප්‍රතිචාර ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන | M/S Search and System B.V. Netherland | Rabo Bank Netherland<br>රබෝ බැන්ක් නෙදර්ලන්තය | Euro 24.9 Mn. | 3,984 | 08 |
| 45 | කිරි දෙනුන් ආනයනය කිරීම | M/s Willard Rural Exports Pvt.Ltd | Rabo Bank Netherland<br>රබෝ බැන්ක් නෙදර්ලන්තය | US $ 12.9 Mn | 1,677 | 06 |
| 46 | මිල්කෝ සමාගමේ නවීකරණය | Desmi Contracting A/S, Denmark | HSBC Bank<br>HSBC බැංකුව | Euro 33.8 Mn. | 5,400 | 07 |
| 47 | ලක්ෂපාන විදුලි බලාගාරය සංවර්ධනය | Voith hydro Gmgh Co KG | Uni Credit Bank of Austria<br>ඔස්ට්‍රියාවේ යුනි | Euro 28 Mn. | 4,480 | 07 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ක්‍රෙඩිට් බැංකුව | | | |
| 48 | පුත්තලම ගල් අඟුරු බලාගාරය අදියර I, II ,III | China National Machinery Import & Export Co. | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 1346 Mn | 174,980 | 15 |
| 49 | උතුරු පළාතට විදුලි බලය ලබා ගැනීමට උපකරණ ලබාගැනීමේ වැඩසටහන | China National Complete Plant Import & Export Co. | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 37.25 Mn | 4,840 | 12 |
| 50 | ඌව උදානය යටතේ ඌව පළාතේ විදුලිබල සංවර්ධන ව්‍යාපෘතිය | China National Complete Plant Import & Export Co. | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 29.32 Mn | 3,811 | 12 |
| 51 | නැගෙනහිර නවෝදය යටතේ නැගෙනහිර පළාතට විදුලිබලය සැපයීමේ ව්‍යාපෘතිය | Shanghai Electric Power Transmission & Distribution Engineering | Exim Bank of China<br>චීන එක්සිම් බැංකුව | US $ 33.33 Mn | 4,332 | 15 |

එකතුව - යුරෝ මිලියන - 455.28
පවුම් මිලියන - 45
ඩොලර් මිලියන - 7918.73

මෙම මුදල් රුපියල් වලින් ගත් කල මුළු එකතුව - රුපියල් මිලියන - 1,247,481 ක් වේ.

(ඩොලරයේ අගය රුපියල් වලට හැරවීමේදී මධ්‍යයන අගය රුපියල් 130 ක් ලෙසට සලකා ගණනය කර ඇත.)

2010 න් පසු ආරම්භ කල ප්‍රධාන ව්‍යාපෘති වලින් 90% ක්ම විදේශ ණය ලබා ගෙන සිදු කරන ලද ව්‍යාපෘති වේ. ණය ලබා දීම ව්‍යාපෘති යෝජනාව ගෙන ආයතනයම සිදු කොට ඇත. මෙයින් චීන එක්සිම් බැංකුවෙන් විශාල ණය ප්‍රමාණයක් ලබා ගෙන ඇති බව නිරීක්ෂණය වේ. බොහෝමයක් ව්‍යාපෘති ලබා දී ඇත්තේ ද චීන සමාගම්වලටය.

2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා චීනයේ චයිනා හාබර් ඉංජිනියරින් කෝපරේෂන් විසින් රුපියල් 147,000,000 ක මුදලක් අල්ලසක් ලෙස අරලිය ගහ මන්දිරයේ මැතිවරණ මෙහෙයුම් කාර්යාලයට ලබා දුන් බවට තොරතුරු අනාවරණය වේ. විශාල සංවර්ධන ව්‍යාපෘති හරහා කෝටි ගණන් මුදල් ගසා

කැමට අමතරව රාජපක්ෂ මහතාගේ පැවැත්ම වෙනුවෙන් චීන සමාගම් අල්ලස් ලබා දුන් ආකාරය මෙයින් පැහැදිලිය.

මෙලෙස දූෂිත ලෙස ලබා ගෙන ඇති ව්‍යාපෘතීන් විශාල සංඛ්‍යාවක් නියමිත විගණනයකට ලක් කොට නොමැත. විගණනයට ලක් කොට අනාවරණය කරගෙන ඇති එක් ව්‍යාපෘතියක් ලෙස කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ දෙවන වර කොන්ත්‍රාත්තුව චීන සමාගමකට ලබා දීම හඳුන්වා දිය හැකි ය. එහි දී මූලික ඇස්තමේන්තුව සිදු කලේ දේශීය ඉංජිනේරුවරුන් විසිනි. ඒ දේශීය අරමුදල් වලින් ඉටුකිරීමටයි. නමුත් රජයට මුදල් නොමැති කමින් 2003 වැඩ නවතා දෙවන වර ටෙන්ඩර් කැඳවීමකින් තොරව "ස්වකැමැත්ත දෙන ව්‍යාපෘති යෝජනා" ආකාරයට රුපියල් මිලියන 37,822කට ඇස්තමේන්තු කොට තිබේ. මේ අනුව වැඩ නිම වනවිට මූලික ඇස්තමේන්තුවට සාපේක්ෂව වැඩිවීමේ ප්‍රතිශතය 437% කි. මෙහි මූලික ඇස්තමේන්තුව 2000 වර්ෂයේ දී සිදු කොට ඇති බැවින් හා දෙවන වර ටෙන්ඩරය 2008 වසරේ දී ලබා දී ඇති බැවින් කාලයට සාපේක්ෂව භාණ්ඩ වල මිල දෙගුණයකින් වැඩි වූයේ යැයි සැලකුව ද සොරා කා ඇති මුදල රුපියල් මිලියන 19,750ක් පමණ වේ.

SCARC කමිටුව පිහිටුවීමෙන් පසු අනුමත කර ඇති ව්‍යාපෘති යටතේ මාතර සිට බෙලිඅත්තට කිලෝමීටර 26ක දුරකට දකුණු අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමට රුපියල් මිලියන 104,520 ක් චීන එරෝ ටෙක්නොලොජි කෝපරේෂන් (China Aero Technology Engineering Co operation) වෙත ලබා දී ඇත. එවිට මෙම මාර්ගයේ මීටරයකට (අඩි 03කට) වියදම රුපියල් ලක්ෂ 40කි.

කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ඉදි කිරීමේ දී සිදුව ඇතැයි සැලකිය හැකි වංචාව රුපියල් මිලියන 19,750 ක් ලෙස ගණනය වන්නේ එය විගණකාධිපති විසින් විගණනයට ලක් කළ බැවිනි. එම වැඩිවීමට හේතු දැක්වීමට මාර්ග සංවර්ධන අධිකාරිය හෝ මහා මාර්ග අමාත්‍යාංශය අපොහොසත් ය. මාතර - බෙලිඅත්ත අධිවේගී මාර්ග කොටස 26km ක් වන අතර එය කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ දුර ප්‍රමාණයට සමානය. මාතර - බෙලිඅත්ත අධිවේගී කොටස සඳහා වියදම රුපියල් මිලියන 104,520 කි. එනම් කොළඹ - කටුනායක කොටසින් වංචාවක් සිදු නොවූ ලෙසට සැලකුව ද මෙහි මිල ගණන් අතර වෙනස රුපියල් මිලියන 66,698කි. කොළඹ - කටුනායක කොටස සඳහා විගණකාධිපතිට අනුව වංචාවක් සිදු වූයේ යැයි සැලකුවහොත් මෙම කොටසේ මිලෙහි වැඩිවීම රුපියල් මිලියන 86,488කි. එනම් සොරකම් කළා යැයි සැක කළ හැකි මුදල මෙය වේ. මෙය සාධාරණීකරණය කළ හැක්කේ කාට ද?

ඉන්දිය ආධාර ක්‍රමය යටතේ අවතැන්වූවන් සඳහා නිවාස ලබා දෙන්නේ නිවසක් රුපියල් ලක්ෂ 5 බැගිනි. සොරා කන ලද මුදලින් ජනතාවට නිවාස ඉදිකර දුන්නේ නම් නිවාස 172,896ක් ඉදිකිරීමට හැකියාව තිබිණ. ඒ මෙම මාර්ගය ද ඉදි කිරීමෙන් අනතුරුවය. මෙසේ විවිධ ව්‍යාපෘති හරහා සොරාකන ලද මුදල් ගණනය කිරීමට මෙම සියලුම ව්‍යාපෘති සඳහා තාක්ෂණික විගණනයක් සිදු කළ යුතු ය.

උදා : 02. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඉදි කිරීම.

සංශෝධිත රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව "ස්වකැමැත්ත දෙන ව්‍යාපෘති යෝජනා" යටතේ වුව ද ඕනෑම ව්‍යාපෘතියක ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබා ගත යුතු ය. මෙම ව්‍යාපෘති බොහෝමයක නියමිත ශක්‍යතා අධ්‍යයන, පාරිසරික අධ්‍යයන වාර්තා ගෙන තිබුණ ද ඒවායේ ඇත්තේ අසත්‍ය කරුණු ය. තම වංචාවට අවශ්‍ය ලෙස ඒවා සකසා ඇත්තේ කොන්ත්‍රාත්කරු විසින්ම එම අධ්‍යයන සිදු කොට ඉදිරිපත් කරන බැවිනි. හොඳම උදාහරණයක් ලෙස මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය හඳුන්වා දිය හැකිය. මේ සඳහා වියදම් කළ මුදල රුපියල් මිලියන 24,700 ක් පමණ වේ. මෙහි සක්‍යතාවය ලෙස ඉදිරිපත් කොට ඇති පුරෝකථන අතර පළමු අදියරේ දී

I. වාර්ෂිකව මගීන් ලක්ෂ 10ක් මෙය පරිහරණය කරනු ඇත. (දිනකට මගීන් 2,739කි.)

II. වසරකට මෙට්‍රික් ටොන් 45,000ක් භාණ්ඩ ගුවනින් හුවමාරු වනු ඇත. (දිනකට මෙට්‍රික් ටොන් 123ක් පමණ )

III. වසරකට ගුවන් ගමන් 30,000ක් (එනම් එන සහ යන ගුවන්යානා වාර දෙකක් ලෙස ගත් කලද දිනකට ගුවන් යානා 41ක් ගොඩ බැස නැවත යා යුතු ය.)

IV. ගුවන් යානා 10ක් නවතා තැබීමට ඉඩකඩ තිබිය යුතු ය.

තව බොහොමයක් දේ අඩංගු වුව ද ඒවා සලකා බැලීම නිෂ්ඵල වන්නේ මෙයින්ම සක්‍යතාවයේ තරම ඔප්පු වී අවසන් බැවිනි. එනම් මෙම ගුවන් තොටුපොළ ඇරඹෙන්නේ 2013 වර්ෂයේ ය. මේ 2015 වර්ෂයයි. වසර 03ක කාලය තුළ වංචනික සක්‍යතාවයේ තරම විදහා දැක්වෙන්නේ අද මත්තල ගවයන් ලගින, වල් අලි ගුවන් ගත වීමට ගුවන් යානයක් එන තෙක් බලා සිටින ස්ථානයක් වී ඇති නිසා ය. ඉදි කෙරුණු පාරවල් ගම්මිරිස් වේලීමට ප්‍රයෝජනයට ගත්ත ද එය සක්‍යතාවට හසු වී නොමැති නිසා ය.

අද දිනට එකදු ගුවන් යානයක් හෝ ගොඩ බස්වන්නේ නැත. මෙම ගුවන් තොටුපොළ භාවිතා නොකළ ද කටුනායක ගුවන් තොටුපොළේ කිසිදු තදබදයක් පිළිබඳ වාර්තා නොවේ.

තත්වය මෙසේ තිබියදී සැලසුම්වලට අනුව මත්තල ගුවන් තොටුපලේ දෙවන අදියර 2015 අවසානයේදී නිම වීමට නියමිතය. එවිට

i. වාර්ෂිකව මගින් ලක්ෂ 50 ක් (දිනකට මගීන් 13,695 ක්) පරිහරණය කරනු ඇත.

ii. වසරකට මෙට්‍රික් ටොන් 150,000 ගුවන් භාණ්ඩ හුවමාරු විය යුතුය.

iii. වසරකට ගුවන් ගමන් 45,000 (දිනකට ගුවන් යානා 61 කි) ක් පැමිණිය යුතුය.

මෙම ගුවන් තොටුපලේ ප්‍රථම අදියර විවෘත වන්නේ 2013/03/18 දිනය. මේ වන විට ප්‍රථම අදියරට පුරෝකථනය කළ මගීන් හෝ ගුවන් යානාවලින් අඩුම තරමින් අඩක් විනා කිසිවෙකුත් නොමැතිව දෙවන අදියර පිළිබඳව පුරෝකථන ගැන කතා කිරීම විහිළුවකි.

මෙයින් ගම්‍ය වන්නේ කුමක්ද? මෙහි ශක්‍යතාවය සහමුලින්ම ප්‍රෝඩාවක් බව නොවේද? එසේනම් ඉහත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ SCARC කමිටුව මේවා නිර්දේශ කලේ කෙසේද?

එම ශක්‍යතා අධ්‍යයනය නිවැරදි නම් අඩුම තරමින් එම පුරෝකතනයන්ගෙන් අඩක්වත් එනම් ගුවන් යානා 20 ක් වත් මෙම ගුවන්තොටුපලට පැමිණිය යුතුය. ගුවන් යානයක් කෙසේ වෙතත් පාරවල් වල වාහනයක්වත් ගමන් කරයි නම් ගවයන් වත් ඉවත් කළ හැක.

මෙම උදාහරණයෙන් ගම්‍ය වන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට සංශෝධිත ගෙනෙමින් SCARC කමිටුව හරහා තවදුරටත් විශ්ලේෂණය කරමින් ඉතාමත් විනිවිද පෙනෙන ආකාරයට ප්‍රසම්පාදනය කරන බව පෙන්වීමේ ප්‍රෝඩාව නොවේද? එම ක්‍රමවේදය හුදු කඩදාසි පමණි. පත්කර ගත් සුවච SCARC කමිටුව පඹයන් පමණි. ශක්‍යතා අධ්‍යයනය, පරිසර ශක්‍යතා වාර්තා සුජාත බවේ ප්‍රදර්ශන පමණි. මෙම කමිටු වාර්තා සියල්ලේ අවසාන තීරණය රාජපක්ෂ රෙජීමයේ කැමැත්ත සහ අවශ්‍යතාවය පමණි. ස්ව කැමැත්තෙ ගෙනෙන යෝජනා වල පසුගිය කාලයේ ක්‍රියාත්මක කළ සියලුම ව්‍යාපෘති මෙලෙස බුදුසරණයි කියා ඉදිරියෙන් ගසාගත් ලොරියක හොර හරක් අදින ක්‍රියාවලියක් වැනිය.

මෙම ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් නිසි තාක්ෂණික විගණනයක් සිදු කළහොත් රාජපක්ෂ පාලනයේ සැබෑ පැටිකිරිය මෙරටේ ජනතාවට වඩා හොඳින් ප්‍රදර්ශනය වනු ඇත. එය හෙළි කර ගත් දිනක රාජපක්ෂ පවුල සතුව ජාත්‍යන්තරව ඇතැයි සැලකෙන ඇ.ඩො. බිලියන 18ක මුදල උපයාගත්තේ මෙම ව්‍යාපෘතීන් හරහා බවට සනාථ වනු නොඅනුමානය.

### ස්ව කැමැත්තෙන් ඉදිරිපත් කල යෝජනා හරහා රටේ ඉඩම් විකුණා ඇති හැටි.

තවත් ස්වකැමැත්තෙන් ඉදිරිපත් කරන යෝජනා වර්ගයකි රටේ පවතින ඉතා වටිනා ඉඩම් සඳහා සිදුකරන සංවර්ධන ව්‍යාපෘති යෝජනා. මෙහිදී සිදුකර ඇත්තේ කොළඹ නගරය ප්‍රධාන කරගත් නගරවල පවතින ඉතා වටිනා ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘතීන් යෝජනා කරයි. එවිට රජය ඒ සඳහා ඉඩම බද්දට හෝ සින්නක්කර හෝ නොමිලේ ලබා දෙන අතර, ආයෝජකයා ව්‍යාපෘතිය තම වියදමින් සිදුකරනු ලබයි. මෙමගින් සිදු කලේ ඉතා හොඳ සංවර්ධන ක්‍රමවේදයක් මෙන් පෙන්නුම් කරමින් කොමිස් මුදල් ගසා කමින් රටේ වටිනා ඉඩම් තම ගජ මිතුරන් හට මුදල් හම්බකර ගැනීමටත් තමාට ඒවායින් කොටසක් ලබා ගැනීමටත් මාර්ග සකසා ගැනීමයි.

උදාහරණයක් ලෙස කොළඹ - 02 "කොම්පඤ්ඤවීදියේ ප්‍රති සංවර්ධන ව්‍යාපෘතිය" යටතේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියන් සඳහා වන ඉඩම වාටා හවුසින් ඩිවලොප්මන්ට් කොම්පැනි ලිමිටඩ් හි උපසමාගම වන තලම්බො පොජෙක්ට් (පයිවට්) ලිමිටඩ් නැමති සමාගමට බදු දීම ගත හැක. මෙම ව්‍යාපෘතිය යටතේ අක්කර 8 පර්චස් 18.27 ක් විශාල මෙම ඉඩම උක්ත සමාගමට වසර 99 සඳහා බදු දෙනු ලැබේ. එහි බදු කුලිය ලෙස එම බිමේ අක්කර 03 පමණක් ආයෝජකයාගේ වියදමින් එහි පදිංචිකරුවන් සඳහා මහල් නිවාස සංකීර්ණයක් වාණිජ අවකාශ සහිතව සංවර්ධනය කරනු ලැබේ. ඉතිරි අක්කර 05 පර්චස් 18.29 එම සමාගම විසින් තම වාණිජ අවශ්‍යතාසඳහා ඉදිකිරීම් කොට වසර 99 කට අදාල සමාගමට පවරා ඇත.

මෙහිදී මෙම නිවාස ඉදිකිරිම සඳහා ආයෝජකයාගේ වියදම් කල යුතු වියදම රුපියල් මිලියන 5874 ක් වන අතර නිවාස ලබාදීමේදී මාසික කුලියක්ද අය කිරීමට නියමිතය. මෙයින් ගම්‍ය වන්නේ ඉතිරි අක්කර 5 පර්චස් 18.29 සඳහා වසර 99 ට බදු කුලිය රුපියල්

මිලියන 5874 වන බව නොවේද? මෙය කොළඹ පිහිටි ඉතාම වටිනා භූමි ප්‍රදේශයකි. පහත 2 වගුවේ දැක්වෙන්නේ ස්ව කැමැත්තෙන් ඉදිරිපත් කොට රජයේ ඉඩම් ලබාදී සිදුකරන ලද ව්‍යාපෘතින් වන අතර මේවායේ ආදායම සම්පූර්ණයෙන්ම පුද්ගලික සමාගම් සතුවේ.

පසුගිය කාලය තුල අනුමත කොට ඇති ඉඩම් ලබා දී ඉදිකිරීම් කළ ව්‍යාපෘති දෙස බලන කල පෙනී යන්නේ මෙම ව්‍යාපෘති බැසිල් ගෝඨාභය හා විමල් සම්බන්ධ අමාත්‍යාංශ වලින් පමණක් සිදුවී ඇති බවයි. තවද මේ මුවාවෙන් රටේ වටිනා ඉඩම් තම ගජ මිතුරු කැළට හෝටල් ඉදිකර ගැනීමට ලබාදී ඇති බවය. මෙම ව්‍යාපෘති හදිසියේ සලකා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව දීමෙන් විශාල කොමිස් මුදලක් ලබාගෙන ඇති බව සැක නැත.

වගුව 2- ස්වකැමැත්ත දෙන ව්‍යාපෘති යෝජනා හරහා රජයේ වටිනා ඉඩම් විදේශිකයන්ට හා රාජපක්ෂ පවුලේ මිතුරන්ට ලබා දී ඇති ව්‍යාපෘති

| **රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ** | | | | | |
|---|---|---|---|---|---|
| අනු අංකය | **ව්‍යාපෘතියේ නම** | **ව්‍යාපෘතියේ විස්තර** | **ආයෝජකයාගේ නම** | **ආයෝජන ය (රු.මි)** | **ලබාදෙන ඉඩම** |
| 01 | කොළඹ - 02 කොම්පඤ්ඤ වීදියේ නිවාස ව්‍යාපෘතිය | අඩු ආදායම්ලාභී පවුල් 456 ක් වෙනුවෙන් තට්ටු නිවාස ඉදිකිරීම හා කඩ කාමර 100 ක් ඉදිකිරීම | වාටා හවුසින් ඩිවලොප්මන්ට් ඉන්දියා | 65,000 | අක්. 06 රූ. 03 පර්. 15 මැලේ වීදිය 99 අවු බදු |
| 02 | සංවර්ධන ව්‍යාපෘතිය - කොම්පඤ්ඤ වීදිය දුම්රියපොල අසල කොටස - අදියර II | දුම්රිය නිවාස 28 ඇතුළු ගෙවල් 147, ව්‍යාපාරික ස්ථාන 03 ඉවත් කිරීම හා ආයෝජකයාට තට්ටු නිවාස සංකීර්ණයක් හා ජාත්‍යන්තර රංග ශාලාවක් ඉදිකිරීම | ඉම්පීරියල් බිල්ඩර්ස් (පුද්ගලික) සමාගම | 58,500 | අක්. 03 රූ. 01 දුම්රිය පොල අසල කොම්පඤ්ඤ වීදිය වසර 50 ක බදු |
| 03 | කොළඹ සංයුක්ත හොටල් පද්ධතිය ඉදිකිරීම | නාගරික සංවර්ධන අධිකාරියේ සංචාරක ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියෙහි | ලේක් ලෙෂර් හෝල්ඩිං (පුද්) ලිමිටඩ් | 45,500 | අක්. 02 රූ. 01 පර්.21.4 චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතට හා ඩී.ආර් විජේවර්ධන මාවතට මායිම්ව අවු 50 බදු |
| 04 | සී.සී.සී. සංවර්ධන ව්‍යාපෘතිය (දේශිය ආයෝජනයෙන් සංවර්ධනය කරයි) | දේශිය විදේශිය සංචාරකයින් සඳහා කාමර 200 කත් යුත් තරු 4 හෝටලයක් හා සාප්පු සංකීර්ණය ඉදිකිරීම | අබාන්ස් (පුද්) සමාගම | 6760 | අක්. 02 පැරණි කොළඹ වානිජ්‍ය ඉඩමෙන් 99 අවු බදු |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | කොළඹ 01 ට්‍රාන්ස්වර්ක් චතුරස්‍රයේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | තට්ටු 80 ගොඩනැගිලි 4 ක් තුල නිවාස පද්ධතියක් සාප්පු සංකීර්ණයක් කාර්යාල පද්ධතියක් හා තරු 07 හෝටලයක් ඉදිකිරීම සඳහා | KRIISH Group India | 59,800 | අක්. 04 රූ. 01 පර්. 2.4 කොළඹ 01 99 අවු බදු |
| 06 | ග්‍රීන් හිල්ස් හොටෙල් ප්‍රයිවේට් ලිමිටඩ් | රාජගිරිය මාදින්නාගොඩ හෝටල් ව්‍යාපෘතියක් ඉදිකිරීම | ග්‍රීන් හිල්ස් හොටෙල් (පුද්) සමා (අරලිය සමාගම් සමූහයට පූර්ණව අයත්වේ) | 2,334.3 | අක්. 01 රූ. 01 පර්. 2.4 99 අවු බදු |
| 07 | ලී හෙජර්ස් පුද්ගලික සමාගම සඳහා කාර්යාල සංකීර්ණය ඉදිකිරීම | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා | ලී හෙජස් (පුද්) සමා. (වර්තමානයේ ලී හෙජස් ඉන්වෙස්මන් සමාගමට අයත්) | 1,310.70 | පර්. 52.43 කොළඹ 03 ගාලු පාරේ ඉඩම |
| 08 | හයට් රිජන්සි හම්බන්තොට හොටෙල් | තරු පහේ හෝටලයක් | ග්‍රීන් හිල්ස් හොටෙලේ (පුද්) සමා (අරලිය සමාගම් සමූහයට පූර්ණව අයත්වේ) | 5,550 | අක්. 09 රූ. 02 පර්.11.33 හම්බන්තොට වෙරළ උද්‍යානයට යාබද ඉඩමේ 99 අවු බදු |
| 09 | කොළඹ 05, එඩ්මන්ටන් පාරේ නිවාසම ව්‍යාපෘතියක් සඳහා | මධ්‍යම හා ඉහළ ආදායම් ලාභී පවුල් සඳහා නිවාස 560 ක් ඉදි කිරීම | සී.ඩී.සී. ඉන්ඩස්ට්‍රියල් ඉන්ෆා ලිමිටඩ්/ NHDA | 6,370 | පර්. . 317 |
| **නිවාස ඉදිකිරීමේ ඉංජිනේරු හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ** | | | | | |
| 10 | යක්කල වැඨල්ලවත්තේ නිවාස ව්‍යාපෘතියක් සඳහා | හා මධ්‍යම හා ඉහළ ආදායම් ලාභීන්ට නිවාස ඒකක 864 ක් ඉදි කිරීම | JAIN ඉන්ෆා ප්‍රොජෙක්ට් (ලංකා) ලිමිටඩ්/ NHDA | 5,197 | අක්. 09 රූ. 01 පර්.'.38 |
| 11 | හෝමාගම මවුන්ට් ක්ලිෆඩ්හි නිවාස | මධ්‍යම හා ඉහළ ආදායම් ලාභීන්ට නිවාස ඒකක | JAIN ඉන්ෆා ප්‍රොජෙක්ට් | 5,582 | අක්.14 රූ. 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සංවර්ධන ව්‍යාපෘතිය එම | 1064 ක් ඉදි කිරීම | (ලංකා) ලිමිටඩ්/ NHDA | | පර්. .31 |
| 12 | යක්කල සියනෑ උයන නිවාස ව්‍යාපෘතිය | මධ්‍යම හා ඉහළ ආදායම් ලාභීන්ට නිවාස ඒකක 40 ක් ඉදි කිරීම | JAIN ඉන්ෆ්‍රා ප්‍රොජෙක්ට් (ලංකා) ලිමිටඩ්/ NHDA | 158 | අක්. 01 රූ. 03 පර්. .3 |
| 13 | හෝමාගම ජල්තර හි අඩු වියදම් ගෙවල් 492 ක් ඉදි කිරීම | මධ්‍යම හා ඉහළ ආදායම් ලාභීන් සඳහා | ප්‍රයිම් ලෑන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් | 1,108 | අක්.07 රූ. 01 පර්. 18.3 |
| 14 | නුවර හන්තාන වත්තේ ගෙවල් 103 සෑදීමේ ව්‍යාපෘතිය මිලේනියම් | මධ්‍යම හා ඉහළ ආදායම් ලාභීන් සඳහා | මිලේනියම් ඩිස්ට්‍රිබියුටර්ස් ඇන්ඩ් ට්‍රේඩර්ස් (පුද්) සමාගම | 1,077 | අක්. 13 |
| 15 | පාමංකඩ වේරවත්ත පාරේ නිවාස ව්‍යාපෘතිය | මධ්‍යම හා ඉහළ ආදායම් ලාභීන් සඳහා නිවාස ඒකක 28 ක් සෑදීම | අර්බනිස්ම් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම | 529 | රූ. 01 පර්. 07 |
| 16 | නුවර පල්ලෙකැලේ කළුගල වත්තේ නිවාස හා ව්‍යාපාරික ස්ථාන ඉදිකිරීම | මධ්‍යම හා ඉහළ ආදායම් ලාභීන් සඳහා නිවාස ඒකක 21 ක් ඉදි කිරීම | සූරිය බණ්ඩාර ඇසෝෂියේටඩ් (පුද්) සමාගම | 232 | අක්. 03 රූ. 03 |
| 17 | රත්නපුර ගල්තුඩුව වත්තේ නිවාස ඒකක 130 ඉදිකිරීම | මධ්‍ය හා ඉහල ආදායම් ලාභීන්ට නිවාස ඒකක 130 ඉදිකිරීම | ACK කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම | 932 | අක්. 11 රූ. 02 පර්. 01 |
| 18 | නුවර හන්තාන වත්ත නිවාස යෝජනා ක්‍රමය (අදියර 3) | මධ්‍ය හා ඉහල ආදායම් ලාභීන්ට නිවාස ඒකක 23 ඉදිකිරීම | මිලේනියම් ඩිස්ට්‍රිබියුටර්ස් ඇන්ඩ් ට්‍රෙඩර්ස් (පුද්) ලිමිටඩ් | 249 | අක්. 02 රූ. 02 පර්.'02 |
| 19 | නුවර හන්තාන වත්ත නිවාස යෝජනා ක්‍රමය (අදියර 4) | මධ්‍ය හා ඉහල ආදායම් ලාභීන්ට නිවාස ඒකක 19 ඉදිකිරීම | ප්ලාන්ට් ආර්කිටෙක්චර ල් ඇන්ඩ් ඉන්ජිනියර් සර්විස් | 188 | අක්. 01 රූ. 02 පර්. 22 |
| 20 | රත්මලාන කඳවල වත්තේ ෆලයිට් විව් සිටි ව්‍යාපෘතිය | නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාස ඒකක 1243 ඉදිකිරීම සහ වර්ග මීටර් 22790 ක වාණිජ්‍ය ප්‍රදේශයක් | චයිනා හැන්හයි කන්ස්ට්‍රක්ෂන්ස් ඉංජිනියරිං (සුමුහ) ව්‍යාපාරය | 194.68 | අක්. 28.5 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ඉදිකිරීම | වීනය | | |
| 21 | නුවර පල්ලේකැලේ ඉස්කාගාර වත්තේ නිවාස ව්‍යාපෘතිය | | කොරාල් ප්‍රොපටි ඩිවලොපර් (පුද්) ලිමිටඩ් (දේශීය ආයෝජන) | 562.5 | පර්. 683 |
| 22 | බණ්ඩාරවෙල පුහාගල පාරේ දෙමහල් නිවාස 16 ක් ඉදිකිරීම | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් දෙමහල් නිවාස 10 ක් ඉදිකිරීම | පී.එල්.ඩී කන්ස්ට්‍රක්ෂන් | 128 | අක්. 03 රූ. 01 පර්. 06 |
| 23 | රත්මලාන රස්වම් වත්තේ නිවාස ව්‍යාපෘතිය | රත්මලාන රස්වම් වත්තේ නිවාසෙ 21 ඉදිකිරීම | හරීන්ද්‍ර කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ප්‍රොපටි ඩිවලොපර්ස් (පුද්) ලිමිටඩ් | 112.64 | පර්. 80 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ | | | | | |
| 24 | කුණ්ඩසාලේ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නිවාස ඒකක 42 ක් ඉදිකිරීම | ප්‍රයිම් ලෑන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ් | 204.85 | පර්. 189.8 |
| 25 | ෂැන්ග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය | සුඛෝපභෝගී හොටල්, සුඛෝපභෝගී නිවාස සංකීර්ණයක් සහ ඉහල මාලවල සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම | ෂැන්ග්‍රිලා, ඒෂියා ලිමියඩ්, හොංකොං | 36,790 | අක්. 10 ගාලු මුවදොර යුධ හමුදා මූලස්ථාන ඉඩම |
| 26 | බහුවිධ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය කොළඹ | කොළඹ බහුවිධ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම ලබාදී ඇත | AA ඉන්ෆ්‍රා ප්‍රොපටිස් (පුද්) සමාගම ඉන්දියා | 15,080 | අක්. 02 කොළඹ වාණිජ භූමිය |
| 27 | "ග්ලෙනී" විදිය සංවර්ධන ව්‍යාපෘතිය | සංයුක්ත බහුවිධ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් | 84,500 | අක්. 03 රූ.05 ගැනී විදිය හා බේරේ වැව |



| | | | | | |
|---|---|---|---|---|---|
| 28 | සුබෝපභෝගී පරිසර හිතකාමී සංචාරක ප්‍රවර්ධනය | යාල පලටුපන පරිසර හිතකාමී සංචාරක ප්‍රවර්ධනය | 1. අර්ගා රිසෝට් (පුද්) සමාගම (ICC)<br>2.ගොබිස් ඇන්ඩ් වොක්ලෙෂර් (පුද්) සමාගම (Dilmah)<br>3.ඇස්කොට් ලෙෂර් (පුද්) සමාගම(Ascot)<br>4. සොනොන් ට්‍රෙඩ් කම්බයින්(පුද්) සමාගම MHDA | 500<br>500<br>445<br>660 | අක්. 7ක් 99 අවුරුදු බදු |
| 29 | කොළඹ නගරයට ජ්ලැග්ෂිප් ආයෝජනය - ඉන්දියාව | කාමර 400 කින් යුත් තරු පංතියේ හෝටලයක් හා නිවාස සංකීර්ණයක් | ITC ලිමිටඩ්- ඉන්දියා | 18,200 | අක්. 5 රූ. 3 පර්. 19 99 අවු.බදු ගාලු පාරේ හමුදා මුලස්ථානයට යාබද ඉඩම |
| 30 | බෙන්තොට හොලිඩේ රිසෝට් | කාමර 20 ක සුබෝපභෝගි වොටර් ප්‍රිරන්ඩ් රිසෝට් හෝටලය ඉදිකිරිම | අබාන්ස් (ප්‍රයි) ලිමිටඩ් | 235 | පර්. 305 ඉඩම |
| 31 | විලා බෙන්තොට රිසෝට්- බෙන්තොට | මන්දිර 06 ක් ඉදි කිරීම | රන්ක් රිසෝට්(පුද්) සමාගම | 175 | පර්. 134.9 99 අවු. බදු |

පසුගිය කාලය තුල අනුමත කොට ඇති ඉඩම් ලබා දී ඉදිකිරීම් කළ ව්‍යාපෘති දෙස බලන කල පෙනි යන්නේ මෙම ව්‍යාපෘති බැසිල් ගෝඨාභය හා විමල් සම්බන්ධ අමාත්‍යාංශ වලින් පමණක් සිදුවී ඇති බවයි. තවද මේ මුවාවෙන් රටේ වටිනා ඉඩම් තම ගජ මිතුරු කැලට හෝටල් ඉදිකර ගැනීමට ලබාදී ඇති බවය. මෙම ව්‍යාපෘති හදිසියේ සලකා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව දීමෙන් විශාල කොමිස් මුදලක් ලබාගෙන ඇති බව සැක නැත.

සමස්ථය විශ්ලේෂණයේදී පෙනී යන්නේ විශේෂ ණය පමණක් ලබා ගෙන ක්‍රියාත්මක කොට ඇති ව්‍යාපෘතියේ වියදම රුපියල් කෝටි 1,24,748 කි. එක් ව්‍යාපෘතියක පමණක් රජයේ විගණකාධිපතිට අනුව අසාමාන්‍ය එසේත් නැත්නම් සාධාරණීකරණය කළ නොහැකි

වැඩිවීමේ ප්‍රතිශතය 437% කි. එය පසෙක තබා සාමාන්‍ය කොමිස් මුදල ලෙස 25% ක් ලබා ගත්තේ යැයි උපකල්පනය කල හොත් වංචා කල මුදල රු.කෝටි 31,187 කි.

මීට අමතරව 02 වගුවේ ඉඩම් ලබා දී ඇති ව්‍යාපෘති වලින් ලබා ගත්තේ යැයි සැක කරන කොමිස් මුදල ගණනය මෙසේ ගණනය කළ නොහැක.

මීට අමතරව මහාපරිමාණ බල ශක්ති ව්‍යාපෘති, පෝට්සිටි, කොළඹ වරාය නවීකරණ ව්‍යාපෘතිය ආදී දැවැන්ත ව්‍යාපෘතීන්. සඳහා ලබා ගෙන ඇති ණය හා එමගින් වංචා කල මුදල් ප්‍රමාණය සිතා ගැනීමට පවා අපහසුය.

මෙම ව්‍යාපෘති සියල්ල සම්බන්ධයෙන් නිසි තාක්ෂණික විගණනයක් සිදු කල හොත් රාජපක්ෂ පාලනයේ සැබෑ පැටිකිරිය මෙරටේ ජනතාවට වඩා හොඳින් ප්‍රදර්ශනය වනු ඇත. එය හෙලි කර ගත් දිනක රාජපක්ෂ පවුල සතුව ජාත්‍යන්තරව ඇතැයි සැලකෙන ඇ. ඩොලර් බිලියන 18 ක මුදල යථාර්තයක් වනු ඇත.



# මහින්ද රාජපක්ෂ සහ රාජපක්ෂ පවුල විසින් සිදු කළ වංචා සහ දූෂණ

ලෝකයේ දූෂිතම රාජ්‍ය නායකයා ලෙස සැලකෙන්නේ ඉන්දුනීසියාවේ හිටපු ජනාධිපති මොහොමඩ් සුහර්තෝය. ඔහුගේ 1967 - 1998 දක්වා පාලන සමය තුළ ඔහු වංචා කරනු ලැබූ ජනතා මුදල් ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 15-35 අතර වෙතැයි ඇස්තමේන්තු කෙරේ.

1972 - 1986 දක්වා පිලිපීනයේ ජනාධිපතිව සිටි ෆර්ඩිනැන්ඩ් මාකෝස් ලොව දෙවන ස්ථානයට දූෂිතම රාජ්‍ය නායකයා ලෙස සැලකෙන අතර ඔහු කොල්ලකෑ ජනතා මුදල් ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 5 - 10 අතර වේ.

මේ වනවිට හෙළි වී ඇති පරිදි මහින්ද රාජපක්ෂ හා ඔහුගේ පවුල විසින් මෙරටින් පිටකර ඇති කොල්ලකෑ ජනතා මුදල් ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 18 ක් බවට වාර්තා පළ වේ. ඒ අනුව දැනට සොයා ගෙන නැති හොරකම්වල ප්‍රමාණය සහ මෙරටින් පිට නොකළ වත්කම් නොසලකා හැරියද මහින්ද රාජපක්ෂ ලෝකයේ දෙවන දූෂිතම නායකයාය. ඔහුගේ සියලු දූෂිත ක්‍රියා හෙළි වූ දිනක ලෝකයේ දූෂිතම රාජ්‍ය නායකයාට හිමි වාර්තාව මහින්ද රාජපක්ෂ තමන් සතු කර ගන්නවා සිකුරුය.

2005 - 2015 දක්වා දස වසරක රාජපක්ෂ පාලනය යටතේ සිදු වූ මූල්‍ය අපරාධ පිළිබඳ විමර්ශන වලදී අනාවරණය වී ඇති තොරතුරුවලට අනුව මුළු රාජපක්ෂ පවුලම මෙම වංචා හා දූෂණ වලට සෘජුව සම්බන්ධ වී ඇති බව පෙනී යයි.

ආරක්ෂක ඇමති, මුදල් ඇමති, මහාමාර්ග ඇමති ආදී වශයෙන් ප්‍රබල අමාත්‍යාංශ ගණනාවක් පාලනය කළ මහින්ද රාජපක්ෂ එම අමාත්‍යාංශ වල සිදු වූ මහා පරිමාණ වංචා හා දූෂණ වල ප්‍රධාන වගඋත්තරකරුවා වන්නේය.

ආරක්ෂක ලේකම් ලෙස ගෝඨාභය රාජපක්ෂ මිග් යානා ගනුදෙනුව, .වීරකැටිය ව්‍යාපෘතිය, ඇවන්ගාඩ් වංචාව, හයත් රිජන්සි හෝටල් ව්‍යාපෘතියේ සිදු වූ වංචා, ලංකා හොස්පිටල්ස්හි සිදු වූ වංචා ඇතුළු මහා පරිමාණ වංචා රැසකට චෝදනා ලබයි. දූෂිත පාලකයින් ඔහු ආරක්ෂා නොකරන්නේ නම් සහ නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වේනම් ගෝඨාභය රාජපක්ෂ මේ වනවිට සිටිය යුත්තේ පොලිස් අත්අඩංගුවේ හෝ සිරභාරයේය.

දිවි නැගුම දෙපාර්තමේන්තුවේ සිදු වූ මහා පරිමාණ වංචා 04 කට චෝදනා ලැබූ බැසිල් රාජපක්ෂ මේ වනවිටත් අත්අඩංගුවට ගෙන ඇප මත නිදහස් කර ඇත.

නාමල් රාජපක්ෂට එරෙහිව එල්ල වන දූෂණ, වංචා පිළිබඳ චෝදනා අතර තාරුණ්‍යයට හෙටක් සංවිධානයට විනිමය හා සුරැකුම්පත් කොමිසමෙන් ලක්ෂ 50 ක මුදලක් ලබා ගෙන වංචා කිරීම සහ සී.එස්.එන්. (CSN) රූපවාහිනී නාලිකාවේ සිදු වූ වංචා මෙන්ම නාමල් රාජපක්ෂට පූර්ණ වශයෙන් හිමිකාරිත්වය ඇති ගවර්ස් (Gowers) සමාගම විසින් එයාර් ලංකා ගුවන් සමාගමට සේවා සපයා දී සිදු කළ වංචා හා දූෂණ ද ඇතුලත් වේ.

ශිරන්ති රාජපක්ෂ වෙත එල්ලවන චෝදනා අතර සිරිලිය සවිය නම් සංවිධානයක් වෙත මෙරට ක්‍රියාත්මක වූ මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති වලින් කෝටි ගණන් මුදල් අල්ලස් ලෙස ලබා ගැනීම, ව්‍යාජ හැඳුනුම්පත් අංකයන් සහිතව කූටලේඛන සකසා බැංකු ගිණුම්වල එම මුදල් තැන්පත් කිරීම සහ විශාල වත්කම් ප්‍රමාණයක් රැස්කර ගැනීම ඇතුලත් වේ. රාජපක්ෂ පවුලේ සමීපතම ඥාතීන් වන උදයංග වීරතුංග මිග් යානා මිලදී ගැනීමේ වංචාවට සම්බන්ධ බවට චෝදනා එල්ලවන අතර එම වංචාවේ ප්‍රධාන භූමිකාවක් රුසියානු තානාපති ලෙස කටයුතු කරමින් ඔහු සිදු කර ඇත. යුක්රේන ත්‍රස්තවාදීන්ට අවි සැපයීම පිළිබඳව චෝදනාවක්ද ඔහුට එල්ල වේ.

නිශාන්ත වික්‍රමසිංහ එනම් ශිරන්ති රාජපක්ෂගේ සොහොයුරාට ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සිදු වූ මහා පරිමාණ දූෂණ හා වංචාවලට සම්බන්ධ බවට චෝදනා එල්ල වේ.

යෝෂිත රාජපක්ෂට එරෙහිව එල්ලවන්නේ මිනීමැරුම් පිළිබඳ අපරාධ චෝදනාවකි. රගර් ක්‍රීඩක තාජුඩීන් ඝාතනය පිළිබඳ පරීක්ෂණ අවසානයේ යොමු වී ඇත්තේ ඔහුට එරෙහිවය.

මෙම චෝදනා දේශපාලන පලිගැනීම් සඳහා හෝ චරිත ඝාතනය සඳහා ඔවුන් වෙත එල්ල කරන පදනම් විරහිත චෝදනා බවට ඔවුන් නිරන්තරයෙන් කරුණු දැක්වුවත් මෙම චෝදනා පිළිබඳව මෙතෙක් හෙළි වී ඇති තොරතුරු මගින් ඒවායේ සත්‍යතාවය තහවුරු කර ගැනීමට හෝ එම චෝදනාවල බරපතල බව තේරුම් ගැනීමට ජනතාවට හැකිය.

## 3.01 මිග් - 27 ගුවන්යානා මිලදී ගැනීමේදී සිදු වූ වංචා

මහින්ද රාජපක්ෂ පාලන සමය තුළ යුධ අවි සහ ගුවන් යානා මිලදී ගැනීම් වලදී සිදු වූ මහා පරිමාණ වංචා සහ දූෂණ පිළිබඳව එම වකවානුවේ මාධ්‍ය මගින් හෙළිදරව් කළ ද ඒවා පිළිබඳව කිසිදු පරීක්ෂණයක් සිදු කලේ නැත.

මෙම මිග් යානා ගණුදෙනුව සිදු වූයේ 2006 වසරේ ජුනි මාසයේදී ය. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් 27 ප්‍රහාරක ගුවන් යානා 4ක් සහ මිග් 23 යානා 1ක් මිලදී ගැනීම සඳහාත් මිග් 27 යානා 3ක් අලුත්වැඩියා කිරීම සඳහාත් ගුවන් හමුදාව 2006 ජුනි 26 දින යුක්රේන රජය සමඟ ගිවිසුමකට එළඹ ඇත.

ඒ අනුව මෙම ගනුදෙනුව රාජ්‍යයන් දෙකක් අතර සිදු වූ ගණුදෙනුවක් ලෙස සැලකේ.

එහෙත් ගිවිසුමේ තෝරා ගන්නා ලද පාර්ශවයක් (Designated Party) ලෙස එනම් තුන්වන පාර්ශවයක් ලෙස Belimissa Holding Limited තෝරාගෙන ඇති අතර සැබෑ ගණුදෙනුව සිදු වී ඇත්තේ මෙම තුන්වන පාර්ශවය සමඟය. මෙම සමාගමේ ලිපිනය ලෙස 2nd Floor, 145 – 157 "St'John's Street" London ECIVAPY දක්වා ඇත. ගිවිසුම අනුව ශ්‍රී ලංකා යුධ හමුදාව මිග් - 27 යානා 4ක් මිලදී ගෙන ඇති අතර ඒ සඳහා එක් යානයකට ඇමෙරිකානු ඩොලර් 2,462,000 (රු.265,896,000) ගෙවා ඇත. මෙම යානා නිපදවා ඇත්තේ 1980 - 1983 අතර කාලයේදීය. මෙම යානා සංචිතයෙන් ම යානා 2ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව 2000 වසරේදී මිලට ගෙන ඇති අතර එහිදී එකක මිල වී ඇත්තේ ඇ.ඩොලර් මිලියන 1.6 කි.(රුපියල් මිලියන 172.8 කි.) ඒ අනුව තවත් වසර 6 ක් පැරණි වූ

එම යානාම මිලදී ගෙන ඇත්තේ එකක් ඇ.ඩොලර් මිලියන2.4 කටය (රුපියල් මිලියන 265 කි). එනම් ඇ.ඩොලර් 862,000 ක මුදලක් හෙවත් රුපියල් මිලියන 93 ක් වැඩිපුර ගෙවා ඇත. ඒ අනුව මෙසේ ලබා ගත් ගුවන් යානා 04 වෙනුවෙන් වැඩිපුර ගෙවා ඇති හෝ කොමිස් ලෙස වංචනිකව ලබා ගෙන ඇති මුදල රුපියල් මිලියන 372 කි.

මුදල් ගෙවා ඇත්තේ මහජන බැංකුව මගින් වන අතර ටෙලිග්‍රැෆික් ක්‍රමයට මුදල් ගෙවා ඇත්තේ තුන්වන පාර්ශවය වන Belimissa Holding Limited ආයතනයටයි. පරීක්ෂණ වලදී හෙළි වී ඇත්තේ මෙහි දක්වා ඇති ලිපිනයේ Belimissa Holding Limited නමැති සමාගමක් නොමැති අතර තුන්වන පාර්ශවය ලෙස දක්වා ඇත්තේ ව්‍යාජ සමාගමක් බවයි.

මෙම ගනුදෙනුවේදී විශාල මූල්‍ය වංචාවක් සිදු වී ඇති අතර එයට හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපති උදයංග වීරතුංග යන අයට සහ එවකට ශ්‍රී ලංකා ගුවන් හමුදාපති රොෂාන් ගුණතිලක ඇතුළු පිරිසකට එරෙහි ව චෝදනා එල්ල වී ඇති අතර සිද්ධිය පිළිබඳව පරීක්ෂණ මේ වන විට ක්‍රියාත්මක වන බව අනාවරණය වේ.

මෙම පරීක්ෂණයේ දී දැනට ඔස්ට්‍රේලියාවේ සිටින ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශයේ සේවය කළ හිටපු උසස් නිලධාරියෙක් මෙම මිග් යානා මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී සිදු වූ වංචා සහගත සහ අවිධිමත් ක්‍රියා පිළිබඳව ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කරන ලද බවට වාර්තා විය.

ඔහුට අනුව ගුවන්යානා මිලදී ගැනීමේදී ඒ පිළිබඳව පරීක්ෂා කිරීමට පත්කරනු ලැබූ තාක්ෂණික ඇගයීම් කමිටුව (Technical Evaluation Committee) තුල සුදුසු පුද්ගලයින් නොසිටි බවත් ඔවුන්ට ප්‍රහාරක ගුවන්යානා මිලදී ගැනීම පිළිබද කිසිදු සුදුසුකමක් හෝ පළපුරුද්දක් නොතිබූ බවත්,

එම කමිටුව ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍ය ආයතනයේ (NPA) අවශ්‍යතා සපුරාලූයේ නැති බවත් කමිටුවට ගුවන් හමුදාවේ පළපුරුදු ගුවන් නියමුවන් ඇතුළත් නොවූ බවත් සදහන් කරයි. තවද ගුවන් හමුදාව නියෝජනය කළ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයා හැර වෙනත් කිසිවෙකුට ප්‍රහාරක යානා හෝ වෙනත් ගුවන් යානා මිලදී ගැනීම පිළිබඳව කිසිදු අත්දැකීමක් හෝ තිබී නොමැත.

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට කෙසේ හෝ මෙම යානා මිලදී ගැනීමට අවශ්‍ය වූ බවත් ඒ අනුව තා.ඇ.ක. අවශ්‍ය අනුමැතිය ලබාදුන් බවත් ඔහු පවසයි.

මිලදී ගැනීමට අදාළ සියලු තොරතුරු ගෝඨාභය රාජපක්ෂ සහ රාජපක්ෂ පවුල සතු රහසක් ලෙස තබා ගත් බවත් ඔහු පවසයි.



## 3 .02 පරිත්‍යාග යටිමඩි ගැසීම.

ශ්‍රී ලංකා යුධ හමුදාවේ ශ්‍රමය සහ රු. මිලියන 135 ක් වියදම් කොට හෝමාගම දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනය ඉදිකරන ලද අතර, එම ඉදිකිරීම් සිදු කල වකවානුවේ දී සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ අධිපතිව සිටි ලලිත් කොතලාවල මහතා රු. මිලියන 100 ක මුදලක් පරිත්‍යාග කර ඇති බව ඒ මහතා විසින් ප්‍රසිද්ධ මාධ්‍යවල ප්‍රකාශ කරන ලදි. මෙම මුදල ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා යොදාගෙන නැති බවත්, එය අවභාවිතා කොට ඇති බවත් චෝදනා එල්ල කර තිබේ. 2015 මාර්තු 23 දින Ceylon Today පුවත් පතට ලබාදී ඇති ප්‍රකාශයකින් ද ස්වාධීන රූපවාහිනී සේවයට ලබාදී ඇති සාකච්ඡාවකින් ද ලලිත් කොතලාවල මහතා මෙම කරුණු අනාවරණය කර ඇත.

මේ පිළිබඳව වැඩිදුරටත් අනාවරණය වන තොරතුරු අනුව ලලිත් කොතලාවල මහතාට අයත් Ceylinco Consolidated (pvt)Ltd ආයතනයේ මහජන බැංකුවේ රජින ශාඛාවේ අංක 033-1001-6-1790851 දරණ ගිණුමෙන් රුපියල් මිලියන 100 ක් අදාළ ක්‍රීඩාංගනය ඉදිකිරීමට මහින්ද රාජපක්ෂ ලබාදුන් බවයි.

## 3.03 වීරකැටිය ව්‍යාපෘතිය

රාජපක්ෂවරු මෙරට සමාජ දේශපාලන ඉතිහාසය තුළ තමන්ට හිමි නැති අතීත උරුමය බලහත්කාරයෙන් සමාජගත කිරීමට ඔවුන් බලයේ සිටි කාලය තුල දී විශාල වශයෙන් උත්සාහ ගන්නා ලදී. මෙරට දේශපාලන ඉතිහාසය තුළ පුරෝගාමී ජන නායකයෙකු ලෙස ඩී. ඒ. රාජපක්ෂ මහතා කටයුතු කළ බවට ජන විඥානය තුළට ඒත්තු ගැන්වීමට රාජපක්ෂ පාලනය විශාල උත්සාහයක් ගන්නා ලදී. ඒ සඳහා ඔවුන් නොයෙක් ව්‍යාපෘති දියත් කරන ලදී. ඩී. ඒ. රාජපක්ෂ ගුණානුස්මරණ උත්සව, සමරු දේශනා, ගොඩනැගිලි හා පාරවල් ඉදි කිරීම යනාදී ව්‍යාපෘති තුළට අලුතින්ම එකතු වූ ව්‍යාපෘතිය වන්නේ "වීරකැටිය ව්‍යාපෘතිය" නමින් හඳුන්වනු ලැබූ දෙමාපියන් වෙනුවෙන් ඉදි කරනු ලැබූ කෞතුකාගාරයයි.

රාජපක්ෂවරු මෙරට සාරය උරාගෙන දූෂිත අයුරින් උපයාගත් මුදල් වලින් හෝ ඔවුන්ගේ පාරම්පරික බූදලයෙන් මෙවැනි කෞතුකාගාර හෝ වෙනත් දේවල් ඉදිකිරීම කිසිසේත්ම ගැටළුවක් නොවේ. සුජාත පුත්‍රයන් වශයෙන් තම දෙමාපියන් වෙනුවෙන් එවන් යුතුකම් ඔවුන් අතින් ඉටු විය යුතුය. එහෙත් රාජපක්ෂවරු තම මවුපිය සෙනෙහස පෙන්වීමට කාබාසිනියා කර ඇත්තේ මෙරට බහුතරයක් දුගී දුප්පතුන්ගේ මුදල් ය. ඔවුන් විසින් තම මවුපියන්ගේ රූප ඉටියෙන් ඇඹීමට, මහගෙදර පාවිච්චි කරන ලද මිරිස් ගල්, කුරහන් ගල්, කුළු, වංගෙඩි යනාදිය ප්‍රදර්ශනය කිරීමට භාවිතා කර ඇත්තේ ගෝඨාභය රාජපක්ෂ යටතේ පැවති ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ රුපියල් 61,710,093/-ක මුදලකි. එම ව්‍යාපෘතිය පිළිබඳව සිදු කළ විගණනයේ දී ඉහත තොරතුරු අනාවරණය විය. මෙවැනි විශාල මුදලක් වියදම් කිරීමට කිසිදු කැබිනට් අනුමැතියක් ලබාගෙන නොමැති අතර ටෙන්ඩර් පටිපාටියක් ද අනුගමනය කර නොමැත. මෙම කෞතුකාගාරය ඉදිරිපිට ජල පොකුණු නිර්මාණයට සහ සුරතල් මසුන් සඳහා රු.6,828,800/-ක් ද, තඹ නෙලුම් මල් 09ක් සඳහා රුපියල් මිලියන 3ක් ද, පලිඟු 02ක් සඳහා රුපියල් මිලියන 9ක් ද, කෞතුකාගාරය

ඉදිරිපිට පාර නවීකරණය සඳහා රුපියල් මිලියන් 2.6ක් ද, විදුලි පහන් වෙනුවෙන් රුපියල් මිලියන 5.4ක් ද, නාවික හමුදාවට රුපියල් මිලියන 25ක් ද ගෙවා ඇත. තව ද නාගරික සංවර්ධන අධිකාරියෙන් 9'x 6' ප්‍රමාණයේ හතරැස් කළුගල් 15,000ක් ලබා ගෙන ඇති නමුත් ඒ වෙනුවෙන් රුපියල් 4,125,000/-ක මුදල ගෙවා නොමැත.

ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ දැක්ම වන්නේ "ගංවතුරින් තොර පරිසර හිතකාමී පරිසරයක් සහ දූෂණයෙන් තොර ජලාශ්‍ර ඇති කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ප්‍රමුඛයා වීම" යන්නයි. ඒ අනුව ඉහත ව්‍යාපෘතිය සංස්ථාවේ දැක්මට හෝ මෙහෙවරට කිසිසේත් අදාළ නොවන්නකි. ගෝඨාභය රාජපක්ෂ සංස්ථාවේ මුදල් රුපියල් කෝටි හයකට වැඩියෙන් වැය කර ඇත්තේ සංස්ථාවේ කටයුතු සඳහා මුදල් නොමැතිකම හේතුවෙන් සංස්ථාව රුපියල් මිලියන 14,277ක් දේශීය බැංකු වලින් ණයට ලබාගෙන තිබියදී ය. මෙම කෞතුකාගාරය 47 වන ඩී. ඒ. රාජපක්ෂ ගුණානුස්මරණ දිනයේ දී විවෘත කර ඇත.

මෙලෙස ඉඩම් ගොඩ කිරීමේ සංස්ථාවේ මුදල් සාපරාධී ලෙස විනාශ කිරීම සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්වරයා ලෙස ගෝඨාභය රාජපක්ෂත්, ඇමතිවරයා ලෙස මහින්ද රාජපක්ෂත් සෘජුවම වගකිව යුතු ය.

## 3.04 බැසිල් රාජපක්ෂ අයුතු ලෙස ඉපැයූ දේපල

සියනෑ කෝරලයේ ගඟබඩ පත්තුවේ පහළ මාපිටිගම අංක 730' ලිපිනයේ පිහිටි අක්කර 16 ක ඉඩමක් බැසිල් රාජපක්ෂ මහතා විසින් මිලදී ගෙන සුවිශාල සුඛෝපභෝගී නිවසක් ඉදිකරන බවට පැමිණිල්ලක් ලැබී ඇත.

රාජපක්ෂවරුන් සිය දේපල ඉතා සූක්ෂම ලෙස විවිධ පුද්ගලයින්ගේ නමට පවරා සඟවා තබා ගෙන ඇත. එහෙත් මෙම වටිනා දේපල පිළිබඳව සහ එහි සැබෑ අයිතිය පිළිබඳ තොරතුරු දැන් හෙළිවෙමින් පවතී.

මල්වාන ප්‍රදේශයේ කැළණි ගඟ අසබඩ පිහිටි මෙම ඉඩම රුපියල් මිලියන 30 කට මිලදී ගෙන ඇත්තේ තිරු නඩේෂන් නමටය. එහෙත් එහි සැබෑ වටිනාකම රුපියල් මිලියන 600 ක් පමණ වේ. 2015 ජූනි මාසයේදී එය මුදිත ජයකොඩි නමැත්තාට පවරා ඇත.

ඉඩමේ සුඛෝපභෝගී නිවසක් සහ ගොවිපලකට අවශ්‍ය ඉදිකිරීම් සිදු කර ඇති අතර එම ඉදිකිරීම්වල වටිනාකම රුපියල් මිලියන 200 ක් පමණ වේ.

මුදිත ජයකොඩි නමට මිලදී ගත් මෙම ඉඩම සඳහා මුදල් ගෙවා ඇත්තේ තිරු නඩේෂන් නම් කෝටිපති ව්‍යාපාරිකයෙකි. ඔහු හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනී නිරූපමා රාජපක්ෂගේ සැමියා වන අතර බැසිල් රාජපක්ෂගේ ඥාතියෙකි. මෙම නිවාස ඉදිකිරීමට අදාළ සියලු නක්ෂත්‍ර කටයුතු හිටපු ජනපති මහින්දගේ රාජකීය දෛවඥ සුමනදාස විසින් සිදු කර ඇති අතර ඔහු එය සිදු කර ඇත්තේ පුෂ්පා රාජපක්ෂ (බැසිල්ගේ බිරිඳ)ගේ ඉල්ලීම පරිදිය.

මෙම නිවසේ ඉදිකිරීම් බැසිල් රාජපක්ෂ, පුෂ්පා රාජපක්ෂ සහ ඔවුන්ගේ වැඩිමහල් දියණියගේ අධීක්ෂණ හා උපදෙස් මත අදාල ඉදිකිරීම් සිදු වූ බව අනාවරණය වී ඇතැයි වාර්තා වේ.

බැසිල් රාජපක්ෂ හා රාජපක්ෂ පවුල සතු දේපල වලින් කොටසක් තිරු නඩේෂන් නමින් සඟවා ගෙන ඇති බවට සැක කෙරේ.

## 3.05 බැසිල්ගේ ගම්පහ පක්ෂ කාර්යාලය

ගම්පහ ඔරුතොට පාරේ පිහිටි ඉඩමක් මිලට ගෙන බැසිල් රාජපක්ෂ මහතාගේ දේශපාලන කාර්යාලය හා මෙහෙයුම් මධ්‍යස්ථානය ඉදිකර ඇති අතර ඒ සඳහා වැයකර ඇති මුදල රුපියල් මිලියන 200 කට අධික බව පැවසේ. මෙම කාර්යාලයේ රැස්වීම් සඳහා සහභාගිවන පුද්ගලයින්ට ආහාර පාන සපයා ඇත්තේ සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ මුදල්වලින් බව හෙළි වී ඇත.

බැසිල් රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි සංචාරක ප්‍රවර්ධන අධිකාරිය වටිනාපහ සෝමානන්ද හාමුදුරුවන්ගේ පැවිදි සංවිධානය නම් සංවිධානයකට රුපියල් ලක්ෂ 50 ක් නීති විරෝධීව ලබා දී ඇති බවද හෙළි වී ඇත. රාජපක්ෂ පරම්පරාව රජයේ මුදල් ඔවුන්ගේ බලය තහවුරු කර ගැනීම සඳහා යොදා ගෙන ඇත්තේ එය තමන්ගේ බුදලයක් බව සිතමිනි.

## 3.06 තාරුණ්‍යට හෙටක් සංවිධානයට රුපියල් මිලියන 05 ක් පරිත්‍යාග කිරීමේ වංචනික ක්‍රියාව

තාරුණ්‍යට හෙටක් නමැති පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතා විසින් මෙහෙයවන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ තරුණ සංවිධානය විසින් ග්‍රාමීය තරුණ ප්‍රජාව අතර කොටස් වෙළඳපලේ ආයෝජනය කිරීමේ වාසි පිළිබඳව ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා යැයි පවසමින් මෙම මුදල් ලබා ගෙන ඇත.

තාරුණ්‍යට හෙටක් සංවිධානයේ ඉල්ලීම පරිදි විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව විසින් මෙම මූල්‍ය අනුග්‍රහය ලබා දී ඇත.

මෙම ගනුදෙනුව සිදුවෙන අවස්ථාවේ කොමිසමේ සභාපති ලෙස කටයුතු කළේ නාලක ගොඩහේවාය. ඔහු රාජපක්ෂ ආණ්ඩුවේ විවිධ ආයතනවල ඉහළ තනතුරු දරමින් රාජපක්ෂ පවුලේ වංචා දූෂණ වලට හවුල් වූ අපකීර්තිමත් නිලධාරියෙකු ලෙස ප්‍රකට අතර විවිධ දූෂණ හා වංචා චෝදනා රැසක පරීක්ෂණවලදී ඔහු පිළිබඳව සඳහන් වේ. ඒ අතර කොටස් වෙළඳපොලේ දූෂිත ගනුදෙනු ප්‍රධාන වේ.

මෙම රුපියල් මිලියන 05 අනුග්‍රහය තාරුණ්‍යයට හෙටක් සංවිධානයට ලබා දීම සඳහා නාලක ගොඩහේවා සභාපතිවරයා විසින් කොමිසම වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන ඇති නමුත් එම ගෙවීම් නීති විරෝධී බව තහවුරු වී ඇත.

සැබවින්ම එවැනි පුහුණු වැඩසටහන් පවත්වන ලද්දේද යන්න පිළිබඳව විනිමය හා සුරැකුම්පත් කොමිසමේ නිලධාරීන්ට තහවුරු කළ නොහැකි බව ඔවුන් පවසයි.

කොමිසම මෙවැනි පුහුණු වැඩසටහන් සඳහා ව්‍යාපාරික සංගම් (Business Chambers) සඳහා අනුග්‍රහය ලබා දෙන අතර දේශපාලන සංවිධානයකට එවැනි වැඩසටහනක් සඳහා අනුග්‍රහය ලබා දුන් ප්‍රථම අවස්ථාව මෙයයි.

මෙහිදී අනාවරණය වී ඇත්තේ මෙවැනි වැඩසටහනක් සඳහා ව්‍යාපෘති වාර්තාවක් හෝ තාරුණ්‍යයට හෙටක් සංවිධානය විසින් ලබා දී නොමැති බවයි. මුළු මුදලම නිදහස් කර ඇත්තේ හුදු ඉල්ලීමක් මත පමණි.

තවද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත අනුව මෙවැනි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා මුදල් වියදම් කිරීමට කොමිෂන් සභාවේ විෂය පථය අනුව බලයක් නොමැති බවද පෙනී යයි.

එමෙන්ම මෙම ගනුදෙනුවේ ඇති වංචනික සහ සැක කටයුතු බව පැහැදිලිවන තවත් අවස්ථාවක් වන්නේ එම මුදල් ගෙවා ඇත්තේ තාරුණ්‍යයට හෙටක් සංවිධානයට නොව වෙනත් සමාගමකට වීමයි. තාරුණ්‍යයට හෙටක් සංවිධානයේ ඉල්ලීම පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධම්මික පෙරේරා මහතා විසින් එම මුදලට අදාළ චෙක්පත සිලෝන් ප්‍රිමියර් ස්පෝර්ට්ස් නමැති සමාගමක් වෙත ගෙවා ඇත. මෙම සමාගම කොටස් වෙළඳපොල පිළිබඳව හෝ මූල්‍ය වෙළඳපොල පිළිබඳව අධ්‍යාපන කටයුතු සිදු කිරීමට සුදුසුකම් සහිත සමාගමක් නොවන අතර එය ක්‍රීඩා පිළිබඳ ව්‍යාපාරික කටයුතුවල නිරත සමාගමක් බව පෙනී යයි.

තවද සිලෝන් ප්‍රිමියර් ස්පෝර්ට්ස් සමාගමේ අධ්‍යක්ෂවරුන් සියලු දෙනා පාහේ රාජපක්ෂ පවුලේ, විශේෂයෙන්ම නාමල් රාජපක්ෂ මහතාගේ සමීපතම හිතවතුන් බවද අනාවරණය වී ඇත. ඒ අතර නිමල් පෙරේරා, චානුක උපේන්ද්‍ර රත්වත්තේ සහ නිශ්ශංක සේනාධිපති යන අය වේ.

මේ අනුව රුපියල් මිලියන 05 ක් වංචනික ලෙස විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාවෙන් ලබාගෙන ඇති බව ඉතා පැහැදිලිව පෙනේ.

### 3.07 රාජපක්ෂ පුතුන්ගේ මෝටර් කාර් රේස්

නාමල් රාජපක්ෂ සිය පියාගේ ජනාධිපති බලතල යොදා ගනිමින් විවිධ වංචා දූෂණ සහ රාජ්‍ය ධනය නාස්ති කිරීම් සිදු කර ඇත.

රාජපක්ෂ පුතුන්ගේ ප්‍රියතම ක්‍රීඩාව වූයේ රගර් සහ මෝටර් රථ ධාවන තරඟය. එම ක්‍රීඩා සඳහා රාජ්‍ය මුදල් බිලියන ගණනක් වියදම් කර ඇති අතර රාජ්‍ය ව්‍යාපාර වලින් (බැංකු, රක්ෂණ සහ දුරකථන සමාගම් වලින්) රුපියල් බිලියන ගණනක් අනුග්‍රාහක මුදල් ලෙස ලබා ගෙන ඇත.

මහනුවර සහ කොළඹ නගරවල ජන ජීවිතයටත් සංස්කෘතික වටිනාකමටත් හානිවන පරිදි පාරවල් වසා රාත්‍රී මෝටර් රථ තරඟ පැවැත්වීම දැඩි ජනතා අප්‍රසාදයට ලක්වූ නාමල්

රාජපක්ෂගේ අත්තනෝමතික ක්‍රියාවකි. මහානායක හිමිවරුන්ගේ විරෝධය පවා නොසලකා මහනුවර නගරයේ මෙලෙස මෝටර් රථ ධාවන තරඟ පවත්වන ලදී.

එමෙන්ම මෙම තරඟ සඳහා යුධ හමුදාවේ සම්පත් සහ සෙබළුන් යොදවා වැලි කොට්ට යොදා මාර්ග ආරක්ෂාව තහවුරු කරන ලද අතර ඒවාට විශාල ලෙස රාජ්‍ය මුදල් වැය කරන ලදී. පූර්ණ තීරු බදු සහන සහිතව ලැම්බෝගිනි මෝටර් රථ ඔවුන් විසින් ආනයනය කරන ලද අතර ජනවාරි 08 ජනාධිපතිවරණයට පෙර ඒවා සියල්ල හෝ කොටසක් රටින් පිටකර ඇත.

## 3.08 හිටපු ජනපති ආර්යා ශිරන්ති රාජපක්ෂගේ "සිරිලිය සවිය"

හිටපු ජනපතිවරයා නිතරම රාජ්‍ය නොවන සංවිධානවලට (NGO) බැනවදින නමුත්, ඔහුගේ බිරිඳ සිරිලිය සවිය නමින් රාජ්‍ය නොවන සංවිධානයක් පවත්වාගෙන ගිය බව පොලිසියට ඇය විසින්ම පවසා ඇති බවට තොරතුරු මෑතදී අනාවරණය විය.

මෙම සිරිලිය සවිය සංවිධානයට රාජපක්ෂ පවුල සිය විශාලතම අයථා මුදල් උපයන ආයතනයක් ලෙස පවත්වා ගෙන ගිය ඇවන්ගාර්ඩ් ආයතනයෙන්ද මුදල් ලැබී ඇති බවට වාර්තා වේ.

රටේ පළමු පුරවැසියාගේ බිරිඳ රාජ්‍ය නොවන සංවිධානයක් පිහිටුවා එමගින් බලාපොරොත්තු වූයේ රජය නොකරන වැඩ කටයුතු කිරීමද? එසේ නම් එය ප්‍රසිද්ධව පවත්වා නොගියේ මන්ද යන ගැටලුවලට පිළිතුරු ශිරන්ති රාජපක්ෂ මහත්මියම දිය යුතුයි.

සිරිලිය සවිය සංවිධානයේ බැංකු කටයුතු කොළඹ ඩාර්ලි පාරේ, සුදුවැල්ල මහජන බැංකුවේ 143-1-001-4-6235069 දරන ගිණුම මගින් ගනුදෙනු සිදුකර ඇති බවත්, එහිදී චෙක්පත් අත්සන් කිරීමට හැකි අයවලුන් ලෙස ශිරන්ති මහත්මිය හා ඇයගේ හිතවතුන් කිහිපදෙනෙකුගේ නම් ලබාදුන්නද ව්‍යාජ හැඳුනුම්පත් අංක ලබා දී ඇති බවද පරීක්ෂණ වලදී අනාවරණය වී ඇත. පිළිවෙලින් 222222222v හා 111111111v ලෙස ව්‍යාජ හැඳුනුම්පත් අංක ලබා දීමෙන් ව්‍යාජ තොරතුරු ලබා දීම හා කූඨ ලේඛන සැකසීම යන වැරදි සිදු කර ඇත. මෙය ප්‍රශ්න ගත ගිණුමක් බවද එහි මැන්ඩේට් පත්‍ර අස්ථාන ගත වී ඇති බවද වාර්තා වේ.

ඉහත ගිණුම පරීක්ෂාවේදී දැනට එහි මුදල් ශේෂය රුපියල් 43,800,000 ක් බව අනාවරණය වී ඇත. එසේම අවස්ථා 88 කදී රු. 82,900,089 ක් තැන්පත් කර ඇති අතරම, අවස්ථා 129 කදී රුපියල් 39,015,651 ආපසු ලබාගෙන ඇත. තවද සංවිධානයට රුපියල් 10,000,000 ස්ථිර තැන්පතුවක්ද පවතී. එසේම එකී සංවිධානයේ මුදල් මගින් කොළඹ 07, ටොරින්ටන් මාවත, අංක 260/17 හි, පිහිටි නිවස රුපියල් 35,000,000 කට මේරි ලුඩ්ස් වික්‍රමසිංහ නමින් මිලට ගෙන ඇති බවද හෙළි වී ඇත. මෙම නිවසේ සත්‍ය වටිනාකම මිලියන 200 අධිකය. තාරුණ්‍යට හෙටක්, සිරිලිය සවිය, නිල් බලකාය යන ආයතන සියල්ල ලියාපදිංචි කර ඇත්තේ මෙම ලිපිනයේය.

නමුත් නීතියේ ආධිපත්‍යට යටත් නොවන මෙම දූෂිත ක්‍රියාව කළ අයවලුන්ට තමුන්ගේ හෘද සාක්ෂිය නම් සමාව නොදෙනු ඇත. WFC ප්‍රාඩෝ ජීප් රථ 02 ක් මෙම සංවිධානය ලබා ගෙන ඇත.

## 3.09 RADA ආයතනය හරහා කොටි ත්‍රස්තවාදීන්ට මූල්‍යාධාර සැපයීම

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව නැගෙන එක් ප්‍රධාන චෝදනාවක් වන්නේ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳ චෝදනාවයි. සුනාමි ව්‍යවසනයෙන් විපතට පත් ජනතාවට නිවාස ඉදිකර දීමට යැයි පවසමින් මෙම මුදල් කොටි ත්‍රස්තවාදීන් වෙත ලබා දී ඇති බවට පැහැදිලි සාක්ෂි මෙහිදී ඉදිරිපත් වී තිබේ.

මෙම ගනුදෙනුව හරහා මහින්ද රාජපක්ෂ මහතාගේ සැබෑ දේශප්‍රේමයත් මානව දයාවත් හෙළිදරව් වේ. මහින්ද රාජපක්ෂ මහතා හෙල්පින් හම්බන්තොට වංචාව හරහා සුනාමි මුදල් හොරකම් කළ බවට හිටපු අගවිනිසුරු සරත් නන්ද සිල්වා මහතා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇති අතර මෙම රාඩා ව්‍යාපෘතිය හරහාද ඔහු වංචා කර ත්‍රස්තවාදීන්ට සපයා ඇත්තේ සුනාමි විපතට පත් ජනයා වෙත ලැබුණු මූල්‍ය ආධාරයි.

චෝදනාවේ දැක්වෙන පරිදි මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 2441 ක් RADA ආයතනය හරහා වංචා කොට එල්.ටී.ටී.ඊ සංවිධානයට ලබා දී ඇත.

එවකට උතුරු නැගෙනහිර පළාත් සඳහා ස්ථාපනය කර තිබූ REPPIA, TAFREN සහ TAFOR යන ආයතන 03 වෙනුවට 2005.11.28 වන දින ජනාධිපති මහින්ද රාජපක්ෂගේ නියෝගය මත RADA හෙවත් Re - construction Development Agency ආයතනය පිහිටුවන ලදී. එහි අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස විරාන් අලස් ඇතුළු 05 දෙනෙකු පත් කොට 2006 ක් වූ ජනවාරි මස සිට 2006 ක්වූ දෙසැම්බර් මාසය දක්වා ක්‍රියාත්මක වී ඇති අතර, 2007.01.23 වන දින එහි කාර්යයන් අවසන් කොට ඇත.

මෙහිදී ජී.එස්. බිල්ඩර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස්, බී. ඇන්ඩ් කේ. ප්‍රයිවට් ලිමිටඩ් සහ එවරෙස්ට් සිවිල් ඉංජිනියරින් සර්විසර්ස් ප්‍රයිවට් ලිමිටඩ් නමැති සමාගම් 03 කට ඉදිකිරීම් පිරිනමා ඇතත්, එම සමාගම් ලිපි ශීර්ෂ වලට සීමාවූ ව්‍යාජ තොරතුරු ඇති සමාගම් බව පෙනී ගොස් ඇත. කිසිදු නිවසක් ඉහත කී මුදල් වලින් ගොඩ නගා නොමැත. උදාහරණ වශයෙන් බී. ඇන්ඩ් කේ. හෝල්ඩින්ග් පුද්ගලික සමාගම සහ එවරස්ට් සිවිල් ඉංජිනියරින් සර්විසර්ස් සමාගම ත්‍රිකුණාමලය සහ මඩකලපුව ප්‍රදේශවල නිවාස ඉදිකළ බවට සඳහන් කරමින් රුපියල් මිලියන 169 ක් චෙක්පත් මගින් ලබා ගෙන ඇති නමුත් කිසිදු නිවසයක් ඉදි කර ඇති බවට සාක්ෂි නොමැත.

මේ පිළිබඳව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවතින අතර 05 දෙනෙකු රිමාන්ඩ් බන්ධනාගාර ගත කොට ඉන් කිහිපදෙනෙකුට ඇප ලබා දී ඇත.

## 3.10 ඇවන්ගාඩ් වංචාව

ගෝඨාභය රාජපක්ෂ හිටපු ආරක්ෂක ලේකම්වරයා විසින් රාජ්‍ය බලය, දේශපාලන බලය උපයෝගී කර ගෙන විවිධ දූෂණ, වංචා හා අපරාධ කළ බවට චෝදනාවලට ලක්ව ඇත. හිටපු අමාත්‍ය මර්වින් සිල්වා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෝඨාභය මහතා කළ අපරාධ සම්බන්ධව පැමිණිලි කර ඇත.

ගෝඨාභය රාජපක්ෂ මහතා සම්බන්ධ විශාලතම මූල්‍ය වංචාවක්, දූෂණයක්, රාජ්‍ය දේපල අයථා පරිහරණයක් හා ජාතික ආරක්ෂාවට බරපතල ලෙස බලපෑ කරුණක් වූ " ඇවන්ගාර්ඩ් ගනුදෙනුව" ප්‍රධාන තැනක් ගනී.

වසර ගණනාවක්ම මෙරටට පැමිණෙන විදේශ නෞකා වරායට පැමිණීමට පෙර ඒවායේ ඇති ආරක්ෂක අවි ආයුධ වරායෙන් පිටත තබා ගැනීමේ සේවාව කරනු ලැබුයේ ශ්‍රී ලංකා නාවික හමුදාව මගිනි. මෙම සේවා සැපයීම මගින් නාවික හමුදාව ආදායමක් ලැබූ අතර එය නාවික හමුදාව මගින් රජයට ලබා දෙන ලදී. පසුගිය රජය මගින් උක්ත සේවා සැපයීම නාවික හමුදාවෙන් විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් පිහිටුවා ඇති "ඇවන්ගාර්ඩ්" සමාගමට ලබා දීමට කටයුතු කරන ලදී. ඇවන්ගාර්ඩ් සමාගමේ සභාපති ලෙස හිටපු නාවික හමුදා මේජර්වරයෙකු වූ නිශ්ශංක සේනාධිපති කටයුතු කරන ලදී.

එසේම පසුගිය කාලයේ නාවික හමුදාපතිවරයෙකු වූ ඩී.ඩබ්.ඒ.එස්. දිසානායක මෙම ආයතනයේ සේවය කරන බව අනාවරණය වී ඇත. ඇවන්ගාර්ඩ් ආයතනය පිහිටුවීම හා රජයේ නාවික හමුදා නිලධාරීන් එහි ක්‍රියාකාරීව කටයුතු කිරීමට මූලික හේතුව වන්නේ ගෝඨාභයගේ වුවමනාව මත මෙම ආයතනය ක්‍රියාත්මක වන හෙයිනි. තවද ඇවන්ගාර්ඩ් ආයතනය සමග තවත් ආයතන දෙකක් එකතුව කටයුතු කරන බව ඔවුන්ගේ වෙබ් අඩවිය පවසයි. එනම් ගෝඨාභයම පිහිටු වූ "රක්නා ලංකා" ආයතනය හා නාවික හමුදාව එකතුව සේවා සැපයීම් කරන බවයි. ඒ අනුව ඇවන්ගාර්ඩ් ආයතනය ලබන ආදායමෙන්, නාවික හමුදාවට හා රක්නා ලංකා ආයතනයට කොපමණ ආදායමක් ලැබුනේද යන්න ආරක්ෂක අමාත්‍යාංශයේ හිටපු ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස ගෝඨාභය පිළිතුරු ලබා දිය යුතුයි.

රජයේ නාවික හමුදාව සංවර්ධනය කරනවා වෙනුවට එහි සම්පත් භාවිතා කොට පුද්ගලික සාමාගමක් සංවර්ධනය කර එමගින් ලැබෙන ආදායම, මෙම දූෂිත නිලධාරීන් විසින් තමන් වෙත ලබා ගත් බව මෙයින් තහවුරු වේ. තවද ඇවන්ගාර්ඩ් සමාගම සතු ආයුධ මෙරට ලියාපදිංචි නොමැති බවත් ඒවා ගබඩා කරන්නේ නාවික හමුදාව සතු භූමියක බවත් ගාල්ල පොලිසිය කළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. එම ආයුධ ගබඩා කර ආරක්ෂාව සපයා ඇත්තේද නාවික හමුදා නිලධාරීන් විසිනි. ගෝඨාභයගේ ඍජු අනුදැනුම මත ඉහත කරුණු සිදු වූ බව මනාව සනාථ වේ. දැනට ලැබෙන ආරංචි අනුව රක්නා ලංකා සමාගම නාවික හමුදාව වෙත කිසිදු මුදලක් ලබා දී නොමැති බවත්, අනාවරණය වී ඇත. ඇවන්ගාර්ඩ් සමාගම ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ අධීක්ෂණය වන රජයට ඍජුව සම්බන්ධ ආයතනයක් බව ඔවුන්ගේ වෙබ් අඩවි වල දක්වා ඇත. රජයේ නිලධාරියෙකුව සිටිමින් පුද්ගලික ආයතනයක් පිහිටුවා ලාභ ලැබීම, එම ආයතනයට රාජ්‍ය සම්පත් භාවිතයට ඉඩ දීම, අනවසර අවි ආයුධ තබා ගැනීමට ඉඩ දීම බරපතල වැරදි වේ.

මෙම චෝදනාවේ පැති දෙකක් පවතී. එනම් අපරාධ චෝදනාව සහ මුදල් විශුද්ධිකරණය පිළිබඳ චෝදනාවයි. මෙහි අපරාධ චෝදනාව නීතිපතිවරයා විසින් යටගසා ඇති අතර ගිනි අවි සහ පුපුරණ ද්‍රව්‍ය පනත ඇතුළු පනත් ගණනාවක් උල්ලංඝනය කිරීම් හරහා සිදු කළ අපරාධ ගනයේ ලා සැලකෙන වැරදි ඒ අනුව යටගසා ඇත.

මුදල් විශුද්ධිකරණය පිළිබඳ විමර්ශන වලදී හෙළි වී ඇති තොරතුරු අනුව ඇවන්ගාර්ඩ් සමාගමට අනුබද්ධිත සමාගම් 14 ක් ඇත. සමාගමට ඇමරිකානු ඩොලර් ගිණුම් 19 ක් හා ශ්‍රී ලංකා රුපියල් ගිණුම් 19 ක් ඇත.

2012.10.15 - 2015.04.30 අතර කාලය තුළ සමාගමේ මුළු ලැබීම් රුපියල් බිලියන 30.9 ලෙසත් මුළු ගෙවීම් රුපියල් බිලියන 30.7 ලෙසත් දැක්වේ.

මේ අතර සැක කටයුතු ගනුදෙනු රැසක් වේ. සභාපතිවරයාගේ නමින් කර ඇති වියදම රුපියල් මිලියන 1294 කි. සභාපතිවරයාගේ බිරිඳ නමට කර ඇති වියදම රුපියල් මිලියන 190 කි. සමාගම පරිත්‍යාග ලෙස රුපියල් මිලියන 166 ක් සහ ත්‍යාග මුදල් ලෙස රුපියල් මිලියන 687 ක් වියදම් කර ඇත. කිසිදු හේතුවක් සඳහන් නොකර කරන ලද වියදම් ලෙස රුපියල් මිලයන 574 ක් දැක්වේ.

සමාගමේ වංචා සහගත මුළු වියදම් ප්‍රමාණය රුපියල් මිලියන 6164 කි. ඇවන්ගාර්ඩ් සමාගම මුහුදු ආරක්ෂණ සේවා සැපයීම සඳහා රටවල් 44 ක නාවුක සමාගම් 194 ක් සමඟ ගිවිසුම්වලට එළැඹ ඇත.

මෙම අපරාධ සහ මූල්‍ය වංචා පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් අපරාධ නීතිය යටතේද මූල්‍ය විශුද්ධිකරණය යටතේද නිශ්ශංක සේනාධිපති ඇතුළු ඇවන්ගාර්ඩ් සමාගමේ අධ්‍යක්ෂවරු 04 දෙනෙකුටත් ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ඩී.එම්.එස් ජයරත්න මහත්මියට එරෙහිවත් නීතිමය ක්‍රියා මාර්ග ගත යුතු වුවත් මේ දක්වා ඔවුන්ට එරෙහිව සැලකිය යුතු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැත.

මෙම ඇවන්ගාර්ඩ් වංචාව ඉතා පැහැදිලි සාක්ෂි සහිත අපරාධ චෝදනා සහ මූල්‍ය විශුද්ධිකරණ චෝදනා යටතේ ක්‍රියා මාර්ග ගත හැකි සිද්ධියකි. පොලිසිය හා නීතිපති දෙපාර්තමේන්තුව නිසි ලෙස නීතිය ක්‍රියාත්මක කළේ නම් ගෝඨාභය රාජපක්ෂ ඇතුළු මෙම වංචාවට සම්බන්ධ පුද්ගලයින් මේ වනවිටත් සිටිය යුත්තේ හිර ගෙවල් තුළය. එහෙත් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහගේ අනුග්‍රහය යටතේ ඔවුන් තවමත් නිදැල්ලේ සිටී. මෙම ධනපති පක්ෂ දෙක ඇතිකරනවා යැයි සපථ කරන යහපාලනයේ තරම ඒ අනුව සිතා ගත හැක.

ගෝඨාභය රාජපක්ෂ ලේකම්වරයා යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් පසු ගිය කාලයේදී කොළඹ නගරය අලංකාර කළ බවත් මේ වන විට නැවත කොළඹ ජරාජීර්ණ වීමට පටන් ගෙන ඇති බවටද චෝදනා නැගෙයි. තමා යටතේ ඇති ආරක්ෂක අමාත්‍යාංශයේ ත්‍රිවිධ හමුදා සෙබලුන් හා සිවිල් ආරක්ෂකයින් යොදවා ආඥාදායකයෙක් ලෙස කටයුතු කරමින් මෙම කාර්යයන් කළ බව බොහෝ දෙනා දනිති. එසේ කටයුතු කරමින් ඉදිකරන ලද කොටුව ඕලන්ද රෝහල් සාප්පු සංකීර්ණ, තුරඟ තරඟ පිටිය

ප්‍රේක්ෂකාගාර, ඉන්ඩිපෙන්ඩන්ස් ආකේඩ් යන ස්ථානවල පවත්වා ගෙන යන R&R Restaurant අයිතිව ඇත්තේ රාජපක්ෂලාගේ ඥාතියෙකු වන සුදර්ශන ගනේගොඩට හා බිරිඳටය. තවද තුරඟ තරඟ පිටියේ ප්‍රේක්ෂකාගාරයේ ඇති "promate" ලිපි ද්‍රව්‍ය අලෙවි සැල හිටපු ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි ගාමිණී සෙනරත්ගේ ව්‍යාපාරයකි. තුරඟ තරඟ පිටිය සැකසීමේදී රු. 60/- ක තණ පිඩැල්ලකට රු. 600/- ක් ගෙවා ඇති බවටද චෝදනා එල්ල වී ඇත. එසේ නම් මහජන මුදල් කෝටි ගණනක් වැය කර මෙම ස්ථාන අලංකාර කර ඇත්තේද තමන්ගේ පැලැන්තියේ උන්ගේ උවමනාවන්ට බව පැහැදිලිය. මෙම ස්ථානවල ආරම්භ කරන ලද ලාංකීය සම්භවයක් සහිත හින්දි නිළියන්ගේ හෝටල් වලින් රු.200/- ක් ගෙවා ආප්පයක් කෑමට පුලුවන් කම තිබෙන්නේ රාජපක්ෂ පවුලට හා ඔවුන් සමඟ රට සූරා කන ලද හොර රංචුවේ එවුන්ට පමණයි.

### 3.11 පුෂ්පා රාජපක්ෂ පදනම

රාජපක්ෂ පවුලේ සාමාජිකයින් ඔවුන් අයථා ලෙස උපයන කළු සල්ලි විශුද්ධිකරණය සඳහා විවිධ රාජ්‍ය නොවන සංවිධාන, සංසද හා පදනම් පිහිටුවා ගෙන ඇත. තාරුණ්‍යට හෙටක්, සිරිලිය සවිය, පුෂ්පා රාජපක්ෂ පදනම ඉන් කිහිපයකි. මෙරට මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල කොන්ත්‍රාත් ලබා ගත් විදේශ සමාගම් වෙතින් අල්ලස් ලෙස ලබා ගත් මුදල් වලින් කොටසක් ආධාර ලෙස මෙම පදනම් සහ සංසද වෙත ගෙවා ඇති බවට පැමිණිලි රැසක් ලැබී ඇති අතර විමර්ශනවලදී ඒවා සත්‍ය බව තහවුරු වී ඇත.

එමෙන්ම මෙම ව්‍යාපෘතිවලින් ලැබුණු දැවැන්තම කොමිස් මුදල් ඔවුන්ගේ විදේශ ගිණුම් වලට බැරවී ඇතැයි විශ්වාස කෙරේ.

පුෂ්පා රාජපක්ෂ යනු බැසිල් රාජපක්ෂ මහතාගේ බිරිඳ වන අතර පුෂ්පා රාජපක්ෂ පදනම මගින් මෙලෙස රාජ්‍ය සමාගම් සහ විදේශ සමාගම් වලින් මුදල් ලබා ගෙන ඇති බවට තොරතුරු හෙළිදරව් වී ඇත.

පුෂ්පා රාජපක්ෂ පදනම සඳහා උකස් හා ආයෝජන බැංකුවෙන් රුපියල් ලක්ෂ 15 ක් ලබා ගෙන ඇති අතර, එය බැංකුවේ පරමාර්ථ වලට පිටින් එවකට සිටි සභාපති ජගත් වැල්ලවත්ත විසින් ලබා දී ඇත.

කොළඹ දකුණු වරායේ පළමු ජැටිය ඉදිකිරීම චීන සමාගමකට ලබා දෙන ලද අතර කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව වංචනික ලෙස පවරනු ලැබූ මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවට ඉතා අවාසි සහගත ව්‍යාපෘතියකි. එමගින් වරායේ අනෙකුත් පර්යන්තවල ආදායම් මේ වනවිටත් අඩු වී ඇති අතර මෙම නව ජැටිය Colombo International Container Terminal නම් චීන සමාගමක් විසින් පවත්වා ගෙන යනු ලැබේ.

මෙම සමාගමේ 012169249001 දරන HSBC බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ගිණුමෙන් රුපියල් 19,410,000/- ක් 2012.05.21 දින පුෂ්පා රාජපක්ෂ පදනම මගින් මහජන බැංකුවේ පවත්වා ගෙන යන 204 - 1 - 001 - 5 - 0003290 දරන ගිණුමට බැරකර ඇත.

කොළඹ වරායේ පිහිටීම හා එහි ඇති වානිජ්‍ය වටිනාකම අනුව ජාත්‍යන්තර තරගකාරී මිල ගණන් යටතේ මෙම දකුණු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ඇරඹුවේ නම් ශ්‍රී ලංකාවට ඉතා වාසිදායක කොන්දේසි යටතේ ලෝකයේ ප්‍රධාන ආයෝජකයින් ඇඳා ගැනීමේ හැකියාව තිබුණි. එහෙත් රාජපක්ෂ පවුලේ මෙවැනි වංචා නිසා එම අවස්ථා රටට අහිමිවී ඇත. මෙවැනි දැවැන්ත යටිතල පහසුකම් ව්‍යාපෘති හරහා රාජපක්ෂවරුන් කොමිස් මුදල් ලබා ගත් බව මේ අනුව පැහැදිලි වේ. සිය බිරින්දෑ වරුන්ගේ පදනම් වලට ලැබී ඇත්තේ එම කොමිස් මුදල් වලින් සොච්චමක් බවත් මහාපරිමාණ කොමිස් මුදල් ඔවුන්ගේ විදේශීය බැංකු ගිණුම්වලට බැර වී ඇති බවට සැක සිතිය හැක. මෙම දූෂිත ගනුදෙනුව පිළිබඳ නීතිමය පියවර ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි පැවතුණද මෙතෙක් ඒ පිළිබඳව කිසිවක් සිදු කර නොමැත.

## 3.12 චීන සමාගම් මහින්ද රාජපක්ෂ රැක ගැනීමට කටයුතු කළ ආකාරය

මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා සිය පාලන සමයේදී මෙරට දූෂිත චීන සමාගම්වල පිලිකන්නක් බවට පත් කළේය. දැවැන්ත යටිතල පහසුකම් ව්‍යාපෘති සියල්ල පාහේ මෙම දූෂිත චීන සමාගම්වලට ලබා දී විශාල කොමිස් මුදල් ලබා ගත් අතර එම ඇතැම් ව්‍යාපෘති සුදු අලි බවට පත්ව රටටත් ආර්ථිකයටත් බරක් වී ඇත. මත්තල ගුවන්තොටුපල, හම්බන්තොට වරාය සහ නිතර ක්‍රියා විරහිතවන නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඒ අතර වේ. රාජපක්ෂ දූෂිත පාලනය පවත්වාගෙන යාම සඳහා මෙම චීන සමාගම් 2015 ජනාධිපතිවරණයේදී නොමසුරුව මුදල් වියදම් කළ බවට තොරතුරු දැන් අනාවරණය වෙමින් තිබේ.

චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් විසින් HPDP Phase II නමින් ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ පවත්වා ගෙන යනු ලබන අංක 01 3359190 - 19 දරන ජංගම ගිණුම මගින් ඊ.එච්.ආර්.එල් ෆැන්සිස්කෝ යන අය වෙත 2014.12.12 සිට 2015.01.07 දක්වා චෙක්පත් 03 ක් මගින් රුපියල් 89,075,000/- ක් ලබා දී ඇත. එම චෙක්පත් වල අංක 981321, 981328, 981336 වේ. පරීක්ෂණ වලදී ෆැන්සිස්කෝ යන පුදගලයා හෙළි කර ඇත්තේ එම මුදල් තිල් බලකාය වෙත ලබා දුන් බවයි. එම මුදල් මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ රුව සහිත ටී ෂර්ට් සහ හිස් වැසුම් සැකසීම සඳහා යොදා ගත් බව ඔහු පවසා ඇත.

එමෙන්ම චායිනා හාබර් ඉංජිනියරින් සමාගම එම ගිණුමෙන්ම 2014.12.31 දින අංක 981319, 981320 යන චෙක්පත් මගින් රුපියල් 58, 594,500/- ක් ප්‍රියන්ත සමරසිංහ නම් පුද්ගලයෙකු වෙත ගෙවා ඇත.

පරීක්ෂණ වලදී ප්‍රියන්ත සමරසිංහ යන අයගෙන් අනාවරණය වී ඇත්තේ මෙම මුදල් අනුර චන්ද්‍රසිරි නම් අයෙකු සමග රැගෙන ගොස් අරලිය ගහ මන්දිරයේ ජනාධිපතිවරණ මෙහෙයුම් කාර්යාලයේ හේමා මාදිවල යන අයට ලබා දුන් බවයි. ඒ අනුව චයිනා හාබර් ඉංජිනියරින් සමාගම විසින් පමණක් මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා රුපියල් මිලියන 147 කට අධික මුදලක් වැය කර ඇත.

## 3.13 අවි ආයුධ මිලදී ගැනීමේදී සිදු කළ වංචා

ආරක්ෂක ලේකම් ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා පත් වීමෙන් පසුව ආරක්ෂක හමුදා සඳහා අවි ආයුධ සහ බර උපකරණ මිලදී ගැනීම සඳහා ලංකා ලොජිස්ටික්ස් සමාගම නමින් නව රාජ්‍ය සමාගමක් පිහිටුවන ලදී. අවි ආයුධ ගනුදෙනුවලදී විශාල වංචා හා දූෂණ සිදුවන බැවින් ඒවා වැලැක්වීම සඳහා මෙම සමාගම පිහිටු වූ බවත්, එමගින් ගනුදෙනුවේ තුන්වන පාර්ශවය ඉවත් වන බවත් ආණ්ඩුව ප්‍රකාශ කළද, මෙම සමාගම හරහා අති විශාල මුදලක් වංචා කර ඇති බවට පැමිණිලි ලැබී ඇත.

මෙම ලංකා ලොජිස්ටික්ස් සමාගම රාජ්‍ය සමාගමක් ලෙස රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන අනුව කටයුතු කළ යුතු බවද, සාමාගම ඒවා උල්ලංඝනය කරමින් මූල්‍ය වංචා හා දූෂණ සිදු කර ඇති බවට පැමිණිල්ලේ දැක්වේ.

සමාගමේ ප්‍රධාන විධායක ලෙස එම තනතුරට අවශ්‍ය සුදුසුකම් නොමැති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පාසල් මිතුරෙකු පත් කර ඇත. එමගින් මෙම වංචා සිදු කිරීම පහසු කර ගෙන ඇත.

සමාගම විසින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය කරමින් සිදු කළ මුළු මිලදී ගැනීම් වල වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන එකකට ආසන්න බවත් එවැනි මිලදී ගැනීම් සඳහා මිල ගණන් ලබා ගැනීම අවිධිමත් ලෙස හිතවත් තානාපතිවරුන් හරහා සිදු කර ඇති බවත් පැමිණිල්ලේ දැක්වේ.

ඉහළ මිල ගණන් වලට නිසි ප්‍රමිතියෙන් තොර භාණ්ඩ මිලදී ගෙන ඇති බවද එමගින් ගෝඨාභය රාජපක්ෂ මහතා අයථා ලෙස මුදල් උපයා ගෙන ඇති බවද පැමිණිල්ලේ දැක්වේ.

මෙලෙස සිදුකල එක් වංචාවක් වන්නේ 2006 වසරේදී නාවික හමුදාවට අයත් ඩෝරා අධිවේගී ප්‍රහාරක යාත්‍රා සඳහා මිලිමීටර් 32 රොකට් මිලදී ගැනීමේදී සිදු කළ වංචා වේ.

මෙහිදී නාවික හමුදාව මිල ගණන් කැඳවීමේදී මිල ගණන් 2 ක් ලැබී ඇත. බ්‍රිතාන්‍ය සමාගමක් විසින් අදාළ රොකට් සැපයීම සඳහා පවුම් මිලියන 32.5 ක්ද ඊශ්‍රායල් සමාගමක් විසින් ඇමරිකන් ඩොලර් මිලියන 18.2 ක්ද ඉදිරිපත් කර ඇත.

මෙම මිලදී ගැනීමේදී වඩා ඉහළ මිලක් ඉදිරිපත් කළ බ්‍රිතාන්‍ය සමාගමට ටෙන්ඩර් ලබා දෙන ලෙස හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ විසින් බල කළ බවත් පැමිණිල්ලේ දැක්වේ.

මෙම මිලදී ගැනීමේ තීරණයට හේතු ලෙස දක්වා ඇත්තේ රොකට් වල ගුණාත්මක තත්වයයි. එහෙත් ඩෝරා යාත්‍රා නිපදවන්නේ ඊශ්‍රායල් සමාගමක් බවත් ඊශ්‍රායලයේ නිෂ්පාදිත රොකට් වල ප්‍රමිතිය පිළිබඳ ගැටළු නොමැති බවත් පැමිණිල්ලේ දැක්වේ.

හිටපු නාවික හමුදාපති කරන්නාගොඩ මහතාගේ බල කිරීමට බ්‍රිතාන්‍ය සමාගමට ඇනවුම ලබා දී ඇති අතර එමගින් රජයට සිදු වූ පාඩුව ඇමරිකන් ඩොලර් මිලියන 22 කට අධිකය.

මෙම වංචාව පිළිබඳව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට සහ හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩට එරෙහිව චෝදනා එල්ල වේ.

## 3.14 ලංකා හොස්පිටල්ස් ආයතනයේ සිදු වූ වංචා සහ දූෂණ

මෙම රෝහල 2002 වසරේ ඉන්දියාවේ ඇපලෝ රෝහල් සමාගම විසින් ආරම්භ කරන ලද අතර 2006 දක්වා එම සමාගම විසින් පාලනය කරන ලදී.

2006 සැප්තැම්බර් මාසයේදී ඩිස්ටිලරීස් සමූහ ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පාලනය ලබා ගැනීමත් සමගම රක්ෂණ සංස්ථාව සතුව ඇපලෝ රෝහලේ බහුතර කොටස් පැවතීම නිසා එහි පාලනයද ඩිස්ටිලරීස් සමාගම ලබා ගනී. ව්‍යාපාරය තවදුරටත් ඇපලෝ රෝහල නමින්ම පවත්වා ගෙන යනු ලැබීය. පසුව ඉන්දියාවේ ඇපලෝ සමාගම සතුව පැවති 30% ක කොටස්ද විකුණා දමනු ලදුව හැරී ජයවර්ධන මහතා ඇපලෝ රෝහලේ සභාපති ලෙස පත්වේ.

2009 ජුනි මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය නීති විරෝධී බවට තීන්දු කිරීමෙන් පසුව රක්ෂණ සංස්ථාව යලිත් රාජ්‍ය ආයතනයක් බවට පත්වන අතර රක්ෂණ සංස්ථාව සතුව පැවති බහුතර කොටස් අයිතිය සමඟ කොළඹ ඇපලෝ රෝහලද රජය සතු සමාගමක් බවට පත් විය. එය ලංකා හොස්පිටල්ස් ලෙස නම් කෙරිණි.

ඒ අනුව 2009 වසරේදී ගෝඨාභය රාජපක්ෂ මහතා රෝහලේ සභාපතිවරයා ලෙස පත් කරනු ලබයි.

දූෂණ විරෝධී හඬ වෙත ලැබුණු පැමිණිල්ලකට අනුව වංචා හා දූෂණ සිදුවන්නේ මෙම ගෝඨාභය රාජපක්ෂගේ සභාපතිත්වය යටතේ පැවති 2009 වසරේ සිට 2014 දක්වා කාලය තුළදීය.

පැමිණිල්ලේ දැක්වෙන්නේ 2011 වසරේදී හැරී ජයවර්ධන මහතා සතුව තිබූ ලංකා හොස්පිටල්ස් සමාගමේ කොටස් 28.66% ක් විකිණීමේදී කොටස් මිල කෘතීම ලෙස ඉහල නැංවීම මගින් විශාල මූල්‍ය වංචාවක් සිදු කර ඇති බවයි.

මෙම කොටස් අලෙවියට ආසන්න දින 03 ක් තුළ ලංකා හොස්පිටල්ස් ආයතනයේ කොටස් වල මිල කෘත්‍රිම ලෙස ඉහල නංවා ඇති අතර රු.42 කට පැවති කොටසක මිල දින 03 කදී රු.84 දක්වා ඉහල නංවා ඇත. මේ සඳහා සභාපති ගෝඨාභය රාජපක්ෂ, සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වූ නාලක ගොඩහේවා (ඔහු සුරැකුම් සහ විනිමය කොමිසමේ සභාපති වරයාද විය.) සහ දිලිත් ජයවීර යන අය සම්බන්ධ බවට චෝදනා කරයි.

මෙම වංචනික කොටස් ගනුදෙනුවේදී රුපියල් මිලියන 600 ක මුදලක් හැරී ජයවර්ධන මහතා විසින් නාලක ගොඩහේවාට සහ දිලිත් ජයවීරට ගෙවන ලද බවත් පැමිණිල්ලේ සඳහන් වේ.

තවද පැමිණිල්ලේ දැක්වෙන්නේ ලංකා හොස්පිටල්ස් සමාගම රාජ්‍ය ආයතනයක් වුවද ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් එය අනෙකුත් රාජ්‍ය හවුල්කරුවන් කොන්කර 2013/2014 කාලය වන විට තම පූර්ණ ආධිපත්‍යයට යටත් කර ගත් බවයි. මෙම සමාගමේ බහුතර කොටස් අයිතිය ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සතු වේ. එහිදී ඔහුගේ මෙරට සහචරයින් සහ ඉන්දීය වෛද්‍යවරුන් තිදෙනෙකු සමග එක්ව ආයතනයේ මුදල් අවභාවිතා කර ඇත. අනෙකුත් අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය නොසලකා කටයුතු කර ඇත. ආයතනයේ ඉන්පසුව සිදු වූ වංචාවලට සහ විශාල මූල්‍ය පාඩුවලට සභාපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ උප සභාපති රෝහිනී කබ්රාල් වගකිව යුතු බවටත් චෝදනා කරයි.

2011 සිට 2013 අතර කාලයේ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ වියදම 36% සිට 187.35% දක්වා වැඩිකර ඇති අතර සමාගමේ 12 දෙනෙකුගෙන් වූ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් නොමසුරුව වියදම් කර ඇති බව පැහැදිලි වේ. 2012 වසරේදී රුපියල් මිලියන 4.15 ද 2013 වසරේදී රුපියල් මිලියන 11.92 ද මෙසේ වැය කර ඇත.

ආයතනයේ ප්‍රතිරූපය නැංවීමට අති විශාල මුදලක් වැය කර දිලිත් ජයවීර මහතාට අයත් TRIAD හරහා මාසයකට රුපියල් මිලියන 3-7 අතර මුදලක් වැය කර ඇත. මෙම ප්‍රචාරක ව්‍යාපාරයේ ඇතැම් ව්‍යාපෘතිවල පිරිවැය රුපියල් මිලියන 30 ඉක්මවන බවද පැමිණිල්ලේ දැක්වේ.

රාජ්‍ය සමාගමක් ලෙස පිළිපැදිය යුතු රජයේ ප්‍රසම්පාදන නීති පිළිපදින්නේ නැතිව වෛද්‍ය උපකරණ ඇතුළු ද්‍රව්‍ය මිලදී ගෙන ඇත. එහිදී ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහචරයින් විශාල ලෙස කොමිස් මුදල් ලබා ගෙන ඇති බවත්, ඒ අතර රුපියල් මිලියන 2 ක් වටිනා උපකරණ මිලදී ගැනීමක් සහ රුපියල් මිලියන 70 වැය කර පරිගණක මෘදුකාංග මිලදී ගැනීමක් අයත් බව පැමිණිල්ලේ සඳහන් වේ.

## 3.15 CSN නාලිකාව

කාල්ටන් ස්පෝර්ට්ස් නෙට්වර්ක් (CSN) යනු රාජපක්ෂ පවුලේ රූපවාහිනී නාලිකාවයි. මෙම නාලිකාව ආරම්භයේ සිටම රාජ්‍ය බලය, රාජ්‍ය ධනය හා රාජ්‍ය සම්පත් අපහරණය කරමින් විශාල මුදලක් රජයට හා රාජ්‍ය ආයතනවලට පාඩු කරමින් පවත්වා ගෙන ගොස් ඇත.

CSN නාලිකාව භාවිතා කරනු ලැබුවේ ස්වාධීන රූපවාහිනී නාලිකාවේ සංඛ්‍යාතයන්ය. එමෙන්ම ස්වාධීන හා ජාතික රූපවාහිනී නාලිකාවල උපකරණද භාවිතා කරන ලදී. රාජපක්ෂ ගැති මෙම ආයතවල පාලකයන්ට ඒවාට විරුද්ධ විය නොහැකි විය. නාලිකාව ඇරඹීම සඳහා විදුලි සංදේශ නියාමන කොමිසමේ අවසරය ලබා ගෙන ඇත්තේද වංචනික ආකාරයෙනි. ශ්‍රී ලංකාව තුළ ක්‍රිකට් තරඟ විකාශන අයිතිය 2012-2015 දක්වා වසර 03 ක කාලයකට ලබා ගැනීමට CSN හි ප්‍රධාන විධායක ලෙසත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම් ලෙසත් කටයුතු කරන නිශාන්ත රණතුංග සමග වංචනික ගනුදෙනුවකට CSN නාලිකාව එළැඹ ඇත.

මෙසේ CSN නාලිකාව සඳහා වසර 03 කට ක්‍රිකට් විකාශන අයිතිය අයුතු ලෙස ලබා දීමෙන් ජාතික රූපවාහිනියට උපයා ගැනීමට හැකිව තිබූ රුපියල් මිලියන 2875 ක් පමණ මුදලක් අහිමි වූ බව සඳහන් වේ.

රාජ්‍ය ආයතන වෙතින් මූල්‍ය අනුග්‍රහයෙන් මෙම නාලිකාවට ලබා ගැනීම සඳහා නාමල් හා යෝෂිත රාජපක්ෂ සිය පියා සතු රාජ්‍ය බලය යොදා ගෙන ඇත. එමෙන්ම CSN නාලිකාව බදු පැහැර ඇති බවද වාර්තා වේ.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නාමල් රාජපක්ෂ හෝ යෝෂිත රාජපක්ෂ නැත. ඔවුන් සූක්ෂම ලෙස තම වත්කම් සඟවන නමුත් ගනුදෙනු සිදුවන ආකාරය අනුව ඒවා හෙළිදරව් වෙමින් පවතී. උදාහරණ ලෙස 2012-2015 ක්‍රිකට් විකාශන අයිතිය CSN වෙත ලබා ගැනීමට පෙර 2011 වර්ෂයේදී විශේෂ කැබිනට් තීරණයක් මගින් ක්‍රිකට් විකාශනය ක්‍රීඩා සඳහා පමණක් විශේෂිත වූ නාලිකාවකට පැවරීමට අනුමැතිය හිමිවේ.

ශෂින්ද්‍ර රාජපක්ෂට කතරගම දේවාලයේ බස්නායක ධුරය ලබා දීමට අවස්ථා 03 දී විහාර හා දේවාල ගම් පනත වෙනස් කළ පරිදිම මහින්ද රාජපක්ෂ තම පුතුන්ගේ රූපවාහිනී නාලිකාවට දැවැන්ත ආදායමක් ලබා දෙන ක්‍රිකට් තරග විකාශය පැවරීම අරමුණු කර ගෙනම අදාළ කැබිනට් අනුමැතිය ලබා ගත් බව පැහැදිලිව කිව හැක.

## 3.16 බැසිල් රාජපක්ෂ යටතේ පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තුළ සිදු වූ දූෂණ හා මූල්‍ය අක්‍රමිකතා

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර තිබූ දිවි නැගුම දෙපාර්තමේන්තුව තුළ සිදු වූ මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ තොරතුරු රාශියක් මේ වන විට අනාවරණය වී ඇත. දෙපාර්තමේන්තුව යටතේ පහත සඳහන් දූෂණ ක්‍රියා සිදු වී ඇති බවට මේ වන විට සනාථ වෙමින් පවතින අතර මේ සම්බන්ධයෙන් හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ, ලේකම් නිහාල් ජයතිලක හා අධ්‍යක්ෂ ජනරාල් රණවක මහතා අත් අඩංගුවට ගෙන ඇප මත මුදා හැර ඇත.

- **ඉසුරුමත් නිවහනක් ව්‍යාපෘතියේ සිදු වූ දූෂිත ක්‍රියා**

දිවිනැගුම සහනාධාර ලාභීන්ට නිවාස අලුත්වැඩියා කිරීම සඳහා මුදල් ලබා දෙන මුවාවෙන් සමෘද්ධි ලාභීන්ගේ ඉතුරුම් සහිත දිවි නැගුම අරමුදල මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීමේ දූෂිත ගනුදෙනුව මේ යටතේ අනාවරණය විය. රුපියල් මිලියන 15000 ක් වියදම් කිරීමට සැලසුම් කර තිබූ අතර මිලියන 3000 කට ආසන්න මුදලක් 2015 ජනාධිපතිවරණය ආසන්නයේ බෙදා හැර තිබුණි. අදාළ ව්‍යාපෘතිය සැලසුම් කර ඇත්තේ දින 10 ක් වැනි කෙටි කාලයක් තුළ බැවින් ඒවා දිවි නැගුම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සැලසුම්වලට ඇතුලත් නොවීය. සිය සහෝදරයාගේ ජනාධිපති ජයග්‍රහණය සඳහා වංචා සහගත ලෙස සමෘද්ධි ලාභීන්ගේ මුදල් යොදා ගැනීමට සැලසුම් කළ ව්‍යාපෘතියකි. අසරණ සමෘද්ධිලාභීන්ගේ නිවාස වැඩි දියුණු කිරීමේ සැබෑ පරමාර්ථයක් ඔවුන් සතුව තිබුනේ නම් විධායක ජනාධිපති බලතල සහිත වසර 10 ක කාල සීමාව අවසන් වීමට පෙර අදාල

අරමුණ ඉටු කිරීමට හැකියාව තිබුණි. එහෙත් බැසිල් රාජපක්ෂ සමෘද්ධි ලාභියා ගැන සිතුවේ නැත. ඔහු සමෘද්ධි ලාභින්ගේ ඉතුරුම්වලින් තම සහෝදරයාගේ ජනපති ජය තහවුරු කිරීමේ වංචා සහගත ගනුදෙනුව සිදු කළේය.

**■ කෝටි 6 1/2ක් වියදම් කර පැවැත් වූ දිවි නැගුම සම්මේලනය**

2015 ජනාධිපතිවරණ සමයේ මහින්ද රාජපක්ෂගේ ජය තහවුරු කිරීම සඳහා 2014 දිවි නැගුම සම්මේලනය කොළඹ කැම්බල් පිටියේදී බැසිල් රාජපක්ෂ විසින් පවත්වන ලදී. දිවි නැගුම දෙපාර්තමේන්තුව සතු සමෘද්ධි ලාභින්ගේ අරමුදල් උපයෝගී කර ගනිමින් පවත්වන ලද මෙම සම්මේලනය සඳහා රුපියල් 63,000,000/- ක මුදලක් වියදම් කොට ඇත. 2015 ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව 2014.11.21 දින පවත්වන ලද එම සමුළුවට සමෘද්ධි නිලධාරීන් හා සමෘද්ධි ලාභින් ප්‍රවාහනය සඳහා මිලියන 25 ක්ද, ආහාර පාන සඳහා මිලියන 20 ක්ද, ඇතුළුව මිලියන 63 ක් මෙම සම්මේලනයට වියදම් දරා ඇති අතර මෙහිදී මැතිවරණ නීති උල්ලංඝනය කිරීම පමණක් නොව සමස්ථ වියදමද දරා ඇත්තේද ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව බවට තොරතුරු හෙළි වී ඇත.

**■ මහින්ද රාජපක්ෂගේ රුව යොදා ලිත් ලක්ෂ 50 ක් සමෘද්ධි අරමුදලින් මුද්‍රණය කිරීම.**

පසු ගිය ජනාධිපතිවරණය අරමුණු කර ගනිමින් සමෘද්ධි ලාභී පවුල් ලක්ෂ 18 ක් සඳහා මහින්දගේ රුව සහිත ලිත් ලක්ෂ 50 ක් මුද්‍රණය කර ඇත. එක් ලිතකට දැරූ වියදම රු. 05.25 ක් වූ අතර VAT බදු ඇතුළුව ලිත් ලක්ෂ 18 ක් සඳහා වැයවිය හැකිව තිබුණේ රුපියල් මිලියන 10.5 කි. නමුත් දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ලිත් මුද්‍රණය සඳහා රුපියල් 29,400,000/- ක මුදලක් වැය කර තිබූ අතර වැඩිපුර වැය කර ඇති මුදල රුපියල් මිලියන 18.5 කි. මෙසේ බැසිල් රාජපක්ෂ තම හිතු මනාපයට රජයේ මුදල් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා ගොනු වී ඇති බවට තොරතුරු ලැබී ඇත.

**■ රාජ්‍ය මුදල් අවභාවිතා කොට මැතිවරණයන් සඳහා ගැල්වනයිස් බට බෙදා හැරීම.**


බැසිල් රාජපක්ෂ දිවිනගුම අරමුදල් උපයෝගී කර ගනිමින් ප්‍රාදේශීය සභා වෙත ගැල්වනයිස් බට ලබා දී ඇති අතර ඒ සඳහා රුපියල් 20,132,277/- වැය කර ඇත. ආර්ථික සංවර්ධනයට හෝ දිවි නැගුමට කිසිසේත් අදාළ නැති ගැල්වනයිස් බට මිලදී ගෙන ඇත්තේ ජනාධිපති මැතිවරණයේදී සිය සහෝදරයන් ජයග්‍රහණය තහවුරු කිරීම සඳහාය. මෙම සියලු වියදම් ප්‍රසම්පාදන ක්‍රියාවලියට පටහැනිව සිදු වී ඇති බවට තොරතුරු අනාවරණය වේ. මෙයින් පැහැදිලි වන්නේ ප්‍රාදේශීය වශයෙන් ඉන්නා දේශපාලන හෙන්චයියන්ට බලය තහවුරු කර ගැනීම සඳහා දූෂිත වට පිටාව සකස් කිරීමට රජයේ සම්පත් අනිසි අයුරින් භාවිතා කරමින් කටයුතු කර ඇති ආකාරයයි.

# මහින්ද රාජපක්ෂගේ අමාත්‍ය මණ්ඩලය විසින් සිදුකරන ලද දූෂණ, වංචා සහ අක්‍රමිකතා

මහින්ද රාජපක්ෂ මහතා සිය අමාත්‍ය මණ්ලය පත් කිරීමේදී උපයෝගී කරගත් නිර්ණායකයන් අතර, ප්‍රධාන වූයේ එසේ පත් කරන්නා තමන්ට සහ තම පවුලට අවනත පුද්ගලයකු වීමයි. තීරණාත්මකව බලපෑම් කල හැකි අමාත්‍ය ධූර තමා යටතේත්, පොදුවේ අනෙකුත් සියලුම අමාත්‍යාංශවලට බලපෑම් කල හැකි ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තමාගේ සහෝදරයා යටතේත් තබා මහින්ද රාජපක්ෂ මහතා බොහෝ අමාත්‍යාංශ නමට පමණක් සීමා කළේය. අමාත්‍යාංශ සියය ඉක්මවා තිබූ නමුදු සිය බලය යොදා ඔහු සියලු අමාත්‍යාංශ පාලනය කළේය. රාජපක්ෂ රජයේ අමාත්‍යාංශවල මූල්‍ය පාලනයක් නොවීය. අමාත්‍යාංශවල සම්පත් තම සහචරයන් ලවා කොල්ලකෑම හෝ තම දේශපාලන ප්‍රතිරූපය ගොඩනගා රජෙකු බවට පත්වීමට දරණ ලද ප්‍රයත්නය තුල ඇමතිවරුන්ගේ චන්දිභට්ටකම් සහ ස්තෝත්‍ර ගීතිකා ගැයීම පමණක් මෙම ඇමතිවරුන්ගේ පැවැත්මට ප්‍රමාණවත් විය. අමාත්‍යවරුන් කොතරම් දූෂිත අයුරින් මහජන ධනය කොල්ලකෑවත් මහින්ද රාජපක්ෂ ඒ කිසිවෙකුට එරෙහිව කිසිදු පියවරක් නොගත්තේය. ඔහු ඒවා යොදා ගත්තේ තමන්ට එරෙහි වන්නන් පාලනය කිරීමේ මෙවලමක් වශයෙනි. අමාත්‍යවරුන්ගේ දූෂිත ගනුදෙනු, සහිත ලිපිගොනු ඔහු භාරයේ තබා ගත්තේය.

තමාගේ අමාත්‍යවරුන්ට විරුද්ධව, විමර්ශණ ආයතන වලට ලැබෙන පැමිණිලි යටපත් කිරීමට සඳහාත් ඔහුගේ විධායක බලතල උපයෝගී කර ගත්තේය. රෝහිත අබේගුණවර්ධන අමාත්‍යවරයාට එරෙහිව අල්ලස් කොමිසමට ලැබුණු පැමිණිල්ල, යටපත් කිරීමට එහි විමර්ශනය භාර සහකාර පොලිස් අධිකාරිවරයා අල්ලස් කොමිසමෙන් ඉවත් කළේය. අධිකරණය තමන් යටතට ගැනීම තමාගේ නීති උපදේශකයා වූ මොහාන් පීරිස් අගවිනිසුරු කිරීමත්, නීතිපති දෙපාර්තමේන්තුව තමා යටතට ගැනීමත් තුළින් මහින්ද රාජපක්ෂ සිදුකළේ තමාගේ මෙන්ම තම දූෂිත අමාත්‍යවරුන්ගේ මූල්‍ය අක්‍රමිකතාවයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මකවීම වළක්වාලීමයි. යටපත් කිරීමයි.

කොතරම් මහජන ධනයක් කොල්ලකෑවද මෙම එම එකදු දූෂිත අමාත්‍යවරයකුටවත් එරෙහි විමර්ශනයක් නොකළේය. රාජ්‍ය ආයතනවල, විශේෂයෙන්ම රාජ්‍ය බැංකු සඳහා තරහකාරී විභාග පවත්වා සුදුස්සන් තෝරා ගත්තද ඔවුන් බඳවා ගැනීම පසෙකලා නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා ජනාධිපති පුත්‍රයා ලෙෂ තමාට ආරෝපණය කර ගත් සුවිශේෂී බලතල සහිතව අමාත්‍යවරයකු ලෙස කටයුතු කරමින් තම හෙන්චයින් තනතුරු සඳහා බඳවා ගත්තේය. දූෂිත බවේ උච්චතම ස්ථානයේ සිටි මහින්ද රාජපක්ෂ වෘත්තයක මධ්‍යයේ ස්ථානගත කළහොත් ඔහුගේ අමාත්‍ය මණ්ඩලය ඔහුට සමීප සිටින ආකාරයට සාපේක්ෂව දූෂිත බවේ ප්‍රමාණාත්මක බව  පැහැදිලිව පෙන්නුම් කල හැකිය.




සැබෑ ස්වාධීන විමර්ශනයක් සිදුකරන්නේ නම් සහ ඊට දේශපාලන බලපෑම් එල්ල නොකරන්නේ නම් මේ සියලු දෙනා මේ වන විට සිරබත් කෑ යුතුය. අඩුවැඩි වශයෙන් විනිශ්චයකාරවරුන්, නීතිපති,පොලිස්පති, ජනාධිපති, අගමැති පොලීසිය භාර ඇමති ජෝන් විසින් සිදුකරනු බලපෑම් නොමැති වූයේ නම් දින 100 වැඩසටහන තුලින් දූෂිතයන්ට දඩුවම් දීම පැහැදිලි යථාර්ථයක් වන්නට තිබිණි. මානව හිමිකම් නඩු පවරමින්, අත්අඩංගුවට පත්වීමෙන් වැලකී සිටින විට මහජනතාවට දැනෙන්නේ නීතියත්, නඩුකාරයනුත්, අධිකරණයත් උන්ගේ ආරක්ෂණය වෙනුවෙන්ම පෙනී සිටින බවයි.

## 4.01 හිටපු ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා

රාජපක්ෂ රජයේ විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යවරයාව සිට ඉන්පසුව ක්‍රීඩා අමාත්‍ය ධුරයට පත් වූ මහින්දානන්ද අලුත්ගමගේට එරෙහිව අයථා ලෙස දේපල එක්රැස් කිරීම ඇතුලු මූල්‍ය අපරාධ ගණනාවක් පිළිබඳ චෝදනා පවතී. දේශපාලනයට පිවිසීමට පෙර "ද ෆිනෑන්ස්" සමාගමේ ඉඩම් අලෙවි ප්‍රවර්ධකයෙකු ලෙස සේවය කළ ඔහුගේ මාසික වැටුප රු.7,000/-ක් පමණ වූ අතර ඔහුගේ බිරිඳ සිංගර් ආයතනයේ මැහුම් සේවිකාවක් ලෙස සේවය කර ඇත. ඔහු ඒකරාශී කර ගත් ධනය පිළිබඳව මහජනයාට තොරතුරු අනාවරණය වනුයේ ඔහුගේ බිරිඳ විසින් කඩුවෙල දිසා අධිකරණයේ පවරන ලද අංක

1109/දික්කසාද නඩුව මගිනි. 2013.05.30 දින විභාගයට ගෙන තිබූ මෙම නඩුවට අදාළ සමථ කොන්දේසි යටතේ බිරිඳට පැවරීමට නියමිත වූ දේපල මෙසේ ය.

01. ඔහු විසින් රුපියල් ලක්ෂ 87.75කට මිලට ගෙන ඇති නාවල - කොස්වත්ත, චන්ද්‍රා වෙත්තසිංහ මාවතේ, අංක 15/31A , 03 වන පටුමගේ පිහිටි පර්චස් 17.5 ක ඉඩම සහ එහි ඉදිකළ නිවස

02. ඔහු විසින් මිලට ගෙන ඇති බොරැල්ල - කුරුප්පු පාරේ, අංක 66 දරණ ස්ථානයේ පිහිටි පර්චස් 20.85 ක ඉඩම

03. ඔහුගේ මුදලින් ආරම්භ කළ කටුනායක - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිටවීමේ පර්යන්තයේ පවත්වාගෙන යන "චේම්බර් ඔෆ් ගිෆ්ට්ස්" සහ "වී ඩූ ශ්‍රී ලංකා" නමැති තීරු බදු සාප්පු දෙක

04. ඔහු විසින් මිලට ගත් මහනුවර ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ පිහිටි පර්චස් 12, පර්චස් 13.5 හා පර්චස් 18.3ක් වන ඉඩම් කැබලි

මෙම දේපල වලට අමතරව රුපියල් මිලියන 30ක් බිරිඳට ගෙවීමට මෙම සමථ ගිවිසුමේ එකඟ වී තිබේ.

මීට අමතරව ඔහුට අයත් අනෙකුත් දේපල මෙසේ ය.

01. රුපියල් ලක්ෂ 285 කට බිරිඳගේ නමට මිලට ගත් ඇල්විටිගල මාවතේ ට්‍රිලියන් රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ අංක 153/9/2 දරණ නිවස

02. කොළඹ 07, කිංසි පාරේ අංක 70/3/1හි පිහිටි නිවස

03. පවුම් 320,000 ක් ගෙවා එංගලන්තයෙන් මිලට ගත් නිවස

04. අංක 15/1, චන්ද්‍රා වෙත්තසිංහ මාවත, කොස්වත්ත - නාවල පිහිටි පර්චස් 15.58 ක ඉඩම

05. සිංගප්පූරුවේ HSBC බැංකුවේ ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 5.5ක් තැන්පත් කොට නැවත ලබාගෙන ඇති මුදල.

06. මීට අමතරව තවත් බැංකු ගිණුම් ගණනාවකි. මහින්දානන්ද අලුත්ගමගේ පදනම නමින් බැංකු ගිණුමක් හා බිරිඳගේ නමින් හැටන් නැෂනල් බැංකුවේ ගිණුම් 05කි. පුතාගේ නමින් හා බිරිඳගේ නමින් බැංකුවේ ගිණුම් 03කි. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේද පුතාගේ නමින් බැංකු ගිණුමක් ඇත. තව ද සම්පත් බැංකුව, මහජන බැංකුව ආදී බැංකුවල තවත් ගිණුම් පවතින බව හා එම ගිණුම් වල මුදල් විශාල වශයෙන් හුවමාරු වී ඇති බවත් අනාවරණය වී ඇත.

මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිවරයාට මෙතරම් දේපලක් අත්පත් කර ගැනීමට හැකි වී ඇත්තේ ඔහු රාජපක්ෂ පාලන සමයේ ඇමතිවරයෙකුව කටයුතු කළ කාලයේ දීය.

ඔහු ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස කටයුතු කළ කාලය තුල සිදුකල වංචා හා දූෂණ මෙසේය.

පසුගිය ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු සඳහා ලක් සතොස ආයතනයෙන් රුපියල් ලක්ෂ 390 ක් වටිනා කැරම් බෝඩ් 14000 ක් හා දාම් බෝඩ් 14000 ක් ලබාගෙන එ.ජ.නි.ස පක්ෂ කාර්යාල වලට බෙදා හැර සතොස ආයතනයට මුදල් නොගෙවා පැහැර හැර තිබේ. ඔහු විසින් මෙම භාණ්ඩ ක්‍රීඩා අමාත්‍යාංශයට මිල දී ගන්නා බව පෙන්වීම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් මගින් ලිපි යවා ඇති අතර එම අමාත්‍යාංශයේ නිලධාරීන් කිසිවෙකුට මෙම භාණ්ඩ දැක ගැනීමට හෝ නොලැබී ඇති අතර ඒ අනුව සතොස ආයතනයට මුදල් නොගෙවීම නිසා සතොස ආයතනය විශාල අලාභයකට මුහුණ දී ඇත.

මීට අමතරව ක්‍රීඩා අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් තම හිතවත් ව්‍යාපාරිකයන්ට පහත් බිම් ගොඩ කිරීමේ හා සංවර්ධන මණ්ඩලයේ රෙඩෙකෝ නම් ආයතනය හරහා අයථා ලෙස ලබා දීම ද, ක්‍රීඩා අමාත්‍යාංශයේ ගුවන් ටිකට් පත් ඇණවුම් පාර්ලිමේන්තු මන්ත්‍රී ලොහාන් රත්වත්තේ මහතාට අයත් "වර්ල්ඩ් එයාර් සමාගම"ට අයථා ලෙස ලබා දීම පිළිබඳව ද විමර්ශන සිදුවෙමින් පවතී.

නාවලපිටිය මැතිවරණ කොට්ඨාශයේ වතු ජනතාව ඡන්දපොළට පැමිණීම වළක්වමින්, සෑම මැතිවරණයකදීම මැතිවරණ දූෂණයන්හි යෙදුණු මහින්දානන්ද අලුත්ගමගේ මහතා සිදු කළ මූල්‍ය අවභාවිතාවන්, දූෂිත ක්‍රියාවන්, මහජන මුදල් කොල්ලකෑම් හේතුවෙන් මේ වනවිට ඔහු සිටිය යුත්තේ සිරගෙදර වුව ද තවමත් නිදැල්ලේ සිටීම පිළිබඳව ජනතාවට ඇත්තේ බලවත් ගැටලුවකි.

## 4.02 හිටපු උසස් අධ්‍යාපන අමාත්‍ය එස්.බී දිසානායක මහතා

එස්.බී. දිසානායක යනු 1994 සිට මෙරට පාලන බලය හෙබවූ සෑම ආණ්ඩුවකම කුමන හෝ අමාත්‍ය ධුරයක් දැරූ විවිධ දූෂණ චෝදනාවලට ලක්වූ අපකීර්තිමත් හිටපු අමාත්‍යවරයෙකි. අධිකරණය විසින් දුන් තීන්දුවක් සමච්චලයට ලක් කිරීම හේතු කොට ගෙන සිරබත් කෑ මොහු උසස් අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස කටයුතු කල කාලසීමාව මෙරට උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අඳුරුම කාල පරිච්ඡේදයකි. විශ්වවිද්‍යාල සිසුන්ට පහත් ලෙස ආමන්ත්‍රණය කරමින්, ඔවුන්ට පහර දෙමින්, ශිෂ්‍ය භාවය අහෝසි කරමින්, ඔහු ගෙන ගිය මැර පාලනය තුල විශ්වවිද්‍යාල අධ්‍යාපනය අන්තයටම පිරිහී ගිය අතර, ඔහුගේ පහත් පෙලේ ක්‍රියා කලාපය මෙරට බුද්ධිමතුන්ගේ දැඩි අප්‍රසාදයට ලක්විය. සමෘද්ධි මුදලින් රුපියල් මිලියන 600 ක පමණ නිවසක් තැනූ බවට චෝදනා ලබා සිටි මොහු මෙරට මැතිවරණ ඉතිහාසයේ අපකීර්තිමත්ම මැතිවරණය වූ වයඹ මැතිවරණය මෙහෙයවූ පුද්ගලයාද වේ.

ඔහු විසින් කරනු ලැබූ රාජ්‍ය දේපළ මංකොල්ලයක් පිළිබඳ දැන් පරීක්ෂණ ආරම්භවී තිබේ. කොළඹ 07, හේවා ඇවනියු යන ස්ථානයේ අංක 11 දරණ නිවාස දේපළ වංචනික ලෙස අත්කර ගැනීම මොහුට එල්ලවී ඇති චෝදනාවයි. මෙම නිවස වෛද්‍ය ශිවා සින්නතම්බි නම් මහත්මියකට අයත්ව තිබූ අතර, 1994 මාර්තු 16 දිනැති ඇයගේ අන්තිම කැමති පත්‍රය අනුව එම නිවස කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂිකාවන්ගේ නේවාසිකාගාරයක් සඳහා පරිත්‍යාග කොට තිබුණි. ඇයගේ බෑණා වූ කුමාරාජ් චිත්‍රන්ජන් නඩරාජා නැමති අයට තම ජීවිත කාලය තුල පදිංචිව සිටීම සඳහා ජීවිත භුක්තිය තිබී ඇත. 2010 මැයි මසදී ඒ මහතා හදිසියේ මියගොස් තිබේ. ඉන්පසු නිවස සීල්තබා පොලිස්

ඊකවල් යටතේ තිබී ඇත. එම නිවස ඉන්පසුව මංකොල්ලා කා ඇති අතර, රුපියල් මිලියන 150 කටත් අධික වටිනාකමින් යුතු ඉතා පෞරාණික ලී බඩු ඇතුලු අනෙකුත් භාණ්ඩද, නඩරාජා මහතා භාවිතා කල වාහනයද පැහැරගෙන ගොස් තිබේ.

මෙම නිවස ඉන්පසුව හිටපු අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශ වියදමින් අලුත්වැඩියා කොට බාහිර පුද්ගලයින්ට ලබාදී ඇති අතර, නේවාසිකාගාරයක් ලෙස ශිෂ්‍යාවන්ට පරිහරණයට ලබාදී නොමැත. මෙම නිවසේ තිබූ දේපල මංකොල්ලාකෑමට එ.බී. දිසානායක ඇමතිවරයා සහ ඔහුගේ බිරිඳ සම්බන්ධ බවට හෙලිදරව්වී තිබේ.

මීට අමතරව කේ.බී. නඩරාජා නැමති අයකුට අයත් මිරිස්වත්තේ කුඩුමිරිස්හේන ප්‍රදේශයේ අක්කර 80 ක ඉඩම කූට ලේඛන සකසා අත්පත් කරගැනීමට උත්සාහ දරා ඇතත්, අදාළ ඉඩම සම්බන්ධයෙන් පැවති ආරවුලක් හේතුවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊට මැදිහත්වීම නිසා එය වාර්තා වී ඇත.

## 4.03 හිටපු ජන මාධ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා

කෙහෙලිය රඹුක්වැල්ල හිටපු අමාත්‍යවරයා එක්සත් ජාතික පක්ෂයේ සිට මහින්ද රාජපක්ෂගේ දෑත ශක්තිමත් කිරීමට එකතු විය. ඉන් පසුව රාජපක්ෂ රජයේ ප්‍රකාශකයා බවට පත්වූ ඔහු, රාජපක්ෂ ආණ්ඩුව විසින් සිදුකරනු ලැබූ ජනතා ද්‍රෝහි ක්‍රියාවන් ජනමාධ්‍ය ඉදිරියේ සාධාරණීකරණය කිරීම .කෙතරම් අපූරුවට සිදුකළේද යත්, කාටූන් ශිල්පින් ඔහුව කාටූන් වල සිත්තම් කරනු ලැබුවේ රෙදි අපුල්ලන්නෙකු ලෙසයි. ජන මාධ්‍ය මගින් රජයේ මඩ සේදීමේ කාර්යය ඉටුකල ඔහුගේ මූල්‍ය වංචා ඇතුලු අපචාරයන් ගණනාවක් දැන් එලිදරව් වී තිබේ.

ජාතික රූපවාහිණියේ විකාශය වන ටෙලිනාට්‍ය වලින් කප්පම් මුදල් ලබා ගැනීම සම්බන්ධව ඔහුට එරෙහිව පැමිණිලි ඉදිරිපත් වනුයේ ජනවාරි 08 දින රාජපක්ෂ පාලනය බිඳ වැටීමෙන් පසුවවේ. ලිඛිතව සහ වාචිකව පැමිණිලි ඉදිරිපත් කල ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරුන්ගේ පැමිණිලි අනුව ටෙලි නාට්‍යයක විකාශනය වන සෑම කොටසක් සඳහාම රු 50,000/- ක මුදලක් කප්පම් ලෙස ඇමතිවරයා ලබාගත් බවට චෝදනා එල්ල කර ඇත. ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරුන් විසින් මෙම කප්පම් මුදල්, හිටපු අමාත්‍ය වරයාගේ සහෝදරයකු වන එල්.එම්.බී.ඩී.රඹුක්වැල්ලගේ නමින් පවතින ලංකා බැංකුවේ ගිණුම් අංක 0002937402 ට බැර කරන තුරු එම ටෙලිනාට්‍ය විකාශනය කිරීම සඳහා අවසර නොලැබෙන බවත්, මෙම කරුණ තහවුරු කිරීමට දිවුරුම් ප්‍රකාශ වුවත් ඉදිරිපත් කිරීමට තමන් සුදානම් බවත් මෙම අධ්‍යක්ෂවරුන් ප්‍රකාශ කොට තිබේ. මෙලෙස කප්පම් ලබාදීමට සිදුවී ඇති කලාකරුවන් අතර, මීට ප්‍රථම මැතිවරණ වලදී මහින්ද රාජපක්ෂ මහතා සංවේදී නායකයකු ලෙස හඳුන්වා දෙමින් ඔහු බලයට පත්කිරීම සඳහා මෙම ඇමතිවරුන් විසින්ම යොදා ගත් කලාකරුවන් වීමද හිටපු අමාත්‍යවරයාගේ නිර්ලජ්ජිත ක්‍රියාව තේරුම් ගැනීමට සාධකයකි. මෙලෙස එක් ටෙලිනාට්‍යකින් ලබාගන්නා මුදල රුපියල් ලක්ෂ 20 ද ඉක්මවන අවස්ථා පවතින බව අනාවරණය වී තිබේ.

තවද 2015 ජනාධිපතිවරණ මැතිවරණයේදී තම පැවැත්ම උදෙසා මහින්ද රාජපක්ෂ මහතා කෙසේ හෝ දිනවීමේ ප්‍රයත්නයක මොවුන් යෙදුණේ රාජ්‍ය දේපල අමු අමුවේ අවභාවිතා

කරමිනි. ගැල්වනයිස් පයිප්ප බෙදා දීම ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාවේ කාර්යයක් නොවේ. නමුත් කෙහෙළිය ඇමතිවරයාගේ නියමයෙන් 2014 දෙසැම්බර් මස රූපවාහිණී සංස්ථාවේ මුදල්වලින් ගැල්වනයිස් පයිප්ප 600 ක් රු. 990,000 ක මුදලකට මිලට ගෙන රාජපක්ෂගේ මැතිවරණ කටයුතු සඳහා ඒවා තම මැතිවරණ කොට්ඨාශයේ ප්‍රාදේශිය සභා හා පක්ෂ කාර්යාල වලට ලබාදී ඇත. රාජපක්ෂ රජයේ කිසිදු ඇමතිවරයෙක් තම පුද්ගලික මුදල් ප්‍රචාරක කටයුතු සඳහා යොදා නොගත් අතර, ඔවුන් සෑම විටම රාජ්‍ය සම්පත් මැතිවරණ ජයග්‍රහණය සඳහා මැතිවරණ නීති අමු අමුවේ උල්ලංඝණය කරමින් යොදා ගත්තේය.

ජනාධිපති අරමුදලේ මුදලින් රුපියල් ලක්ෂ 200 ක පමණ ණය මුදලක් කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිවරයා විසින් ලබාගෙන ඇති බවත් වාර්තාවේ. නැති බැරි අහිංසකයෙකුගේ හෘද රෝග සැත්කමකට, වකුගඩුවක් බද්ද කර ගැනීමට වැනි ඉතා බරපතල ශල්‍ය කර්මයක් සඳහා රුපියල් ලක්ෂ 05 ක මුදලක් හෝ නොදෙන ජනාධිපති අරමුදලින්, ඇමතිවරුන්ට ලක්ෂ සිය ගණන් ණය ලබා දුන් බවට හෙළිදරව්වූ ප්‍රථම අවස්ථාව මෙයයි. රාජපක්ෂ රජය අත නොගැසූ මූල්‍ය සම්පතක් නොමැති බව මෙයින් පෙනීයයි.

## 4.04 අමාත්‍ය විමල් විරවංශ මහතාගේ දූෂිත ගණුදෙනු

2015 ජනවාරි 08 දින ජනතාව ප්‍රතික්ෂේප කළ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ නැවත බලයට ගෙන ඒම සඳහා දරණ ප්‍රයත්නයේ ප්‍රධාන භූමිකාව ඉටු කරනුයේ විමල් වීරවංශ හිටපු ඇමතිවරයා විසිනි. ඔහු එසේ කරනු ලබන්නේ දැනට හෙළි වෙමින් පවත්නා තමන්ගේ සහ තම භාර්යාවගේ අයථා ගණුදෙනු යටපත් කර ගැනීම සඳහා බව පැහැදිලිය.

විමල් වීරවංශ මහතාගේ හෝකන්දර පිහිටි නිවස අයත් ඉඩම සමඟ ඉඩම් කැබලි 8 ක් ශෂි විරවංශ විසින් රුපියල් මිලියන ගණනක් වැය කොට මිලදී ගත්තේ කෙසේද යන්න විමර්ශණයට භාජනය වී තිබේ. මෙම කරුණු ප්‍රසිද්ධ මාධ්‍ය වල පලවූ පසු හිටපු ඇමතිවරයා වෙනුවෙන් වෙබ් අඩවියක ප්‍රකාශ කර තිබුණේ එම ඉඩම තමා ඇමතිවරයකු වීමට ප්‍රථම මිලදී ගත් ඉඩම් බවයි. ඉඩම් කට්ටි 09 කින් යුත් මෙම ඉඩමේ ලොට් 6 සහ 8 කොටස් 2012 පෙබරවාරි 01 දින දී මිලයට ගෙන ඇති අතර, ලොට් 5 සහ 9 කොටස් 2012 අගොස්තු මස 15 දින මිලදී ගෙන තිබෙනුයේ ඔහු ඇමති ධූරයේ සිටියදීය. ඉඩම් වල ඔප්පු ලිවීමේදී, නියම වටිනාකම අඩුවෙන් දක්වා ඔප්පු පිළියල කර ඇති බවත්, එසේ සඳහන් කර ඇති වටිනාකමද රුපියල් කෝටිය ඉක්මවන බවත් තහවුරු වී තිබේ. මීට අමතරව නීතිපතිවරයා වෙත නීතීඥයකු විසින් මූලික අයිතිවාසිකම් නඩුවක් සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපියකින් කරුණු දක්වා ඇත්තේ හිටපු ඇමතිවරයාගේ බිරිඳ රුපියල් එක්කෝටි හැත්තෑ ලක්ෂයක මුදලක් සලාකා ව්‍යපාරයේ අයිතිකරුට පොලියට දී ඇති බවයි. මෙතරම් විශාල මුදල් ප්‍රමාණයක් ඒකරාශි කරගත හැකි වූයේ කෙසේද යන්න දැනට විමර්ශණය වෙමින් පවති.

තම ඇමති බලය උපයෝගී කර ගෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් මත්තේගොඩ සහ කහතුඩුව නිවාස යෝජනා ක්‍රම වල නිවාස අඩුමිලට ඥාතීන්ට ලබාදීම

ඇමතිවරයාට එල්ලවී ඇති තවත් චෝදනාවකි. මත්තේගොඩ අංක 16 දරණ නිවස, විමල් වීරවශගේ වැඩිමහල් සහෝදරියගේ ස්වාමි පුරුෂයා වන ඩබ්ලිව්. හේමසිරි නැමති පුද්ගලයකුටද, අංක 10 දරණ නිවස පී.පී.පී. ආනන්ද ප්‍රියදර්ශන නම් තම බාල සොහොයුරාටද, කහතුඩුව නිවාස යෝජනා ක්‍රමයේ අංක 35 දරණ නිවස ඔහුගේ මස්සිනා වන පී.ඩබ්ලිව්. රූපසිංහ නැමති පුද්ගලයකුටද, අංක 05 දරණ නිවස ඔහුගේ සහෝදරියකගේ පුත් වසන්ත කුමාරසිංහ නැමැත්තෙකුටද, අංක 10 නිවස අයි.එම්. රණවීර නම් ඔහුගේ නෑනාටද අංක 36 දරණ නිවස හිටපු ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂගේ ඉල්ලීම මත ජනාධිපති මාධ්‍ය අංශයට අනුයුක්තව ඇයගේ කාර්ය මණ්ඩලයේ සේවය කල මිලින්ද රත්නායක නැමති පුද්ගලයාටද ඉතා අඩුමිලට ලබාදී තිබේ. රුපියල් මිලියන 09 ක් පමණ වටිනා මෙම එක් එක් නිවසක් පවරා ඇත්තේ එයින් 1/10 ත් වඩා අඩු මුදලකට බව හෙළිදරව්වී ඇත.

විමල් වීරවංශ හිටපු ඇමතිවරයාට සමීප සම්බන්ධයක් පවතින සයුරි ඉන්ටර්නැෂනල් ආයතනයට, නිවාස අමාත්‍යාංශය යටතේ ඇති ඕෂන්ව්‍යු ගොඩනැගිල්ලේ පහත මාලය ඉතා අඩු මුදලකට බදුදීමද ඔහුට එරෙහිව ඇති තවත් චෝදනාවකි. කොළඹ ප්‍රදේශයේ මෙවැනි ගොඩනැගිල්ලක බිම් ප්‍රමාණයක  වටිනාකම මාසිකව රුපියල් ලක්ෂ 5 ඉක්මවුවද, මේ සඳහා මාසිකව අයකොට ඇත්තේ රුපියල් 50,000/- පමණක් බව හෙළිවී තිබේ.

මේ අතර ඉංජිනේරු සංස්ථාවට අලෙවි ප්‍රවර්ධකයන් ලෙස පුද්ගලයින් 43 දෙනෙකු අයථා ලෙස බඳවා ගෙන ඔවුන් තම පක්ෂයේ කාර්යයන් සඳහා යොදවා ඉංජිනේරු සංස්ථාවේ වැටුප් ගෙවා ඇති අතර, පසුගිය ජනවාරි 08 දිනෙන් පසු මෙම සේවකයන් ආගිය අතක් සොයා ගැනිමටනොහැකිව සිටී. ඇමතිවරයා සිටි කාලය තුල ඔහුට බියෙන් නිලධාරින්ට වැටුප් ගෙවා ඇති අතර, රාජපක්ෂ රජය බිඳ වැටීමෙන් පසු විමල් වීරවංශ හිටපු අමාත්‍යවරයා අනාථ වූ හෙයින් මෙම සේවක පිරිසද අතුරුදහන්වී තිබේ.

මේ ආකාරයටම අමාත්‍යාංශය යටතේ පවත්නා ඕෂන් ව්‍යු ඩිවලප්මන්ට් නැමති සමාගමටද අයථා ලෙස පත්වීම් ලබාදී තම පක්ෂයේ කටයුතු සඳහා ඔවුන් යොදවා ගෙන ඇති බවටද අනාවරණය වී ඇත.

තම අමාත්‍යාංශයට හා ඊට අනුබද්ධ ආයතනවල නිලධාරීන් සඳහා දින දර්ශන සහ කැලන්ඩර් මුද්‍රණය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව තම සහෝදරයා වන සරත් වීරවංශ හරහා ලබාගෙන ඔහුට හිතවත් නුගේගොඩ පිහිටි "ඉමාෂි ප්‍රින්ටර්ස්" නැමති ආයතනයට රුපියල් එක් කෝටි හතලිස් ලක්ෂයක ඇණවුමක් ලබාදී තිබේ. අමාත්‍යාංශ ලේකම්ගේ කාර්ය භාර්යක් වූ ටෙන්ඩර් කටයුතු වල බලය සියතට ගෙන තම හිතවතුන්ට ලබාදීම පිළිබඳව විමර්ශණ කටයුතු ආරම්භවී තිබේ.

### 4.05 හිටපු අධ්‍යාපන අමාත්‍ය බන්දුල ගුණවර්ධන මහතා

දිනේෂ් ගුණවර්ධනගේ මහතාගේ මහජන එක්සත් පෙරමුණෙන් දේශපාලනය ආරම්භ කොට එම පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වී, ඉන්පසුව විවිධ වරප්‍රසාද සඳහා වරින් වර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සහ එක්සත් ජාතික පක්ෂයට පනිමින් ද එම පැනීම

සාධාරණීකරණය කරමින් ද කටයුතු කරන බන්දුල ගුණවර්ධන හිටපු අමාත්‍යවරයා, රාජපක්ෂ පාලනය යළි ස්ථාපිත කිරීමට වෙර දරන තවත් පුද්ගලයෙකි.

හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලය වැඩි දියුණු කිරීම සඳහා ගොඩනැගිලි සෑදීමේ මුවාවෙන් මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාරය ඉදිකළ කොන්ත්‍රාත් කරුවන්ගෙන් 6% ක කොමිස් මුදල් ලබා ගෙන වංචා කිරීම පිළිබඳ චෝදනාවක් ඔහුට එරෙහිව ඉදිරිපත් වී ඇත.

මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සඳහා කොන්ත්‍රාත් පැවරීමේ දී අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් ලබා දී තිබූ අනුමැතියට පටහැනිව අධ්‍යාපන අමාත්‍යාංශය හරහා කොන්ත්‍රාත් ලබා දී ඇති බව දැන් තහවුරු වී තිබේ. අමාත්‍ය මණ්ඩල අනුමැතියේ, කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා දී ඇති නියමය වනුයේ මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය සහ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අධීක්ෂණය යටතේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඉදිකිරීම් කටයුතු සාර්ථකව නිම කර ඇති ඉක්ටාඩ් ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන්, දිස්ත්‍රික් ලේකම්වරයා විසින් තෝරාගෙන නිර්දේශ කරන කොන්ත්‍රාත්කරුවන්ට තාක්ෂණ විද්‍යාගාර ඉදිකිරීම් කටයුතු පවරන ලෙසයි.

එහෙත් මෙම තීරණයට පටහැනිව යමින්, දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිර්දේශ ලබා නොගෙන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තමන්ට හිතවත් කොන්ත්‍රාත්කරුවන්ට මෙම ඉදිකිරීම් පවරා ඇති බව දැන් තහවුරු වී තිබේ. එසේ කොන්ත්‍රාත් ලබා ගත් පුද්ගලයින්ගෙන් 6%ක කොමිස් මුදලක් ලබා ගෙන, හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ මුවාවෙන් එම මුදල් ගිණුමකට බැර කොට ඇති බවට වන පැමිණිල්ලක් දැනට විමර්ශනය වෙමින් තිබේ. රජයේ පාසැල් ඉදිකිරීම සඳහා මුදල් වෙන් කරනු ලබනුයේ අයවැය මගිනි. එසේ තිබියදීත් මෙලෙස එකතු කර ගත් රුපියල් කෝටි 44 ක් පමණ වූ මුදලකට සිදු වූයේ කුමක් ද යන්න කිසිවෙකු නොදනී.

එපමණක් නොව, ඔහු විසින්, මීට ප්‍රථම වෙළඳ හා පාරිභෝගික කටයුතු අමාත්‍ය ධූරය දරන කාල වකවානුවේ දී රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ සභාපති ලෙස පත් කරනු ලැබූ ප්‍රදීප් ගුණවර්ධන නමැති පුද්ගලයා විසින් සහල් ආනයනය කිරීමේ දී සිදු කරන ලද රුපියල් මිලියන 1,041 ක වංචාවක් පිළිබඳව ද දැනට විමර්ශනයක් සිදු වෙමින් පවතී.

මීට අමතරව මහින්දෝදය තාක්ෂණ විද්‍යාගාර සඳහා පරිගණක මිලදී ගැනීමේ දී රුපියල් කෝටි 450කට අධික මුදලක් වියදම් කර ඇති අතර, එහිදී පරිගණක සැපයීමේ සමාගම් අතුරෙන් එකක් පමණක් තෝරාගෙන සැපයුම ඔවුනට භාර දී ඇති අතර, එම පරිගණක දෝෂ සහිත බවට අනාවරණය වී තිබේ. මෙම සැපයුම සඳහා හිටපු ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා වශයෙන් අනුමැතිය ලබා දී තිබේ. රාජපක්ෂ පාලනය නැවත පිහිටුවා ගැනීමට පවතින වුවමනාව පිටුපස ඇත්තේ නිසැක ලෙසම මූල්‍ය අපරාධ වලට හසුවන ඔහුට එරෙහිව පැමිණිලි වලට අදාළ විමර්ශන වලින් ගැලවී සිටීමයි.

### 4.06 විදුලිබල හා බලශක්ති අමාත්‍ය චම්පික රණවක මහතා

පාඨලී චම්පික රණවක මහතා සැම විටම පෙනී සිටින්නේ දූෂණයට හා වංචාවට එරෙහිව විශාල හඬක් නගන ඇමතිවරයෙකු ලෙසයි. නමුත් ඔහු ඔහුගේ පක්ෂ දේශපාලනය වෙනුවෙන් තම අමාත්‍යකම භාවිතා කොට ඇති බව කිසිවෙකුත් නොදනී. ලංකා

ට්‍රාන්ස්ෆෝමර් ලිමිටඩ් හෝල්ඩිංග්ස් යනු විදුලිබල අමාත්‍යාංශය යටතේ පැවති විදුලිබල මණ්ඩලයට සම්බන්ධ රජයට අයත් සමාගම් පනත යටතේ ලියා පදිංචි කල සමාගමකි. මොහු 2011 විදුලිබල ඇමති ලෙස කටයුතු කරමින් සිටියදී 2500 සම්බුද්ධත්ව ජයන්ති උත්සව සඳහා තෝරාගත් පන්සල් 300 කට රු. 100,000/- බැගින් රු.මිලියන 30 ලබා දෙන ලෙස ලංකා ට්‍රාන්ස්ෆෝමර් සමාගමේ ප්‍රධාන විධායක යූ.ජී. ජයවර්ධන මහතාට දන්වා ඇත. මෙම පන්සල් 300 ජාතික හෙළ උරුමයට සම්බන්ධ දේශපාලන කටයුතු කරන පන්සල් බව දැන් අනාවරණය වී ඇත. රණවක මහතා උපදෙස්දී ඇත්තේ මෙම පන්සල් සඳහා මුදල් චෙක් පත් (Cash Cheque) ලියා ඒවා තම පුද්ගලික කාර්ය මණ්ඩලයට ලබා දෙන ලෙසයි. මෙහිදි මුදල් චෙක්පත් නිකුත් කර ඇත්තේ පහසුවෙන් බැංකුවෙන් මුදල් ලබා ගැනීම සඳහා වේ. මෙම චෙක්පත් ජාතික හෙළ උරුමයේ දිස්ත්‍රික් සංවිධායකවරුන්ට බෙදා දී ඇති බවත් මෙම මුදල් පන්සල්වලට නොව හෙළ උරුම සංවිධායකවරුන්ගේ මූල්‍ය අවශ්‍යතා පිරිමසා ගැනීමට යොදාගත් බවත් දූෂණ විරෝධි හඬට පැමිණිලි ලැබී තිබේ. මෙම චෙක්පත් මුදල් වී ඇති ආකාරය ලංකා ට්‍රාන්ස්ෆෝමර් ලිමිටඩ් හෝල්ඩිංග්ස් ආයතනයේ ගිණුම් පරීක්ෂාවෙන් පහසුවෙන් සොයා ගත හැකි අතර, මේ පිළිබඳව පරීක්ෂණ අරඹා ඇත. මෙම මුදල් ලබාගත් පුද්ගලයින්ගේ විස්තර බැංකු මගින් ඉතා පහසුවෙන් අනාවරණය කරගත හැකිව තිබේ.

## 4.07 හිටපු ජාතිය ගොඩනැගීමේ අමාත්‍ය රෝහිත අබේගුණවර්ධන මහතා

මොහු රාජපක්ෂ පාලනයක් යළි පිහිටුවීම තම පැවැත්ම සඳහා ඇති එකම මග ලෙස දකින සහ ඒ වෙනුවෙන් මාරාන්තික අරගලයක යෙදෙන තවත් හිටපු දූෂිත ඇමතිවරයෙකි. ඔහුට අයත්ව පවතින රුපියල් මිලියන 450කටත් අධික (ලක්ෂ 4500) වත්කම් ඔහු උපයා ගත්තේ කෙසේද යන්න සොයාගැනීම සඳහා අල්ලස් කොමිසම හමුවට කැඳවන ලද අවස්ථාවේදී නයෙකු දෂ්ට කළ බව කියමින් පරීක්ෂණ මග හැරිය බව මුළු රටම දන්නා කරුණකි. මොහුට විරුද්ධව පැමිණිලි විමර්ශනය කළ අල්ලස් කොමිසමේ නිලධාරීන් දෙදෙනෙකු රාජපක්ෂ පාලනය විසින් ස්ථාන මාරු කර තිබුණු අතර ,එක් නිලධාරියෙකු වව්නියාවේ මුරපොලක බංකරයක සේවයට යොදවා තිබූ අතර අනෙක් නිලධාරියා පොලිස් මුලස්ථානයට අනුයුක්ත කොට තිබුණි. ඔවුන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොණු කළ මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට අවසරදී තිබුණි .

රාජපක්ෂ පාලනය නැවත පිහිටුවීමට හැකිවුවහොත් රුපියල් මිලියන 450ක මුදල උපාය ගත්තේ කෙසේද යන්න හෙළිදරව් කිරීම අවශ්‍ය නොවන නිසා ඔහු රාජපක්ෂ නැවත බලයට ගෙන ඒම සඳහා විශාල ප්‍රයත්නයක් දරයි.

## 4.08 හිටපු මහජන සම්බන්ධතා අමාත්‍ය මර්වින් සිල්වා මහතා

පසුගිය රාජපක්ෂ පාලනයේ මැරකම්, කප්පම් ගැනීම් සහ දූෂණ ක්‍රියාවලට නම්දරා සිටි ඇමතිවරයකු වූ මර්වින් සිල්වා මහතා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ අග්‍ර පුරෝහිතයකු විය. ඔහු විසින් සිදුකල මැර ක්‍රියා අතර, ජාතික රූපවාහිණියට කඩා වැදි එහි නිලධාරීන්ට පහරදීම, සිරස මාධ්‍ය ආයතනයට මැරයන් යොදා ප්‍රහාර එල්ල කිරීම සහ රජයේ සේවකයකු ගස්බැඳිම, නාගරික මන්ත්‍රීවරයෙකු ඝාතනය පිළිබඳ එල්ල වූ චෝදනා,

මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ වීම මෙරට මහත් ආන්දෝලනාත්මක සිදුවීම් වූ අතර, මොහුගේ රාජපාක්ෂික භාවය කොතරම්ද යත්, හිටපු ජනාධිපතිවරයා අවම වශයෙන් ඔහුට අවවාදයක් හෝ නොකර, තනතුරු සහ වරප්‍රසාද තව තවත් ලබාදෙමින් ඔහුව දිරිමත් කරන ලදි. ඇමතිවරයා මෙන්ම ඇමතිවරයාගේ පුතාද රටේ ප්‍රසිද්ධ චරිතයක් විය. හමුදා බුද්ධි අංශ නිලධාරීන්ට පහර දී තම පියාගේ දේශපාලන බල පුළුවන්කාරකම උපයෝගී කර ගෙන එම වරද ඔවුන් පිට පැටවීම, විදේශිකයන්ට පහර දීම, මත්ද්‍රව්‍ය චෝදනා මොහුට එල්ල වූ චෝදනා විය. නමුත් මේ එකදු චෝදනාවක් පිළිබඳ හෝ නිසි විමර්ශන සිදු නොවුණ අතර රාජපක්ෂ පාලනයේ ලිහා දැමූ බල්ලා මෙන් මෙම ඇමතිවරයා හැසිරෙන්නට විය.

හිටපු ජනාධිපතිවරයාගේ රැකවරණය පිළිබඳව ඔහුට ලැබුණු සහතිකය මත කප්පම් මුදල් ලබා ගැනීම සහ දේපල අයථා ලෙස අත්පත් කර ගැනීම සිදුවූ අතර, එයින් එක් සිද්ධියක් වනුයේ කොළඹ 07, බාන්ස් පෙදෙසේ අංක 43 නැමති වත්තේ පදිංචිව සිටි සිංහල හා දෙමළ පවුල් බලහත්කාරයෙන් ඉවත් කොට සිදුකල ඉඩම් මංකොල්ලයයි. පර්චස් 158 ක් වූ එම ඉඩමේ, එදිනෙදා සුළු රැකියාවක් කර ජීවිකාව සරිකරගත් අහිංසක ද්‍රවිඩ සහ සිංහල වැසියන් පදිංචිව සිටි අතර, හිටපු ජනාධිපති ආර්යා ශිරන්ති රාජපක්ෂට අයත් කාල්ටන් පෙර පාසල සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට බව පවසමින් එම පවුල් බලහත්කාරයෙන් ඉවත් කොට , ඉඩම විශාල මුදලකට විකිණීමට කටයුතු කිරීම මොහුට ඇති චෝදනාවයි. මෙමගින් රුපියල් ලක්ෂ 1100 ක් ඔහු විසින් උපයා ගැනීමට උත්සහ දරණ බවට චෝදනා එල්ල වී තිබේ.

## 4.10 හිටපු සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

එතනෝල් බලපත්‍රලාභී අමාත්‍යවරයකු වූ ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාට තැබෑරුම් බලපත්‍රද තිබේ. ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු අමාත්‍යවරයා එක්සත් ජාතික පක්ෂයේ සිට මහින්ද රාජපක්ෂගේ දෑත ශක්තිමත් කිරීම සඳහා එම රජයට එකතු වූවෙකි. හිටපු ජනාධිපතිවරයා ඝාතනය කිරීම සඳහා එල්.ටී.ටී. සංවිධානය සමඟ කුමන්ත්‍රණය කලේ යැයි චෝදනා ලබා සිටි ඔහු එම චෝදනා වලින් ගැලවීම සඳහා රජයට එකතු වූ බව ඒ දිනවල සමාජ ගතවිය. ඔහු යටතේ ක්‍රියාත්මක වූ ලංකා සතොස, වී අලෙවි මණ්ඩලය, සමුපකාර සංවර්ධන අරමුදල යන ආයතන වල දූෂණ වංචා විශාල ප්‍රමාණයක් සිදුවී ඇති අතර, ඔහු විසින් ලංකා සතොස ආයතනයේ භාණ්ඩ මැතිවරණ ප්‍රචාරණය සඳහා ලබා ගෙන මුදල් නොගෙවීමට අදාළ විමර්ශණයේදී රිමාන්ඩ් බන්ධනාගාර ගතවිය. වයඹ ඩිස්ටිලරිස් නම් මත්පැන් නිෂ්පාදනාගාරය හරහා සිදුවූ වංචා වලට මොහුගේ නමද සම්බන්ධවී තිබේ. හිටපු ඇමතිවරයා සිදුකර ඇති වංචා සහ දූෂණ වලට අදාල විමර්ශණ මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

මොහුගේ පාලනය යටතේ, මෙරට ජනතාවගේ ජීවිත සමඟ ගැටගැසී ඇති සමුපකාර ව්‍යාපාරයට සිදුකරන ලද හානිය ඉතා බරපතල වේ. 2011 වර්ෂයේදී " ඉසුරු සවිය" නමින් වූ ප්‍රදර්ශණයක් සමුපකාර අරමුදලින් පවත්වා තිබුණි. වියදම රුපියල් මිලියන 167 කි. එනම් රුපියල් ලක්ෂ 1670 කි. හිටපු ඇමතිවරයාගේ කාර්ය මණ්ඩලය විසින් ටෙන්ඩර් කටයුතු වලට මැදිහත් වෙමින් විවිධ වංචා සිදුකර තිබෙන බවට සාක්ෂි සහිතව පැමිණිලි ලැබී තිබේ.

ප්‍රදර්ශණයක් පැවැත්වීමේදී ඒ සඳහා සුදුසු ස්ථානයක එය පැවැත්වීම සමාන්‍ය. ක්‍රමය වුවත්, මෙම ප්‍රදර්ශණය පැවැත්වීම සඳහා කුරුණෑගල මාලිගාපිටිය හා වෙලගෙදර ක්‍රීඩාංගන දෙක රුපියල් මිලියන 67 ක් වියදම් කර අලුත්වැඩියා කර තිබීම තුල විශාල වංචාවක් සිදුකර තිබේ. මෙම උත්සවය සඳහා මාධ්‍ය ප්‍රචාරයට පමණක් රුපියල් මිලියන 20 ක් වියදම් කර ඇති බවත්, එයින් වැඩි කොටසක් වංචාකර ඇති බවත්, හිටපු ඇමතිවරයාගේ හිතවතුන් වන චමින්ද නැමැත්තාගේ කටුපොත ආසනයේ පවතින නොවටිනා නිවසක් රුපියල් මිලියන 20 කට නීති විරෝධී ලෙස රජයේ මුදල් යොදවා මිලදී ගෙන එය මැතිවරණ කටයුතු මෙහෙයවන මධ්‍යස්ථානයක් ලෙස පාවිච්චි කොට ඇති බවත්, තවත් එවැනිම හිතවතකුගේ මහනුවර අනිවත්ත ප්‍රදේශයේ නිවසක් රුපියල් මිලියන 20 ක් රජයේ මුදල් වැය කොට මිලදි ගෙන ඇති බවත් හිටපු අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් වූ චම් බස්නායක නැමැත්තා සභාපතිවරයා වන සමුපකාර සමිතියට නීති විරෝධී ලෙස රුපියල් මිලියන 20 ක් ලබාදි ඇති බවත් පැමිණිල්ලේ සඳහන්වේ. මෙම උත්සවය සඳහා වියදම් කල රුපියල් මිලියන 167 ක මුදලින් වැඩි ප්‍රමාණයක් ව්‍යාජ බිල්පත් සකසා වංචා කර ඇති බව පැමිණිල්ලේ සටහන් වේ. 2015 ජනාධිපතිවරණය හා ඒ ආශ්‍රිත ප්‍රචාරක කටයුතු වෙනුවෙන් සමුපකාර අරමුදලේ සහ සමුපකාර අතිරික්ත අරමුදලේ මුදල් රුපියල් මිලියන 58.7 ක් යොදා ගෙන ඇති බවද එම අරමුදල් වලින් කුරුණෑගල හා නිකවැරටිය ප්‍රදේශවල පාසැල් 02 ක් සඳහා තවත් රුපියල් මිලියන 26.6 ක් ලබා දීම, රාජපක්ෂ පාලනයේ හිතවතුන් වන මහානාම රාජමන්ත්‍රී හා ආරිය රූබසිංහ යන අයවලුන් ඇමතිවරයාගේ උපදේශකයන් ලෙස බඳවා ගෙන රුපියල් මිලියන 03.9 ක් එම අරමුදල් වලින් ගෙවා ඇති බවටද තවත් පැමිණිල්ලක සඳහන් වේ.

ඔහුගේ අමාත්‍යාංශයේ පාලනය යටතේ පැවති වී අලෙවි මණ්ඩලය, සහල් බවට පත්කිරීම සඳහා මෝල් හිමියන්ට වී තොග ලබාදී ඇති අතර, ඔවුන් විසින් ආපසු ගෙවා නොමැති සහල්වල වටිනාකම පමණක් රුපියල් කෝටි 8.8 කි. වී අලෙවි මණ්ඩලයේ සමාන්‍යාධිකාරි සහ අනෙකුත් තනතුරු සඳහා සුදුසුකම් නොමැති නිළධාරින් පත්කිරීම හරහා පරිපාලනයේ සිදුවූ බිඳවැටීමට අමතරව එක්සත් අරාබි එමීර් රාජ්‍යයට සහල් මෙට්‍රික් ටොන් 22950 ක් අපනයණය කිරීමේදී සිදුවී ඇති වංචාවන් හේතුකොට ගෙන රුපියල් මිලියන 1014 ක අලාභයක් වී අලෙවි මණ්ඩලයට සිදුවී තිබේ. පෞද්ගලික මෝල් හිමියන්ට වී තොග නිකුත් කිරීමේදී, පිලිගත් පටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම නිසා විශාල ආදායමක් අහිමිවී ඇති බව විගණන වාර්තා වලින්ද හෙලිදරව් කොට තිබේ. සතොස ආයතනයට අවිධිමත් ලෙස සහල් සැපයීමෙන් සිදුවී ඇති අලාභය රුපියල් මිලියන 658.06 කි. සතොස සභාපතිවරයා ලෙසට එරාජ් ප්‍රනාන්දු නමැති තම ඥාති සහෝදරයා පත් කරවා ගත් අතර එම පාලන කාල සීමාව තුළ ලොකු එණු මිලදී ගැනීම, අර්තාපල් මිලදී ගැනීම යනාදී ගනුදෙනුවල විශාල අක්‍රමිකතා මගින් සතොසේ මුදල් මිලියන ගණනින් විනාශ කර ඇත. සහල් ආනයනය කිරීම, පරිභෝජනයට නුසුදුසු සැමන් ආනයනය කිරීම හා ඩිමෝ බටිටා ලොරි රථ මගින් ජංගම අලෙවි කටයුතු සිදු කිරීම වැනි ගනුදෙනු මගින් සතොසේ මුදල් මිලියන ගණනින් කබාසිනියා කර ඇත. මෙම දූෂිත ගනුදෙනුවලින් ජොන්ස්ටන්ගේ හොර රංචුව උපයාගෙන ඇති මුදල් වලින් විශාල දේපල ප්‍රමාණයක් අත්පත් කර ගෙන ඇති බවට සතොස සේවකයන් විසින්ම චෝදනා එල්ල කර ඇත. එසේ හොරකම් කර ගන්නා ලද මුදල් වලින් කොටසක් ජොන්ස්ටන්ගේ සාක්කුවට එය නොගිය බවට සහතික විය හැකිද?

තම විෂය පථය යටත් පැවති ආයතන සියල්ල කාබාසිනියා කරමින්, ඒවායේ සම්පත් මංකොල්ල කමින් සහ අයථා පරිහරණය කරමින් කටයුතු කල ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු ඇමතිවරයාට, රාජපක්ෂ පාලනය නැවත බිහිකර ගැනීම හැර මෙම අපරාධ වලින් ගැලවීමේ වෙනත් විකල්පයක් නොමැත.

## 4.11 විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී සජින් ද වාස් ගුණවර්ධන මහතා

විදේශ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී ලෙස මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් පත්කරන ලද සජින් ද වාස් ගුණවර්ධන මන්ත්‍රී වරයා මෙරට බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් ක්‍රිස්නෝනිස් මහතාට පහරදීම හේතුකොට ගෙන ජාත්‍යන්තර අපකීර්තියට පත්වූ පුද්ගලයකි. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ සමීපතම පුද්ගලයකු වූ මොහු විසින් සිදුකරන ලද අති විශාල මූල්‍ය වංචා පිළිබඳව විමර්ශණ දැනටමත් සිදුවෙමින් පවතී. දේශපාලනයට ඒමට පෙර සාමාන්‍ය ජීවිතයක් ගත කළ මොහු දේශපාලනයට පැමිණීමෙන් පසු පුද්ගලික ගුවන් යානා තමන් සන්තක කර ගැනීමට තරම් වත්කම් උපයා ගෙන ඇති බවට චෝදනා එල්ල වේ. ජනාධිපති කාර්යාලයේ වාහන 20 ක් අයථා ලෙස පරිහරණය කල සිදුවීමකට අදාළව රිමාන්ඩ් බන්ධනාගාර ගතකරන ලද ඔහුට එරෙහිව විවිධ මූල්‍ය අපරාධ පිළිබඳ චෝදනා එල්ලවී තිබේ.

හිටපු මන්ත්‍රී වරයා විසින් සමාගම් විශාල ප්‍රමාණයක් පවත්වාගෙන ගොස් ඇති අතර, ඒ සෑම සමාගමක්ම මහජන මුදල් වංචා කිරීමට සම්බන්ධවේ. ඔහු මිහින් ලංකා ආයතනයේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබුයේ හිටපු ජනාධිපතිවරයා විසිනි. එහි සිටියදීම ඔහු කොස්මෝස් එවියේෂන් නමින් සමාගමක් පිහිටුවන ලදි. එය ගුවන් නියමුවන් පුහුණු කිරීමේ ව්‍යාපාරයක් වූ අතර, එය පවත්වාගෙන යනු ලැබුවේ රත්මලාන ගුවන් තොටුපලට අයත් ගොඩනැගිල්ලක් තුලය. එම සමාගම ගුවන් නියමුවන් පුහුණු කිරීම සඳහා පාඨමාලා පවත්වන මුවාවෙන් එක් අයකුගෙන්. රුපියල් ලක්ෂ 13 බැගින් අයකොට අදාල පුහුණුව ලබා නොදී, විශාල පිරිසකගේ මුදල් වංචා කිරීම පිළිබඳව, පුහුණුව ලැබීමට මෙම ආයතනයට මුදල් ගෙවූ දරුවකුගේ පියකු විසින් කල පැමිණිල්ලක් දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශණය වෙමින් පවතී. ගමන් වාර 45 කින් පුහුණුව සමන්විත වන බව සඳහන් කොට ඉහත මුදල අයකල සජින් වාස්ගේ සමාගම, ගමන් වාර 03 ක් පමණක් පුහුණු පහසුකම් ලබාදී පැහැර හැරීම නිසා ආයතනයට මුදල් ගෙවන ලද දරුවන් විශාල පිරිසකට මුදල් හා පුහුණුව අහිමිවී තිබේ. මීට අමතරව මහනුවර දිගන වික්ටෝරියා ක්ලබ් හි පිහිටි නිවසක් මිලදී ගැනිමේදී එහි අයිතිකරුට රුපියල් ලක්ෂ 239 ක් ගෙවීම පැහැරහැරීම පිලිබඳවද මොහුට චෝදනා එල්ලවී තිබේ. එම පැමිණිල්ලද විමර්ශණ සඳහා පොලිස්පති වෙත යොමුවී තිබේ. මෙම ගණුදෙණුව සිදු කිරීමේදී සජින්වාස්ට හිමි කොස්මෝස් සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂ වජිර කාලිංග අබේගුණවර්ධන නැමති පුද්ගලයකු මැදිහත්වී ඇති බව ද අනාවරණයවී තිබේ.

## 4.12 හිටපු කම්කරු අමාත්‍ය අතාවුද සෙනවිරත්න මහතා

හිටපු අමාත්‍ය අතාවුද සෙනවිරත්න, වරකාපොල පිහිටි ජල ව්‍යපෘතියකට විරෝධය පල කොට, එහි දේපල විනාශ කරනු ලැබුයේ මීට කලකට ඉහතදීය. මේ පිළිබඳව පැවති නඩු විභාගයේ දී 2015 පෙබරවාරි මස 11 දින ඔහු ඊට වරද පිළිගත් අතර රුපියල් ලක්ෂ 8ක් අලාභ වශයෙන් ගෙවීමට අධිකරණයේ දී පොරොන්දු විය. ඔහු විදේශ රැකියා පිළිබඳව ඇමතිවරයාව සිටියදී ,කොරියාවට ශ්‍රමිකයන් යැවීම පිළිබව සිදුවී තිබූ අක්‍රමිකතා විශාල ප්‍රමාණයකට චෝදනා එල්ල වූ පුද්ගලයෙකි.

ශ්‍රී ලංකා කැනඩා රැකියා ව්‍යාපෘතියේ අක්‍රමිකතා සම්බන්ධයෙන් ද ඔහුට චෝදනා එල්ල වී තිබේ. මෙම ව්‍යාපෘතිය මහින්ද චින්තනය යටතේ ආරම්භ කල ව්‍යාපෘතියකි. ශ්‍රී ලංකා කැනඩා රැකියා පුහුණු ව්‍යාපෘතිය ලෙස ප්‍රසිද්ධ දැන්වීම් පල කොට තරුණ තරුණියන් 1000 ක් අතුරින් තෝරාගත් 74 දෙනෙකුගෙන් එක් අයකුගෙන් රු. 813,500/- බැගින් ගාස්තු අය කොට 08 දෙනෙකුට පමණක් රැකියා ලබා දී ඉතිරි 66 දෙනාගේ රුපියල් මිලියන 53 ක් ආපසු නොගෙවා වංචා කිරීම යටතේ ඇමතිවරයාට සහ තවත් අයට චෝදනා එල්ල වී තිබේ. මුදල් ගෙවූ සියලුම දෙනාට කැනඩාවේ රැකියා ලබා දෙන බව පොරොන්දු වී ඔවුන්ගේ මුදල් වංචා කිරීම පිළිබඳව දැනට විමර්ශන කටයුතු සිදු වෙමින් පවතී. මීට සෘජුවම වගකිව යුතු පුද්ගලයා නිතීඥ ඉන්දික ජයසූරිය වන අතර, අමාත්‍ය වරයාගේ වක්‍ර මැදිහත්වීම මත මෙම මූල්‍ය වංචාව සිදුවූ බව පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන්වේ.

## 4.13 හිටපු විදේශ අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම මහතා

චන්ද්‍රසේකර රෝහිත බණ්ඩාර බෝගොල්ලාගම මහතා එක්සත් ජාතික පක්ෂයේ සිට මහින්ද රාජපක්ෂගේ දෑත ශක්තිමත් කිරීමට එකතුවූ තවත් පුද්ගලයකි. රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමත්, මෙරට, ජනතාවගේ බදු මුදලින් රජසැප විඳීමත් පිළිබඳ අපකීර්තිමත් ඉතිහාසයක් මොහුට තිබේ.

මොහු ව්‍යවසායක සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා ලෙස කටයුතු කරන සමයේ බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවර " ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය සහ කැඳවුම්කරුවන්ගේ හමුව" ට සහභාගි වී ඇත්තේ තමාට අයිති නොවන වෙනත් රජයේ සේවකයකු සහභාගි විය යුතු අවස්ථාව තමා ලබා ගනිමිනි. එහිදී රාජ්‍ය සේවකයකුගේ විදේශ සංචාර වලදී භාණ්ඩාගාර චක්‍රලේඛ අංක එම්.එෆ් 6/1/1/96 ට අනුව ලබාදෙන මුදලට වඩා රුපියල් 376.196.62 ක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති හරහා නිතී විරෝධි ලෙස ලබාගෙන ඇත. පසුව මොහු නවාතැන් ගෙන ඇත්තේ ලන්ඩන් නුවර පාර්ක් ලේන් හිල්ටන් හෝටලයේය. එහි රු 1,170,111.59 ක බිලක් නොගෙවා පලා ගොස් ඇති අතර එම බිල උක්ත චක්‍රලේඛ 6/1/1/96 චක්‍රලේඛයට පටහැනිව ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හරහා ගෙවා ඇත. ලද පැමිණිල්ල අනුව විමර්ශණ අවසන් කොට මොහුට විරුද්ධව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති බවට තොරතුරු අනාවරණය වේ.

## 4.14 නැවත පදිංචි කිරීමේ හිටපු අමාත්‍ය ගුණරත්න වීරකෝන් මහතා

නැවත පදිංචි කිරීමේ නියෝජ්‍ය අමාත්‍ය වරයාව සිටි එවකට කරන්දෙණිය ආසන සංවිධායක ලෙස කටයුතු කල ගුණරත්න වීරකෝන්ට එරෙහිව චෝදනා ගණනාවක් සම්බන්ධව පැමිණිලි ඉදිරිපත්ව තිබේ. කරන්දෙණිය ආසනයට අයත් කොහිලවතුර නම් අක්කර 200 ක් පමණ පොල් ඉඩම රජයට අත්කර ගැනීමෙන් පසු එහි තිබූ වටිනා දැව ඉවත්කර ගැනීම. එම ඉඩමෙන් අක්කර 5ක් හිතවතෙකුට ලබාදීම, තවත් අක්කර 5 ක ප්‍රණමාණයක් හිටපු නියෝජ්‍ය ඇමතිවරයාට හෝටලයක් ඉදිකිරීම සැළසුම් කොට මාදු ගඟේ සිට අනවසර ඇළක් කැපීම. එම ඇළ කැපීමේදී අනවසර වැලි ජවාරම් කිරීමට ඉඩ ලබාදීම ඇතුළු අක්‍රමිකතා ගණනාවක් සම්බන්ධයෙන් චෝදනා එල්ලවී තිබේ.

## 4.15 සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසායකත්ව සංවර්ධන හිටපු අමාත්‍ය ඩග්ලස් දේවානන්ද මහතා

ඩග්ලස් දේවානන්ද හිටපු අමාත්‍යවරයා පසුගිය මහින්ද රාජපක්ෂ රජයේ රාජ්‍ය බලය සමඟ අවි බලයද , මැර බලයද එකලෙස යොදා ගනිමින් කටයුතු කල ඇමතිවරයෙකි. උතුරේ යුධ ගැටුම් නිමාවට පෙර සිටම පැවති මෙම තත්වය ඉන්පසුව වඩාත් බරපතල වූ අතර, මැර බලය මගින් මහජනයා තලාපෙලා මුදල් එකතු කිරීමට අදාළ චෝදනා මොහුට විරුද්ධව ඉදිරිපත්වී තිබේ.

ඔහුට විරුද්ධව පවතින යාපනයේ ලොරි රථ හිමියන්ගේ සමුපකාර සංගමයෙන් කප්පම් ලබා ගැනීමට අදාළ පැමිණිල්ල දැනටමත් විභාග වෙමින් තිබේ. 1972 වර්ෂයේ පමණ සිට ක්‍රියාත්මක මෙම සංගමයේ සමාජිකයන්ගෙන් 2010 වර්ෂයේ සිට රු 5000/- බැගින් කප්පම් ගැනීමත්, ඔවුන් විසින් ප්‍රවාහනය කරන සෑම වැලි ලොරියකින්ම රු. 300/- ක මුදලක් කප්පම් ලෙස ලබා ගැනීමත් පිළිබඳව එම සංගමය පැමිණිලි කොට ඇති අතර, 1143 දෙනෙකුගෙන් යුත් තම සමාජිකයන්ගෙන් මෙලෙස මුදල් අයකොට හිටපු අමාත්‍යවරයාට අයත් " මහේෂ්වරි පදනම" යන ආයතනයේ ගිණුමට එකතු කොට තිබේ. මෙලෙස රුපියල් කෝටි 2 කට අධික මුදලක් තැන්පත් කරගෙන ඇති බව පැමිණිල්ලේ සඳහන් කර තිබේ.

එපමණක් නොව පේදුරුතුඩුව ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා විසින් කරනු ලැබූ පැමිණිල්ලක සඳහන් වනුයේ 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය අතර කාලය තුල යාපනය ප්‍රදේශයේ රජයේ ඉඩම් වල පවතින වැලි ප්‍රවාහන බලපත්‍ර ලබා ගැනීමේදී ඇමතිවරයා විසින් කප්පම් ලෙස මුදල් අයකර ඇති බවයි. එම මුදල් මහේෂ්වරි පදනමට තැන්පත් කිරීමට අදාළ රිසිට්පත ප්‍රාදේශිය ලේකම් වෙත ඉදිරිපත් කරන අයට පමණක් වැලි නිධි ඉවත්කර ගැනීමේ බලපත්‍ර නිකුත් කල බවත් මෙසේ වැලි ඉවත් කිරීමේදී, පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබාගෙන නොමැති බවත්, ප්‍රාදේශිය සභාවේ අවසරය ලබාගෙන නොමැති බවත්, පවසන ප්‍රාදේශිය සභා සභාපතිවරයා, රුපියල් කෝටි ගණන් කප්පම් ලෙස ඇමතිවරයා උපයාගෙන ඇති බවට පැමිණිලිකර ඇත.

එමෙන්ම ඩග්ලස් දේවානන්ද විසින් යාපනයේ ස්ට්‍රැන්ලි පාරේ ජදිංචි නිත්‍යානන්දන් මහතාට අයත්ව තිබූ රුපියල් කෝටි ගණනක් වටිනා ශ්‍රීදර් නම් සිනමා ශාලාව වසර ගණනාවක සිට මේ දක්වා බලහත්කාරයෙන් අත්පත් කරගෙන සිටී. මේ පිළිබඳව අයිතිකරුවන් යාපනය දිසාපතිවරයාට පැමිණිලි කලද ඉන් පළක්වී නොමැති බව වාර්තාවේ. මහින්ද රාජපක්ෂගේ සෑම ඇමතිවරයෙක්ම තමාගේ බඩ වඩා ගැනීම සඳහා කිසිදු හිරිකිතයකින් තොරව පොදු දේපළ සාවද්‍ය සාපරාධී පරිහරණය කරන අතර ඉන් නොනැවතී ජනතාවගේ පෞද්ගලික දේපල පවා බලහත්කාරීව අත්පත්කරගෙන සිටී.

## 4.16 හිටපු ප්‍රවාහන අමාත්‍ය කුමාර වෙල්ගම

පාර්ලිමේන්තුව තුළ සහ ඉන් පිටත සිදු කරන ප්‍රසිද්ධ කථාවලදී තමන්ට අවධානය ලබා ගැනීම සඳහා තම මුග්ධ බව ප්‍රදර්ශනය කරමින් තමන් සල්ලාලයකු බවට ඇඟවෙන අයුරින් කටයුතු කරන හිටපු අමාත්‍යවරයා ද රාජපක්ෂ පාලනය නැවත බිහිකරවා ගැනීම

සඳහා වෛර දරණ පුද්ගලයෙකි. තම පෞද්ගලික ජීවිතයේ පවතින කිසියම් අඩුපාඩුවක් හේතුකොට ගෙන දැඩි ස්ත්‍රී ලෝලියෙකු ලෙස ඔහු කරන ප්‍රකාශ පිළිකුල්සහගත වේ.

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සඳහා බස් රථ අමතර කොටස් ගෙන්වීමේදී තීරු බදු රහිතව ගෙන්වීමට ලබා දී තිබූ සහනය උපයෝගී කර ගෙන එම අමතර කොටස් ගෙන්වා බෙදාහැරීමේ දී සිදු කල මහා පරිමාණ වංචා හා දූෂණ පිළිබඳව ඔහුට චෝදනා එල්ල වී තිබේ. ගමනා ගමන මණ්ඩලයට අමතර කොටස් මිලදී ගැනීමේ දී එම ඇණවුම් බස් රථ නිෂ්පාදනය කරන ටාටා හා ලේලන්ඩ් ආයතනවලින් මිලදී නොගෙන අමාත්‍යවරයාට හිතවත් සමාගම් වෙත ලබා දී ඇති බව පැමිණිලිවලින් තහවුරු වේ.

අමතර කොටස් සැපයීම සඳහා ඇණවුම් ලබා දෙන මෙම සමාගම් වනුයේ ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගම සහ අයිඩියල් මෝටර්ස් නැමැති සමාගම් වේ. අයිඩියල් මෝටර්ස් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වනුයේ කුමාර වෙල්ගම මහතාගේ සහෝදරයෙකු වන නලින් වෙල්ගම වේ සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ පවතින ලේඛන අනුව මෙය තහවුරු වේ. එමෙන්ම එම රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලේඛන අනුව ස්ටීල් ඉම්පෙක්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් සමාගමේ ලාභාංශ, අයිඩියල් මෝටර්ස් සමාගමට බැරවිය යුතු බවට ලිපිලේඛන පවතී. ඒ අනුව මෙම සමාගම් දෙකම කුමාර වෙල්ගමගේ ලඟම ඥාතීන්ට අයත් සමාගම් වේ. ගමනාගමන මණ්ඩලයේ සභාපති ශමී වෙල්ගම, ඇමති කුමාර වෙල්ගම හා සමාගමේ අධ්‍යක්ෂ නලින් වෙල්ගම එකතු වී අමතර කොටස් වැඩි මිලට ලංකා ගමනා ගමන මණ්ඩලයට අලෙවි කොට මහජන මුදල් ගසාකෑම පිළිබඳව දැනට විමර්ශණයක් ආරම්භ වී තිබේ. කුමාර වෙල්ගමට මහින්ද රාජපක්ෂගේ උදව්ව අවශ්‍යවනුයේ ඒ මර උගුලෙන් ගැලවීම සඳහාය.

## 4.17 හිටපු විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍ය ඩිලාන් පෙරේරා මහතා

මෙවර රාජපක්ෂ කල්ලියට ජාතික ලැයිස්තුවෙන් නම් කොට ඇති ඩිලාන් පෙරේරා හිටපු අමාත්‍යවරයා විදේශ රැකියා ප්‍රවර්ධන විෂයභාර අමාත්‍යවරයා විය. විදේශ රැකියා වල නියුතු ශ්‍රමිකයින් වෙනුවෙන් පිහිටුවා ඇති විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඔහු යටතේ පාලනය වූ ආයතනයකි. රට විරුවන්ගේ සුභ සාධනය වෙනුවෙන් යැයි පවසමින් විවිධාකාර වැඩසටහන් සංවිධානය කරමින්, ඒ තුලින් විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ මුදල් මංකොල්ලකෑම පිළිබඳව විගණකාධිපතිවරයා විසින් පිටු 68කින් යුත් විගණන වාර්තාවක් නිකුත් කරනු ලැබුවේ පසුගිය ජුනි මස 16 වන දිනදී ය. එම වාර්තාව මගින් හෙළිදරව් කර ඇති තොරතුරු අනුව ඔහු විසින් සිදු කර ඇති මුදල් වංචාවන් විශාල ප්‍රමාණයක් පවතින අතර, පසුගිය කාලයේ මීරියබැද්ද නායයාමෙන් විපතට පත්වූවන්ට සහන සැලසීමේ මුවාවෙන් සිදු කරන ලද මුදල් වංචාවන් ද ඊට ඇතුළත් වේ.

ඔහුට එල්ල වී ඇති චෝදනා අතර, විදේශ රැකියා පිලිබඳ දැනුවත් කිරීම සඳහා පාගමන් පැවැත්වීමට වියදම් කළ රුපියල් ලක්ෂ 91ක මුදල් කූට ලේඛන මගින් වංචා කිරීම, කූට ලේඛන පිළියෙළ කොට ඩිලාන් පෙරේරා පදනමට රුපියල් මිලියන 1.6 ක මුදලක් ලබා ගැනීම, රටවිරු පවුල් වල සාමාජිකයින්ට සෙත්පතා පින්කම් පවත්වන මුවාවෙන් 2015

ජනාධිපතිවරණ ප්‍රචාරක රැස්වීම් සඳහා රුපියල් මිලියන 3.5 ක් වැය කිරීම, 2014 දෙසැම්බර් මස නායයාම නිසා හාලිඇල ප්‍රදේශයේ අවතැන් වූ රටවිරු පවුල් වලට සහන සැලසීමේ මුවාවෙන් රුපියල් මිලියන 3.9 ක් වංචනික ලෙස වියදම් කිරීම, හාලිඇල සම්පත් මධ්‍යස්ථානයට මුල්ගල තැබීම සඳහා පමණක් රුපියල් මිලියන 9.5ක් වැය කළ බවට කූට ලේඛන පිළියෙළ කොට මුදල් වංචා කිරීම, 2014 වර්ෂයේ පාසැල් පොත් හා උපකරණ කට්ටල බෙදාදීම සඳහා බව පවසමින් කූට ලේඛන පිළියෙළ කොට රුපියල් මිලියන 9.5ක් වංචනික ලෙස වියදම් කිරීම ද, මීරියබැද්ද විපතට පත් පවුල් වලට සහන සැලසීම සඳහා ලබා ගත් රුපියල් ලක්ෂ 10 ක මුදලින් වංචා කිරීම ද ඇතුළු වංචනික ක්‍රියා විශාල ප්‍රමාණයක් පවතී.

මෙම මුදල් වංචා වලදී, ඩිලාන් පෙරේරා හිටපු අමාත්‍යවරයා සභාපති ධුරය දැරූ වොලිබෝල් සම්මේලනයේ ලේකම් වූ ද, හිටපු අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් වරයා වූ ද සුසිල් රණසිංහ නමැති පුද්ගලයා ද සම්බන්ධව ඇති බව විගණන විමසුමෙන් හෙළිදරව් කර තිබේ. වොලිබෝල් සම්මේලනය කූට ලේඛන පිළියෙළ කොට ක්‍රීඩා අමාත්‍යාංශයේ මුදල් වලින් මෙවැනිම වංචාවන් සිදු කොට තිබූ අතර එහි වගඋත්තරකරුවන් වනුයේ ද හිටපු අමාත්‍යවරයා සහ ඔහුගේ සම්බන්ධීකරණ ලේකම්වරයා වේ.

## 4.18 හිටපු විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍ය රංජිත් සියඹලාපිටිය.

පසුගිය රාජපක්ෂ සමයේ දැයට කිරුළ සංදර්ශනය භාරව සිටි ඇමතිවරයා වූයේ රංජිත් සියඹලාපිටිය යි. වසරක් පාසා රාජපක්ෂ පාලනය විසින් කෝටි ගණනක් මහජන මුදල් නාබාසිනියා කරමින් ප්‍රචාරක ව්‍යාපෘතියක් ලෙසින් පවත්වාගෙන ගිය මෙම සංදර්ශනය මගින් සිදු කළ මුදල් වංචාවන් පිළිබඳව මෙරට අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල සේවය කරනු ලබන සියලුම නිලධරයෝ හොඳින් ම දනිති. මෙම ව්‍යාපෘතිය තුළ සිදු වූ විවිධාකාරයේ මහා පරිමාණ දූෂණ වලට මැති ඇමතිවරුන් සහ නිලධාරීන් යන කණ්ඩායම් දෙකම සම්බන්ධ විය. ව්‍යාපෘතිය තුල ක්‍රියාත්මක කළ සෑම අංගයකින්ම පාහේ මුදල් වංචා කිරීම සාමාන්‍ය තත්ත්වයක් වූ බැවින් මෙම ව්‍යාපෘතිය " දැයට කිරුළ - අපට කරල " ලෙසින් රාජ්‍ය නිලධාරීන් අතර ප්‍රචලිත විය.

ප්‍රදර්ශනය පැවැත්වීමේ දී, පුරා වස්තු බහුලව පවතින ප්‍රදේශ සහ විශාල වනාන්තර ආශ්‍රිත ප්‍රදේශ තෝරා ගැනීම මගින් පුරා වස්තු මංකොල්ලය සහ දැව ජාවාරම ඉලක්ක කොට ගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බව ජනතාව අතර තහවුරු වූ අතර, ව්‍යාපෘතිය සඳහා ඉදි කළ බාල තත්ත්වයේ ගොඩනැගිලි කෙටි කලකින් දිරාපත් වී කිසිවෙකුට පලක් නොවන තත්ත්වයට පත් වෙයි. ඇතැම් අමාත්‍යාංශ වල ප්‍රදර්ශන කුටියට පමණක් වැය කරන ලද මුදල රුපියල් කෝටිය ඉක්මවා තිබුණි. මෙම ව්‍යාපෘතිය, තනිකරම මහජන මුදල් මහා පරිමාණයෙන් මංකොල්ල කමින්, රාජපක්ෂ පාලනය ප්‍රචාරය කිරීමේ මෙවලමක් විය.

සියඹලාපිටිය හිටපු අමාත්‍යවරයා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් තම බිරිඳ ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නගරයට පිටත් කර හැරීමට අදාළ තොරතුරු අනාවරණය වී තිබේ. ඔහුගේ දියණියන් දෙදෙනා මෙල්බර්න් නගරයේ ඉගෙනුම ලබන බවත්, එම

දියණියන් බලා ගැනීම සඳහා බිරිඳ පිටත් කර හැරීමට විදේශ කටයුතු අමාත්‍යාංශයේ උදව් ලබා ගෙන තිබේ.

සියඹලාපිටිය හිටපු අමාත්‍යවරයාගේ බිරිඳට මෙල්බර්න් නගරයට යාමට වීසා ලබා ගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය  අචලා ධර්මචාරිකා පීරිස් යන ව්‍යාජ නමින් ඇයට ලිපිකරු පත්වීමක් මෙල්බර්න් තානාපති කාර්යාලය වෙත ලබා දී තිබේ. ඉන්පසු  අචලා ධර්මචාරිකා සියඹලාපිටිය යන නමට පත්වීම වෙනස් කොට විදේශ ගත වීමට ඉඩ දී තිබේ. විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා මෙවන් පත්වීමක් ලබාදීමෙන් පසු මෙල්බර්න් නගරයට ගිය ඇය තානාපති කාර්යාලයේ සේවයට නොගොස් සිය දියණියන් බලා ගනිමින් සිටින බව වාර්තා වේ.

මෙරට විදේශ කටයුතු අමාත්‍යවරයා වශයෙන් මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා නාමිකව පත් කළ හිටපු ජනාධිපතිවරයා, ඔහුට ඉහළින් අධීක්ෂණ මන්ත්‍රීවරයෙකු වශයෙන් සජින් ද වාස් ගුණවර්ධන පත් කරන ලදී. මහින්ද, ජී.එල්, සජින් තුන්කට්ටුව විදේශ කටයුතු අමාත්‍යාංශය යොදා ගනු ලැබුයේ ඇමති බිරින්දෑවරුන් රට පැටවීම, තානාපතිවරුන්ට පහර දීම වැනි බාල තත්ත්වයේ වැඩ වලට මිස රට වෙනුවෙන් පෙනී සිටීම සඳහා නොවේ.

සියඹලාපිටිය මහතා තමාට ඇමතිවරයා ලෙස හිමි වාහන ප්‍රමාණය ඉක්මවා නීති විරෝධී ලෙස මහජන බැංකුවෙන් ලබා ගෙන පරිහරණය කළ අංක 65 - 1990 දරන ජීප් රථයට අලාභ හානි කොට භාර දී ඇති අතර ඉන් පසුව ඒ වෙනුවට අංක 32 - 7394 රථය ලබා දී ඇති අතර එම රථයටද අලාභ හානි කොට ආපසු භාර දී තිබේ. තමන්ට හිමි වාහන සීමාව ඉක්මවා වාහන භාවිතා කිරීම ඇමති සියඹලාපිටියට පමණක් සීමාවූවක් නොවේ.

## 4.19 හිටපු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය සුසන්ත පුංචිනිළමේ මහතා

නම කියූ පමණින් ලක්වැසි ජනතාව හඳුනන, මෙම හිටපු  නියෝජ්‍ය අමාත්‍යවරයාට එරෙහිව දූෂණ චෝදනා එල්ල කරනුයේ එම පක්ෂයේ ම ප්‍රබලයෙකු වන ඉඩම් අමාත්‍ය එම්.කේ.ඩී.එස්. ගුණවර්ධන මහතා විසිනි. 2014 වර්ෂයේ ත්‍රිකුණාමල නගරය හා කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට රු.මි. 686 ක් වෙන් වී තිබී ඇත. සේරුවිල ප්‍රදේශයේ වැව් අලුත්වැඩියා කිරීමට යයි පවසා ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මඟින් යෝජනා සම්මත කොට නියෝජ්‍ය  අමාත්‍යවරයාට හිතවත් සංවිධානවලට කොන්ත්‍රාත් ලබා දීමෙන් මෙම මුදල් වංචා කර ඇති බවට පැමිණිලි ගොනු වී තිබේ. මෙලෙසම ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ අලි වැටවල් ඉදිකිරීමට වෙන් කර තිබූ මුදල් ද මොවුන් විසින් ගසාකා ඇති බවත්, එයට හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාද සම්බන්ධ බවත් ඉඩම් අමාත්‍යවරයා චෝදනා කර තිබේ.

# මහින්ද රාජපක්ෂ පාලනයේ ප්‍රාදේශීය දේශපාලඥයින් විසින් සිදු කළ දූෂණ ක්‍රියා

බලය විමධ්‍ය ගත කරමින් ජාතික ගැටලුවට විසඳුමක් ලෙස හඳුන්වා දුන් පළාත් සභා මේ වනවිට ප්‍රධාන පක්ෂ දෙකේ ජාතික දේශපාලනයට දෙවන පෙළක් සකස් කරන අම්බලමක් බවට පත් වී ඇත. ජනතාවට විශේෂ සේවාවක් ලබා නොදෙන සුදු අලියෙකු වන පළාත් සභා තුළින් සිදු කරනු ලබන වියදම් වලින් 90% ක් පුනරාවර්ථන වියදම්ය. සංවර්ධන කටයුතු සඳහා යොදන මුදල 10% ටත් වඩා අඩුය. ඒ ආශ්‍රිතව සිදුවෙමින් පවත්නා මහා පරිමාන දූෂණ වංචා මහින්ද රාජපක්ෂ පාලනය තුළ ජාතික තලයේ දේශපාලඥයින් විසින් සිදු කර ඇති දූෂිත ක්‍රියාවන්ට නොදෙවෙනි විය.

ගමේ ප්‍රශ්න විසඳා ගැනීමේ අරමුණින් ස්ථාපිත කළ පළාත් පාලන ක්‍රමය මහින්ද රාජපක්ෂ විසින් භාවිතා කලේ තම බලය ශක්තිමත් කරන ග්‍රාමීය ඒකකය ලෙසයි. එය පසු ගිය දශකය තුළ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පක්ෂ කාර්යාලයක් බවට පත් වෙමින් දේශපාලනීකරණය වූ අතර බොහෝ අවස්ථාවලදී ප්‍රාදේශීය සභා සභාපතිවරයා අන්ත දූෂිත පුද්ගලයෙකු විය.

රටේ ප්‍රථම පුරවැසියා දූෂණය සිය ප්‍රතිපත්තිය කර ගත් විට එය මුළු ජාතික දේහය පුරාම පිළිකාවක් සේ පැතිර ගොස් සියලු ප්‍රපංචයන් දූෂණයට ලක් කරයි. පොදු ජනතාව විසින් ගෙවනු ලබන බදු මුදලින් යැපෙමින් එම බදු මුදල් සහ රජයෙන් සංවර්ධන කටයුතු ග්‍රාමීය මට්ටමේ යටිතල පහසුකම් සඳහා වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදනයන්ට අදාළ සියලු කොන්ත්‍රාත් ලබා ගත්තේ මොවුන් විසිනි. ප්‍රාදේශීය සභාවෙන් පළාත් සභාවට ඉන් පසු පාර්ලිමේන්තුවට පැමිණීමට මාර්ගය මහින්ද රාජපක්ෂ විසින් විවෘත කලේ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම හෝ දක්ෂතාවය මත නොවේ. ඔහු කොතරම් දූෂිතයෙකු වුවත් මහින්ද රාජපක්ෂ වාදියෙකු හෝ පවුලට ගැතියෙකු වූයේ නම් ඔහුට ඉතා කෙටි කාලයක් තුළ ජාතික දේශපාලනයට පැමිණීමට ඉඩකඩ විවර කළේය.

අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා බාලවයස්කාර තරුණියන් ඇතුළු ස්ත්‍රීන් සියයක් දූෂණය කළ බව ජනමාධ්‍ය මගින් අනාවරණය විය. තංගල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විදේශීය තරුණියන් දූෂණය කරමින් මිනීමරුමද සිදු කළේය. ප්‍රාදේශීය දේශපාලකයන් අතර වැඩිම දූෂිතයන්, මංකොල්ලකරුවන්, හොරුන් සිටියේ මහින්ද රාජපක්ෂගේ නිජ භූමිය වූ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළය. හම්බන්තොට නගරාධිපති එරාජ් ප්‍රනාන්දු, තංගල්ල ප්‍රාදේශීය සභාපති සම්පත්, දකුණු පළාත් සභා මන්ත්‍රී ඩී.වී. උපුල් මේ අතර ප්‍රධාන විය. කෝටි ගණන් කප්පම් ගත්, තමන්ගේ කාර්යය මණ්ඩල වාහන වලින් ගංජා අදින ප්‍රධාන අමාත්‍යවරුන් මෙන්ම ගුරුවරියන් දණ ගැස්සූ පළාත් ඇමතිවරුන්ද රාජපක්ෂ පාලනයේ නිර්මාණයන් විය. ගමේ චන්ඩියාට ප්‍රාදේශීය සභාව සඳහා නාම යෝජනා ලබා දීමට රාජපක්ෂ පාලනය උත්සුක විය. සෑම සංවර්ධන ව්‍යාපෘතියකම කොන්ත්‍රාත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් අතර බෙදා හැරියේය. ඔවුන් විසින් සිදු කළ මාර්ග ඉදිකිරීම් හා වෙනත් ගොඩනැගිලි කොන්ත්‍රාත් වලින් 75% ක පමණ මුදලක් දූෂිත අයුරින් තම සාක්කුවට දමා ගත්තේය. බලය රඳවා ගැනීමේ ප්‍රාදේශීය ජාලයක් ලෙස

පමණක් මෙම මංකොල්ලකාරීන් පෝෂණය කරමින් රාජපක්ෂ කටයුතු කලේ කිසි දිනක තම පාලනය බිඳ දැමිය නොහැකිය යන ඒකාධිපති වියරුවෙනි.

## 5.01 බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් සිදු කර ඇති අක්‍රමිකතා

කොලොන්නාව මීතොටමුල්ල පාරේ අංක 251/9 දරන ස්ථානයේ පිහිටි අක්කර 02 යි පර්චස් 2.8 ක වපසරියක් ඇති ඉඩමක්, (අනවසර පදිංචි පවුල් කිහිපයක් සහිත වූ පහත් බිමකි) මොරටුව, ප්‍රදේශයේ පදිංචි, ව්‍යාපාරිකයෙකු වන, ගෙහාඩ් මෙන්ඩිස් නැමැති අය මීතොටමුල්ල ප්‍රදේශයේ පදිංචි අජිත් ස්වර්ණප්‍රිය නැමැත්තෙකුගෙන් (2013 වර්ෂයේ) මිලදී ගෙන ඇත. මෙම ඉඩම බහලුම් පර්යන්ත අංගනයක් සහ ගබඩා සංකීර්ණයක් ඉදි කර කුලී පදනම මත පළාත් සභාවට ලබා දීම සම්බන්ධව මහ ඇමති ප්‍රසන්න රණතුංග සමග සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ ඇත.

පෞද්ගලික ව්‍යාපාරමය කටයුත්තකට මිලදී ගත් මෙම ඉඩමෙහි පදිංචි අනවසර පවුල් ඉවත් කිරිමේ කාර්යයටත්, ඉඩම පිරවීමේ කාර්යයටත් මහ ඇමතිවරයා නිල බලය යොදා ගෙන සෘජුවම සම්බන්ධ වන්නේ පළාත් සභාවේ අවශ්‍යතාවකට මෙන් පෙනෙන ආකාරයටය. පහත්බිම් ගොඩ කිරීම, මධ්‍යම රජයේ කාර්යයක් වන අතර එය පළාත් සභාවට කළ නොහැක. එමෙන්ම ඉඩම අත්පත් කර ගැනීමට ඇති අවශ්‍යතාව නිසා එහි සිටි අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීම සඳහා එක් පවුලකට රුපියල් 60,000/- බැගින් වන්දි මුදල් ගෙවා ඇත්තේ, මහ ඇමතිවරයා රජයේ මුදල් වලිනි. ඉඩම පිරවීමට ද, ප්‍රධාන අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබා ගැනීමට මැදිහත් වී ඇත. ඒ සඳහා ඔහු විසින් ගෙහාඩ් මෙන්ඩිස් මහතා ගෙන් මුදල් ඉල්ලා ඇත. ප්‍රධාන අමාත්‍යවරයාට ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සෘජුව මැදිහත් විය නොහැකි නිසා ඔහු ගේ උපදෙස් හා සැලසුම් මත ඔහුගේ බිරිඳ හා බිරිඳ ගේ සහෝදරියගේ පුතා වන නරේජ් ෆාරික්ගේ බිරිඳ ක්‍රිස්ටීන් ශිවන්ති වනිගසේකර යන ඉඩමේ විකුණුම්කරු හා ගැණුම්කරු එකතුව අවබෝධතා ගිවිසුමක් 2014.01.17 දින අත්සන් කර ඇත. එමගින් ප්‍රසන්න පාර්ශවයට 31% ලාභයක් ලැබෙන බවට තහවුරු කර ඇත.

පසුව මෙම ඉඩම රුපියල් මිලියන 209 කට විකුණා ඇති අතර, අමාත්‍යවරයා විසින් රුපියල් මිලියන 70 ක් අල්ලස් වශයෙන් ඉල්ලා කිහිප වතාවකදී තර්ජනය කර බලහත්කාරයෙන් චෙක්පත් 19 කින් රුපියල් මිලියන 15 ක් මේ වන විට අයකර ගෙන ඇති මෙම අල්ලස් මුදල් ඉල්ලීම සම්බන්ධයෙන් දිගින් දිගටම දුරකථන සංවාද පැවති ඇති අතර අවසානයේ අසභ්‍ය වචන පාවිච්චි කරමින් මෙලෙස තර්ජනය කර ඇත. දූෂණ හා වංචා චෝදනා නොමැති දිවංගත හිටපු අමාත්‍යවරයෙකු වූ රෙජී රණතුංග මහතා තම පුත්‍රයාගේ ක්‍රියාවන් ගැන අතිශය කණගාටු වනවාට සැක නොමැත. ප්‍රසන්න මහතා උක්ත දූෂණ ක්‍රියාවට සෘජුවම සම්බන්ධ බව සනාථ කෙරෙන දුරකථන සංවාද ඇතුළත් හඬ පටි විමර්ශන අංශ වෙත ලබා දී ඇති බව අනාවරණය වේ.

**එම දූරකථන සංවාදයක පටිගත කිරීමක උපුටා ගැනීමක් පහත වේ.**

**අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා** - දැන් ඔයයි මමයි හම්බවෙන්න ඕන, මේ චෙක් එක රිටන් වෙලත් සති තුන හතරක් වෙනවා, එතකොට මට අද ගත්ත හැකි ද කියන්නකො මගෙ වැඩේ කර ගන්න, දැන් මට එල් සී ඇර ගන්න ප්‍රශ්ණ ගොඩක මාත් හිරවෙලා ඉන්නෙ. මම අර වචනෙ විශ්වාස කරලානෙ එහෙම කරේ

**ගෙහාඩ් මෙන්ඩිස් මහතා** - අපට හම්බ වෙන්න බැරිද

**අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා** - මට හම්බවෙන්න පුළුවන් ඉතිං මට ටිකක් රිටන් වෙච්ච චෙක් එකට ගෙනාවොත් ඉතින් ඔයාගෙ චෙක් එක ඔයාට දීල, අර ටික මෙච්ච කර කතා කර ගන්න පුළුවන්

**ගෙහාඩ් මෙන්ඩිස් මහතා** - මම Before 10.30 - 11.00 වෙනකොට cm ට කෝල් එකක් දෙන්නම්

**අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා** - මට හෙට ලැහැස්ති කරලා දෙන්න උදේට මොකක් හරි ඇරෙන්ජ්මන්ට් එකක් කරලා දෙන්න එතකොට මගෙ වැඩේ කර ගන්න පුළුවන්

2015.05.29 දින මුදල් ඉල්ලා තර්ජනය කළ ආකාරය පටිගත කිරීමක්

**" අද දවස හරියට සිකුරාදා නේ, ගෙහාඩ් ඔයාගෙ ගේ කොහෙද තියෙන්නෙ කියන්න, මම එන්නම් ඔයාව හම්බවෙන්න, මම එන්නම්කො මම ඇවිත් මගෙ වැඩේ විසඳ ගන්න, මම දානව පොලිසියෙ ඇන්ට්‍රි එකක් දානව විතරක් නෙමේ මාව නරක මිනිහ කරගන්න එපා, ගෙහාන් හොඳේ, ඔයාලා මාව ගොනාට අන්දන්නත් එපා, නරේන්ද්‍රයි ඔයයි එකතුවෙලා ඔය දෙන්නම මට බොරුව කරන්නෙ මම නරේන්ද්‍රටත් කිව්ව උගෙ අම්මට ----------------ගන්න කියලා, මට නිදහසට කාරණා කියන්නත් එන්න එපැයි කියල. ඌ දැන ගන්න ඕන එහෙනම් මෙහෙ ඉදල ඌ කතා කරල කරා වගේ දැන් ඌ මට බබා හුකුන් පාන්න එනවා. දැන් ඔයා කියපු දේ ඉවරයි හොඳේ, අද සිකුරාදා. නරේන්ද්‍රගේ අම්ම--------- ගන්න කියන්න. ඒ පරයා ඌත් කට වහගෙන ඉන්නවා. ඌට කියා ගන්න කියන්න කරුණාකරලා තමුසෙට මම අද දෙන්නම් 06 ත් ඉස්සෙල්ලා මගේ ප්‍රශ්ණ විසඳනවා මම ඊට වඩා කතා කරන්නෙ නෑ.**

මේ සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. ඇමතිවරයා විසින් තනතුරේ බලය භාවිතා කර අල්ලස් මුදල් ලබා ගැනිමක් සිදු කර ඇති අතර, තනතුරේ තව තවත් වැජඹෙන්නට ඉඩ හරිනවාද ඇපත් නැතිව ගෙදර යවනවාද යන්න ඔබට භාර කරුණකි.

## 5.02 ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ නගරාධිපති ජනක රණවක මහතා සිදු කර ඇති අක්‍රමිකතා

නගර සභාවට ලොරි රථ 06 ක් මිලදී ගැනීම සඳහා 2014.12.20 දින පුවත් පත් දැන්වීමක් පළ කරමින් මිල ගණන් කැඳවා, 2015.01.12 දින ටෙන්ඩර් විවෘත කොට, 2015.01.22 දින තාක්ෂණික ඇගයීම් කමිටුව ලැබී තිබුණු අවම මිළ ගණන් වන ඇක්සස් ඉන්ටනැෂනල් සමාගම ඉදිරිපත් කර තිබූ මොඩල් අංක ASHOK LEYLAND - TPSRCU 08/ BOSS 1112 LE වන එක් රථයක් රු 10,575,000/- ක් වන මිල ගණන නිර්දේශ කොට මිලදී ගැනීමට කටයුතු කර ඇත. මෙම ආයතනය මෙරටට වාහන ගෙන්වන නියෝජිත ආයතනයක් නොවේ. මෙරටට වාහන සපයන නියෝජිත ආයතන වන ටාටා,ලේලන්ඩ්, ඉසුසු, නිසාන් ආයතන කිසිවකුගෙන් මිල දී ගැනීම සඳහා මිල ගණන් ලබා නොමැති අතර, ඇක්සස් ඉන්ටනැෂනල් සමාගමේ මාදිලිය සහ මෙරට ලේලන්ඩ් නියෝජිත සමාගමේ මාදිලිය එකිනෙකට වෙනස් වේ. තවද ඇක්සස් ඉන්ටනැෂනල් සමාගමේ ලේලන්ඩ් රථයක් සඳහා ලක්ෂ 106 ක් නියම කර ඇති අතර, ලේලන්ඩ් සමාගමේ ලංකාවේ නියෝජිත සමාගම මගින් රු. ලක්ෂ 60 කට එම රථය මිලදී ගැනීමට හැකියාව තිබේ. ඒ අනුව මෙම මිලදී ගැනීම මගින් රජයට රුපියල් ලක්ෂ 274 ක අලාභයක් සිදුකරමින් නගරාධිපතිවරයා වංචාවක් සිදුකොට ඇත.

කෝට්ටේ මහනගර සභාව විසින් වැලිකඩ පරණ පොදු වෙළඳ පොළ හා මහජන පුස්තකාලය පිහිටි ඉඩමේ සුපිරි වෙළඳ සංකීර්ණයක් ඉදිකිරිම සඳහා කටයුතු යොදා ඇත. නගර සභා ආඥා පනතට පටහැනිව සැලසුම් අනුමත නොකර නාගරික සංවර්ධන අධිකාරියේද අනුමැතියකින් තොරව සිදු කරන ලද රුපියල් බිලියන 02 කට වඩා වැඩි වටිනාකමකින් යුක්ත වූ මෙම ව්‍යාපෘතිය මුල සිටම දූෂිත ගනුදෙනුවක් බවට එම නගර සභාවේම නාගරික මන්ත්‍රීවරයෙක් පැමිණිලි කරයි. මේ කරුණු තහවුරුවන විගණන වාර්තාවක්ද පැමිණිල්ල සමඟ එවා ඇත. පෙර විකුණුම් ක්‍රමවේදය භාවිතා කර මෙම ව්‍යාපෘතියට අවශ්‍ය මුදල් සොයා ගැනීමට තීරණය කර තිබුනද මේ දක්වා ඒ සඳහා අරමුදල් සොයා ගැනීමක් සිදු කර නොමැත. එසේ වුවද මූලික උපදේශන ගාස්තු වශයෙන් රුපියල් 24,253,623 ක් පුද්ගලික සමාගමකට ගෙවා ඇත. එහෙත් එම සමාගම මෙම ක්ෂේත්‍රය පිළිබඳව කිසිම සුදුසුකමක් නොමැති සමාගමක් බවත් ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය සැලසුම් සත්‍ය ඒවා නොවන බවත් වැඩි දුරටත් සඳහන් කර ඇත. එවැනි තත්වයක් තුළ උපදේශක ගාස්තු ලෙස මිලියන 24 කට වැඩි මුදලක් නගර සභාවේ අරමුදලින් ගෙවීමෙන් සභාව මූල්‍ය අර්බුදයකට ඇද දමා ඇති බවත් විගණන වාර්තාවේ දක්වා ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා සැලසුම් සකස් කිරීමේදී ඒ සඳහා ලබා ගත යුතු ශක්‍යතා වාර්තාවන් කිසිවක් ලබා නොගැනීම, උපදේශක සමාගම තෝරා ගැනීම, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම යනාදී සියලු කටයුතු විනිවිද භාවයකින් තොරව සිදු කර ඇති බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුව කටයුතු කර නොමැති බවත් විගණන වාර්තාවේ පෙන්වා ඇත. උපදේශක සමාගම වෙත තට්ටු 28 ක ගොඩනැගිල්ලක් වෙනුවෙන් ගාස්තු ගෙවා ඇත. එහෙත් පසුව ඉදිකිරිම තට්ටු 12 ක ගොඩනැගිල්ලක් දක්වා පරිවර්තනය වූ බවත් මේ තුළ නගරාධිපතිවරයාගේ මැදිහත් වීම මත විශාල දූෂිත ගනුදෙනුවක් සිදු වූ බව පැමිණිලිකාර මන්ත්‍රීවරයා පෙන්වා දී ඇත.

පෞද්ගලිකව නගරාධිපතිවරයාට විරුද්ධව නාගරික මන්ත්‍රීවරයෙකු විසින් පැවරූ නඩුවක නඩු ගාස්තු වශයෙන් රුපියල් ලක්ෂ 50 ක මුදලක් නගර සභාවේ අරමුදල් වලින් ගෙවීම සම්බන්ධවද නගරාධිපතිවරයාට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් වී ඇත.

## 5.11 දෙහිවල-ගල්කිස්ස නගරාධිපති ධනසිරි අමරතුංග මහතාගේ දූෂණ හා සාපරාධී ක්‍රියා

දෙහිවල-ගල්කිස්ස නගරාධිපති ධනසිරි අමරතුංග මහතා සාහසික මනුෂ්‍ය ඝාතන ගණනාවක් සිදු කරවා ඇති බව රටම දන්නා කරුණකි. රෝහණ නැමති පාතාලකරුවකු මගින් රත්මලාන බටහිර එක්සත් ජාතික පක්ෂ නාගරික මන්ත්‍රී. එස්. ආරියරත්න මහතා ඝාතනය කරවා ඇති අතර, දෙහිවල ප්‍රතිබිම්බාරාම පාරේ උපනන්ද මහතා ඝාතනය කරවා ඇත්තේ බී.ඒ. සනත් හා තවත් දෙදෙනෙකු මගිනි. දෙහිවල ප්‍රදේශයේ මස්කඩ ව්‍යාපාරිකයෙකු හා ලොක්කා නැමති අය හා ඔහුගේ ගෝලයෙකු දෙමටගොඩ කමල් යන අය හා නගරාධිපතිගේ ගෝලයෙකු වන දිනේෂ් නැමති අයගේ මස්සිනා ලවා නගර සභා කාර්යාලය තුලදී ඝාතනය කරවා ඇත. දෙහිවල ලලිත් යන අයගේ හා අජිත් නැමති අයගේ ඝාතන සිදු කරවා ඇත්තේද නගරාධිපතිවරයා විසින් බවට තොරතුරු අනාවරණය වී ඇත.මුදල් හා ලිංගික අල්ලස් ලබා ගනිමින් දෙහිවල සත්වෝද්‍යානය අසල නීති විරෝධීව වාහන නතර කිරීමට බී.ඒ. සනත් නැමති අයට මුදල් උපයා ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසා ඇත.

නගර සභාවේ සැලසුම් අංශය මුළුමණින්ම තම ග්‍රහණයට ගෙන කුඨ හා ව්‍යාජ ලෙස සැලසුම් අනුමත කිරීමෙන් මුදල් හම්බ කරනු ලබන අතර කසල බැහැර කිරීමේ කටයුතු පවා මොහුගේ ග්‍රහණයට ගෙන මස් කඩ, හෝටල් ආදියෙන් අල්ලස් ලබා ගනී.

නගරාධිපතිවරයාගේ රියදුරෙකු වන නන්දන නැමති අය නගර සභාවේ සියලු ටෙන්ඩර් මෙහෙය වන අතර, ප්‍රධාන සැපයුම්කරුවකුද වේ. මොහුද මෑතකදී ධනවත් පුද්ලයකු බවට පත්වී ඇති අතර, මොහු විසින් මිලදී ගෙන ඇති වාහන නගර සභාවේ කුලී රථ සේවාවේ යොදවා ඇත.

එමෙන්ම නගරාධිපතිගේ තවත් ගෝලයන් වන දිනේෂ්, උපුල් සහ සුමිත් යන කප්පම් ලබා ගැනීම ඇතුලු අයථා ලෙස මුදල් උපයමින් සිටී.

ධනසිරි මහතාම අල්ලස්ගත් අවස්ථා ගණනාවක් ඇති අතර එයින් එක් අවස්ථාවක් පහතින් පෙන්නුම් කරමි.

ගල්කිස්ස හෙජාස් ජාත්‍යන්තර පාසලට, දෙහිවල සරණංකර පාරේ ඉදිවන නව ගොඩනැගිල්ලට සැලසුම අනුමත කර දීමට නගර සභාවේ සභාපති ධනසිරි අමරතුංග රු. 500,000/- ක මුදලක් අල්ලස් ලබා ගැනීම සහ මෙම පාසලෙන් රු.1,000,000/- ක මුදලක් ලබා ගෙන පසු ගිය ජනාධිපතිවරණයට මහින්ද රාජපක්ෂගේ රූප ප්‍රදර්ශනය කිරීමට දැන්වීම් පුවරු සැකසීම සිදු කර ඇති බව අනාවරණය වේ.

## 5.12 මොරටුව මහ නගර සභාවේ නගරාධිපති සමන් ලාල් ප්‍රනාන්දු මහතාගේ අයථා දේපල හා ධනය ඉපයීම්.

01. රු. 15,000/- ක මාසික වැටුපක් ලබා ගත් මොරටුව නගරාධිපති සමන් ලාල් ප්‍රනාන්දු මහතා නගරාධිපති ලෙස පත්වී ඉතා කෙටි කාලයකදී උකස් කර තිබූ තම නිවස හා ඉඩම උකසෙන් නිදහස් කරගෙන අති විශාල මුදලක් වියදම් කර අලුත්වැඩියා කර තිබේ.

02. මොරටුව මහජන බැංකුවෙන් රු. ලක්ෂ 15ක ණයට ලබාගෙන රු. ලක්ෂ 60ක් පමණ වැය කර නව නිවසක් ඉදිකර ඇති අතර, මොරටුව නගර සභාවට අයත් ඉඩමක් මොරටුව හැටන් නැෂනල් බැංකුවේ රථ ගාලක් වෙනුවෙන් බදු දී එම මුදල් පුද්ගලික පරිහරණයට ගෙන ඇත.

03. මොරටුව ලක්ෂපතිය, ඩී මෙල් පාරේ දෙමහල් නිවසක් ඉදිකර තිබේ.

04. කටුබැද්ද දන්දෙනියවත්ත තම පුතුට අයත් පර්චස් 50 ක ඉඩමක් ගොඩ කිරීම සඳහා නගර සභාවේ සේවකයන් හා වාහන යොදවා ගෙන නගර සභාවේ මුදල් හා දේපල අයථා අයුරින් පරිහරණය කර තිබේ.

05. ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි මුදලක් යොදවා දෙමහල් නගරාධිපති කාර්යාලය තෙමහල් කාර්යාලයක් ලෙස ඉදි කිරීම හා ප්‍රතිසංස්කරණය කර එහි තිබූ පැරණි ශිලා ලිපි ඉවත් කොට යොදා තිබූ නව ශිලා ලිපි ඉවත් කොට නැවතත් නව ශිලා ලිපි සකස් කිරීම සඳහා නගර සභා අක්මුදල් විශාල ලෙස වැය කර මුදල් නාස්තියක් කර ඇත.

06. තම හිතවත් සේවකයන් යොදවා ව්‍යාපාරික ස්ථානවලින් මුදල් ලබා ගනිමින් කැලි කසල එකතු කිරීම නිසා නගර සභාවට හිමි විය යුතු ආදායම් අහිමි කර ඇත.

07. මුල් සැලැස්මට පරිබාහිරව කඩ කාමර ඉදි කර තම හිතවත් අයට විකුණා තිබේ.

08. කටුබැද්ද වෙලෝනා ආයතනයට අයත් ඉඩම "ප්‍රයිම් ලැන්ඩ් සේල්" දේපල සමාගම සමග හවුල් වී විකිණීම සඳහා ගාළු පාරට ආසන්න පර්චස් 10 ක් හෝ 20ක් ඉල්ලා ඇති අතර එම බිම් කොටස එම සමාගම මගින්ම විකුණා රු. කෝටි ගණනක මුදලක් නගරාධිපතිවරයා පුද්ගලිකව ලබා ගෙන තිබේ.

09. මොරටුව ප්‍රදේශයේ නිවාස හා බිම් කොටස් සැලසුම් සකස් කර සිතියම උපයෝගි කර ව්‍යාජ ලෙස අනුමත කර මුදල් උපයනු ලැබේ. ඊට අමතරව මහා පරිමාණ ඉදි කිරීම් අනුමත කිරීමට අල්ලස් ලබා ගනී.

10. මොරටුව වීරෝන් ප්‍රනාන්දු ක්‍රීඩාංගනය අලුත්වැඩියා කිරීමේ මුවාවෙන් විශාල මුදලක් වංචා කොට තිබේ.

11. පෞද්ගලික හිතවතෙකුගේ ගලි බවුසර් අප ද්‍රව්‍ය ඉවත් කිරීමට යොදා ගැනීම නිසා මොරටුව නගර සභාවට හිමිවිය යුතු ආදායම් අහිමි වී තිබේ. එම ආදායම් නගරාධිපතිවරයා තමා වෙත ලබා ගැනීමට ක්‍රියා කර තිබේ.

12. නගරාධිපතිවරයා පෞද්ගලික කොන්ක්‍රීට් ගල් සැපයුම්කරුවෙකු සමග රහස් ගිවිසුමක් අත්සන් කොට කොන්ක්‍රීට් ගල් ලබා ගන්නා අතර ලියා පදිංචි සමිතිවල නම් භාවිතා කර එම ආයතනවලටද 5% ක ලාභාංශයක් ලබා දෙයි. එමෙන්ම අධි ඇස්තමේන්තු සකස් කර නගර සභාවට අයත් මුදල් වංචා කරමින් සිටී.

13. 2014-2015 වර්ෂය සඳහා ආරක්ෂක සේවා පහසුකම් ලබා ගැනීමට අඩු මිල ගණන් ඉදිරිපත් කර තිබූ පෞද්ගලික ආරක්ෂක සේවා ආයතන ඉවත් කර අත්තනෝමතික ලෙස වැඩි මිල ගණන් ඉදිරිපත් කල පුද්ගලයෙකුට ලබා දී නගර සභාව සතු මුදල් නාස්ති කර ඇත.

14. රු. 19,250/- ක මුදලක් වැය කර පෞද්ගලික ඉඩමක වෙනත් ඉඩමකින් ජලය බැස යන බව වළලා 250,000/- මුදලක් නගර සභාවට වැය වූ බවට ගිණුම් පෙන් වීම.

15. කොන්ත්‍රාත් සඳහා මුදල් ගෙවීමේදී මුදල් රෙගුලාසි උල්ලංඝණය කරමින් පුද්ගලයන්ගේ නමට චෙක්පත් නිකුත් කර තිබේ.

16. 2015 ජනාධිපතිවරණයට පෙර අල්ලස් ලබාගෙන පත්වීම් ලබා දී තිබේ.

17. කොන්ත්‍රාත්කරුවන්ගෙන් කොමිස් මුදල් ලබා ගෙන 2015-03-17 දින විදේශ සංචාරයක නිරත වී තිබේ.



# මහින්ද රාජපක්ෂ පාලනයේ දූෂිත රාජ්‍ය නිලධාරීන්

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා තම පවුලට හා තමාට හිතවත් අමාත්‍යවරුන් නිර්මාණය කළා සේම රාජ්‍ය සහ රාජ්‍ය අනුබද්ධ ආයතන වලට තමන්ට ගැති නිලධාරීන් කණ්ඩායමක් පත්කිරීමටත් කටයුතු කළේය. විශාල වශයෙන් මූල්‍ය ගනුදෙනු සිදුවන ආයතන තමාට සහ තම පවුලට හිතවත් අයවලුන් යටතට පත් කිරීමටත් සැළසුම් සහගතව කටයුතු කළේය. අන්‍යෝන්‍ය රැකවරණය සැළසෙන පරිදි අමාත්‍යවරයා , ලේකම්වරයා , ආයතන ප්‍රධානී පත්කර ගන්නා ලදී. අමාත්‍යාංශ වලින් විශාල ප්‍රමාණයක බලය තමා යටතේ තබා ගත් මහින්ද රාජපක්ෂ එම අමාත්‍යාංශ යටතේ වූ ආයතන සඳහා දේශපාලන හෙංචයියන් , තමාගේ ඥාතීන් , හිතවතුන් පත් කිරීමට කටයුතු කළේය . රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හැරුණු කොට මුදල් අමාත්‍යාංශය , වරාය හා නාවුක අමාත්‍යාංශය මාර්ග සංවර්ධන අමාත්‍යාංශය , නිතිපති දෙපාර්තමේන්තුව සියලු රාජ්‍ය බැංකු , ජාතික ලොතරැයි මණ්ඩලය යන ආදී වශයෙන් විශාල මූල්‍ය ගණුදෙනු සිදුවන ආයතන තමා යටතට පත්කොට තමාගේ හිතවතුන්ට බාර කිරීමට කටයුතු කරන ලදී. ඉතිරිව තිබූ අනෙකුත් සියලුම අමාත්‍යාංශ වලට බලපෑම් කල හැකි ප්‍රධානම අමාත්‍යාංශය වන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තමාගේ මළනුවන් වන බැසිල් රාජපක්ෂ යටතට පත් කිරීමට වගබලා ගත්තේය. ආරක්ෂක ලේකම් ධුරයට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය ඊට ඒකාබද්ධ කොට පවුල් බලය වඩාත් ශක්තිමත් කර ගත්තේය. විදේශ සේවයට තම හිතවතුන් ඥාතීන් සහ ගැත්තන් පත් කල රාජපක්ෂ තානාපති සේවය පහත් තත්වයකට පත් කළේය . දීප ව්‍යාප්ත සේවාවල සමහර නිලධාරීන් විවිධ වරප්‍රසාද වරදාන අපේක්ෂාවෙන් රාජපක්ෂට ගැති අයුරින් සිය රාජකාරි ඉටුකල අතර , කිසිදු සුදුසුකමක් නැති දේශපාලන හෙංචයියන් සංස්ථා , මණ්ඩල සඳහා පත් කර තිබුණි . මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ මහින්ද රාජපක්ෂට හිතවත් ඔහුට ගැති සහ යටහත් දූෂිත නිලධාරීන් පිරිසක් රාජ්‍ය සේවයේ සහ විදේශ සේවයට පත්වීමයි.

රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යභාරය වුවද මොවුන්ගේ අරමුණ වූයේ රාජපක්ෂ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යාමට කටයුතු කිරීමයි. බය පක්ෂපාතීකමින් සහ ගැතිකමින් සිය පෞරුෂත්වය පසෙකෙලා කටයුතු කල මෙම දූෂිත නිලධාරීන්ගේ පෝෂණය සහ රැකවරණය සඳහා හිටපු ජනාධිපති රාජපක්ෂ දිගින් දිගටම කටයුතු කළේය.

18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඒකරාශී කරගත් බලය තුලින් අධිකරණයට බලපෑම් කල මහින්ද රාජපක්ෂ ශිරානි බණ්ඩාරනායක අග්‍ර විනිශ්චයකාරවරිය ඉවත් කොට අධිකරණ ස්වාධීනත්වය අහෝසි කොට තම පාලනයට යටත් කළේය.

### 6.01 හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග

හිටපු ජනාධිපතිවරයාගේ ලේකම්වරයා වූ ලලිත් වීරතුංග සැබෑ ලෙසම මේ වන විට සිටිය යුත්තේ සිරගෙදර වුවද , ඔහු තවමත් නිදැල්ලේ කාලය ගත කරයි. මැතිවරණ නීති උල්ලංඝණය කරමින් සමස්ත රාජ්‍ය සේවාවට නරක පූර්වාදර්ශ සපයමින් , රාජ්‍ය සේවයේ ඉහළ නිලධාරියකු වූ ලලිත් වීරතුංග රුපියල් බිලියන ගණන් රාජ්‍ය මුදල් 2015

ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණය ජයග්‍රහණය සඳහා යෙදවීම පිළිබඳ චෝදනා ලැබ සිටියි.

විදුලි සංදේශන නියාමන කොමිසමේ සභාපතිවරයා ලෙසද කටයුතු කල ලලිත් වීරතුංග මහතා විදුලි සංදේශන නියාමන කොමිසමේ මූල්‍ය ප්‍රතිපාදන රු ලක්ෂ 6000 ක් උපයෝගී කර ගනිමින් සිල්රෙදි මිලදී ගෙන 2015 ජනාධිපතිවරණයේදී, මහින්ද රාජපක්ෂ මහතාගේ මැතිවරණය ජයග්‍රහණය වෙනුවෙන් අල්ලස් ලෙස බෙදා හරිනු ලැබීය.

මේ පිළිබඳ සිදු කළ විමර්ශන අවසන් වී ඇති අතර ඔහුට එරෙහිව නඩු පැවරීම විවිධ බලපෑම් නිසා ප්‍රමාද වෙමින් පවතී.

තවද වීරතුංග මහතා ශ්‍රී ලංකන් එයාර් සමාගමේ සුරූපී ගුවන් සේවිකාවක් මහින්ද රාජපක්ෂගේ පුත් නාමල් රාජපක්ෂගේ කාර්ය මණ්ඩලයට මුදාහරින ලෙස තම අත්අකුරින් ලිපියක් යවා ඇයට රු 35,000/- ක මාසික වැටුපක් ගුවන් සමාගමෙන් ගෙවන ලෙස තවත් රු 35,000/- ක වැටුපක් අරලියගහ මන්දිරයෙන් ලබාදීමටත් කටයුතු කර ඇත. එයින් නොනැවතී 40,000/- ක ප්‍රවාහන දීමනාවක්ද , තවත් රු.30,000/- ක ඉන්ධන දීමනාවක්ද ලබාදී තිබුණේ සියලු මුදල් රෙගුලාසි උල්ලංඝණය කරමිනි . මෙම සියලු මහජන මුදල් එම ගුවන් සේවිකාවට ලබා දී තිබුණේ නාමල් රාජපක්ෂගේ වුවමනාවන් සංතර්පණය කිරීම වෙනුවෙනි .

## 6.02 ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන අස්ථාන ගත වීම

ජනාධිපති ලේකම් කාර්යාලය සතු රාජ්‍ය දේපලවල පාලනය සහ ආරක්ෂාව පිළිබඳව ජනාධිපති ලේකම්වරයා වග කිව යුතුය. එහෙත් එම වගකීම ලලිත් වීරතුංග ලේකම්වරයා විසින් පැහැර හැර ඇති අතර ලේකම් කාර්යාලය සතු වාහන විශාල ලෙස අපහරණය කරන ලද බව ඔප්පු වී ඇත.

ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 958 ක් ඇති බව පැවති බවත් මෙම වාහන අතරින් වාහන 211 ක් ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රවාහන අංශයේ ලේඛන ගත වී නොමැති බව අනාවරණය විය. එමෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලය නමින් එල් . ඕ . එල් . සී ( LOLC ) මූල්‍ය ආයතනය හරහා වාහන 77 ක් කල් බදු පහසුකම් යටතේ ලබා ගෙන ඇත. ඉන් වාහන 20 ක් ලේකම් කාර්යාලය තුළ ලේඛණ ගත වී නැත. ජාතික සවිය වැඩ සටහන යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 105 එවකට තර්ජනයට ලක්ව පැවති ගම්මාන සඳහා ලබා දී ඇත. වැටුප් කොමිසම සතුව ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන 08 ක් ඇති බවත් එම වාහන පසුව එම කොමිසම විසින් පවරා ගැනීම සිදුකර ඇති බව අනාවරණය විය. පශු සම්පත් අමාත්‍යාංශය සතුව ජනාධිපති ලේකම් කාර්යාලය නමින් වාහන 13 ක් ඇති බව අනාවරණය විය. ජනාධිපති ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ තිබී ජනාධිපති ලේකම් කාර්යාලයේ ලේඛණ ගත නොවූ වාහන 22 ක් සිදු කරන ලද පරීක්ෂණයේදී සොයා ගන්නා ලදී. ජනාධිපති ලේකම් කාර්යාලය නමින් වාහන 670 ක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය තුළ ලියාපදිංචිව ඇති අතර ඉන් වාහන 43 ක් ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රවාහන අංශයේ ලේඛණවල ඇතුලත්ව නොමැති බවද අනාවරණය විය . සිදු කර ඇති විමර්ශන අනුව ඉහත සඳහන් කළ වාහන

958 න් වාහන 2 ක් අස්ථාන ගත වී ඇත. ඉන් වාහන එකක් එල් . ඕ . එල් . සී ( LOLC ) ආයතනය හරහා කල් බදු පහසුකම් යටතේ ලබා ගෙන ඇති LP – 8737 වාහනය වේ. තවද අංක HC-8064 දරණ යතුරු පැදිය දිරා පත් වූ බවට ඉදිරිපත් කළ ලේඛණයක් ඇත .

මෙලෙස රුපියල් කෝටි ගණනක් වටිනා රජයට අයත් වාහන අනිසි ලෙස පරිහරණය, අස්ථාන ගත කිරීම, පෞද්ගලික සමාගම්වලට සහ පුද්ගලයන්ට පෞද්ගලිකව පරිහරණය කිරීම සඳහා නීති විරෝධී ලෙස සැපයීම යන වැරදි වලට ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රවාහන අංශයේ නිලධාරීන්ට එරෙහිව චෝදනා එල්ල වී ඇති අතර වගඋත්තරකරුවන් වන කීර්ති සමරසිංහ දිසානායක සහ අහමඩ් කබීර් යන අය ඇප මත නිදහස්ව සිටින අතර සුදත් අබේසිංහ සහ සජින් ද වාස් ගුණවර්ධන ය නඅය මේ දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත .

## 6.03 හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත්

රාජ්‍ය පරිපාලන සේවයේ නිලධාරියෙකු වූ ගාමිණී සෙනරත් මහතා මේ වනවිට ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ දූෂිත නිලධාරියෙකු ලෙසිනි . මහින්ද රාජපක්ෂ මහතාගේ කාර්ය මණ්ඩල ප්‍රධානියා ලෙස කටයුතු කළ ගාමිණී සෙනරත් මහතා අයුතු ලෙස රැස්කර ගත් දේපල රාශියක් පිළිබඳව තොරතුරු අනාවරණය වේ . ගාමිණී සෙනරත් මහතා ඔහුගේ බිරිඳ , බිරිඳගේ මව , පුතා අධ්‍යක්ෂකවරුන් ලෙස නම් සඳහන් සමාගම් හතරක් ලෙස ප්‍රින්ට් එක්සෙල් පුද්ගලික සමාගම , රත්න පබ්ලිෂර්ස් ඇන්ඩ් ප්‍රින්ටර්ස් , රත්න පොත් ප්‍රකාශකයෝ පුද්ගලික සමාගම , රත්න මෙට්ල් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගම දැක්විය හැක .ඊට අමතරව ඔහුට සහ ඔහුගේ සමාගම්වලට අයත් අයුතු ලෙස උපයා ගත්තේ දැයි සැක කෙරෙන දේපල පහත පරිදි වේ.

| දේපල | හිමිකරුගේ නම | මිලට ගත් දිනය සහ වටිනාකම |
|---|---|---|
| අංක 47/2 , ග්‍රෙගරී පාර , කොළඹ 07 | මල්කාන්ති ගුණරත්න ( බිරිඳ ) | මිලියන 45<br>2006 ජූලි 23 |
| අංක 164/4 , බක්මීගහ වැව පාර , පොරේ , අතුරුගිරිය . | PRINTXCLE (PVT) LTD | මිලියන 77<br>ඔජ්පු 19 කින් |
| අංක 426 , අතුරුගිරිය පාර , අරංගල ගබඩාව. | PRINTXCLE (PVT) LTD | මිලියන 25<br>2012.09.20 |
| අංක 125/4 , පන්නිපිටිය පාර , බත්තරමුල්ල. | PRINTXCLE (PVT) LTD | මිලියන 25<br>2010.07.28 |

| | | |
|---|---|---|
| අංක 962 , පන්නිපිටිය පාර , බත්තරමුල්ල. | PRINTXCLE (PVT) LTD | මිලියන 29.75<br>2010.06.23 |
| ලියන්වත්ත , පාදුක්ක , ගොවිපළ | RATHNA PUBLISHERS AND PRINTERS (PVT) LTD | මිලියන 75<br>2011.12.06 |
| ගොඩඉරිකන්ද , හක්මන | රත්න මෙටල්ස් ඉන්ඩස්ට්‍රීස් | මිලියන 9<br>2014.04.07 |
| අංක ඒ / 12 /පී /1 , මැනින්ටවුන් , මාතා පාර , කොළඹ 08. | PRINTXCLE (PVT) LTD | මිලියන 6.5<br>2012.09.05 |
| අංක 66 , බදුල්ල පාර , නුවරඑළිය | RATHNA PUBLISHERS PRINTERS (PVT) LTD | මිලියන 60<br>2008.11.06 |
| දේපළ මිලදී ගෙන ඇති මුළු මුදල | | මිලියන 352.25 |

මීට අමතරව සෙලාන් බැංකුවේ සහ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මිලියන 16 ක තැන්පතු සහිත ගිණුම්ද, HSBC බැංකුවේ බිරිඳගේ නමින් බැංකු ගිණුම් 15 ක්ද, කොමර්ෂල් බැංකුවේ ජංගම ගිණුමක්, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ බිරිඳගේ හා පුතාගේ නමින් බැංකු ගිණුම්ද පවත්වා ගෙන යන බවට තොරතුරු අනාවරණය වී ඇත.

රජයේ වැටුප් ගෙන රාජ්‍ය නිලධාරියෙකුට මෙවැනි අයුරින් දේපල අත්පත් කර ගත හැකිද යන්න සහ මිලියන ගණන් සහිත තැන්පතු පවතින බැංකු ගිණුම් විශාල ප්‍රමාණයක් ආරම්භ කිරීමට හැකියාව තිබේදැයි විමසා බැලිය යුතු කරුණකි. මෙලෙස අයුතු ලෙෂ දේපල අත්පත් කර ගැනීම පිළිබඳව ගාමිණී සෙනරත් මහතාට විරුද්ධව විමර්ශනයක් සිදු කරන බව ජනමාධ්‍ය වාර්තා කර තිබුණි .

## 6.04 හිටපු මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් රංජිත් ප්‍රේමසිරි

මොහු මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරයෙකි. මහින්ද රාජපක්ෂ පාලනය යටතේ ඔහු මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති ලෙස පත් කරන ලදී. ඉන් නොනැවතී ඔහුව මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම් ලෙසද පත් කරන ලදී. රාජපක්ෂ පාලන සමයේ මහා පරිමාන වංචා හා දූෂණ සිදු වී ඇත්තේ මහාමාර්ග ව්‍යාපෘතිවලින් වන අතර එක විට මෙම තනතුරු දෙකම දැරීමට ප්‍රේමසිරි මහතා පත් කරන ලද්දේ එම සොරකම් නිත්‍යානුකූලව කර ගැනීමේ අරමුණෙනි. ඉන් පසුව මාර්ග සංවර්ධනයට තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීම, ඒවා අධීක්ෂණය, ඇස්තමේන්තු කිරීම, ටෙන්ඩර් පිරිනැමීම ආදී සියල්ලම එකම පුද්ගලයෙකු අතින් විෂය භාර ඇමති ලෙස මහින්ද රාජපක්ෂට අවශ්‍ය ලෙස මෙහෙයවූයේ

මොහු විසිනි . මොහුගේ දූෂිත ක්‍රියාවන් පිළිබඳ විගණන පරීක්ෂණ වලදී හෙළි වී ඇත්තේ අල්ප මාත්‍රයක් පමණි . ඉන් කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය දෙවන වර කිසිදු ටෙන්ඩර් කැඳවීමකින් තොරව China Metallergical Group Corporation නැමැති සමාගමට ලබා දීමේදී මූලික ඇස්තමේන්තුවට සාපේක්ෂව මිල වැඩිවීම 437% ක් එනම් හතර ගුණයකටත් අධික බව විගණකාධිපති විසින් පෙන්වා දෙන අතර රජයට සිදු වූ සමස්ත පාඩුව රු.මි . 19,750 ක් පමණ වේ .

තවද , මාර්ග 28 ක් පුනරුත්ථාපනයට ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගත් රු. කෝටි 5,539.2 ණය මුදලින් වංචනික ලෙස ලබා ගත් රු. කෝටි 1800 ක අත්තිකාරම් මුදල් ප්‍රේමසිරිට හිතුමනාපේ දේශපාලන වුවමනාව මත වෙනත් ආයතන හා කාර්යයන් සඳහා යොදවා ගැනීම , කොළඹ පිට රවුම් පාර ( කඩවත - කඩුවෙල ) කොටස ඉදි කිරීමේදී වංචනික ලෙස අසාධු ලේඛනයට යොමු කොට තිබූ තායිසේ සමාගමට ටෙන්ඩර් කැඳවීමකින් තොරව මූලික ඇස්තමේන්තුවට වඩා 42% වැඩි මුදලකට ලබා දීම යන කරුණු පිළිබඳවද විමර්ශණය අරඹා ඇත . මොහු මහින්ද රාජපක්ෂට මෙම වංචනික ක්‍රියාවලට ආධාර හා උපදෙස් ලබාදීම වෙනුවෙන් පෞද්ගලිකව තම පවුල්වල සාමාජිකයන්ටත් විශාල ධනයක් වරදාන ලෙස ලබා ගෙන ඇත.

## 6.05 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක හා දිවි නැඟුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් රණවක

පසුගිය කාලයේ දී වාර්ෂික අයවැය ලේඛනයෙන් වැඩි ම කොටස වෙන් කර ගත්තේ මහින්ද රාජපක්ෂ විසිනි. දෙවනුව වැඩිම කොටස බැසිල් රාජපක්ෂ විසින් වෙන් කර ගන්නා ලදී. බැසිල්ගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ආයතන 18ක් ඒකාබද්ධ කරමින් දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. දිවි නැඟුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවට ප්‍රකාශ කිරීම නිසා රාජපක්ෂ පාලනය විසින් හිටපු අගවිනිසුරුවරිය එම තනතුරෙන් බලහත්කාරයෙන් ඇද දමා ඇයට එළව එළවා පහර දුන් බව ජනතාවට නොරහසකි.

එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය යටතේ, ඔවුන්ගේ මැතිවරණ යාන්ත්‍රණය සිය අමාත්‍යාංශය හරහා මෙහෙයවන ලද්දේ බැසිල් රාජපක්ෂ විසිනි. දිළිඳුකම පිටු දැකීම සඳහා ආරම්භ කරන ලද සමෘද්ධි ව්‍යාපාරයේ මුදල්, සේවකයින් සහ ප්‍රතිලාභී පවුල් මේ සඳහා යොදා ගන්නා ලදී. රාජ්‍ය සම්පත් මෙලෙස කොල්ලකෑමට නම් ඒ සඳහා අදාළ ආයතන වල ප්‍රධානීන් ලෙස තමන්ට සුවච කීකරු ගැත්තන් පිරිසක් පත් කර ගත යුතු විය. නිහාල් ජයතිලක, ආර්.ඒ.ඒ.කේ. රණවක තමන් යටතට පත්කර ගන්නේ ඒ සඳහා ය. මෙම නිලධාරීන් ඇමතිවරයා කියන ඕනෑම දේට එකඟ වෙමින්, රාජ්‍ය මුදල් බැසිල්ගේ හිතුමනාපෙට වියදම් කිරීමට ඉඩ දී ඉවත බලා සිටියේය. එපමණක් නොව ඔවුන් ද හැකි පමණ සොරාගත් බවට සැක සිතීමට ඕනෑතරම් සාධක තිබේ.

නැවත වරක් බලයට පැමිණ රට සූරා කෑම සඳහා, වසර දෙකකට මත්තෙන් යළි ජනාධිපතිවරණයකට මහින්ද රාජපක්ෂ තල්ලු කළේ බැසිල් රාජපක්ෂ බව පක්ෂයේම අය පවසති. ඒ දිවි නැඟුම දෙපාර්තමේන්තුව හරහා මෙරට පවුල් ලක්ෂ 50 කගේ ඡන්ද

මංකොල්ල කෑමට හැකි බව දන්නා බැවිනි. දිවි නැඟුම සහනාධාර ලාභීන්ට නිවාස අලුත්වැඩියා කිරීමට මුදල් ලබාදීමේ වැඩසටහනක් සකස් කරන ලෙස 2014.10.24 දින බැසිල් මෙම නිලධාරීන්ට දැනුම් දී ඇති අතර ඒ සඳහා රණවක මහතා 2014.10.29 දින සකස් කළ 2014 / 11 චක්‍රලේඛය බැසිල්ට පෙන්වා සංශෝධනය කරගෙන ඇත.

ඇමතිවරයා විසින් ලේකම් නිහාල් ජයතිලක හා අධ්‍යක්ෂ ජනරාල් රණවකට පවසා ඇත්තේ මේ සඳහා සමෘද්ධි බැංකුවල තැන්පත් කර ඇති රුපියල් මිලියන 15,000ක් (කෝටි 1500) පාවිච්චි කරන ලෙසත් පසුව එම මුදල මහා භාණ්ඩාගාරයෙන් ලබාගත හැකි බවත් ය.

මෙය සම්පූර්නයෙන්ම නීති විරෝධී ක්‍රියාවකි. මෙතරම් විශාල මුදලක් යොදවන ව්‍යාපෘතියක් රජයේ වාර්ෂික අයවැය ලේඛනය හරහා අනුමත කරවා ගෙන නොමැති නම් නැවත පාර්ලිමේන්තුව හරහා ඒ සඳහා අනුමැතියක් ලබා ගත යුතුය. මෙම ව්‍යාපෘතියට අවම වශයෙන් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය හෝ ලබා ගෙන නොමැත.

ඒ අනුව එකී චක්‍රලේඛය 2014.10.30 දින දිවයිනේ සියලුම පළාත් වල දිවි නැඟුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් වෙත යවා ඇත.

2014.11.09 දින වනවිට සමීක්ෂණ සිදු කර, ප්‍රතිලාභීන් තෝරා, අයදුම්පත් නිකුත් කර, නැවත එම අයදුම්පත් ලබාගෙන, ඒවා නිර්දේශ කර, අනුමත කර, ගෙවීම් කිරීමට කුමන ශාඛාවෙන්ද යන්නත්, එම සියලු වැඩ අවසන් කොට මුදල් ද ගෙවා අවසන් කළ යුතු බවත් දන්වා ඇත. 2014.10.30 දින නිකුත් කරන චක්‍රලේඛයට අනුව 2014.11.09 වනවිට සියලු වැඩ අවසන් කළ යුතු වුවත් ඒ සඳහා ඇත්තේ වැඩ කරන දින 06ක් පමණි. මෙරට ක්‍රමවේදයට අනුව වැඩ කරන දින 06කින් මේ සියලු දේ අවසන් කළ හැකි ද? ප්‍රතිලාභී සියලුම පවුල් එකම පරිගණක ජාලයකට සම්බන්ධ කළ ද මෙම කාර්ය සිදු කළ හැකි යැයි සිතිය නොහැක.

සැබවින්ම මෙහිදී බැසිල්ට අවශ්‍ය වූයේ ජනාධිපතිවරණයට පෙර මෙම මුදල් ඡන්ද අල්ලස් ලෙස සමෘද්ධිලාභීන්ට දී ඔවුන් රවටා ඡන්දය ලබා ගැනීමයි. එහෙත් බෙදිය හැකි වූයේ රුපියල් බිලියන 3.75කි. මෙසේ සමෘද්ධිලාභීන්ගේ ඉතිරිකිරීමේ මුදල් මංකොල්ලකෑමට එරෙහිව කිසිදු නිළධාරියෙක් හඬ නඟා නැත.

දිවි නැඟුම පවුල් සඳහා බෙදා දීමට යැයි පවසා මහින්ද රාජපක්ෂගේ රුව සහිත ලිත් ලක්ෂ 50ක් රුපියල් කෝටි 03කට ආසන්න මුදලක් වැය කර මුද්‍රණය කොට ඇත. සමෘද්ධිලාභීන් ලක්ෂ 18කට ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කිරීමත් ඒ සඳහා සමෘද්ධි මුදල් යොදා ගැනීම මෙලෙස මොවුන් විසින් සිදු කළ තවත් මූල්‍ය අපරාධයකි. 2014 දිවි නැඟුම ජාතික සම්මේලනය පැවැත්වීමට රුපියල් මිලියන 63.7ක් ( රුපියල් කෝටි 6 ලක්ෂ 37) වැය කිරීම තවත් ජාතික අපරාධයකි. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු මෙවන් සමුළුවක් පැවැත්වීමේ අරමුණ දිවි නැඟුම ප්‍රතිලාභීන්ගේ ඡන්දය උදුරා ගැනීමයි. මෙකී සමුළුවට පුද්ගලයින් 09 දෙනෙකු මන්නාරම සිට කොළඹ රැගෙන ඒමට රු. 337,000/-ක් වැය කර ඇත. මොවුන් පෙරහැරේ කැඳවාගෙන ආවත් මෙතරම් මුදලක් වැය වේද? මෙකී ගෙවීම අනුමත කළේ අධ්‍යක්ෂ ජනරාල් ඇස් කන් පියාගෙනද? සමුළුවට කෑම බීම සඳහා පමණක්

වියදම රුපියල් ලක්ෂ 20කි. ජනාධිපතිවරණයට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොඩි දැමීම සඳහා පළාත් පාලන ආයතන වලට රුපියල් කෝටි 02ක් වටිනා ගැල්වනයිස් බට බෙදා දී ඇත. මෙම බට බෙදා දීම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අරමුණු වලට ඇතුළත් නොවේ.

නිදහස් අධ්‍යාපනයට පිං සිද්ධ වෙන්න රජයේ ඉහළ තනතුරු වලට පත් ව මහජනතාවගේ බදු මුදලින් වැටුප් ලබන මෙවන් නිළධාරීන්ට, දේශපාලකයින්ගේ සොරකම් සඳහා විරුද්ධ වීමට කොන්දක් තිබිය යුතුය. දේශපාලකයින්ගේ පැවැත්ම ජනතා කැමැත්ත මත රඳා පවතින අතර ඔවුන් පත් කිරීමත් පලවා හැරීමත් කළ හැක්කේ ජනතාවටයි. එහෙත් රජයේ නිලධාරීන් වසර 30 - 40ක් සිය සේවය රටට, ජනතාවට ලබා දෙයි. දේශපාලකයින්ට විරුද්ධව කටයුතු කිරීමෙන් රජයේ නිලධාරීන්ගේ රැකියා අහිමි කිරීමට ඔවුන්ට හැකියාවක් නොමැත.

අමාත්‍යාංශ ලේකම් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් යනු රාජ්‍ය මුදල් පිළිබඳ මහා භාණ්ඩාගාරයට වගකිව යුතු නිලධාරීන් වේ. එහෙයින් ඔවුන් යම් වියදමකට බලය දෙන්නේ නම ඒ පිළිබඳ සලකා බැලිය යුතු කරුණු ගණනාවකි. ඉහත ගෙවීම් වල්දී මෙම නිලධාරීන් එම එකදු කරුණක් හෝ පිළිබඳ අවධානය යොමු කර නොමැති බවට පැහැදිලි සාක්ෂි ඇත. එබැවින් රජයේ මුදල් අවභාවිතා කිරීමේ චෝදනාවෙන් ගැලවීමට මෙම නිලධාරීන්ට නොහැක.

## 6.06 හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල්

කබ්රාල් , රාජපක්ෂ පාලනයේ සිටි තවත් එක් දූෂිත නිලධාරියෙකි . මෙරට ආර්ථික දිශානතිය තීරණය කරනු ලබන මර්මස්ථානයේ පාලනය භාරව සිටි කබ්රාල් තම හාම්පුතාට අවශ්‍ය අයුරින් මහ බැංකුවේ කටයුතු හසුරුවමින් දූෂිත පාලනයක් ගෙන ගිය අතර රටේ ආර්ථිකය පිළිබඳව ගල් පැලෙන බේගල් ඉදිරිපත් කරමින් යථාර්තයක් නොවන ආර්ථික වර්ධනයක් මෙරට පවතින බවට තර්ක ඉදිරිපත් කරන ලදී . කබ්රාල් වැනි සුදු කරපටි හොරුන් විසින් ව්‍යාජව මවා පාන ලද ආර්ථික වර්ධනය තුළින් මෙරට ඒක පුද්ගල ආදායම ඉහළ ගොස් ඇති බවත්, ශ්‍රී ලංකාව අඩු ආදායම් ලබන තත්වයේ සිට මැදි ආදායම් ලබන රටක් බවට පත්වී ඇති බවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරන ලදී. මෙහි ප්‍රතිඵලය වූයේ මෙතෙක් කලක් අපට විදේශයන් ගෙන් ආධාර ලෙස හෝ ඉතා අඩු පොලියකට ලැබුණ ආධාර හා ණය අහිමි වීමයි.

සක්විති රණසිංහ විසින් සිදු කරන ලද මූල්‍ය වංචාවෙන් ආරම්භ වූ ආර්ථික කඩා වැටීමට ලලිත් කෙතලාවලට අයත්ව තිබූ ගෝල්ඩන් කී සමාගම ද හසු වූ අතර එහි තැන්පත්කරුවන් ලලිත් කොතලාවලට එරෙහිව සිදු කරන ලද පැමිණිල්ල අනුව කොතලාවල මහතා අත් අඩංගුවට පත් වූ අතර , ඔහුට හා ඔහුගේ බිරිඳ සිසිල් කොතලාවලගේ දේශීය හා විදේශීය මුදල් ආසන්න වශයෙන් රුපියල් මිලියන 990 ක් ද , දේපල විශාල ප්‍රමාණයක් ද මහ බැංකුව වෙත පවරා ගන්නා ලද බවට ලලිත් කොතලාවල මහතා විසින් පැමිණිලි කර ඇත. එසේ මහ බැංකුවට පවරා ගන්නා ලද ලලිත් කොතලාවලගේ දේපලවලින් රු.මි.350 ක් පමණ වටිනා දේපල රු.මි 117 කට "සොෆ්ට්

ලොපික් " සමාගම වෙත විකුණා ඇත. මෙසේ "සොෆ්ට් ලොපික් " ලෙසට නම වෙනස් කර ගෙන ඇත්තේ පෙරදී " වණික් ලීසිං ලිමිටඩ් " හා "කැපිටල් රිච් ලීසිං " ලෙස හැඳින්වූ අජිත් නිවාඩ් කබ්රාල් අධ්‍යක්ෂ ධූරය දරණ ලද සමාගමයි. කබ්රාල් මහ බැංකු අධිපති ලෙස පත් වීමෙන් පසු එම අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වී ඒ වෙනුවට රෝෂිණී සුනේත්‍රා කබ්රාල් වන තමාගේ බිරිඳ එම සමාගමේ අධ්‍යක්ෂ ධූරයට පත් කර ඇත. කොතලාවල යුවලට අයත්ව තිබූ අළුත්ගම " සී සෑන්ඩ් " හෝටලය , සෙලින්කෝ ශ්‍රී රාම් සමාගමට අයිතිව තිබූ කොළඹ 03 , ආර්. ඒ . ද : මෙල් මාවතේ පිහිටි මූලස්ථාන ගොඩනැගිල්ල , කොතලාවල මහත්මියට අයත්ව තිබූ කොළඹ 04 , ෆොන්සේකා පාරේ අංක 13 හි පිහිටි පස් මහල් ගොඩනැගිල්ල ද මිලදී ගෙන ඇත්තේ ඉහත කී සොෆ්ට් ලොපික් සමාගම විසින් බවට චෝදනා කර ඇත . තමා විසින් " ගෝල්ඩන් කී " තැන්පත් කරුවන්ගේ කෝටි 1,350 ක් වූ තැන්පත් මුදල් වසර 3 $^{1/2}$ක කාලයක් තුල ගෙවා නිම කිරීමේ සැලැස්මක් අධිකරණයට ඉදිරිපත් කල ද , අධිකරණය එම සැලැස්ම ප්‍රතික්ෂේප කර තමා බන්ධනාගාර ගත කල බවද කොතලාවල මහතා ප්‍රකාශ කර ඇත. මෙයින් අපට පැහැදිලි වන්නේ කුමක්ද ? කොතලාවලගේ වත්කම් පිළිබඳ වහ වැටුණු කබ්රාල් සූක්ෂම ලෙස හා වංචනිකව කටයුතු කරමින් එම දේපල තමා වෙත පවරා ගැනීමයි. කබ්රාල්ට මේ කටයුතු සඳහා එවකට අගවිනිසුරු මොහාන් පීරිස්ගේ ද නොමඳ සහය හිමි වූ බව කොතලාවල මහතා චෝදනා කර ඇත. 2005 වසරේදී කොතලාවලගේ " ගෝල්ඩන් කී ක්‍රෙඩිට් " සමාගමේ නීතිඥවරයා ලෙස කටයුතු කල මොහාන් පීරිස් මහ බැංකුවේ නීති උපදේශකයෙකුද විය." ගෝල්ඩන් කී " තැන්පත්කරුවන් පවරන ලද SCFR 191/2009 දරණ නඩුවේ වග උත්තරකරුවෙකු වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ කරුණු ඉදිරිපත් කල මොහාන් පීරිස් ඔහු අගවිනිසුරු වූ පසුව එම නඩුව ඔහු විසින්ම විභාගකර වරින්වර කොතලාවලගේ දේපල අත්පත් කර ගත් බවත්, එම දේපල අන්සතු කිරීමට නියෝග නිකුත් කල බවත්, තමා බන්ධනාගාරගත කරන ලෙස ඉල්ලා සිටින ලද්දේද නීතිපතිවරයා ලෙස කටයුතු කරන කාලයේ දී මෙම මොහාන් පීරිස් මහතාම බවද චෝදනා කර ඇත. කොතලාවලගේ දේපල කුණු කොල්ලයට මිලදී ගත් සොෆ්ට් ලොපික් සමාගමට නීති උපදෙස් සපයන්නේ මොහාන් පීරිස්ගේ බිරිඳ වන දයාංගනී පීරිස් බවටද, වැඩි දුරටත් තොරතුරු දන්වා ඇත.

මහින්ද රාජපක්ෂ රජයේ මුදල් සොරකම් කිරීමේ උපදේශකයන් දෙදෙනා වන්නේ පී.බී.ජයසුන්දර හා කබ්රාල් යන දෙදෙනායි. රාජපක්ෂ පවුලට හිතුමනාපේ රාජ්‍ය මුදල් කොල්ල කෑමට ඉඩදීම නිසා භාණ්ඩාගාරය හිස් වීමෙන් ඒදිනෙදා අවශ්‍ය ඛනිජ තෙල් ප්‍රමාණය ගෙන ඒමට පවා මුදල් නොමැති විය. එයට විසඳුම් ලෙස තෙල් සංස්ථාව උකසට තබා හෙජින් ගිවිසුමට එළඹියේ මොවුන් දෙදෙනාය. මොවුන් කැබිනට් මණ්ඩලයට දේශනයක් මගින් හෙජින් සූදුවේ වටිනාකම පෙන්වා දී ඔවුන් ලවා රාජ්‍ය නිලධාරීන්ගෙන් යුත් කමිටුවක් පත් කොට වාර්තාවක් ලබා ගැනීමට අනුමැතිය ලබා ගන්නා ලදී. එම කමිටුව නම් කලේ පී .බී . ජයසුන්දරය. එහි නිර්දේශ යයි පවසමින් කැබිනට් අනුමැතිය ගෙන එළඹි විවිධ හෙජින් ගිවිසුම්වලින් තෙල් මිල පහත බැසීමත් සමඟ විදේශ බැංකුවලට මුදල් ගෙවීමට සිදුවීමෙන් රජයට සිදුවූ පාඩුව රු.මි 4,000 පමණ වන අතර තවත් 4,000 ක් පමණ ගෙවීමට සිදුවීමේ අවධානමක් පවතී. මේ පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය පරීක්ෂණ සිදු කරන අතර එහිදී අනාවරණය වී ඇත්තේ උක්ත උපදේශන විශේෂඥ කමිටුවේ කිසිවෙකුත් හෙජින් යනු කුමක්ද යන්න හෝ නොදන්නා බවයි. මෙහිදී

කබ්රාල් සහ ජයසුන්දර දෙදෙනා ප්‍රකාශ කොට ඇත්තේ තමන්ද හෙයින් යනු කුමක්ද යන්න නොදන්නා බවයි.

තවද, මෙම දෙපොල මෙම දූෂිත ගනුදෙනුව සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ එවකට සභාපති අසන්ත ද මෙල් හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( මුදල් ) ලලිත් කරුණාරත්න උපයෝගී කර ගත් අතර, මොවුන්ට බැංකු මගින් නොයෙකුත් වරදාන ලබා දී ඇති බව හෙලි වී ඇත. විදේශ සංචාර 08 කට වැඩි ප්‍රමාණයක් ලබා දී ඇති අතර, පිටරට ගොල්ෆ් ක්‍රීඩා කිරීමට බිල් ගෙවා ඇත්තේ බැංකු මගිනි. මේ හරහා උපයාගෙන ඇති ධනය කොපමණද යන්න පිළිබඳ පරීක්ෂණ ක්‍රියාත්මක වෙමින් පවතී.

සෙන්ට්‍රල් ඉන්වෙස්ට් ෆිනෑන්ස් ( CIFL ) සමාගම පසුගිය කාලයේ කඩා වැටීමට ලක් වූ තවත් එක් මූල්‍ය ආයතනයකි. මෙම ආයතනය ඉහළ පොලියක් ගෙවන බව දන්වා තැන්පත්කරුවන් 19,000 කගේ තැන්පත් මුදල් ලබා ගෙන රුපියල් කෝටි 400 කට ආසන්න මුදලක් වංචා කර සමාගමේ සභාපති දීප්ති පෙරේරා රටින් පලා ගොස් ඇත. එම තැනැත්තා අත් අඩංගුවට ගැනීමට පොලීසිය විසින් මහ බැංකුවෙන් මෙම සමාගමේ විගණන වාර්තාද ඉල්ලා සිටියද අජිත් නිවාඩ් කබ්රාල් මොහු සමග පැවැත්වූ සැක කටයුතු සම්බන්ධතාවය නිසා ඔහු රටින් පැන යන තුරුම මහ බැංකුව මෙම වාර්තා ඉදිරිපත් නොකල අතර දීප්ති පෙරේරා පලා ගිය පසුව මහ බැංකුව එම වාර්තා ලබා දී ඇත.

## 6.07 විදුලි සංදේශන නියාමන කොමිසමේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් අනූෂ පැල්පිට

විදුලි සංදේශන නියාමන කොමිසමේ රුපියල් මිලියන 600 ක මුදල් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ මැතිවරණ ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීමට මූලික වූ තවත් අයෙකි. මොහු විසින් කොළඹ 07, ලොන්ඩන් පෙදෙසේ නිවසක විශේෂ විමර්ශන ඒකකය නම් කාර්යාලයක් පිහිටුවා විදුලි සංදේශන නියාමන කොමිසමේ සේවකයන් පිරිසක් සහ බාහිර පිරිසක් යොදවා 2015 ජනවාරි ජනාධිපතිවරණය ප්‍රකාශ කළ දින සිට එය පැවැත්වූ ජනවාරි 8 දක්වා කාලය තුළ දේශපාලන කටයුතු වල නියැලිනි. මේ සඳහා ටෙන්ඩර් පටිපාටි උල්ලංඝනය කරමින් අත්තනෝමතිකව පරිගණක 150 කට අධික සංඛ්‍යාවක් මිලදී ගෙන අන්තර්ජාල පහසුකම් සහිතව මෙම මැතිවරණ ප්‍රවර්ධන කටයුත්තේ නියැලුණු කාර්ය මණ්ඩලය සඳහා කාමර පහසුකම් නගරෝදය මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා පදනම් ආයතනය මගින් ලබා ගන්නා ලද බවත් ඔවුන්ට අහාරපාන, වැටුප් , අතිකාල , ප්‍රසාද දීමනා විශාල වශයෙන් රජයේ මුදලින් ගෙවන ලද බවත් අනාවරණය විය.

තවද මැතිවරණය සඳහා මහින්ද රාජපක්ෂ වෙනුවෙන් රූපවාහිණී දැන්වීම් සකස් කිරීම සඳහා විදුලි සංදේශන නියාමන කොමිසමේ මුදල් යෙදවූ බවත් රු ලක්ෂ 60 ක මුදලක් ජනාධිපති ලේකම් කාර්යාලයට මැතිවරණය සඳහා ලබා දී ඇත. තවද අනූෂ පැල්පිට මහතා තමාගේ පක්ෂයේ දේශපාලන හිතවතුන්ට විදුලි සංදේශන කොමිසමේ පුරප්පාඩු නොමැතිව තිබියදීත් පත්වීම් ප්‍රදානය කර ඇති අතර , ලංකාදීප කර්තෘ දොඹගහවත්ත මහතා මහින්ද රාජපක්ෂ වෙනුවෙන් කඩේ යාම වෙනුවෙන් ඔහුගේ දියණියට තොරතුරු තාක්ෂණ සහකාර තනතුරක් ප්‍රදානය කිරීම එක් නිදසුනකි. විදුලි සංදේශන නියාමන කොමිසමේ නෙළුම් කුළුණු ව්‍යාපෘතිය සහ සූරිය වැව ඉදිකරන තොරතුරු තාක්ෂණ

ව්‍යාපෘතිය මගින් අනුෂ පැල්පිට මහතා අයුතු ලෙස මුදල් ඉපැයීම කල බවත් මෙම ව්‍යාපෘතියේ රාජකාරි ඉටුකරන බව පවසා මාසිකව රු 150,000/- බැගින් අමතර වැටුපක් ලබා ගැනීම ඇතුළු තවත් අක්‍රමිකතා රාශියකට ඔහු සම්බන්ධ බව අනාවරණය වී ඇත.

## 6.08 රංජිත් රූබසිංහ හිටපු ප්‍රධාන විධායක - මොබිටෙල්

2002 වර්ෂයේ සිට , මොබිටෙල් ආයතනය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය යටතේ පාලනය වන රජයට අයත් සමාගමකි. මෙම ආයතනයේ ප්‍රධාන විධායක ලෙස රංජිත් රූබසිංහ 2009 වර්ෂයේදී පත් කරනු ලැබුයේ නාමල් රාජපක්ෂගේ අවශ්‍යතාවයකට අනුවය . එම අවශ්‍යතා රංජිත් රූබසිංහ කෙතෙක් දුරට ඉටු කර ඇති ද යන්න පහත සිදුවීම් වලින් පැහැදිලි වේ.

2015 ජනාධිපතිවරණය ඉලක්ක කරගෙන චීනයෙන් ගෙන්වන ලද ජංගම දුරකථන 400 ක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙනුවෙන් මැතිවරණ අල්ලසක් ලෙස නොමිලයේ ලබා දී ඇත. පසුගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ තමන්ට ඡන්දය ලබා දෙන මෙන් ඉල්ලා පටිගත කරන ලද පණිවිඩයක් මෙරට ජනතාව භාවිතා කරනු ලබන සෑම ජංගම දුරකථනයකටම එවා ඇත. මෙය මැතිවරණ නීති අමු අමුවේ උල්ලංඝනය කිරීමකි. එසේ වුවද මෙම කාර්යය මොබිටෙල් ආයතනය හරහා ඉටු කර ගැනීමට සියලු හැකියාවන් පැවතියද එම කොන්ත්‍රාත්තුව HELLO CROP නම් ආයතනයකට පවරා ඊට රු.72,000,000/- ක් ගෙවා ඇත. මෙකී HELLO CROP ආයතනයේ අයිතිකරු කවුද? 2013.06.14 දින HELLO CROP ආයතනයේ 100% කොටස් GOWERS CORPORATE SERVICE ( PVT ) LTD. නම් ආයතනය විසින් මිලදී ගෙන ඇත . සමාගම් ලියාපදිංචි කිරීමේ ලේකම් කාර්යාලයේ ලේඛන අනුව GOWERS CORPORATE SERVICE ( PVT ) LTD ආයතනයේ හිමිකරු වන්නේ නාමල් රාජපක්ෂයි . නාමල් රාජපක්ෂ සිය අතවැසියන් එම ආයතනයන්ට පත් කර ගනිමින් ඔවුන් ලවා එම ආයතනයන් සතු මුදල් හා සම්පත් කොල්ල කෑම සිදුකොට ඇති ආකාරය හොඳින්ම පැහැදිලිය.

රාජපක්ෂ පුතුන්ගේ CSN නාලිකාවට , ජනාධිපතිවරණ කාලසීමාවේ වෙළඳ දැන්වීම් ප්‍රචාරණය වෙනුවෙන් රු.30,000,000/- ක් මොබිටෙල් සමාගම විසින් ගෙවා ඇත . මෙලෙස CSN වෙත ගෙවන ලද මුදල් ද අවසානයේ නතර වන්නේ රාජපක්ෂලාගේ සාක්කුවේය . රාජපක්ෂ පාලන සමයේ මෙරට හන්දියක් හන්දියක් පාසා මහින්ද රාජපක්ෂගේ රුව රැගත් දැවැන්ත පුවරු ''කුමා ස්ටිකර්ස්'' නැමැති ආයතනය හරහා ප්‍රදර්ශනය කරන ලදී . එම ආයතනයේ අනුග්‍රහයක් ලෙස මෙම පුවරු ඉදි කර ඇති බව බැලූ බැල්මට පෙනුනද සැබෑ ලෙසම සිදුව ඇත්තේ රංජිත් රූබසිංහගේ පාසැල් සගයෙකු මෙන්ම මහින්ද රාජපක්ෂගේ ඥාතියෙකු වන කුමා ස්ටිකර්ස් ආයතනයේ හිමිකරුට

මොබිටෙල් ආයතනයෙන් පමණක් මෙසේ පුවරු ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් රු.120,000,000/-ක්( ජනාධිපතිවරණය වෙනුවෙන් පමණක් ) ගෙවා ඇති බවයි .

දයාබර සහෝදර සහෝදරිය , රුපියල් 50/- ක් වැය කර ජංගම දුරකථනයට දමා ගන්නා රීලෝඩ් එකකින් රු.15/- කට ආසන්න බද්දක් රජයට ගෙවන බව ඔබ දන්නවා දැයි නොදනමි , කෙසේ වුවත් රාජපක්ෂලා මෙලෙස සූරා කෑවේ ඔබ රජයට ගෙවන බදු මුදල බව සිහියේ තබා ගන්න .

මහින්ද රාජපක්ෂ ප්‍රතිරූපය ඔසවා තබමින් නගරයක් නගරයක් පාසා සංචාරය කිරීමට සලස්වන ලද LED තිර සහිත ට්‍රක් රථ වෙනුවෙන් රු.25,000,000/- ක් ද , ජනාධිපතිවරණ ප්‍රචාරණ ව්‍යාපෘතියක් වන "කළගුණ " වැඩසටහන වෙනුවෙන් ද "පුබුදමු හෙටක් " කැලැන්ඩරය මුද්‍රණය සඳහාද , මහින්ද රාජපක්ෂට ඡන්දය ඉල්ලා යවන SMSපණිවිඩ වෙනුවෙන් ද මොබිටෙල් කාර්ය මණ්ඩලය ජනාධිපතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා යෙදවීම ද යනාදී කටයුතු සඳහා මොබිටෙල් ආයතනයේ මුදල් රු.140,500,000/-ක් වැය කර ඇති බව හෙළි වී ඇත .

ඉහතින් පෙන්වා දුන් පරිදි රංජිත් රූබසිංහ විසින් මොබිටෙල් ආයතනය සතු රුපියල් කෝටි 100 කට අධික මුදලක් මහින්ද රාජපක්ෂගේ මැතිවරණ ව්‍යාපාරයට සහ රාජපක්ෂ පුතුන් වෙනුවෙන් වියදම් කර ඇති බව ආයතනය තුළ සිදු කරන ලද විගණන පරීක්ෂණ වලින් ද හෙළි වී ඇති බව ඉදිරිපත් කර ඇති පැමිණිලි වල ද සඳහන් කර ඇත . රාජපක්ෂ පරපුර හා වහලුන් නැවත මෙරට බලය උදුරා ගැනීමට සැරසෙන්නේ කුමක් සඳහා ද යන්න මේ අනුව හොඳින්ම පැහැදිලි වේ . මෙම දූෂිතයන්ට තවත් වරක් බලය ලබා දීම කෙතරම් නිවැරදිද යන්න ඔබගේ හෘද සාක්ෂියෙන් විමසා දැන ගන්න .

## 6.09 පියදාස කුඩාබාලගේ - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂ

1962 වසරේදී ස්ථාපිත කිරීමෙන් පසු එදාමෙදා තුර මෙරට ආර්ථිකය විශාල ශක්තියක් වී ඇති රක්ෂණ සංස්ථාවද රාජපක්ෂ පාලනය නැමැති බූවල්ලාගේ ග්‍රහනයට හසුවීමෙන් පසු ආයතනයට සිදුවී ඇත්තේ ඛේදවාචකයකි . ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස පසුගිය රජය සමයේ කටයුතු කරනු ලැබුයේ පියදාස කුඩාබාලගේ නැමැති ගණකාධිකාරීවරයකි . මොහු හිටපු ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත්ගේ සමීප විශ්ව විද්‍යාල මිතුරෙකු වීම මෙම තනතුර ලැබීමට එකම සුදුසුකම විය . කුඩාබාලගේ හට ලිට්රෝ ගෑස් සමාගමේ කළමණාකරණ අධ්‍යක්ෂ ප්‍රධාන විධායක නිලධාරී ධූරය ලබා දෙනුයේද මෙකී සම්බන්ධතාවය මතය . මෙම ප්‍රධාන ආයතන දෙකද ඇතුළුව රජය සතු ඉතා විශාල ලෙස මුදල් ගණුදෙනු කරනු ලබන ආයතන 18 ක අධ්‍යක්ෂ , සභාපති හෝ කළමනාකරණ අධ්‍යක්ෂ තනතුරු සඳහා මෙම කුඩාබාලගේ පත් කිරීම තුලින් ජනාධිපති කාර්යය මණ්ඩල ප්‍රධානී ගාමිණී සෙනරත් හා මොහු අතර තිබූ සබඳතාවය කෙබඳුද යන්න හෙළි කර ගත හැක . හොරණ ප්‍රදේශය ඉතාම සාමාන්‍ය පවුලක ඉපදී පොදු ප්‍රවාහන සේවා මගින් ගමන් බිමන් ගිය කුඩාබාලාගේ හට අද වන විට කොළඹින් එපාර්ට්මන්ට් 03 ක් , මහනුවර රජපිහිල්ල මාවතේ කෝටි 17 ක නිවස , නුගේගොඩ රු.

කෝටි 2.5 ක නිවස ලෙස වත්කම් විශාල ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇති බවට පැමිණිලි ලැබී ඇත . රක්ෂණ සංස්ථාව නැවත රජයට පවරා ගන්නා විට කටයුතු කල යුතු ආකාරය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය 2019.06.04 දින ප්‍රකාශ කරන ලද තීන්දුව අනුව හැරී ජයවර්ධනට රු බිලියන 6.72 ක මුදලක් වසර 05 කදී ගෙවා අවසන් කල යුතු බව දන්වා තිබුණද එම මුදල වසරකදී ගෙවීම මගින් රක්ෂණ සංස්ථාවේ වත්කම් වලට සිදුකරන ලද විනාශය ඉතා බරපතලය . රුපියල් බිලියන 6.72 ක මුදල ගෙවූ බවට දක්වා තිබුණද හැරී ජයවර්ධන තමන්ට ලැබුණේ බිලියන 5.71 ක් බව ලිපියකින් දන්වා ඇත . ඒ අනුව ඉතිරි රුපියල් බිලියන 1.01 (කෝටි 100 ) කට සිදුවුයේ කුමක්ද ?

රජයේ ටෙන්ඩර් පටිපාටි පුද්ගලික ආයතන වලට අදාළ නොවන බව පවසමින් ලිට්රෝ සමාගමේ මිලදී ගැනීම් වලදී රුපියල් මිලියන ගණන් යටිමඩි ගසා ඇති බව දැන් හෙළි වෙමින් තිබේ . එහෙත් මෙම සූර චෞරයාට ලිට්රෝ සමාගමේ 50% ක කොටස් රජයට අයත් බවත් රජය සතු සමාගම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි කටයුතු කල යුතු බවත් අමතක වී ඇත . ගෑස් මිලදී ගැනීම සඳහා ගිවිසුම් ගතවීම , ප්‍රමිතියෙන් බාල ගෑස් ගෙන්වීම හදිසි අවශ්‍යතාවයක් බව පෙන්වා ගෑස් ගෙන්වීම වැනි වංචා තුළින් රු.කෝටි 100 කට ආසන්න පාඩුවක් කුඩාබාලාගේ නැමැති මෙම බහිරවයා විසින් සමාගම වෙත සිදුකර ඇති බව සමාගමේ සේවකයන් විසින්ම පෙන්වා දී ඇත .

මේ සියළු ආයතන වලින් කුඩාබාලාගේ මසකට රු. ලක්ෂ 50 ඉක්මවූ වැටුප් හා දීමනා ලබා ගෙන ඇත . රක්ෂණ සංස්ථාවෙන් හා ලිට්රෝ ගෑස් සමාගමේ දේපළ පුද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීම , පුද්ගලික නිවාස වල ජල , විදුලි බිල්පත් ආයතන මුදල් වලින් ගෙවීම , 2015 ජනාධිපතිවරණය ඇතුළු පසුගිය රජය සමයේ පවත්වන ලද මැතිවරණ කටයුතු සඳහා ආයතන වල මුදල් දේපල හා කාර්ය මණ්ඩල ලබා දීම , රාජපක්ෂ පුතුන්ගේ රගර් ක්‍රීඩාව වෙනුවෙන් කාල්ටන් ස්පෝර්ට්ස් වෙත රුපියල් මිලියන ගණන් ලබා දීම , 2015 ජනාධිපතිවරණය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී තිලංග සුමතිපාල හරහා ගෑස් සිලින්ඩර් 1000 ක් බෙදා දීම යන ආදී බරපතල මූල්‍ය අපරාධ ගණනාවකට පියදාස කුඩාබාලාගේ සම්බන්ධ බවට මේ වන විට තොරතුරු හෙළිවී ඇත .

එදා වේල හම්බකර ගැනීම සඳහා දහඅතේ ණය වී ලබා ගන්නා ත්‍රී රෝද රථයට , දුප්පතාගේ යතුරු පැදියට , සුළු ව්‍යාපාරිකයාගේ ඩිමෝ බට්ටා රථයට ගෙවන ලද රක්ෂණ වාරික හා මර බියට හෝ සොර සතුරු බියට ලබා ගන්නා රක්ෂණයට ගෙවන ලද මුදලින් සතෙන් සතේ එකතු වී දියුණු කර ගන්නා ලද රක්ෂණ සංස්ථාවත් අහස උසට නංවන ලද ගෑස් සිලින්ඩරයේ මුදලින් ගොඩනංවන ලද ගෑස් සමාගමත් පියදාස කුඩාබාලාගේ වැනි රාජපක්ෂ හෙංචයියන් විසින් පසුගිය කාලය තුල සාරය උරාබී හපය පමණක් ඉතිරි කර ඇත , එසේ උරා බොන ලද සාරයෙන් උන්ගේ පරම්පරාවල් පමණක් පෝෂණය වී ඇත.

### චම්පික කරුණාරත්න - මහා මාර්ග අමාත්‍යාංශයේ හිටපු සම්බන්ධීකරණ ලේකම්

නාමල් රාජපක්ෂගේ සමීප මිතුරෙකු වන මොහු 2010 වසරේ සිට මහා මාර්ග අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු ලෙසද රාජ්‍ය දැව සංස්ථාවේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද සේවය කරන ලදී. කිසිදු වෘත්තීය සුදුසුකම් නොමැති බව සඳහන්

මොහු අ.පො.ස (සා/පෙළ) පමණක් සමත් අයෙක් බව පැවසේ. නාමල් රාජපක්ෂගේ " තාරුණ්‍යට හෙටක්" සංවිධානයේ අධ්‍යක්ෂවරයෙක් හා Carlton Sports Rugby සහ Carlton Basketball සංවිධායකවරයෙකු ලෙස ක්‍රියා කරමින් එම තරග සඳහා රජයේ ආයතන වලින් අනුග්‍රහය ලබා ගැනීමට නාමල් රාජපක්ෂගේ සම්බන්ධතා උපයෝගී කර ගෙන දැඩි බලපෑම් සිදුකර ඇත.

රේගු අධිකාරියේ රත්‍රං වෙන්දේසියෙන් මොහුගේ නමින් මිලියන 25 ක රත්‍රං මිලදී ගැනීම, රත්නපුර ප්‍රදේශයේ මැණික් පතල් වංචනික ලෙස ලබා ගැනීම හා බැංකු ගිණුම් වල තැන්පත් කර ඇති මිලියන 45 ක් උපයා ගත් ආකාරය පිළිබඳව චෝදනා මොහුට එරෙහිව ලැබී ඇත.

## නාගරික සංවර්ධන අධිකාරියේ හිටපු සභාපති නිමල් පෙරේරා

ගෝඨාභය රාජපක්ෂ යටතේ තිබූ නාගරික සංවර්ධන අධිකාරියේ හිටපු සභාපතිවරයා වේ. 2015 ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු සඳහා අධිකාරියේ මුදල් වාර 03 කදී ලබා දී ඇති බවත් එක් වරකදී රුපියල් ලක්ෂ 550 ක චෙක් පතක් ලබා දී ඇති බවත් පැමිණිලි මගින් ඉදිරිපත් වී ඇත. එමෙන්ම අඩු ආදායම් ලාභී නිවාස ව්‍යාපෘති විවෘත කිරීමේ උත්සවය සඳහා ලක්ෂ ගණනින් මුදල් වැය කිරීම, ජනාධිපතිවරයාගේ කටයුතු සඳහා අධිකාරියේ සේවකයන් හා මුදල් යෙදවීම, ප්‍රචාරක පොත් 150,000 ක් හා අත් පත්‍රිකා විශාල ප්‍රමාණයක් මුද්‍රණය කිරීම සම්බන්ධවද, කොළඹ කොටුවේ පාවෙන වෙළඳ සංකීර්ණයේ ආපන ශාලා ටෙන්ඩරය ටෙස්ටා බේකර්ස් වෙත ලබා දීමේදී වංචා කර ඇති බවද, (ආරක්ෂක අමාත්‍යංශයේ රණවිරු සේවා අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන සෑම ආපනශාලා ටෙන්ඩරයක්ම ලබාදී ඇත්තේ මෙම ටෙස්ටා බේකර්ස් වෙතය.) කොළඹ කොටුව ට්‍රාන්ස්වර්ක් ඉඩම ක්‍රිෂ් සමාගම වෙත විකිණීම හා කොම්පඤ්ඤ වීදියේ ඉඩම් ඉන්දියාවේ ටාටා (TATA) සමාගමට විකිණීමේදී මිලියන ගණනින් මුදල් ලබා ගෙන ඇති බවට පැමිණිලි ලැබී ඇත.

නාගරික සංවර්ධන අධිකාරියට අයත් අංක 70/2, ඔරුගොඩවත්ත ස්ථානයේ පිහිටි අක්කර 09 ක් විශාල ඉඩමක් සිලෝන් ෂිපිං ලයින්ස් නැමැති සමාගමකට මසකට රු. 140,000/- ක් වැනි ඉතා අඩු මුදලකට කුලියට ලබා දී ඇති බවත් එම සමාගම විසින් අදාළ ඉඩමෙන් කොටසක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) වෙතට කුලියට දීමෙන් මසකට රුපියල් ලක්ෂ 32 ක්ද (3,200,000/-) තවත් කොටසක් ශ්‍රී ලංකා රේගුවට කුලියට දීමෙන් මසකට රුපියල් ලක්ෂ 09 ක් වශයෙන් ඉඩමෙන් මසකට ලක්ෂ 41 (4,100,000/-) උපයා ගන්නා බවට චෝදනා එල්ල වී ඇත. රජයට අයත් දේපලක් ඉතාම සොච්චම් මුදලකට ලබා ගෙන එයින් ඉතා විශාල මුදලක් හම්බ කර ගැනීමට ඉඩදී බලධාරීන් ඇස් කන් පියාගෙන ඉන්නේ අදාළ සමාගමෙන් මසකට විශාල මුදලක් අල්ලස් ලෙස ලබා ගන්නා හේතුවෙන් බව සේවකයින් විසින් චෝදනා කර ඇත.

බෙල්ලන්විල දියත උයන, තුරග තරග පිටිය 1 සහ 2 අදියර, ඕලන්ද රෝහල, පිටකොටුවේ ගෝල්ඩ් මාර්කට් වැනි නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති විවෘත කිරීම් වලදී භාතිය -

සන්තුෂ් ගායක දෙපළගේ Event Management ආයතනයට මිලියන 150 ඉක්මවා මුදල් ගෙවීම තවත් චෝදනාවකි.

තමන් යටතේ ඇති ආයතනයේ සභාපතිවරයා සිදු කරන වංචා දූෂණ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරයා ලෙස ගෝඨාභය රාජපක්ෂ නොදැන සිටියේ යැයි උපකල්පනය කළ නොහැක. එසේම දූෂණයන්ට ඉඩදී ඉවත බලාගෙන සිටීමද වරදකි.

## 6.12 හිටපු බුද්ධි අංශ ප්‍රධානි මේජර් ජනරාල් කපිල හෙන්දවිතාරණ

ගෝඨාභය රාජපක්ෂගේ ළගම හිතවතෙකු වන හිටපු බුද්ධි අංශ ප්‍රධානි විශ්‍රාමික මේජර් ජනරාල් කපිල හෙන්දවිතාරණ අයථා ආකාරයෙන් රැස් කර ගත් මුදල් ප්‍රංශයේ සහ ලක්සම්බර්ග් යන රටවල් වල තැන්පත් කර ඇති බවට පැමිණිලි ලැබී ඇත. කපිල හෙන්දවිතාරණගේ හා CSN නාලිකාව අයිති රාජපක්ෂ පුතුන්ගේ මුදල් මෙම රටවල් වල තැන්පත් කර ඇත්තේ DAN TV නමැති දෙමළ රූපවාහිනී නාලිකාව හිමි එස්.එස්. කුහන්දන් යන අය මගින් බව එම පැමිණිල්ලේ දක්වා ඇත. කුහන්දන් හට මෙම DAN TV නාලිකා බලපත්‍රය ලබා ගැනීමට කපිල හෙන්දවිතාරණ ජනමාධ්‍ය අමාත්‍යාංශයට හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට බලපෑම් කර ඇති බවත් DAN TV නාලිකාව පසුගිය ජනාධිපතිවරණ දිනයේදී ඡන්දය ප්‍රකාශ කිරීමේ වේලාව සවස 04 සිට සවස 06 දක්වා දීර්ඝ කළ බවට ව්‍යාජ ප්‍රවෘත්තියක් විකාශනය කර ඇති බවටත් තවත් පැමිණිල්ලක් ඉදිරිපත් වී ඇත. තවද මෙම නාලිකාව එදින ජනප්‍රිය දෙමළ චිත්‍රපට විකාශනය කරමින් උතුරේ වැසියන් ඡන්ද දැමීමට යෑම වැලැක්වීමේ උත්සහයක නිරත වී ඇති බවද එමගින් කරුණු දක්වා ඇත.

## 6.13 හිටපු යුධ හමුදාපති ජනරාල් දයා රත්නායක

යුධ හමුදා මූලස්ථානය තිබූ ඉඩම ශැන්ග්‍රිලා ඇතුළු හෝටල් සමාගම් වලට විකිණීමෙන් පසුව බත්තරමුල්ලට අමාත්‍යාංශය ගෙන යන තෙක් හමුදා කාර්යාල කුලියට ලබා ගත් ගොඩනැගිලිවල පිහිටුවා ඇත. මෙම ගොඩනැගිලි සඳහා කුලිය ගෙවීමේදී එම කුලිය ගොඩනැගිලිවල නියම අයිතිකරුවන් නොවන වෙනත් පුද්ගලයන් හට ලබා දී ඔවුන්ගෙන් අල්ලස් ලබා ගත්තා බවට හිටපු යුධ හමුදාපති දයාරත්නායකට හා හට නිවාස අධ්‍යක්ෂට එරෙහිව හට නිවාස අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙබළුන් පිරිසක් විසින් චෝදනා එල්ල කර ඇත.

කොල්ලුපිටියේ රේල් පාලම අසල සුභ සාධක අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථාන ගත කර තිබූ ගොඩනැගිල්ල සඳහා එස්. ගුණසේකර නමැති වංචනික පුද්ගලයෙකු හට මාසිකව මිලියන 06 බැගින් කුලිය ගෙවීම හා කැළණිය දළුගම දාස ගොඩනැගිල්ල වෙනුවෙන් එහි නියම අයිතිකරු නොවන පුද්ගලයෙකුට කුලිය ගෙවීම ඔවුන් උදාහරණ ලෙසට පෙන්වා දී ඇත. මෙම ගනුදෙනු මගින් උපයා ගත් මුදල් පිළිබඳව ඔවුන්ගේ බැංකු ගිණුම් පරීක්ෂා කිරීමෙන් සොයා ගත හැකි බවටද මෙම පැමිණිල්ලෙන් දක්වා ඇත.

## 6.14 ජේ.පී.අයි. වජිර ඉරුගල්බණ්ඩාර - මහින්ද රාජපක්ෂ මහතාගේ හිටපු මහජන සම්බන්ධතා පිළිබඳ අධ්‍යක්ෂ

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන ප්‍රතිරූපය ඉහළ නංවාලීම සඳහා ඔහුගේ මහජන සම්බන්ධතා පිළිබඳ අධ්‍යක්ෂවරයා වූ ජේ.පී.අයි.වජිර ඉරුගල්බණ්ඩාර මහතා විසින් ජ්‍යෙෂ්ඨ පුරවැසි ජාතික සංවිධානය නමින් සංවිධානයක් පිහිටුවා ඇත.

මෙම සංවිධානයේ මාසික සාමාජික ගාස්තුව රු.50/-ක් වන අතර වසරක සාමාජික ගාස්තුව රු.500.00කි. යාවජීව සාමාජික ගාස්තුව රු.5,000/-කි. එම සාමාජික මුදල් සම්පත් බැංකුවේ 102 760 332 581 ගිණුමට බැර කර තිබේ. මෙම සාමාජික ගාස්තු සාමාජිකයින් වෙත නැවත ලබා දීමේ පොරොන්දුව මත අය කරගෙන ඇතත් ඒ සඳහා ඉතිරි කිරීමේ තැන්පතු පොත් කිසිදු සාමාජිකයෙකුට නිකුත් නොකර සාමාජික මුදල් වංචා කර ඇති අතර එසේ වංචා කරන ලද මුදල ඉතා විශාල බව පැමිණිලිකරු සඳහන් කරයි.

දිප ව්‍යාප්තව, දහස් ගණනින් සාමාජිකයින් බඳවා ගනිමින් පවත්වාගෙන ගොස් ඇති මෙම සංවිධානයේ රැස්වීම් මැතිවරණය ආසන්න කාල සීමාවේ ඡන්දය ඉලක්ක කර ගනිමින් පවත්වාගෙන ගොස් තිබේ. මෙම සංවිධානය විශ්වාසය කඩ කරමින් ජනතාවට සිදු කොට ඇති අසාධාරණයට සාධාරණයක් ඉටු කරන මෙන් ඉල්ලා පැමිණිලිකරු විසින් පැමිණිල්ල ඉදිරිපත් කොට ඇත.

## 6.15 ජගත් වැල්ලවත්ත - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ හිටපු සභාපති

ජගත් වැල්ලවත්ත රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළ අවධියේ එම බැංකුවේ පරමාර්ථයන්ගෙන් බැහැරව, එසේ ම බැංකුවේ කටයුතු වලට කිසිසේත් ම අදාළ නොවන පුෂ්පා රාජපක්ෂ පදනමට බැංකුවේ මුදලින් රුපියල් ලක්ෂ 15ක් ලබා දී ඇත. මෙකී කාරණාව පිළිබඳව මහාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරන බවට තොරතුරු අනාවරණය වී ඇත.

## 6.16 අයි.ඒ.පී.හර්ෂානන්ද සිල්වා - ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ හිටපු සභාපතිවරයා

පසුගිය රජයේ රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපතිවරයා වූයේ ගෝඨාභය රාජපක්ෂගේ හිතවතෙකු වූ හර්ෂානන්ද සිල්වා යි.

ගෝඨාභය රාජපක්ෂගේ ව්‍යාපෘති තම ආයතනය හරහා ක්‍රියාත්මක කිරීම තුළින් රුපියල් කෝටි ගණනින් හම්බ කරගෙන ඇති බවට චෝදනා එල්ල වී ඇත. විශේෂයෙන් ම නුගේගොඩ, නාවල පාරේ දියත උයන ඉදිකිරීමේ කටයුතු, බෙල්ලන්විල වගුරු බිම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති සඳහා පෞද්ගලික යන්ත්‍රෝපකරණ සැපයීම, වන්දි ගෙවීම් වලින් වංචා කිරීම යන චෝදනා මොහුට එරෙහිව ඉදිරිපත් වී ඇත.

2014/02/17 සිට 2014/11/06 දක්වා කාලය තුළ වීරකැටිය ව්‍යාපෘතිය නමින් හඳුන්වන ලද මහින්ද රාජපක්ෂගේ දෙමාපියන් වෙනුවෙන් කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා කිසිදු කැබිනට් අනුමැතියක් හෝ ටෙන්ඩර් මණ්ඩල අනුමැතියක් නොමැතිව සංස්ථාවේ මුදල් රුපියල් 61,710,093/-ක් වැය කිරීම තුළින් සංස්ථාව වලපල්ලට යවා ඇත. සංස්ථාවේ වැඩසටහන් වලට ඇතුළත් නොවූ මෙවැනි ව්‍යාපෘති වෙනුවෙන් මුදල් වැය කිරීම හේතුවෙන් අද වනවිට සංස්ථාව බරපතල මූල්‍ය අර්බුදයකට ලක්ව ඇත. "ගංවතුරින් තොර පරිසර හිතකාමී පරිසරයක් හා දූෂණයෙන් තොර ජලාශ ඇති කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ප්‍රමුඛයා වීම" සංස්ථාවේ දැක්ම වේ. ආයතනයේ දැක්ම තුළ අනුස්මරණ කෞතුකාගාර ඉදිකිරීම ඇතුළත් වන්නේ කෙසේ ද යන්න දන්නේ හර්ෂානන්ද සිල්වා සහ ගෝඨාභය රාජපක්ෂ පමණි. මෙවැනි නිෂ්ප්‍රයෝජන කටයුතු සඳහා රුපියල් මිලියන 61 කට අධික මුදලක් වැය කරන්නේ සංස්ථාව දේශීය බැංකු වලින් ලබා ගන්නා ලද රුපියල් මිලියන 14,277ක ණය මුදලින් බව මෙම වාර්තාවට අමතක කර ඇත.

රජයේ කොන්ත්‍රාත් වැඩ තරඟකාරී මිල කැඳවීමකින් තොරවම සංස්ථාවට ලබාදීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා දී ඇත. එසේ වුව ද මෙම සංස්ථාව එම අනුමැතියට මුවා වී ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩාංගන ඉදිකිරීමේ කටයුතු තරඟකාරී මිල කැඳවීමකින් තොරවම ලබා ගෙන එම ඉදිකිරීම් කටයුතු එවකට ක්‍රීඩා ඇමතිව සිටි මහින්දානන්ද අලුත්ගමගේට හිතවත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව නම් කරන පුද්ගලයින්ට උප කොන්ත්‍රාත්තු ලෙස ටෙන්ඩර් කැඳවීමකින් තොරවම ලබා දී ඇත. මෙමඟින් සංස්ථාවට 3%ක කොමිස් මුදලක් පමණක් හිමිවන අතර මෙම ආයතන දියුණු කිරීමේ පරමාර්ථයෙන් ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට එරෙහිව යාමකි.

## 6.17 සුදර්ශන ගනේගොඩ - ලංකා පොහොර සංස්ථාවේ හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂ

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සමීපතම ඥාතියෙකු වන සුදර්ශන ගනේගොඩ විවාහ වී සිටින්නේ මහින්ද රාජපක්ෂගේ සහෝදරියකගේ දියණියක් වන වින්ධ්‍යා රංගනී හෙට්ටිආරච්චි සමඟයි. 2010 වර්ෂයේ සිට ලංකා පොහොර සංස්ථාවේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළ මොහු නාමල් රාජපක්ෂගේ කොළඹ 05 හි පිහිටි NR CONSULTANCIES ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ලෙස ද කටයුතු කරයි. ඉන්දියාවේ TRIMAX IT සමාගම, හම්බන්තොට තොරතුරු තාක්ෂණ කලාපයේ විදුලි සංදේශ නියාමන කොමිසම හරහා සිදු කළ ආයෝජනයෙන් රාජපක්ෂවරු ලබා ගත් කොමිස් මුදල් පිළිබඳ සම්බන්ධීකරණය කරමින්, එම කොමිස් මුදල් ලබාගෙන ඇත්තේ මෙම පුද්ගලයා බවට පැමිණිලි ලැබී ඇත. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා ORACAL INTERNATIONAL සමාගම අතර සිදු වූ ගණුදෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 02ක් අල්ලස් ලෙස ලබා ගෙන ඇති බවට ද පැමිණිලි ඇත.

මෙසේ අයථා ආකාරයෙන් උපයා ගත් මුදල් වලින් මොහු බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ තීරුබදු රහිත සාප්පු සංකීර්ණයේ 'TELCY' නමැති විදුලි උපකරණ අලෙවිහල පවත්වාගෙන යන අතර කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 421 දරණ

ස්ථානයේ එම ආයතනයේ ම තවත් ශාඛාවක් හා රාජගිරිය, බුත්ගමුව පාරේ, අංක 101 දරණ ස්ථානයේ පිහිටි "THE FAIRWAY" නමැති මහල් නිවාස සංකීර්ණයෙන් රුපියල් මිලියන 20 වටිනා නිවසක් සතු බවත්, මිරිහාන, එදිරිසිංහ මාවතේ, පළමු පටුමගේ, අංක 50/5 දරණ ස්ථානයේ විශාල තට්ටු නිවසක් ඇති බවත්, මහින්ද රාජපක්ෂ දැන් පදිංචිව සිටින්නේ එම නිවසේ බවත් විමර්ශන වලදී අනාවරණය වී ඇත. කොළඹ 07, තුරග තරඟපිටිය ක්‍රීඩාගාරයේ සහ කොටුව ඕලන්ද රෝහල සාප්පු සංකීර්ණයේ ඇති "R & R RESTAURANT" යන අවන්හල් මොහුට අයිතිව ඇති බව විමර්ශන වලදී හෙළි වී ඇත.

මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් විසින් දැන් පවසන්නේ "අපට හොරා කියලා චෝදනා කළා. එත් කරපු හොරකම් කිසිදෙයක් ඔප්පු කරලා නැහැ" යනුවෙනි. මේ සුදර්ශන ගතේගොඩ ලා ඇතුළු රාජපක්ෂ ඥාතීන් විසින් මෑත අවුරුදු 10ක ඉතිහාසය තුළ හම්බ කරගෙන ඇති ධනය දෙස බැලූ විට රාජපක්ෂලා හොරකම් කළ දේ කාගේ නම් වලින් පවත්වා ගෙන යන්නේ ද යන්න ඔබට පැහැදිලි වනු ඇත.

## 6.18 රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු සභාපති සිරිපාල අමරසිංහ

රාජ්‍ය දැව සංස්ථාවේ හිටපු සභාපති සිරිපාල අමරසිංහ එම ධුරය දරමින් සිටි කාලයේ දී, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹගහවැව ප්‍රදේශයේ හේන් ගොවීන් විසින් ගොවිතැන් කරගෙන ආ ඉඩම් අක්කර 50 ක් ඇතුළුව අක්කර 90ක භූමියක් ඔහුට නීත්‍යානුකූලව අයිතිය ඇති බව පවසා රාජ්‍ය බලය යොදා ගනිමින් දේශපාලන අධිකාරියේ සහ රජයේ උසස් නිලධාරීන්ගේ සහයෝගය ඇතිව අවි ආයුධ පෙන්වා ගම්වාසීන් බියවද්දා බලහත්කාරයෙන් අයිති කර ගෙන ඇති බවට ලැබී ඇති පැමිණිල්ලක් අනුව විමර්ශනයක් පවත්වයි. මෙම ඉඩම් වල තිබුණු වටිනා දැව වර්ග දැව සංස්ථාවේ වාහන හා සේවකයින් උපයෝගී කරගෙන කපා ඉවත් කරගෙන ඇති බවට ද මෙසේ බලහත්කාරයෙන් අයිති කර ගන්නා ලද ඉඩම් වල සිටුවීම සඳහා පොල්, අඹ, කජු, දෙළුම්, පැපොල්, දෙහි වැනි පැළ වර්ග දිවි නැගුම දෙපාර්තමේන්තුව හරහා ලබා ගෙන ඇති බවට ද පැමිණිලි කර ඇත. සිරිපාල අමරසිංහගේ මෙම ඉසුරු ඉමේෂන් නමැති ගොවිපල පිහිටුවා තිබෙන්නේ අලිමංකඩක් හරහා බවත්, මේ හේතුවෙන් වන අලීන් ගම් වැදීමට පටන් ගෙන ඇති බවත්, ගොවීන් චෝදනා කරයි. මෙම ප්‍රදේශයේ පිහිටි ඉහළ කෝන්ගස්දිගිලිය නමැති වැවේ ඇළ මාර්ගය, වෙනස් කරමින් සිරිපාල අමරසිංහ විසින් තනිව 'ම භුක්ති විඳින බවත් මේ පිළිබඳව අදාළ අංශ දැනුවත් කළ ද තම රාජ්‍ය බලය උපයෝගී කරගෙන සිරිපාල අමරසිංහ එම සියලු දේ යටපත් කරගෙන සිටින බව ද ගම්වාසීන් චෝදනා කරයි.

පසුගිය ජනාධිපතිවරණ සමයේ දී රාජපක්ෂට එරෙහි පොදු අපේක්ෂයා පරාජය කිරීම සඳහා අරලිය ගහ මන්දිරයේ සිට රාජ්‍ය දේපල, රාජ්‍ය නිලධාරීන් යොදවා ගෙන එක ආසනයක කටයුතු වෙනුවෙන් එක් පරිගණකය බැගින් පාවිච්චි කරමින් සිදු කරන ලද ප්‍රචාරණ යාන්ත්‍රනය භාරව කටයුතු කරන ලද්දේ මෙම සිරිපාල අමරසිංහ නමැති පුද්ගලයාය. රාජපක්ෂ පාලනයේ බල පුළුවන්කාරකම් සියතට ගෙන අහිංසක මිනිසුන්ගේ වගා ඉඩම් කොල්ල කෑමට ඉඩදීම වෙනුවෙන් එසේ කෘතගුණ දක්වා ඇති බව පෙනේ.

## 6.19 සතොස හිටපු සභාපති එරාජ් ප්‍රනාන්දු ඇතුළු නිලධාරීන් කිහිපදෙනෙකු විසින් සතොසට සිදු කරන ලද විනාශය.

ලංකා සතොස ආයතනය අද වනවිට මරණාසන්නව පණ අදින රෝගියෙකු තත්ත්වයට පත් වී ඇත. නැවත ගොඩ ගත නොහැකි තත්ත්වයට වැටී ඇති සතොස එම මූල්‍ය අර්බුදයෙන් ගැලවීම සඳහා අලෙවිසැල් කිහිපයක් විකුණා දැමීමට ද යෝජනා වී ඇති බව අසන්න ලැබේ. සතොස මෙවැනි විපතකට ලක්වීමට ප්‍රධාන ලෙස ම හේතු වූයේ හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ ඥාති සොහොයුරෙකු වූ එරාජ් ප්‍රනාන්දු සතොස සභාපති තනතුරට පත් කිරීමයි. ඔහු සහ ඔහු වටා සිටි නිලධාරීන් කිහිපදෙනෙකු සතොස කාබාසිනියා කල අන්දම පහතින් සඳහන් කරමි.

කිලිනොච්චි නගරයේ ඉදි කරන කුඩා ප්‍රමාණයේ සංචාරක හෝටලය, සුපිරි වෙළඳ සැල, සහ ඉන්ධන බෙදා හැරීමේ මධ්‍යස්ථානය, යෝක් වීදියේ පිහිටි සතොස කාර්යාලය නවීකරණය, වැලිසර සුපිරි වෙළඳ සංකීර්ණය නවීකරණය, කඹුරුපිටිය සහ වැලිගම ගොඩනැඟිලි ඉදි කිරීම යන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 400කට අධික ටෙන්ඩර්, මිල ගණන් කැඳවීමකින් තොරවම පිරිනැමීම පිළිබඳව මොහුට චෝදනා එල්ල වී ඇත.

2014 වර්ෂයේ ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු කාල සමයේ දඹුල්ල සහ අනුරාධපුර ප්‍රදේශ වලින් රු.90/- බැගින් මිලදී ගත් ලොකුළූණු කිලෝ 1,100,000ක් නරක් වීම නිසා වලලා දැමීමෙන් රුපියල් මිලියන 100කට ආසන්න අලාභයක් සිදු කිරීම, රු.90/- බැගින් මිලට ගත් ළූණු වරින් වර රු.65/-, 60/-, 28/-, 15/- හා 10/- බැගින් විකිණීමෙන් රුපියල් මිලියන 200කට ආසන්න අලාභයක් සිදු කිරීම, 2014 ඌව පළාත් සභා මැතිවරණ සමයේ බදුල්ල හා මොණරාගල ප්‍රදේශ වල අර්තාපල් කිලෝව රු.90/- බැගින් මිලට ගෙන ඇති අතර එයින් කිලෝ 222,979ක් නරක් වීම නිසා වල දැමීමෙන් රුපියල් මිලියන 29කට ආසන්න පාඩුවක් සිදු කිරීම, හා රු.90/-ට මිලට ගත් අර්තාපල් කිලෝ 1,558,609 කිලෝව රු.80/- බැගින් විකිණීමෙන් රුපියල් මිලියන 15.8ක පාඩුවක් සිදු කිරීම පිළිබඳව සභාපතිවරයාට ඍජුවම චෝදනා එල්ල වී ඇත.

පිළිගත් පටිපාටීන්ගෙන් බැහැරව තාක්ෂණික ඇගයීම් නිසිපරිදි සිදු නොකර සැපයුම් කරුවන් තෝරා ගැනීම, තත්ත්වයෙන් බාල පරිගණක දෘඩාංග මිලදී ගැනීම යනාදී අක්‍රමිකතා හේතුවෙන් ආයතනය පරිගණක ගත කිරීම වෙනුවෙන් වියදම් කළ රුපියල් මිලියන 300ක මුදල අපතේ යවා ඇත.

බංග්ලාදේශය, පකිස්තානය සහ ඉන්දියාවෙන් රුපියල් මිලියන 5850කට ආසන්න (ඩොලර් මිලියන 45) මුදලකට සහල් ආනයනය කිරීම සතොස ආයතනය විසින් සිදු කර ඇත. මෙහි දී නිසි ක්‍රමවේදයන්ගෙන් බැහැරව කටයුතු කිරීම, මිලට ගත් මුදලට වඩා අඩු මුදලකට සහල් විකිණීම, කෘමි හානි නිසා නරක වූ සහල් සත්ත්ව ආහාර ලෙස අලෙවි කිරීම යනාදී අක්‍රමිකතා රාශියක් මඟින් රුපියල් මිලියන 2,000කට ආසන්න පාඩුවක් සිදු කර ඇත.
සතොස සමාගමේ විධායක නිලධාරී ජගත් ප්‍රියදර්ශන යන අය, බියර්, රොක්ලන්ඩ් සමාගමේ මත්පැන් සහ ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු අමාත්‍යවරයාට අයත් වයඹ අරක්කු සමාගමේ මත්පැන් මිලදී ගැනීම් වලදී සතොසට ලැබිය යුතු කොමිස් මුදල් වංචනික ලෙස ඔහු සතු කර ගෙන ඇති බවට චෝදනා එල්ල වී ඇත.

සතොස හිටපු සභාපතිවරයා ඔහුගේ තනි කැමැත්තට කිසිදු ගිවිසුමකින් තොරව සතොස මුදල් රුපියල් ලක්ෂ 98ක් යොදවා ගෙන්වන ලද සැමන් කන්ටේනර් 02ක් මිනිස් පරිභෝජනයට නුසුදුසු වීම හේතුවෙන් එම මුළු මුදලම සතොසට අහිමි වී ඇත.

ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුත්තක් ලෙස ඩිමෝ බට්ටා ලොරි මඟින් ජංගම අලෙවි රථ ව්‍යාපෘතිය වෙනුවෙන් ලොරි රථ 100ක් ලීසිං පහසුකම් මත ආයතනයට ලබා ගෙන ඇති අතර එක් ලොරි රථයක් වෙනුවෙන් මසකට රුපියල් 30,000/-ක මුදලක් ලීසිං වාරිකය ලෙස ගෙවීමට සිදු වී ඇත. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක එකක් වූ අතර දේශපාලන හිතවතුන් වෙත ලබා දුන් මෙම ලොරි රථ නැවත ආපසු ලබා ගැනීමට කටයුතු කර නොමැති බවට ද චෝදනා එල්ල වී ඇත.

මෙම දූෂිත ගණුදෙනු හා මුදල් නාස්තීන් සඳහා හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, සතොස සභාපති එරාජ් ප්‍රනාන්දු, ආසිරි ප්‍රනාන්දු, අංජන නිශ්ශංක, වී.විජේතිලක, කේ.ආරියවංශ, ජගත් ප්‍රියදර්ශන යන නිලධාරීන් වගකිව යුතු බව ඉදිරිපත් වී ඇති පැමිණිලි වල සඳහන් වේ.

## 6.20 මේජර් ජනරාල් එම්.එම්.අඹන්පොල අයථා දේපල රැස් කිරීම.

මෙම නිලධාරියා විසින් සිදු කරන ලද බව සඳහන් වැරදි ගණනාවක් පිළිබඳව පරීක්ෂණ කිහිපයක් සිදු කර ඇති බවත්, ඒවායින් ඔහු වැරදිකරු කර තිබුණ ද හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ නියෝග අනුව ඔහුට විරුද්ධව කිසිම පියවරක් ගෙන නොමැති බව ද හෙළි වී ඇත. ආයුර්වේද රෝහලේ හෙද නිලධාරිනියක් වන එස්. ගොඩහේවා නමැති ඔහුගේ බිරිඳගේ හා නිලධාරියාගේ වැටුපෙන් පමණක් අත්පත් කර ගත නොහැකි රුපියල් මිලියන 900 ක් පමණ වටිනා මහරගම නිවාස 04, හෝමාගම නිවාස 02, මාලබේ නිවාස 01, මොරටුව නිවාස 01, මහරගම පර්චස් 12 ඉඩම් 01 වශයෙන් දේපල රාශියක් අත්පත් කර ගෙන ඇති බවට පැමිණිලි ඉදිරිපත් වී ඇත. එසේ ම මැනිං ටවුම හමුදා විවාහක නිල නිවස්න ඉදි කිරීමේ දී නවලෝක සමූහ ව්‍යාපාරයෙන් මිලියන 05 ක අල්ලසක් ලබා ගත් බව ඔහුට විරුද්ධව එල්ල වී ඇති තවත් චෝදනාවකි.

මෙම චෝදනා පිළිබඳව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමේ අංක 849/2009 යටතේ උප පොලිස් පරීක්ෂක ඩේවිඩ් යන නිලධාරියා විසින් විමර්ශනයක් සිදු කළ බවත් අඹන්පොල මහතා විසින් එම පරීක්ෂණ නිලධාරියාට විශාල අල්ලසක් ලබා දී ලිපිගොනුව වැසීමට ක්‍රියා කර ඇති බවටත් පැමිණිල්ල මඟින් කරුණු අනාවරණය කරයි.

## 6.21 ප්‍රදීප් ගුණවර්ධන - ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ (STC) හිටපු සභාපතිවරයා

පසුගිය රාජපක්ෂ පාලන සමයේ ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවේ (STC) සභාපතිවරයා මෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නැගෙනහිර කොළඹ ආසනයේ ප්‍රධාන සංවිධායකවරයා වූයේ ප්‍රදීප් ගුණවර්ධනයි. රජයේ සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත සමාගම් සඳහා ප්‍රධානීන් පත් කිරීමේ දී තම ආසන සංවිධායකවරු, මැතිවරණ වලින් පරාජයට පත්

වූ අපේක්ෂකයින් එම තනතුරු වලට පත් කිරීමේ මහින්ද රාජපක්ෂගේ ජාතික ප්‍රතිපත්තිය අනුව සුදුසුකම් ලත් ප්‍රදීප් ගුණවර්ධන STC ආයතනය විනාශ මුඛයට ඇද දැමීමේ කෙසේ ද?

STC ආයතනය 2010 ජනවාරියේ දී (මාස් කන්නයේ වී අස්වැන්න නෙලන අවස්ථාවේදී ) සහල් මෙට්‍රික් ටොන් 35,000 ක් ආනයනය කිරීමට තීරණය කර ඇත. ඒ සඳහා තෝරා ගන්නා ලද ආනයනකරුවන් තිදෙනෙකුගෙන් සහල් මිල දී ගෙන ඇත. (මෙම ආනයනකරුවන් තිදෙනා මෙයට පෙර සහල් ගෙන්වා නොමැති ඒ පිලිබඳ පළපුරුද්දක් ද නොමැති අයවලුන් වේ.) අදාළ කාලසීමාවේ දී වෙළඳපොළට සහල් ගෙන්වන අනෙකුත් ව්‍යාපාරිකයන්ගේ මිලට වඩා වැඩි මිල ගණන් වලට මෙම ආනයනකරුවන් තිදෙනාගෙන් සහල් මිල දී ගෙන ඇත. මෙසේ ආනයනය කරන ලද සහල් වසරකට වඩා වැඩි කාලයක් අලෙවි කිරීමට නොහැකිව ගබඩා කර තිබිය දී, ඇ. ඩොලර් 525 බැගින් මිල දී ගත් සහල් මෙට්‍රික් ටොන් 01ක් ඇ. ඩොලර් 336.55 බැගින් ටොන් 21,000 එක්සත් අරාබි එමීර් රාජ්‍යයට විකුණා දමන ලදී. එනම් සහල් කිලෝව රු.35/-ක මුදලකට ය. නමුත් එම කාලයේ දී දේශීය වෙළඳපොලේ සහල් කිලෝවක් රු.60/-ක් විය. මෙමගින් STC ආයතනයට රු. මිලියන 500ක පමණ අලාභයක් සිදු විය. තව ද ගබඩා කර තිබූ සහල් මිනිස් පරිභෝජනයට නුසුදුසු වීමෙන් ටොන් 35ක් ගංගාරාම පන්සලට සුනු සහල් ලෙසට නොමිලේ නිකුත් කර ඇති අතර තවත් ටොන් 10ක් එම පන්සලටම පොහොර සෑදීමේ ව්‍යාපෘතියක් සඳහා නොමිලේ ලබා දී ඇත.

2009 වර්ෂයේදී STC ආයතනය ප්‍රදීප් ගුණවර්ධන ගේ බිරිඳ වන සුභාෂිණී අතුරුවියගමගේට අයත් SARERO INTERNATIONAL (PVT) LTD. ආයතනය මගින් නවසීලන්තයෙන් කිරිපිටි මෙට්‍රික් ටොන් 48ක් ගෙන්වීමට තීරණය කරන ලදී. මේ සඳහා ඇමෙරිකානු ඩොලර් 94,560 ක් (ආසන්න වශයෙන් රුපියල් මිලියන 11 ක්) වියදම් කර ඇත. ගෙන්වන ලද කිරිපිටි 400g පැකැට්ටුවක් සඳහා ආයතනය රු.180/-ක පිරිවැයක් දරා ලාභයක් ද සහිතව රුපියල් 240/- බැගින් 400g පැකැට්ටුව විකිණීමට මිල නියම කළ ද විකුණා ගත නොහැකි වූ මෙම කිරිපිටි පැකැට් එකක් රු.100/- බැගින් යෝගට් නිෂ්පාදනයට ලබා දීමෙන් රුපියල් මිලියන ගණනක අලාභයක් ආයතනයට සිදු කොට ඇත. කිරිපිටි වෙළඳාමේ දී STC වැනි ආයතන සඳහා වෙළඳපොලේ ඉඩක් පවතින්නේ ද, ගෙන්වන කිරිපිටි පාරිභෝගිකයා පිළිගන්නේ ද යන තත්ත්වයන් අධ්‍යයනය නොකර මෙවැනි මලමොට්ටල තීරණ ගැනීම මෙම දේශපාලන වන්දිභට්ටයන්ගෙන් බලාපොරොත්තු විය යුතු තත්ත්වයකි.

ප්‍රදීප් ගුණවර්ධන යටතේ STC ආයතනය විසින් පාසල් නිල ඇඳුම් රෙදි ගෙන්වීමද තවත් එවැනිම වූ අදූරදර්ශී විගණකාධිපතිවරයා විසින් මෙම ගණුදෙනුව පිළිබඳව සිදු කරන ලද විගණනයේ දී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව අවශ්‍ය රෙදි ප්‍රමාණයට වඩා රෙදි මීටර් 15,580 ක් මිලදී ගැනීම, රෙදි ආනයනය කිරීමට දීර්ඝ කාලයක් ගත කිරීම (නැව් වාර 11ක්), වැඩි මිල ගණන් දක්වා ඇති ටෙන්ඩරය තෝරා ගැනීම වැනි වැරදි තීන්දු තීරණ වලින් රුපියල් මිලියන 104 කට අධික පාඩුවක් STC ආයතනයට සිදු කර ඇති බවත්, ඇණවුම් කරන රෙදි වලින් රුපියල් මිලියන 158 කට අධික වටිනාකමකින් යුතු රෙදි, විගණනය සිදු කරන අවස්ථාව වන විටත් ගබඩා වෙත ලැබී නොතිබුණු බව හෙළි වී ඇත. තවද දේශීය නිෂ්පාදකයාගෙන් රෙදි මිලදී නොගෙන චීනයෙන් ඇණවුම් කිරීම හේතුවෙන්

රජයට රුපියල් 135,523,881/- ක පාඩුවක් සිදු කර ඇති බව එම විගණන විමසුමේ දක්වා ඇත. දේශීයත්වය පිළිබඳව පපුවට අත ගසමින් වේදිකාවන්හි බෙරිහන් දෙන මහින්ද රාජපක්ෂ, දේශීය නිෂ්පාදකයාට කොකා පෙන්වා චීනයට ගැතිකම් කිරීම පිළිබඳව ඉහත සිදුවීම හොඳම උදාහරණයකි.

තව ද මාසික කුලිය රු.500,000/- පමණ වන ගබඩා සංකීර්ණයක් මාසික කුලිය රු.1,250,000/-ක අසාමාන්‍ය මුදලකට බදු ගැනීම සහ පරිගණක මිලදී ගැනීම සඳහා LOLC සමාගමින් රුපියල් මිලියන 340ක ණය මුදලක් ලබා ගැනීමේදී ද වංචාවන් සිදු කර ඇත.

ප්‍රදීප් ගුණවර්ධන හොරා කෑමට පමණක් නොව වෙනත් දේට ද දක්ෂ බව පෙන්වා ඇත. STC ආයතනයේ සේවය කරන ලද සහකාර ගණකාධිකාරිවරියක් වෙත මොහු විසින් කරන ලද ලිංගික බලපෑමක් මත ඇය සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

ආයතනය සූරා කමින්, ආයතනයේ ගණුදෙනු වලින් මිලියන ගණනින් සොරකම් කළ ප්‍රදීප් ගුණවර්ධන එසේ සොරකම් කළ මුදලින් හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලිකන්න, සහ ලහිරුගම යන ග්‍රාම සේවා වසම් වලින් අක්කර 05 ක පමණ ඉඩමක් රුපියල් එක් කෝටි හැට ලක්ෂයකට මිලදී ගෙන ඔහුට අයත් AGRI LEISURE (PVT) LTD. නමැති ආයතනය මඟින් හෝටලයක් ඉදි කරන බවට ද ලහිරුගම ග්‍රාම සේවා වසමේ පර්චස් 30 ක ඉඩමක් රුපියල් ලක්ෂ 24 කට මිලදී ගෙන ඇති බවට ද විමර්ශන වලින් කරුණු හෙළි වී ඇති බව අනාවරණය විය.

රාජපක්ෂගේ සාටකයට මුවා වී මෙවැනි හොරු රාජ්‍ය සම්පත් සොරා කෑ ආකාරය දැන් හෙළි වී අවසානයි. ඉතිරිව ඇත්තේ මොවුන්ට දඬුවම් ලබා දීමයි. එය ඉටුවන තුරු මහජනතාව අවධියෙන් බව සිහිපත් කරමු.

## 6.22 හිටපු ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් රංජනී ජයකොඩි මහත්මිය

මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ක්‍රීඩා අමාත්‍යවරයාගේ ළඟම හිතවතියක් වීම නිසා ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් වූ මෙම කාන්තාව විසින් ක්‍රීඩා ක්ෂේත්‍රයට සිදු කළ හානිය හෙළිදරව් වනුයේ ජනවාරි 08 වනදා රාජපක්ෂ පාලනය බිඳ වැටීමටත් පෙර සිට ය. කූඨ ලේඛන පිළියෙළ කොට ඇමතිවරයාගේ අවශ්‍යතාව මත ක්‍රීඩා සංගම් වලට ලබා දෙන මුවාවෙන් රුපියල් මිලියන 60ක් වූ ගෙවීම් සිදු කිරීමට තැත් කිරීම, CSN නාලිකාවට ක්‍රීඩා විකාශන අයිතිය අයථා ලෙස ලබා දීම, වාහන අලුත්වැඩියා කටයුතු තමන්ට හිතවත් ගරාජයක් වෙත ලබා දීම, ගුවන් ටිකට්පත් ඇණවුම් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ලොහාන් රත්වත්තේ මහතාට අයත් ව්‍යාපාරයකට අයථා ලෙස ලබා දීම ඇතුළු බහුවිධ චෝදනා මත අමාත්‍ය මණ්ඩලය විසින් ධූරයෙන් ඉවත් කරන ලද නිලධාරිණියකි. මැතිවරණ සමයේ කැරම් බෝඩ් 14000 ක්, සහ දාම් බෝඩ් 14000ක් එක්සත් ජනතා නිදහස් සන්ධාන කාර්යාල වලට බෙදා හැරීමේ දී එම භාණ්ඩ රැගෙන යාම සඳහා ඇය විසින් වාචිකව උපදෙස් දුන් බවට ගබඩා භාරකරු සාක්ෂි දීම නිසා මෙම දූෂණයන්ට ඇයගේ ද සම්බන්ධයක් පවතින බව හෙළි වී තිබේ.

### 6.23 හිටපු ක්‍රීඩා අමාත්‍යංශ ලේකම්, නන්ද මල්ලවාරච්චි මහතා

මහින්දානන්ද අලුත්ගමගේ අමාත්‍යවරයාගේ ක්‍රීඩා අමාත්‍යංශයේ ලේකම් ලෙස කටයුතු කල මොහු හිටපු මේජර් ජනරාල්වරයෙකි. ක්‍රීඩා අමාත්‍යංශයේ ලේකම් ලෙස කටයුතු කල ඔහු තම නම පවතින එක් වැඩක්වත් සිදුකර තිබේ. 2015 ජනවාරි 08 දින ජනාධිපතිවරණය සඳහා ප්‍රචාරක කටයුතු සිදු කිරීමේ දී මහින්දානන්ද ඇමතිවරයා සමග එකතු වී කැරම් බෝඩ් 14,000 ක් සහ දාම් බෝඩ් 14,000 ක් ලංකා සතොස ආයතනයෙන් ලබා ගැනීම සඳහා ඇණවුම නිකුත් කොට තිබෙනුයේ මෙම නිලධාරියා වන අතර, 2014 වර්ෂය සඳහා ක්‍රීඩා අමාත්‍යංශයට මුලු දිවයින සඳහාම අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීමට පාර්ලිමේන්තුවෙන් වෙන් කල මුදල් රු. මි. 40 ක් ම තිබියදී, රු. මි. 39 ක කැරම් බෝඩ් සහ දාම් බෝඩ් තම බලය ඉක්මවා මිලදී ගෙන පක්ෂ කාර්යාලවලට යවා අමාත්‍යංශයේ මුදලින් ගෙවීමට සැලසුම් කර තිබියදී අතටම අසු විය. ඔහු විසින් ක්‍රීඩාවට කරන ලද සේවය එයයි. ගෝඨාභය රාජපක්ෂ හිටපු ආරක්ෂක ලේකම්ගේ හෙංචයියකු වීම හේතුකොටගෙන අමාත්‍යංශ ලේකම් කමක් ලැබූ මෙම පුද්ගලයා විසින් ලංකා සතොස ආයතනයට සිදු කල අලාභය මේ දක්වා පියවා ගැනීමට නොහැකි වී තිබේ.

- **ප්‍රසන්න වික්‍රමසූරිය - ගුවන් තොටුපොල හා ගුවන් සේවා සමාගමේ හිටපු සභාපති**

විශ්‍රාමික හමුදා නිලධාරියෙකු වන මොහු ගෝඨාභය රාජපක්ෂගේ සමීපතම හිතවතෙකි. එම සබඳතාව මත ගුවන් තොටුපොල හා ගුවන් සේවා සමාගමේ සභාපති තනතුරට පත් වීමෙන් පසු සිදු කරන ලද අක්‍රමිකතා රාශියක් පිළිබඳව තොරතුරු එහි සේවකයින් විසින් දැන් හෙළි කරමින් තිබේ.

ජනාධිපතිවරණය කැඳවීමෙන් පසු පෙරදාතම් කොට පත්වීම් 66ක් ලබා දීම, රුපියල් කෝටියක් වැය කර චෝගම් සමුළුව වෙනුවෙන් කූඩාරමක් (Marquee Tent) සවි කරන ලද නමුත් එය කිසිදු භාවිතයකට නොගෙන අත්හැරීමෙන් සිදු කරන ලද පාඩුව, චෝගම් සමුළුව වෙනුවෙන් ගුවන් තොටුපොළේ V I P මැදිරි නවීකරණය තම බෑනා වෙත පැවරීම, ගුවන් තොටුපොළේ නත්තල් සැරසිලි වෙනුවෙන් නාමල් රාජපක්ෂගේ රගර් පුහුණුකරුගේ බිරිඳට ලක්ෂ ගණන් මුදල් ගෙවීම, ආයතනයේ වාහන ජනාධිපතිවරණ කටයුතු වෙනුවෙන් යෙදවීම, ගුවන්සේවා සමාගමේ කටයුතු සඳහා භාවිතා කිරීමට තිබූ තලංගම පිහිටි අක්කර 62ක ඉඩමක් යුධ හමුදාවට පවරා දීම යනාදී අක්‍රමිකතාවයන්ට ඔහු සෘජුවම වගකිවයුතු බවට චෝදනා එල්ල වී ඇත.

ඉහත සඳහන් කරන ලද අයථා ගණුදෙනු වලින් සභාපතිවරයා උපයා ගෙන ඇති මුදලින් පාර්ලිමේන්තුව අසල ඉඩමක් මිලදීගෙන සුඛෝපභෝගී නිවසක් ඉදිකර ඇති බවත් පන්නිපිටිය ප්‍රදේශයෙන් තවත් නිවසක් හා කුරුණෑගල ප්‍රදේශයෙන් අක්කර ගණනාවක ඉඩමක් මිලදී ගෙන ඇති බවත් චෝදනා වල සඳහන් වේ. මොහු සභාපති ධූරය දරණ අවධියේ සෑම වසරකටම මාස 03 බැගින් නිවාඩු ලබා ගෙන විදේශ ගත වී ඇත. එහෙත් එම නිවාඩු ලබාගත් කාල සීමාවට ද අදාළ වන පරිදි බෝනස් ලබාගෙන ඇත.

2015.01.09 දින නව රජය බලයට පත්වීමත් සමඟ මොහු ඇමෙරිකාවට පලා ගොස් ඇත.

## 6.25 ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මුදල් සාවද්‍ය පරිහරණය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විමල් වීරවංශ අමාත්‍යවරයා යටතේ පැවති ආයතනයක් විය. එහි හිටපු සභාපතිවරයා වූයේද වීරවංශ ඇමතිවරයාගේ පක්ෂයේ සමාජිකයකු වූ ජයන්ත සමරවීර යන අයයි. මෙම ආයතනයේ 2014 වර්ෂයේ සංග්‍රහ වියදම් වෙනුවෙන් ලබාගෙන ඇති අත්තිකාරම් පිළිබඳව අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද විගණන වාර්තාව 2015/05/27 දින එළි දක්වා ඇත. විගණන වාර්තාව අනුව 2014 වර්ෂයේදී සංග්‍රහ කටයුතු වෙනුවෙන් ලබාගෙන ඇති මුදල රුපියල් 10,934,855.30 කි. (රුපියල් කෝටිය ඉක්මවයි.)

2013 වර්ෂයේදී සංග්‍රහ සඳහා වියදම් කර ඇති මුදල ලක්ෂ 56 කි. මෙලෙස රුපියල් කෝටිය ඉක්මවා වියදම් කර ඇති සංග්‍රහ වියදම් මොනවා දැයි එම විගණන වාර්තාවේ දක්වා ඇත. මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩ මුළුවකට සහභාගි වූ 450 ක් වෙනුවෙන් 2014.01.07 දින රාත්‍රි කෑමට පමණක් රුපියල් 1,602,000/- ක් (ලක්ෂ 16) වැය කර ඇත. එනම් එක් පුද්ගලයකු වෙනුවෙන් රුපියල් 3,560/- කි. එදා වේල කන්න නොමැතිව මෙරට බහුතරයක් දුක පමණක් අනුභව කරද්දි වීරවංශලා යටතේ ඇති රාජ්‍ය ආයතන එක් වේලක් වෙනුවෙන් රුපියල් 3,560/- ක් වියදම්කර ඇත.

2014.03.22 දින ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වා ඇති වැඩමුළුවක් සඳහා රු 753,000/- ක් ද අවුරුදු උත්සවයේ සංග්‍රහ හා වෙනත් වියදම් සඳහා 1,407,750/- ක්ද(ලක්ෂ 14) 2014.05.19 දින සුහද හමුවේ සංග්‍රහ කටයුතු සඳහා රුපියල් 813,700/- ක්ද 2014.07.04 දින ප්‍රගති සමාලෝචන රැස්වීමේ සංග්‍රහ සඳහා රුපියල් 324,740/- ක්ද 2014.08.12 දින ප්‍රගති සමාලෝචන රැස්වීමේ සංග්‍රහ සඳහා රුපියල් 215,350/- ක්ද 2014.10.01 දින සංග්‍රහ සඳහා රුපියල් 910,340 ක්ද 2014.10.20 රුපියල් 391,350/- ද 2014.11.13 දින රාත්‍රී ආහාර සඳහා 830,000 ක්ද 2014.12.09 දින සංගීත ප්‍රසංගයේ සංග්‍රහ සඳහා රුපියල් 1,594,000/- ක් (ලක්ෂ 15) මෙම වියදම් අතර වේ. (මෙහි දක්වා ඇත්තේ ප්‍රධාන වියදම් කිහිපයක් පමණි.)

එක් පුද්ගලයෙකුට එක් ආහාර වේලක් සඳහා දහස් ගණන් වැය කර ඇති බව මෙම වියදම් විග්‍රහ කර බැලීමේදී පෙනී යයි. මෙම වියදම් වෙනුවෙන් ඉදිරිපත් කර ඇති බිල් පත් පරීක්ෂා කිරීමේදී විශාල වංචාවන් හෙළිවන බව විගණන විමසුමේ දක්වා ඇත. 2015.05.19 දින මෝදර ප්‍රදීපා ශාලාවේ පැවති සුහද හමුවේ සංග්‍රහ සඳහා නිපුන සම්බා හාල් කිලෝවක් මිලදී ගෙන ඇත්තේ රු. 180/- බැගිනි. එම මිලට හාල් කිලෝ 100 ක් මිලදී ගෙන ඇත්තේද මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයෙනි. කොළඹ 14 මෝදර පැවති සංග්‍රහයට ඊට කිලෝ මීටර් 35 ක් පමණ ඈතින් මීගොඩින් හාල් මිලදී ගෙන ඇත. එම දිනය වන විට අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන් සිටියේ 381 ක් බව වාර්තාවේ සඳහන් වේ. මෙම පිරිස සඳහා කජු කිලෝ 40 ක් රු. 104,000/- ගෙවා මිලදී ගෙන ඇත. තවද මෙම පිරිසට ආහාර පිසීමට කිලෝ 37.5 ක ප්‍රමාණය (විශාලම ප්‍රමාණය) ගෑස් සිලින්ඩර් 07 ක් මිලදී ගෙන ඇත. එම ගෑස් මිලදී ගෙන ඇත්තේද ගොඩගම ප්‍රදේශයෙනි. වෙළඳපොලේ රු. 30 ක් වන යෝගට් එකක් මෙම අධිකාරිය මිලදී ගෙන ඇත්තේ රු. 40/-කටය. වතුර බෝතල් මිලදී ගැනීම මගින් රු. 100,000/- කට වැඩි මුදලක් වංචා කර ඇති බව එම වාර්තාව පෙන්වා දෙයි. වියදම් පියවීමේදී පිළිගත හැකි විධිමත් බිල්පත් වෙනුවට පිළිගත නොහැකි ඉහළ

තුණ්ඩු වැනි දෑ ඉදිරිපත් කර ඇති බවද ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර වෙළඳපොලේ පවතින මිලට වඩා පිළිගත නොහැකි මිල ගණන් බිල්පත්වලට ඇතුලත් කරමින් අයථා ලෙස මුදල් ලබා ගැනීමට කටයුතු කර ඇති බවද මෙම වාර්තාවේ පැහැදිලිව දක්වා ඇත.

මෙම වාර්තාව එළිදක්වා ඇත්තේ ආයතනයේ වියදම් අතරින් එක් කොටසක් පිළිබඳව පමණි. සංග්‍රහ වියදම් වලින් මෙපමණ හොරකම් කර තිබේ නම් අනිකුත් වියදම් වලින් කෙතරම් හොරකම් කර තිබේදැයි සිතා ගැනීමටද අපහසුය. මහා ලොකු දේශප්‍රේමියෙකු ලෙස පෙනී සිටින වීරවංශ තමා යටතේ තිබූ මෙම අධිකාරියේ සිදු කෙරෙන හොරකම් පිළිබඳව නොදැන සිටියාද? නොඑසේනම් එම හොර කම් වලින් කොටසක් සාක්කුවේ දමා ගෙන නිශ්ශබ්දව සිටියා දැයි ජනතාවට පැහැදිලි කළ යුතුය.

අද වනවිට මෙම දූෂිත බලවේග මහින්ද රාජපක්ෂ නැවත බලයට ගෙන එම සඳහා වේදිකා දෙවනත් කරමින් බෙරිහන් දෙන්නේ ඔහු මගින් මෙම සොරකම් වසා ගැනීමටත් ඉදිරියටද සොරා කෑම් කර ගෙන යාමට අවශ්‍ය රැකවරණය ලබා ගැනීමට බව ඉඳුරාම පැහැදිලිය.

## 6.26 අලි පැටවුන් ජාවාරම

අලි පැටවුන් ජාවාරම පසුගිය කාල වකවානුවේ ඉදිරිපත් වූ තවත් චෝදනාවකි. මව් ඇතින්නගෙන් හා රංචුවෙන් වෙන් කර වනාන්තර වලින් හොර රහසේ රැගෙන විත් රුපියල් ලක්ෂ සියයක් වැනි මුදලකට අලි පැටවුන් අලෙවි කිරීමේ මහා පරිමාණයේ ජාවාරමක් පසුගිය කාලයේ සිදු විය. රොෂාන් යන නමට අලි රොෂාන් වැනි විශේෂණ යෙදුණේ ද මේ හේතුවෙනි. මෙම නින්දිත ජාවාරමට දේශපාලන අනුග්‍රහය නොඅඩුව ලැබුණු බවට හොඳම සාධකය නම් එවකට රටේ ආරක්ෂාව භාර ඉහළම නිලධාරියා සතුව ද බලපත්‍ර රහිත අලි පැටවුන් සිටීම හේතුවෙනි. මෙරට ජනප්‍රිය ස්වාමීන් වහන්සේලාගේ පන්සල් වල ද හොර අලි පැටවුන් රඳවා තබා ගෙන සිටියදී  හසු විය. මෙම ජාවාරම් කෙතරම් ජයට කෙරුණේ ද යත් ජාවාරම්කරුවන් විසින් හීලෑ අලි ඇතුන් ලියාපදිංචි කරන අලිපොත පවා සොරකම් කරන ලදී. උසාවි වල නඩුකාර හාමුදුරුවරු යැයි කියා ගන්නා පුද්ගලයින් ද හොර රහසේ අලි පැටවුන් ළඟ තබා ගෙන ඇති බව විගණකාධිපතිවරයා නිකුත් කර ඇති වාර්තාවෙහි දක්වා ඇත. පසුගිය දිනක මෙම මහේස්ත්‍රාත්වරයා තමා සන්තකයේ තබාගෙන සිටි අලි පැටවා රහසින් රැගෙන ගොස් වනජීවියට භාර දෙන අයුරු මාධ්‍ය ඔස්සේ විකාශනය විය.

2009 අංක 22 දරණ වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධිත) පනත අනුව ලියාපදිංචි ඇතින්නක් ගැබ් ගැනීම හා යම් උපතක් පිලිබඳ තොරතුරු වේ නම් වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය. එකී නීතිය ප්‍රකාරව 2009 වර්ෂයෙන් පසු ලියාපදිංචි කරන සියලුම අලි පැටවුන්ගේ තොරතුරු වනජීවී අධ්‍යක්ෂ වෙත වාර්තා වී ලේඛනගත විය යුතු නමුත් එබඳු වාර්තා සටහන් නොමැති බවත්, මෙසේ හොර රහසේ ළඟ තබාගෙන සිටි අලි පැටවුන්, 2009 අංක 22 දරණ පනතට යටත් නොවන පරිදි 2008 වර්ෂයට පෙර ඉපදුණු අලි පැටවුන් බව සඳහන් කරමින් ලියාපදිංචි කොට ඇති බව විගණකාධිපති විසින් නිකුත් කරන ලද අංක ටී/එම්/එල්/වජී/2013/ ටීවී02 හා 2014.07.22 දින දරණ විගණන වාර්තාව මගින් පෙන්වා දී ඇත. එම වාර්තාව  පිළියෙළ කිරීමේ දී

නියැදි පරීක්ෂණයක් සිදු කරන ලද අතර එහිදී අලි පැටවුන් 09 දෙනෙක් ව්‍යාජ ලෙස ලියාපදිංචි කර ඇති බව අනාවරණය කරගෙන ඇත. පසුව සිදු කරන ලද විමර්ශන වලදී අලි ඇතුන් 40ක් වංචනිකව ලියාපදිංචි කර ඇති බවට තොරතුරු අනාවරණය විය. ව්‍යාජ බලපත්‍ර මත හෝ බලපත්‍ර රහිතව ළඟ තබා ගෙන සිටින අලි පැටවුන් 25ක් දැනට සොයාගෙන ඇත. අලි පැටවුන් ජාවාරමට එරෙහිව හඬ නැඟූ චරිත ශ්‍රී විජේසේකර නම් මහතාට වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ඇතුළු වීම පවා තහනම් කරමින් මහින්ද රාජපක්ෂ නියෝග නිකුත් කර ඇත. මෙම සාපරාධී ක්‍රියාවන්ට එස්. නිරාජ් රොෂාන් නොහොත් අලි රොෂාන් සමඟ වනජීවී දෙපාර්තමේන්තුවේ අඩවි වන නිලධාරී උපාලි පද්මසිරි හා ලිපිකාරිණී එච්.පී. ප්‍රියංකා සංජීවනී සම්බන්ධ බවට විමර්ශන මඟින් හෙළි වී ඇත. හිටපු වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ට මෙන්ම වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යංශයේ ලේකම් ඉංජිනේරු උදේනි වික්‍රමසිංහ මහතාට ද මෙම චෝදනා වලින් ගැලවීමට නොහැක.

## 6.27 ජාතික ලොතරැයි මණ්ඩලයේ මුදල් අවභාවිත කිරීම

අන්ත දරිද්‍රතාවයෙන් හෝ උග්‍ර ජීවන බරින් මිරිකී සිටින මෙරට බහුතරයක් ජනතාව එම තත්ත්වයෙන් ගොඩ ඒමට තමන්ට කවදා හෝ දිනුමක් හිමිවේ යැයි සිතා මිලදී ගන්නා ලොතරැයි ආදායම ජාතික ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන ආදායම වේ. කාලයක පටන් මෙරට ලාභ ලබන රාජ්‍ය ආයතනයක් ලෙස ලොතරැයි මණ්ඩලය පැවතුණි. ඒ සම්බන්ධයෙන් වහ වැටුණු රාජපක්ෂ බහිරවයන් ලොතරැයි මණ්ඩලයේ අරමුදල් තම ප්‍රතිරූපය ඉහළ නංවාගැනීමට භාවිතා කර ඇති අයුරු පහත දක්වමි.

ලොතරැයි අලෙවිය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් සිදු කරන බව දක්වා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ලොතරැයි මණ්ඩලය විසින් මුළු දිවයින පුරා විශාල ප්‍රමාණයේ පුවරු (BILL BOARDS) 150ක් සවි කිරීම සඳහා රු.57,750,000/- ක් වැය කර ඇත. එහෙත් මෙම පුවරු වල ලොතරැයි පිළිබඳව කිසිවක් සඳහන් නොවූ අතර මහින්ද රාජපක්ෂගේ රූප ප්‍රදර්ශනය කිරීම පමණක් සිදු කර ඇත. තව ද ජංගම ප්‍රවර්ධන ට්‍රක් රථ උපයෝගී කරගෙන විශාල ප්‍රමාණයේ LED තිර මඟින් ලොතරැයි ප්‍රවර්ධන කටයුතු සිදු කරන බව සඳහන් කරමින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා විසින් යුද්ධය ජය ගත් අන්දම දැක්වෙන චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමට සලස්වා ඒ සඳහා රු.70.350,000/- වියදම් කර ඇත. මේ අනුව බලන කල මහින්ද රාජපක්ෂ පිම්බීම සඳහා ජනතා මුදල් රු.128,130,000/- (කෝටි 13කට ආසන්න මුදලක්) කාබාසිනියා කර ඇත.

මෙම ප්‍රචාරක කටයුතු සඳහා වන මිල කැඳවීම්, ටෙන්ඩර් මණ්ඩල පත් කිරීම්, ඇගයීම් යනාදී කටයුතු ඉතා කඩිනමින් සිදු කර ඇති අතර සැපයුම්කරුවන්ට ප්‍රමාණවත් කාලයක් මේ සඳහා ලබා නොදීම, ටෙන්ඩර් පටිපාටි විනිවිදභාවයකින් නොකිරීම යනාදී සැක කටයුතු සිදුවීම් මේ තුළ සිදුවී ඇති අතර එමඟින් අත යට ගණුදෙනු සිදු වී ඇති බවට අදාළ ලේඛන වලින් පැහැදිලි වේ.

මහින්ද රාජපක්ෂගේ උපන්දින සැමරුම් දන්සල සඳහා රු.63,070/-ක් ද, බෙලිඅත්තේ රුහුණු අරුණ වැඩසටහනට රු. 850,000/-ක් ද, හම්බන්තොටදී ජනාධිපතිවරණ සමයේ පැවැත්වූ ආශීර්වාද පාගමනට කෑම සැපයීම වෙනුවෙන් රු. 519,915/-ක් ද, එම කාලයේදීම

හම්බන්තොට පවත්වන ලද වෛද්‍ය සායනයක් වෙනුවෙන් රු.1,000,000/-ක් ද, යෝෂිත රාජපක්ෂ සභාපති ධුරය දැරූ එල්ලේ සම්මේලනයට රු.5,000,000/-ක්ද, ජනාධිපතිවරණයට දින දෙකකට පෙර හම්බන්තොටදී පැවැත්වූ බෝධි පූජා පිංකමකට රු.1,806,850/-ක් ද, රාජපක්ෂ පුතුන්ගේ CSN ආයතනයට රු.1,142,375/-ක් ද වශයෙන් ලොතරැයි මණ්ඩලයේ මුදල් ගෙවා ඇත.

මෙයින් අපට පැහැදිලි වන්නේ රාජපක්ෂවරු මෙරට සාමාන්‍ය ජනතාව අතර දැවැන්ත ප්‍රතිරූප මවා පෙන්වූයේ මේ සියලු කටයුතු තමන්ගේ පුද්ගලික මුදලින් සිදුකරන බව හැඟී යන ආකාරයෙනි. එහෙත් යථාර්තය නම් මේ සියලු දේ ඔවුන් සිදුකළේ රාජ්‍ය සම්පත් සූරාකමින් බව සක්සුදක්සේ පැහැදිලිය. එසේ නම් මොවුන් නැවත බලයට එන්නේ මේ දේවල් නැවත නොකිරීමට යැයි කාට කිවහැකිද ?

## 6.28 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය අක්‍රමිකතා

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු කපිතාන් පත්බේරිය නම් නාවික හමුදා නිලධාරියෙකු විසින් මෙහෙයවයි. දෙපාර්තමේන්තුවේ වාහන අලුත්වැඩියා කටයුතු ඔහුගේ සහෝදරයා වන මහේෂ් කුමාර පත්බේරියට අයත් පිළියන්දල, කොළමුන්න, අංක 49 හි පිහිටි දයාසිරි ඔටෝ වෙක් වෙත පවරන අතර, මිලගණන් කැඳවීම කරනු ලබන්නේ ඉහත කී දයාසිරි ඔටෝ වෙක් ආයතනය, කපිතාන් පත්බේරියට අයත් කාර් නේෂන් ආයතනයෙන් හා හිටපු ගුවන් හමුදා නිලධාරියෙකුට අයත් රසායනික දියර අලෙවි අරණ ස්ක් එන්ටර්ප්‍රයිසස් යන ආයතන වලිනි. පසුගිය කාලය තුළ රුපියල් මිලියන ගණනාවක ඇණවුම් කපිතාන් පත්බේරිය විසින් සිය සහෝදරයාගේ ආයතනයට ලබා දී ඇති බව සඳහන් වේ.

එසේ ම විශාල ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් බල සීමාව ඉක්මවා නොයන පරිදි කැබලි වලට කඩා එහි මිලදී ගැනීම් කටයුතු සිදු කරන ලද අතර, එහිදී අවශ්‍ය සැපයුම් එකවර ලබා නොගෙන එකම මිල ගණන් යටතේ කොටස් වශයෙන් මිලදී ගැනීමට කටයුතු කර ඇති අතර එහි දී ටෙන්ඩර් සීමා මගහැර යාම නිසා දූෂණයක් සිදු කර ඇති බව 2014.04.15 දින විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇත.

දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ගොවිපලවල් මඟින් ලැබෙන ආදායම් ලංකා බැංකුවේ බම්බලපිටිය ශාඛාවේ අංක 70743246 දරන ඉතිරි කිරීමේ ගිණුමට බැර කරන අතර එම ආදායම් මහා භාණ්ඩාගාරයට වාර්තා වී නොමැත. රජයේ දෙපාර්තමේන්තු වලට ඉතිරි කිරීමේ ගිණුම් පවත්වා ගෙන යාමට අවසර නොමැත. ඉතිරි කිරීමේ ගිණුමේ ගනුදෙනු සඳහා අංක 70759844 දරන ජංගම ගිණුම විවෘත කර ඇති අතර ඉතිරි කිරීමේ ගිණුමේ මුදල් වරින් වර ජංගම ගිණුමට මාරු කර එම මුදල් වලින් වාහන ඇතුළු උපකරණ රෙගුලාසි වලට පරිබාහිරව මිලදී ගන්නා බවත්, එම දේපල පොත්පත් වල සටහන් නොවන බවත්, මෙම ගිණුම් දෙකම මහා භාණ්ඩාගාරයේ අවසරයකින් තොරව පවත්වා ගෙන යන බවත්, ඉතිරි කිරීමේ ගිණුමට ලැබීම් ලෙස රුපියල් මිලියන 1239ක් ද ගෙවීම් ලෙස රුපියල් මිලියන 1146 ක්ද 2015 වර්ෂය වන විට සටහන් වී ඇති බවත් මෙම දෙපාර්තමේන්තුව පිළිබඳව ඉදිරිපත් වී ඇති පැමිණිල්ලේ සඳහන් වී ඇත.

පැමිණිල්ලේ සඳහන් කරුණු පිළිබඳව විමර්ශන සිදු කරමින් පවතී. ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ පැවති ආයතන තුළ වෙනම ම පාලනයක් පැවති බව මෙම පැමිණිල්ල හා ගාලු මුවදොර පිහිටි ආරක්ෂක අමාත්‍යාංශය පිහිටි ඉඩම විකිණීමෙන් ලැබුණු මුදල භාණ්ඩාගාර අරමුදලේ තැන්පත් නොකර හිටපු ආරක්ෂක ලේකම්වරයා එම මුදල් වෙනම ගිණුමක පවත්වාගෙන යාම යන කරුණු වලින් පැහැදිලි වේ.

## 6.29 ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ මුදල් සාවද්‍ය පරිහරණය

පූර්ණ රාජ්‍ය බැංකුවක් වන ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව පසුගිය කාල සීමාවේ දී නිසි ණය සුරැකුම් නොමැතිව, පසුගිය රජයේ දේශපාලකයින්ගේ ඉල්ලීම් අනුව රුපියල් මිලියන 1132 කට ආසන්න මුදල් ප්‍රමාණයක් ණය වශයෙන් ලබා දී ඇති බවත් එම ණය මුදල් වලින් කිසිදු මුදලක් ආපසු ගෙවා නොමැති බවත් ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ වත්මන් පාලනාධිකාරිය පැමිණිලි කර ඇත.

RATHNADEEPA EXPORTS - කිසිදු වටිනාකමක් නොමැති තිරිවානා ගල් ඇපයට තබා ගෙන මුදල් අමාත්‍යංශයේ උපදෙස් මත රුපියල් මිලියන 05 ක් ණය වශයෙන් ලබා දී ඇත.

SATHSIDU ORGANIZATION - හම්බන්තොට ජුලම්පිටියේ පන්සලක ඔප්පුවක් ඇපයට තබා ගෙන ජුලම්පිටියේ පදිංචි කේ. ඒ. පියනන්ද සහ චන්දන නාමල් ද සිල්වා යන අයගෙ SATHSIDU ORGANIZATION වෙත රුපියල් මිලියන 03 ක් ණය ලබා දී ඇත.

එක්සත් ධීවර සමිතිය, ත්‍රිකුණාමලය නැගෙනහිර පළාත් සභාවේ සභාපතිණි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධායක ආරියවතී ගලප්පත්තිගේ ඉල්ලීම අනුව රුපියල් මිලියන 75 ක ණයක් කිසිදු ඇපයක් නොමැතිව ලබා දී ඇත.

BETTANS ආයතනය - කිසිදු සොයා බැලීමකින් තොරවම රුපියල් මිලියන 300 ක ණය මුදලක් ලබා දී ඇත. මෙම ණය මුදල ලබා දීම බැංකුව පළමුව ප්‍රතික්ෂේප කළ ද ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත පසුව එම ණය මුදල ලබා දී ඇත.

ප්‍රභාත් විජේවීර - හම්බන්තොට ප්‍රදේශයේ පදිංචි එකම පුද්ගලයෙකු විසින් විවිධ අයගේ නම් භාවිතා කරමින් උතුරු නැගෙනහිර රාජකාරියේ යෙදී සිටි හමුදා විරුවන්ගේ නම් ඇපකරුවන් ලෙස යොදා වාර 10 ක දී හම්බන්තොට ශාඛාවෙන් රුපියල් මිලියන 3.6 ක ණය ලබාගෙන ඇත.

සී/ස ජනතා හිරියාල - දීර්ඝ කාලීන බදු මත රජයෙන් ලබා ගත් ඉඩමක් ඇපයට තබා ගෙන රුපියල් මිලියන 26.16 ක ණයක් ලබා දී ඇත

KEEN WARE INTERNATIONAL - දීර්ඝ කාලීන බදු මත රජයෙන් ලබා ගත් ඉඩමක් ඇපයට තබා ගෙන හා හිටපු අමාත්‍ය රංජිත් සියඹලාපිටියගේ හා ජනාධිපති කාර්යාලයේ ඉල්ලීම මත රුපියල් මිලියන 10 ක ණයක් ලබා දීම

TRI STAR APPAREL - හිටපු මුදල් අමාත්‍යංශ ලේකම් පී.බී.ජයසුන්දරගේ උපදෙස් මත රුපියල් මිලියන 530 ක ණය මුදලක් ලබා දීම.

CRESENT BUTTONS - රුපියල් මිලියන 35 කට වඩා වැඩි මුදලක් ලබා දී ඇත. එවකට වරාය හා ගුවන් සේවා අමාත්‍යවරයාව සිටි චමල් රාජපක්ෂ මහතා හිටපු අමාත්‍ය ගුණරත්න වීරකෝන් ගේ ඉල්ලීම අනුව ලිපියක් මගින් මෙම ආයතනයට සැලකිය හැකි සහනයක් සලසන ලෙස බැංකුවෙන් ඉල්ලා ඇත.

- මහින්ද චින්තන සහෘද සංසදය - හිටපු අමාත්‍යංශ ලේකම් විලී ගමගේ සභාපති ධුරය දරණ මෙම සංසදයට රුපියල් 100,000/- ක මුදලක් පරිත්‍යාග කිරීම.

- TORANA MUSIC DISTRIBUTORS - රු.මිලියන 25
- SAARA OS LEATHER (PVT) LTD . - රු.මිලියන 25
- NTS INTERLINING (PVT) LTD - රු.මිලියන 17
- රජ්ජුරුවත්ත තේ (පුද්.) සමාගම - රු.මිලියන 16
- NANDANA AUTO PRODUCTS (PVT) LTD - රු.මිලියන 62

ණය මුදල් වශයෙන් ලබා ගත්තද ආරම්භයේ සිටම කිසිදු මුදලක් ආපසු නොගෙවීම තුලින් අනාවරණය වන්නේ මෙසේ ලබා ගත් ණය අදාළ කාරණාවෙන් බැහැරව පෞද්ගලිකව අයථා ලෙස පරිහරණය කර ඇති බවයි. දේශීය බැංකු සුරක්ෂිත කරනු වෙනුවට මහින්ද රාජපක්ෂ පාලනය තුළ එම බැංකු වලපල්ලට දමා ඇති ආකාරය මෙමගින් මනාව පැහැදිලිවේ. තම කුඹුරට අවශ්‍ය තෙල් ටික හා පොහොර ටික මිලදී ගැනීමට මුදල් නොමැතිව බැංකුවෙන් ලබා ගත් රුපියල් 10,000 – 15,000 ක් වගා ණය ගෙවා ගැනීමට නොහැකි වූ විට ඔවුන්ට එරෙහිව නීති මගින් කටයුතු කරමින් ගොවියන් සිය දිවි නසා ගැනීමේ තැනට තල්ලු කරන බැංකු රුපියල් කෝටි ගණනින් පොලු තබා ඇති මෙම ව්‍යාපාරිකයන්ගෙන් එම මුදල් ආපසු අය කර ගැනීමට කටයුතු කර තිබේද?

## 6.30 CWG Hambanthota 2018 නැමැති සමාගම

CWG Hambanthota 2018 නැමැති සමාගම මහ බැංකුව යටතේ පසුගිය රජය සමයේ ආරම්භ කර ඇති සමාගමකි. CWG Hambanthota යනු කුමක්ද? මෙහි අර්ථය Common Wealth Games Hambanthota 2018 එනම් 2018 පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල - හම්බන්තොට යන්න වේ. මහින්ද රාජපක්ෂ රජය 2018 පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල හම්බන්තොටට ලබා ගැනීම සඳහා විශාල උත්සහයක යෙදුණි. උළෙල මෙරටට ලබා ගැනීමේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් පමණක් රුපියල් කෝටි 1000ක් වැය කිරීමට සූදානම් බවට ඒ දිනවල මාධ්‍ය වල ප්‍රචාරය විය. ඒ අනුව ක්‍රීඩා උළෙලේ ප්‍රචාරක කටයුතු සඳහා මෙම සමාගම පිහිටුවා ගෙන ඇති බවට පැහැදිලිය. ක්‍රීඩා උළෙල පවත්වන රට තේරීමේ සමුළුවක් 2011 නොවැම්බර් මස බටහිර ඉන්දීය දූපත් වන ශාන්ත කිට් හා නේවිස් දූපත්

වල පැවැත්විණි. ශ්‍රී ලංකාවෙන් හාරසීය දෙනෙකු රැගත් ගුවන් යානයක් ඒ වෙනුවෙන්ම එම රටට පිටත් කර යැවීය. මේ 400 දෙනෙකු පිරිස අතර තරුණියන් 100 ක් පමණ රැගෙන ගොස් ඇති අතර තරුණියන් සැපයීම හා රැගෙන යාම සිදු කර ඇත්තේ මෙරට ජනප්‍රිය සිංදු කාරයෙක්ගේ නැගණියයි. මොවුන්ගේ පියා ප්‍රීතියට රජෙක් නම් වන චිත්‍රපට නිෂ්පාදකයෙකි. මෙම තරුණිය නාමල් රාජපක්ෂලාගේ නයිට් කාර් රේස් වලදී හා කාල්ටන් රග්බි තරඟවලදී තරුණියන් සැපයීමද සිදු කර ඇත. තරුණියන් සපයා හෝ තේරීම් කමිටුවේ මනදොළ සම්පූර්ණ කර ක්‍රීඩා තරඟාවලිය මෙරටට ලබා ගැනීමට දැරූ උත්සහය නිරර්ථක විය. එහෙත් ශාන්ත කිට් දූපත්වලදී මෙරටින් ගිය නඩය හොඳහැටි විනෝද වූ බව පෙන්වන ඡායා රූප ඒ දිනවල මාධ්‍ය වල පළ විය. නාමල් රාජපක්ෂ, අජිත් නිවාඩ් කබ්රාල්, නිමල් පෙරේරා යනාදි ගජ මිතුරු නඩය පෝලිමට කරට අත් තබා ගෙන පොඩි එවුන් මෙන් කෝච්චි යන පිංතූර බලා මෙරට ජනතාව අනේ අපොයි කීවෝය.

CWG Hambanthota 2018 සමාගමේ ගිණුම් වාර්තා පරීක්ෂා කිරීමේදි පෙනී යන්නේ මෙරට ප්‍රකට සමාගම් මෙන්ම අජිත් නිවාඩ් කබ්රාල්, නාමල්ගේ රගර් පුහුණුකරු අසංග සෙනෙවිරත්න, රවී විජේරත්න වැනි පුද්ගලයන් විසින් මිලියන ගණනින් මුදල් ලබා දී ඇති බවයි. එමෙන්ම නිශ්චිතව නම සඳහන් නොකරමින් "සුහ පතන්නන්" යනුවෙන් සඳහන් කර මිලියන ගණනින් මුදල් ලබා දී ඇත. 2011.01.18 සිට 2013.02.06 දක්වා කාලයේදී චෙක් පත් වලින් සහ මුදලින් වාර 85 දී රු. 688,819,155.85 ක් ගිණුමට බැර වී ඇත. එනම් කෝටි 69 ට ආසන්න මුදලකි. මුදලින් ලැබී ඇත්තේ 25,639,553.85 ක් (කෝටි 2 1/2) ක් ගිණුමට බැර කර නොමැත. මෙම මුදල ගියේ කාගේ සාක්කුවටද? තවද ඉහතින් සඳහන් කළ ගායකයාගේ නැගණියගේ නමට 2011.10.24 සිට 2012.06.11 දක්වා කාලය තුළ රු. 10,461,988/- ක් (කෝටියකට අධික මුදලක්) මෙම සමාගමෙන් ගෙවා ඇත. තවද මෙම තරුණියගේ Wizcraft International Entertainments ආයතනයට 2011.05.30 දින අංක 486679 දරන චෙක්පතින් රු. 9,048,082/- ක මුදලක් ගෙවා ඇත. මෙම තරුණිය නාමල් රාජපක්ෂගේ "තාරුණ්‍යට හෙටක්" සංවිධානයේ උපදේශිකාවක් මෙන්ම නාමල්ලාගේ CSN හා RED FM නාලිකාවල සේවය කරයි.

ඉහත දැක්වූ පරිදි මෙම සමාගමේ ගණුදෙනු පරීක්ෂා කිරීමේදි පෙනී යන්නේ ක්‍රීඩා උළෙල මුවාවෙන් එක් එක් සමාගම්වලින් හා පුද්ගලයන්ගෙන් මොවුන් මුදල් එකතු කර (කප්පම්) එම මුදල් තරුණියන්ගේ පහස ලබා ගැනීම වැනි පුද්ගලික සුඛ විහරණයට භාවිතා කර ඇති බවට මනාව පැහැදිලි වේ. "තාරුණයට හෙටක්" නැමැති සංවිධාන පිහිටුවාගෙන මොවුන් සිදුකර ඇත්තේ තම රාජ්‍ය බලය මගින් බලපෑම් කර මුදල් එකතු කර තමන්ගේ හෙට දවස ගොඩනගා ගැනීමත් තම ප්‍රතිරූපය පමණක් පුම්බා ගැනීමත් මෙරට ලක්ෂ සංඛ්‍යාත තරුණ තරුණියන්ගේ අනාගත වලපල්ලට යැවීමත් පමණකි.

### 6.31 නෙළුම් කුළුන ව්‍යාපෘතිය

පසු ගිය රජය සමයේ විශාල ප්‍රසිද්ධියක් ලබා දී අරඹන ලද තවත් මෙගා ව්‍යාපෘතියකි නෙළුම් කුළුන ව්‍යාපෘතිය. මේ සඳහා චීනයේ Exim බැංකුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 105 ක (රුපියල් බිලියන 13.65) ණය මුදලක් ලබා ගෙන ඇත. කුළුනේ පහළ මහල් 07 ක්, සාප්පු සංකීර්ණ, සම්මන්ත්‍රණශාලා, හෝටල් යනාදිය සඳහා වෙන් කර ඇත.

කුළුනේ ඉහළ රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශන ඇන්ටනා සහ සීමිත විදුලි සංදේශ ඇන්ටනා සඳහා වෙන් කර ඇත.

ඉදි කිරීම සඳහා CEIEC නමැති චීන සමාගමක් තෝරා ගෙන ඇත්තේ විධිමත් පරිපාටියෙන් බැහැරව බව. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ හා නියාමන කොමිෂන් සභාවේ ව්‍යාපෘතියක් බවට දැක්වුවද ව්‍යාපෘතිය කොමිෂන් සභාවේ අරමුණුවලින් බැහැර කටයුත්තක් බව. කුළුන ඉදිකිරීම මගින් මුදාහරින රූපවාහිනී සංඥා ආවරණය කරනු ලබන්නේ දිවයිනේ 10%ක භූමි ප්‍රමාණයක් බවත් එම කාර්යය ඇමරිකානු ඩොලර් 0.5 ක මුදලකින් ඉටු කර ගත හැකිව තිබූ බවත් පැමිණිල්ලෙන් කරුණු දක්වා ඇත.

# මහින්ද රාජපක්ෂ පාලනය වගකිව යුතු පැහැර ගැනීම්, අතුරුදහන් කරවීම් හා ඝාතන

2009 මැයි වන විට උතුරු නැගෙනහිර ත්‍රස්තවාදය සහ ඊට එරෙහි හමුදා මෙහෙයුම් අවසන් වුවද, මහින්ද රාජපක්ෂ පාලනය යටතේ පැහැර ගැනීම්, අතුරුදහන් කරවීම් සහ ඝාතනවල කිසිදු අඩුවක් දක්නට නොලැබිණි. යුද්ධය පැවති සමයේත් යුද්ධය නිමාවට පත් වූ පසුවත් සිදු වූ මෙම අපරාධ බොහොමයක් රාජපක්ෂ පාලනය විසින් සිදු කොට ඇත්තේ දේශපාලන පළිගැනීම් වශයෙනි. විශේෂයෙන්ම තම දේශපාලනය මතයට  අභියෝග කරන මාධ්‍යවේදීන්ට ප්‍රසිද්ධියේ සිදු කළ පහර දීම්, අඩන්තේට්ටම් කිරීම්, අතුරුදහන් කිරීම් හෝ ඝාතනය කිරීම් වාර්තා විය. සන්ඩේ ලීඩර් කතෘ ලසන්ත වික්‍රමතුංග, මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ ඝාතන මේ අතර ප්‍රධාන වේ.

ජාති වාදය, තම බලය තහවුරු කර ගැනීමේ  එකම මෙවලම බවට පත් කර ගනිමින් බොරු දේශප්‍රේමයෙන් ජනතාව නොමඟ යැවීමට රාජපක්ෂ පාලනය ද්‍රවිඩ දේශපාලනඥයින් රාශියකට වෙඩි තබා ඝාතනය කළේය. පාර්ලිමේන්තු මන්ත්‍රී රවිරාජ්, පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසේකරම් හා පාර්ලිමේන්තු මන්ත්‍රී මහේෂ්වරන් ඝාතන මේ අතර ප්‍රධාන වේ.

2009 යුද්ධය අවසන් වුවද රාජපක්ෂ පාලනය උතුරු නැගෙනහිර පළාත් මිලිටරිකරණය කිරීම අවසන් කළේ නැත. උතුරු පළාතේ ද්‍රවිඩ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදය හෝ තමන් කැමති දේශපාලන මතයක් දැරීමට ඇති අයිතිය ලබා නොදුන් අතරම වෙනත් දේශපාලන පක්ෂයක මතවාදයක් උතුරේ ජනතාව අතර ප්‍රචලිත වීම වැලැක්වීම සඳහා රාජපක්ෂ පාලනය දිගින් දිගටම කටයුතු කළේය. ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරීන් දෙදෙනෙකු වූ ලලිත් සහ කුහන් උතුරු පළාතේ දහස් ගණනක් හමුදා කඳවුරු සහ හමුදා රැකවලුන් සිටියදී අතුරු දහන් විය. එයින් පැහැදිලිවම පෙනී යන්නේ රාජ්‍ය මැදිහත් වීම මත එම අතුරුදහන්වීම් සිදු වූ බවයි. මේ පිළිබඳව මේ දක්වා කිසිදු විමර්ශනයක් පවත්වා නැත.

යෝෂිත රාජපක්ෂට චෝදනා එල්ල වන රග්බි ක්‍රීඩක තාජුඩීන්ගේ ඝාතනය සම්බන්ධයෙන් මීට පෙර පැවත් වූ විමර්ශන සහ ඉදිරිපත් වී ඇති වෛද්‍ය වාර්තා පරස්පර බවත් අදාළ සිද්ධියේ සත්‍ය යටපත් කිරීමට කටයුතු කර ඇති බවත් මේ වන විට අනාවරණය වී ඇත. ඉහත දැක්වූ බොහෝ ඝාතන දේශපාලන පලිගැනීම් හෝ තම මතයට විරුද්ධ මතවාදයන් ඉවසීමට ඇති නොහැකියාව සහ ඒවා යටපත් කිරීමට සිදුවූ ඝාතන හා පැහැර ගැනීම් වුවද, රග්බි ක්‍රීඩක තාජුඩීන්ගේ ඝාතනය හුදෙක් පෞද්ගලික හේතුවක් මත යෝෂිත රාජපක්ෂගේ අනුදැනුම මත සිදු වූ ඝාතනයක් බව දැන් අනාවරණය වෙමින් පවතී.

ඇතැම් මිනී මැරුම් සම්බන්ධයෙන් පැමිණිලි භාර ගෙන විමර්ශන ආරම්භ කිරීමට කටයුතු කලද, සැබෑ මිනීමරුවන් නීතියේ රැහැනට හසු කර ගැනීමට වටපිටාවක් රාජපක්ෂ පාලන සමයේ පැවතියේ නැත. ස්වාධීන විමර්ශනයන්ට බලපෑම් කොට ඒවා යටපත් කිරීමට මහින්ද - ගෝඨා පාලනය කටයුතු කරන ලදී. 2010 ජනාධිපතිවරණයේ දී අම්බලන්ගොඩදී ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාකාරිකයෙකු වූ චන්ද්‍රදාස නායිදුවාවඩු සහෝදරයාට සජින් වාස්ගේ ආධාරකරුවන් විසින් පහරදී මරණයට පත් කිරීම පිලිබඳ ස්වාධීන පරීක්ෂණයක් සිදු නොවීය. එම ඝාතනය පිළිබඳ සාක්ෂි නොමැති බව පවසමින් අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම වලක්වා ඇත. ජ.වි.පෙ. ක්‍රියාකාරිකයෙකු වූ නන්දන බාලගේ සහෝදරයාට ගම්පහදී වෙඩි ලබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් ජාතික නිදහස් පෙරමුණේ දේශපාලන මණ්ඩල සභිකයෙකු වූ පියසිරි විජේනායක චෝදනා ලබා ඇති අතර ඔහුට විරුද්ධව මේ දක්වාම අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට නීතිපති උපදෙස් පොලීසියට ලබා දී නොමැත. රාජපක්ෂ පාලනය මිනීමරුවන් ආරක්ෂා කිරීමට අවශ්‍ය පරිදි පොලීසිය, නීතිපති දෙපාර්තමේන්තුව සහ අධිකරණය මෙහෙයවා තිබුණි. රනිල් වික්‍රමසිංහගේ පසුගිය මාස 06 ක කාලය තුලදී ද එහි කිසිදු වෙනසක් දක්නට නොවීය. මාතලේ පොලිස් ස්ථානාධිපති කේ.සී. හපුආරච්චි විසින් මාතලේදී ඝාතනය කරන ලද ජ.වි.පෙ. ක්‍රියාකාරිකයෙකු වූ ඒ.ඩී. සිරිදේව සහෝදරයා සම්බන්ධව මෙන්ම එස්. බී. දිසානායක ඇතුළු මැරයන් විසින් පාමංකඩදී ඝාතනය කල චම්මික සුසන්ත සහෝදරයා වෙනුවෙන්ද මේ දක්වා යුක්තිය ඉෂ්ඨ කිරීමට රාජපක්ෂ පාලනය ඉඩ දී නොමැත. මිනීමරුවන්ට නිදහසේ කටයුතු කරගෙන යාමට ඉඩදී තම බලය වෙනුවෙන් ඔවුන්ට රැකවරණ සැලසූ මිනීමරු රාජපක්ෂ බෝධිසත්වයෙකු ලෙස හැසිරීම හාස්‍යයට කරුණකි.

මාතර දික්වැල්ල පදිංචි කේ. නලින්ද ප්‍රදීප් සහ ආඩිඅම්බලම දැවමොට්ටාව කේ.පී. පීවන් සුනිල් යන අයවළුන්ගේ මරණ මහින්ද රාජපක්ෂගේ ආරක්ෂක නිලධාරී මේජර් නෙවිල් වන්නිආරච්චිගේ අනුදැනුම මත පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කල බවට තොරතුරු අනාවරණය වී තිබුණි. මේ සම්බන්ධනේ ජනාධිපතිවරයා ඇතුළු රටේ සියළු බලධාරීන්ට පැමිණිලි කලද කිසිදු විමර්ශනයක් නොකල බව ඥාතීන් චෝදනා කර ඇත.

තවද, අම්බලන්තොට හැඩවින්න මාමඩල පදිංචි පී. ඩබ්ලිව්. සරත් මහතා 2013.12.12 ඝාතනය කරන ලද අතර ඊට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියා මාර්ග ගැනීමට ඉදිරිපත් වූ ඥාතීන්ට එවැනි නෛතික ක්‍රියා මාර්ගවලට එළඹියහොත් ඔවුන් මරා දමන බවට මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂක නිලධාරී මේජර් නෙවිල් තර්ජණය කොට යටපත් කල බවට ඥාතීන් විසින් චෝදනා කර ඇත.

රාජපක්ෂ පාලනය විසින් මෙලෙස සිදු කල සිය දහස් ගණනක ඝාතන මහින්ද හා ගෝඨා විසින් යටපත් කර ඇත. පසුගිය වසර 10 ක කාලය තුල සිදු වූ පැහැර ගැනීම් අතුරුදහන් කරවීම් සහ ඝාතන පිළිබඳ පූර්ණ බලය සහිත කොමිසමක් පත් කොට තරාතිරම නොබලා ඊට වගකිව යුත්තන්ට එරෙහිව දඬුවම් කල යුතු බව අවධාරණය කරමු.

## 7.04 ජනක බණ්ඩාර තෙන්නකෝන් සිදු කළ පුද්ගල ඝාතන

2006 මහමැතිවරණය සමයේදී මාතලේ කොහෙලවෙල ප්‍රදේශයේදී එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂක රංජිත් අලුවිහාරේ මහතාගේ ආධාරකරුවෙකු වෙඩි තබා ඝාතනය කිරීම පිළිබඳව ජනක බණ්ඩාර තෙන්නකෝන් නම් රාජපක්ෂ ආණ්ඩුවේ හිටපු ඇමතිවරයා අධි චෝදනා ලබා ඇතත් එම නඩු කටයුතු රාජපක්ෂ පාලනය විසින් යටගසා ඇත.

2015 පසුගිය ජනාධිපතිවරණයේදී මුලින්ම මෛත්‍රීපාල සිරිසේන මහතාට සහය පලකළ තෙන්නකෝන් මහතා පසුව තම තීරණය වෙනස් කළේය. මෙම ඝාතනය පිළිබඳ සිද්ධිය යොදා ගනිමින් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ජනක බණ්ඩාර තෙන්නකෝන් තමාට අවශ්‍ය පරිදි පාලනය කරන අයුරු දැන් දක්නට ලැබේ. ජූලි 26 දා ඔහු මහින්ද රාජපක්ෂට ප්‍රසිද්ධියේ දණගහ වැන්දේය.

මෙම ඝාතනය පිළිබඳව පොලිස් පරීක්ෂණ වලදී හෙළි වී ඇති පරිදි මැතිවරණ ප්‍රචාරක කටයුතු වල යෙදී සිටි එක්සත් ජාතික පක්ෂ ආධාරකරුවන් පිරිසක් ජනක බණ්ඩාර තෙන්නකෝන් ඇතුළු පිරිසක් ගමන් කළ රථ පෙළ පාලියකට හමු වී ඇත. එහිදී ජනක බන්ඩාර තෙන්නකෝන් මහතා ඔවුන්ට වෙඩි තබන ලෙස තම ආධාරකරුවන්ට පවසා ඇත. එහිදී සිදු කළ වෙඩි තැබීමෙන් එක් පුද්ගලයෙකු මියගොස් තවත් පිරිසක් තුවාල ලැබීය.

වෙඩි තැබීම සිදු කළ පුද්ගලයා පොලිසියට පවසා ඇත්තේ ජනක බණ්ඩාර විසින් වෙඩි තබන ලෙස නියෝග කළ බැවින් තමා වෙඩි තැබූ බවයි.

මෙවැනි නිරායුධ, පෝස්ටර් අලවන විපක්ෂ ආධාරකරුවන් වෙඩි තබා ඝාතනය කිරීමට තරම් අමානුෂික වූ ඇමතිවරුන්ගෙන් රාජපක්ෂ ආණ්ඩුව සමන්විත විය. සියලු චෝදනා ඔප්පු වී තිබියදීත් ඔහු යලිත් මෙවර මැතිවරණයට තරඟ කරයි.

### පාර්ලිමේන්තු මන්ත්‍රී රවිරාජ් ඝාතනය.

ද්‍රවිඩ ජාතික සන්ධානය නියෝජනය කරමින් පාර්ලිමේන්තුව නියෝජනය කල නඩරාජා රවිරාජ් මහතා 2006 නොවැම්බර් 10 දින කොළඹදී වෙඩිතබා ඝාතනය කරන ලදී.

රවිරාජ් මහතා නීතිඥයෙකු සහ මානව හිමිකම් ක්‍රියාකාරිවරයෙකු වූ අතර LTTE ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක පැවති වකවානුවක සිදු වූ මෙම ඝාතනය LTTE සංවිධානය සිදු නොකළ බවටත් එය සිදුකලේ ආණ්ඩුවට සම්බන්ධ පුද්ගලයින්ගේ අවශ්‍යතා සඳහා බවටත් මතයක් ප්‍රචාරණය විය. එමෙන්ම LTTE සංවිධානය ඝාතනයේ වගකීම බාර නොගත් අතර එය ආණ්ඩුව විසින් සිදුකල බවට චෝදනා කළේය. උතුරේ දෙමළ දේශපාලන පක්ෂ හා සංවිධාන වලද මතය වුයේ එයයි.

ආණ්ඩුව ඝාතනයට සම්බන්ධ නොමැති නම් එම ඝාතනය පිළිබදව පරීක්ෂණ ආණ්ඩුවේ ඉදිරියට ගෙන ගොස් සැකකරුවන්  අත්අඩංගුවට ගත හැකිව තිබුණි. එහෙත් එය සිදුනොවීය. රාජපක්ෂ ආණ්ඩුව මෙම ඝාතනයේ පරීක්ෂණ යටගැසුවේය. රහස් පොලිසිය මගින් මෙම ඝාතනය පිළිබඳ පරීක්ෂණ ජනවාරි 8න් පසුව යලි ආරම්භ කළ අතර 2015.06.05 දින ඒ පිළිබඳ කරුණු අධිකරණයට වාර්තා කළේය.

එම තොරතුරුවලට අනුව ඝාතනය සඳහා යොදා ගනු ලැබූ ආයුධ හඳුනාගෙන ඇති අතර ඒවා ආරක්ෂක හමුදා සතු ආයුධ බව සොයා ගෙන ඇත. ඝාතනය සඳහා නාවික සෙබළුන් 04 දෙනෙකු සම්බන්ධ වී ඇති අතර නිලන්ත සම්පත් මුණසිංහ නොහොත් නේවි සම්පත් නැමැත්තා ඉන් ප්‍රධානියාය.

රවිරාජ් ඝාතනයට මෙම නාවික සෙබළුන්ට පෞද්ගලික අවශ්‍යතාවයක් නොමැති අතර ඝාතනය සඳහා ඔවුන්ට ඉහලින් නියෝගයක් ලැබිය යුතුය. ඝාතන පරීක්ෂණ අත්හිටවනු ලැබුවේ මෙම ඝාතනයේද අවසාන චෝදනාව ගෝඨාභය රාජපක්ෂ වෙත යොමු වීම වැලැක්විය නොහැකි බැවිනි.

- **මහීපාල හේරත්**

දැරණියගල නුරි වතුයායේ කළමනාකරු නිහාල් පෙරේරා මහතා 2013 ජුලි 05 දින වෙඩි තබා ඝාතනය කරන ලද අතර මෙම ඝාතනයේ චෝදනාවට ලක්වූයේ දැරණියගල ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති චම්පික විජේසිංහ නොහොත් අතකොටාය.

අතකොටා යනු ගංජා ව්‍යාපාරයේ යෙදෙමින් නොබෝදා සාක්ෂි සහිතව පොලිසියට කොටු වූ සබරගමුව මහඇමති මහීපාල හේරත්ගේ සහ ඔහුගේ පුත් පාර්ලිමේන්තු මන්ත්‍රී කනක හේරත්ගේ සමීපතම අනුගාමිකයෙකි. මෙම නුරි වතුයායේ සහ දැරණියගල ප්‍රදේශයේ සිදු වූ අපරාධ රැසකට අතකොටා සෘජුවත් හේරත් පිය පුතු දෙදෙනා වක්‍රවත් සම්බන්ධ බවට ප්‍රදේශවාසීහු චෝදනා කරයි.

මහීපාල හේරත් සහ අතකොටා එක්ව මුළු දැරණියගල ප්‍රදේශයම විවිධ අපරාධ මගින් භීතියට පත් කර අසරණ ජනතාව වහලුන් බවට පත්කොට තිබුණි. නිහාල් පෙරේරා මහතා ඝාතනය කිරීමෙන් අනතුරුව අතකොටා මහීපාල හේරත් මහ ඇමතිවරයා විසින් සඟවා තබාගෙන සිටි බවට සැක කෙරෙන අතර ඝාතනයෙන් සැහෙන කලකට පසුව ඔහු අත්අඩංගුවට ගනු ලැබීය.

## 7.07 සුදු වෑන් මගින් පුද්ගලයින් පැහැර ගැනීම.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්තා අනුව ලෝකයේ අතුරුදහන් වූ පුද්ගලයින් වැඩිම සංඛ්‍යාවක් සිටින රටවල් අතරින් දෙවන ස්ථානය හිමිවන්නේ ශ්‍රී ලංකාවටයි. 1980 දශකයේ එක්සත් ජාතික පක්ෂ පාලන සමයේද 2005 න් ඇරඹි රාජපක්ෂ පාලන සමයේද මෙරට ප්‍රගතිශීලී ශිෂ්‍යයින්, කම්කරුවන්, සිවිල් සංවිධාන ක්‍රියාකාරීන්, මාධ්‍යවේදීන් වැනි විවිධ පිරිස් ඝාතනයට හෝ අතුරුදහන් වීම් වලට ලක්විය.

රාජපක්ෂ පාලන සමයේ පැහැර ගනු ලැබූ පුද්ගලයින්ගෙන් බහුතරය ද්‍රවිඩ ජාතිකයින් වූ අතර කොළඹ නගරයේ අධි ආරක්ෂක කලාප තුළදී පවා පැහැර ගැනීම් සිදු විය.

2008 වසරේදී දෙහිවල ප්‍රදේශයෙන් පැහැර ගනු ලැබූ තරුණයින් 07 දෙනෙකු පිළිබඳ පරීක්ෂනවලදී හෙළිදරව් වී ඇත්තේ මෙම පැහැර ගෙන ගොස් රඳවා තබා ගෙන සිට පසුව ඝාතනය සඳහා හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ ඇතුළු උසස් නාවික හමුදා නිලධාරීන්ගේ අනුදැනුම මත සිදුවූ බවයි. එම පැහැර ගන්නා පුද්ගලයින්ගේ දෙමව්පියන් වෙතින් කප්පම්ද ලබා ගෙන පසුව ඔවුන් ඝාතනය කර ඇත.

මෙලෙස සුදු වෑන් යොදා ගනිමින් පුද්ගලයින් පැහැර ගෙන යනු ලැබුවේ ආරක්ෂක අංශ විසින් බව තහවුරු වූයේ වැල්ලම්පිටිය ප්‍රදේශයේදී එවැනි පැහැර ගැනීමක් සඳහා පැමිණි පිරිස් අල්ලා රඳවාගැනීමට ප්‍රදේශවාසීන්ට හැකිවීමත් සමගය. පැහැර ගැනීමට උත්සහ දරන ලද්දේ වැල්ලම්පිටිය නගර සභාවේ නගරාධිපති රවීන්ද්‍ර උදය ශාන්ත මහතාය. එහිදී යුධ හමුදා සාමාජිකයන් 04 දෙනෙකු අල්ලා පොලිසියට භාර දෙනු ලැබූ නමුත් ඒ පිළිබඳව ඉන්පසු කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවේ නැත.

සුදු වෑන් මගින් සිදු කළ මෙම පැහැර ගැනීම් සහ ඝාතන සියල්ල පිටුපස සිටියේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාය. ඔහුට අවශ්‍ය වූයේ පූර්ණ මිලිටරි පාලනයකට රට ගෙන යාමයි. ඒ සඳහා තර්ජනයක් විය හැකි සියලු ප්‍රගතිශීලී බලවේග මර්ධනයට, යටත් කිරීමට හෝ රටින් පලවා හැරීම ඔහුගේ අභිප්‍රාය විය. රාජපක්ෂ පාලනයේ අවසාන භාගය වන විට රට අර්ධ මිලිටරි පාලනයකට යටවී තිබුණි. සුදු වෑන් සංස්කෘතියට විරුද්ධ මතවාදීන් මර්දනය කිරීමට සහ රාජපක්ෂ පාලනයට එරෙහිව හඬ නගන්නන් තුල භීතිය ඇති කිරීමට ගෝඨාභය රාජපක්ෂගේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කල මෙහෙයුමක් විය.

